

ආරක්ෂක අමාත්‍යාංශය

2024

වාර්ෂික කාර්යසාධන වාර්තාව

අන්තර්ගතය

පිටු අංකය

ආරක්ෂක ලේකම්ගේ පණිවිඩය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ **01**

1.1 හැඳින්වීම 03
1.2 අමාත්‍යාංශයේ දැක්ම සහ මෙහෙවර 04
1.3 අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් 05-06
1.4 අමාත්‍යාංශයේ සංවිධාන සටහන 07-10
1.5 අමාත්‍යාංශය යටතේ පවතින ප්‍රධාන අංශ 11
1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන 12
1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු 13-24
අ. විදේශ ආධාර ලබන ව්‍යාපෘති
ආ. විදේශ ණය යෝජනා ක්‍රම

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම **25**

2.1 ප්‍රගතිය 27-108
2.2 ඉදිරි දැක්ම 109-112

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය **113**

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 115
3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 116
3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 117
3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 118
3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය 119
3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය 119
3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 119
3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය 120
3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව 121-138

පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක **139**

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 141-151

පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය **153**

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු 155
5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 156

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ **157**

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 159
6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම 159
6.3 මානව සම්පත් සංවර්ධනය 159

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව **161-161**

ආරක්ෂක ලේකම්ගේ පණිවිඩය.....



සාමකාමී, නිදහස් හා නිවහල්, දේශයක් අනාගත පරපුර වෙත දායාද කිරීම උදෙසා උපායමාර්ගික ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කර ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගනිමින්, සැමට එකසේ ජීවත්විය හැකි රටක් බිහිකිරීමේ අභිලාෂයෙන් යුතුව "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" යන සංකල්පය තේමා කරගනිමින් කටයුතු කිරීම ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රමුඛතම රාජකාරිය වී ඇත. ඒ අනුව, එය සාක්ෂාත් කරගැනීමේ අරමුණ පෙරදැරිව ආරක්ෂක අමාත්‍ය ගරු අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමන්ගේ පූර්ණ උපදේශකත්වය මත ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ඇති සියලුම දෙපාර්තමේන්තු, ආයතනයන් මෙන්ම ත්‍රිවිධ හමුදාව, සිවිල් ආරක්ෂක බලකාය සහ වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් තම විෂයය පථයන්ට අදාළ රාජකාරීන් ඉටුකරමින් සේවා ස්ථානයට උපරිම සේවය ලබාදෙමින් කටයුතු කිරීම තුලින් අමාත්‍යාංශයේ කාර්යසාධනය ඉහළ මට්ටමකට රැගෙන ඒමටත් එය නොවෙනස්ව පවත්වාගෙන යාමටත් අවැසි පසුබිම සකස් කිරීමට කටයුතු කර ඇති බව සඳහන් කරමි.

සමුද්‍රීය කලාපය හරහා සිදුකරනු ලබන මිනිස් ජාවාරම, නීති විරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම, නීති විරෝධී මසුන් ඇල්ලීම මෙන්ම මුහුදු මංකොල්ලකරුවන්ගෙන් අප මාතෘභූමිය ආරක්ෂා කිරීම මෙන්ම නිදහස් හා නිවහල්, දේශයක් අනාගත පරපුර වෙත දායාද කිරීමේ අරමුණු පෙරදැරිව ත්‍රිවිධ හමුදාව, බුද්ධි අංශ සහ වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සාමාජික සාමාජිකාවන් විසින් සිදුකරන්නා වූ කැපකිරීම පැසසුමට ලක්කල යුතු කරුණකි. එමෙන්ම පිළිලයක් මෙන් අප රට වෙලාගෙන පවතින මත්ද්‍රව්‍ය උවදුර මෙරටින් තුරන් කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ අධීක්ෂණයෙන් සියලුම බුද්ධි අංශ සහ ශ්‍රී ලංකා පොලීසිය විසින් පසුගිය කාල සීමාව තුළ සිදුකරනු ලැබූ මෙහෙයුම් මගින් මහාපරිමාණ වශයෙන් ක්‍රියාත්මක මත්ද්‍රව්‍ය ජාවාරම මැඩලීමට අවශ්‍ය කටයුතු කිරීම තුලින් යහපත් සමාජයක් බිහිකිරීමට අවැසි පසුබිම සකස් කිරීමට හැකිවීම ආරක්ෂක අමාත්‍යාංශය ලැබූ එක් ජයග්‍රාහී පැතිකඩක් බව සඳහන් කිරීමට කැමැත්තෙමි.

මුලුමහත් ලෝකයටම බලපෑ කාලගුණික හා දේශගුණික විපර්යාසයන් හේතුවෙන් ස්වාභාවික ව්‍යසන හමුවේ හදිසි ආපදා තත්වයන්ට මුහුණ දීම සඳහා පෙර සූදානම, පුළුල් ආපදා සහන සේවාවන් සැලසීම, ආපදාවන්ට ලක්වූවන් මුදාගැනීම, ආපදා අවම කිරීමට අවශ්‍ය නව ක්‍රමෝපායන් ක්‍රියාවට නැංවීම මෙන්ම අවතැන්වූවන් ඉතා කෙටි කාලයක් තුල නැවත පදිංචි කිරීම, ආපදාවන්ට ලක්විය හැකි අවදානම් කළාප හඳුනාගෙන ඒවායින් ජනතාව ඉවත් කිරීම වැනි ප්‍රමුඛ කාර්යයන් ඉතාමත් යුහුසුළුව ක්‍රියාත්මක කිරීම තුලින් රටේ සමස්ථ ජනතාවට සාමකාමී, නිදහස් හා නිවහල් පරිසරයක ජීවත්වීමේ අයිතිය තහවුරු කිරීමට ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආපදා කළමනාකරණ අංශයට හැකිවී ඇති බව දන්වා සිටිමි. එමෙන්ම, සහනයක් අවැසි ඕනෑම ආපදා අවස්ථාවක ඒ සඳහා නොපැකිලිව ඉදිරිපත් විය හැකි ලෝකයේ හොඳම ආරක්ෂක හමුදාවන් අප සතු බව අභිමානයෙන් යුතුව ප්‍රකාශ කරමි.

පසුගිය වර්ෂ කිහිපය පුරා රටතුල ආර්ථික හා සමාජීය මෙන්ම දේශපාලනමය වශයෙන් අස්ථාවර තත්වයකට පත්වෙමින් පැවති අවධියක ගරු ජනාධිපතිතුමන් ප්‍රමුඛ නව රජය පත්වීමෙන් පසු දීර්ඝ කාලයක් තිස්සේ රට වැසියන්ගේ ඒකායන බලාපොරොත්තුව වූ ජාතික සමගිය ඇතිකර ස්වයංපෝෂිත රටක් අනාගත පරපුර වෙනුවෙන් බිහිකිරීමේ අවස්ථාව හිමිව පවතින අවධියක කිසිදිනෙක අප රටේ ආගමික හෝ වෙනත් අන්තවාදී කණ්ඩායමකට කිසිදු ආකාරයක විනාශකාරී ක්‍රියාවක් සිදුකිරීමට නොහැකි පරිදි ජාතික ආරක්ෂාව තහවුරු කිරීම පිණිස ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ත්‍රිවිධ හමුදාව සහ බුද්ධි අංශ ඇතුළු අනෙකුත් සියලුම ආයතනයන් සහ දෙපාර්තමේන්තු වල පූර්ණ මැදිහත්වීම මා මෙහිදී පැසසිය යුතු බව ප්‍රකාශ කර සිටිමි. එමෙන්ම විවිධාකර වූ ගැටුම්වලින් පීඩාවිඳි ශ්‍රී ලාංකිකයන් වශයෙන් අනාගත පරපුර හට එවන් කිසිදු ආකාරයක ගැටුම්කාරී තත්වයකට යළි මුහුණ දීමට සිදු නොවන පරිදි නීතිගරුක රටක් සහ විනයගරුක සමාජයක් බිහි කිරීම වෙනුවෙන් ජාති, ආගම්, කුල හා දේශපාලන භේද පසෙකලා සමාජ සහජීවනය ගොඩනගා ගනිමින් යහපත් පරිසරයක ජීවත්වීමේ අයිතිය උදාකරදීම මෙන්ම ජීවන තත්වය උසස් කර සුභවාදී අනාගතයකට අවැසි පසුබිම සැකසීමට ආරක්ෂක අමාත්‍යාංශයේ උපරිම දායකත්වය ලබාදීමට හැකිවීම අගය කළ යුතුය.

2024 වර්ෂය ආරක්ෂක අමාත්‍යාංශයට සමාජීය, ආර්ථික මෙන්ම දේශපාලන වශයෙන් විවිධාකර වූ අභියෝගයන් රාශියකට මුහුණදීමට සිදුවූ වර්ෂයක් වූ අතර, එම සියලුම අභියෝගයන්ට සාර්ථක ලෙස මුහුණදී ඒවා සමථයකට පත්කරගෙන ජාතික ආරක්ෂාව තහවුරු කරගනිමින් 2025 වර්ෂය සාර්ථක වර්ෂයක් ලෙස පත්කර ගැනීමේ තිර අධිඨානින් යුතුව ගරු ජනාධිපතිතුමන් සහ වත්මන් රජය විසින් ක්‍රියාත්මක කරමින් පවතින "Clean Sri Lanka" වැඩසටහනේ යථාර්ථය අවබෝධ කරගනිමින් එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපරිම සහයෝගය ලබාදීමට ආරක්ෂක අමාත්‍යාංශය, ත්‍රිවිධ හමුදාව ඇතුළු අමාත්‍යාංශය යටතේ ඇති සියලුම ආයතන සහ දෙපාර්තමේන්තු වල සේවයේ නියුතු ඔබ සැමට අවශ්‍ය ශක්තිය සහ ධෛර්ය ලැබේවායැයි ප්‍රාර්ථනා කරන අතරම, අමාත්‍යාංශයේ 2024 වර්ෂයේ කාර්යසාධන වාර්තාව සකස් කිරීමට දායක වූ සියලුම දෙනා වෙත මාගේ ස්තුතිය පුද කිරීමට ද මෙය අවස්ථාවක් කර ගනිමි.

එයාර් වයිස් මාර්ෂල් සම්පත් තුයියකොන්තා (විශ්‍රාමික)
ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී (තෙවරක්), ආර්එස්පී (දෙවරක්), යූඑස්පී,
එම්එම්එස්සී (උපායමාර්ගික අධ්‍යයන-චීනය), එම්එස්සී (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ,
එම්එස්සී (ආරක්ෂක හා උපායමාර්ගික අධ්‍යයන), එෆ්එන්ඩීයූ (චීනය), පීඑස්සී
ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය

පරිච්ඡේදය 1

ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

ශක්තිමත් මානව සබඳතා, දේශපාලන සුරක්ෂිතතාවය, ආර්ථික සුරක්ෂිතතාවය, බලශක්ති සුරක්ෂිතතාව, පරිසර සුරක්ෂිතතාවය , මානව සම්පත් සංවර්ධනය, සයිබර් ආරක්ෂාව සහ ජාත්‍යන්තර සබඳතා ආදී වූ ජාතික ආරක්ෂාවේ විවිධ මානයන් ඔස්සේ අධ්‍යයනය කරමින් අන්තවාදය, ත්‍රස්තවාදය, සංවිධානාත්මක අපරාධ, නීති විරෝධී මත්ද්‍රව්‍ය හා මහජන කැළඹීම් ආදිය හේතුවෙන් අභියෝගයට ලක්විය හැකි ජාතික ආරක්ෂාව සුරක්ෂිත කිරීම පිණිස ප්‍රතිපත්ති සකස් කිරීම, නීති සම්පාදනය හා උපායමාර්ගික සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රමුඛතම කර්තව්‍යය වේ.

ඒ අනුව , 2024 වර්ෂය තුළ සිදු වූ ගෝලීය ආර්ථික, දේශපාලනික හා සාමාජීය පරිවර්තනයන් හමුවේ අස්ථාවර වෙමින් පැවති රටෙහි ආර්ථික, දේශපාලන හා සාමාජීය පරිසරය ශක්තිමත් කරමින් පුරවැසි සුරක්ෂිතතාවය, භෞමික අඛණ්ඩතාවය සහ ස්වෛරීභාවය සඳහා බාහිර හා අභ්‍යන්තර වශයෙන් හා ස්වභාවික හා මිනිස් ක්‍රියාකාරකම් මඟින් එල්ලවිය හැකි අභියෝගයන් මනාව කළමනාකරණය කරමින් ආරක්ෂක විධි විධාන තර කිරීමට හා ජන ජීවිත සුරක්ෂිත කිරීමට 2024 වර්ෂය තුළ ත්‍රිවිධ හමුදාවන්හි කැපවීම හා අමාත්‍යාංශයට අනුබද්ධ සිවිල් ආරක්ෂක බලකාය ඇතුළු අනෙකුත් ආයතනයන්හි දායකත්වය මත ආරක්ෂක අමාත්‍යාංශයට හැකියාව ලැබිණි.

විශේෂයෙන්ම, වර්ෂයේ සිව්වන කාර්තුව ආරම්භ වීමත් සමඟ මෙරට දේශපාලන ක්ෂේත්‍රයේ සිදු වූ බල පරිවර්තනය හා ඒ අනුව පිහිට වූ නව රජයේ ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් පරිදි ජාතික ආරක්ෂාව තහවුරු කිරීම පිණිස නව ප්‍රවේශයක් ද හඳුන්වා දෙනු ලැබිණි. ඒ අනුව, ජාතික ආරක්ෂාව තහවුරු කිරීම පිණිස ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් ප්‍රතිපත්ති හා මූලධර්මයන්ට අනුගතව ක්‍රියා කිරීම සඳහා මුලපිරීමක් වශයෙන් සියලු ආයතන සඳහා අවශ්‍ය මාර්ගෝපදේශකත්වය සැපයීම 2024 වර්ෂයේ අමාත්‍යාංශයේ ප්‍රධාන වගකීම විය.ඒ අනුව, 2025 වර්ෂය සඳහා ආරක්ෂක අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ වෙන්වූ ප්‍රතිපාදන කාර්යක්ෂමව හා ඵලදායීව යෙදවීම සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම හා අධීක්ෂණය කිරීමේ ක්‍රමවේදයන් හඳුන්වා දීම හා ප්‍රශස්ත කාර්යසාධනයක් අත්කර ගැනීම උදෙසා සියලු ආයතන මෙහෙයවීම සිදු කරන ලදී.

ආරක්ෂක අංශවල මෙහෙයුම්හි ගුණාත්මකභාවය පවත්වාගෙන යාම, වෘත්තිමය නිපුණතා සහිත හමුදාවන් ඇති කිරීම සඳහා පුහුණු, නව තාක්ෂණය හඳුන්වාදීම, බුද්ධි අංශ ශක්තිමත් කිරීම, රාජ්‍යතාන්ත්‍රික සබඳතා ශක්තිමත් කිරීම, මානව සම්පත් කළමනාකරණය හා සංවර්ධනය, අන්තවාදය හා ත්‍රස්තවාදය වැළැක්වීම, අපරාධ මර්දනය, අභ්‍යන්තර කැරළි මර්දනය කිරීම, නීති විරෝධී මත්ද්‍රව්‍ය හා ගනුදෙනු වැළැක්වීම, සයිබර් අපරාධ මැඩලීම, රණවිරු සුබසාධනය, මෙන්ම ආපදා කළමනාකරණය සහ ආපදා සහන සේවා සැපයීම ආදී අමාත්‍යාංශය වෙත පැවරුණු සුවිශේෂී කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම මෙන්ම තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීම යන ක්ෂේත්‍ර රැසක් ආවරණය වන පරිදි 2024 වර්ෂය තුළ ඉටු කරන ලද කාර්යයන්හි ප්‍රගතිය මෙම කාර්යසාධන වාර්තාව මඟින් ඉදිරිපත් කර ඇත.

ජාතික ආරක්ෂාව තහවුරු කිරීම පිණිස 2024 වර්ෂය තුළ සිය මෙහෙවර ඉටු කිරීම තුළින් අමාත්‍යාංශය ඉහළ කාර්යසාධනයක් අත්කරගෙන ඇති අතර ඉදිරි වර්ෂයන්හිදී ද ඉහළ කාර්යසාධනයක් අත්කර ගැනීම සඳහා භෞතික හා මානව සම්පත් මනාව කළමනාකරණය කර ගැනීම අමාත්‍යාංශයේ අපේක්ෂාව වේ.

1.2 අමාත්‍යාංශයේ දැක්ම සහ මෙහෙවර

දැක්ම

''සැම සුරැකි සාමකාමී දේශයක්''

මෙහෙවර

භෞමික අඛණ්ඩතාවයෙන් යුත් සුරක්ෂිත, ස්වෛරී රටක්

තහවුරු කිරීම උදෙසා

උපායමාර්ගික සැලසුම් හා ප්‍රතිපත්ති සකස් කිරීම

සහ

ක්‍රියාවට නැංවීම

1.3 අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන්

2024 වර්ෂ ආරම්භයේදී ආරක්ෂක අමාත්‍යාංශය වෙත පැවරී තිබූ විෂයයන් නව රජයේ අංක 2412/08 හා 2024.11.25 දින දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් යම් සුළු සංශෝධනයකට ලක් වූ අතර ඒ අනුව ආරක්ෂක අමාත්‍යාංශය වෙත පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් පැවරී ඇත.

1. රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා රාජ්‍ය ආරක්ෂාව, ආපදා කළමනාකරණය සහ ප්‍රතිචාර පිළිබඳ විෂයයන්ට සහ අමාත්‍යාංශයට අනුබද්ධ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම
3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල්වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම
4. ජාතික ආරක්ෂාව තහවුරු කිරීම
5. අභ්‍යන්තර ආරක්ෂාව පවත්වාගෙන යාම
6. රාජ්‍ය හා අභ්‍යන්තර ආරක්ෂාව තහවුරු කිරීම සඳහා පවත්නා වූ ඒකාබද්ධ බුද්ධි යාන්ත්‍රණය විශ්වාසවන්ත හා කාර්යක්ෂම ලෙස වැඩි දියුණු කිරීම
7. ජාතික ආරක්ෂක උපදේශක මණ්ඩලය පිහිටුවීම හා ක්‍රියාත්මක කිරීම
8. ආගන්තුක හමුදාවන් හා සබඳතා පවත්වාගෙන යාම
9. ජාත්‍යන්තර මානුෂීය මෙහෙයුම් සඳහා සහයෝගය ලබාදීම
10. පුපුරණ ද්‍රව්‍ය, ගිනිඅවි, පීඩාකාරී ආයුධ සහ රසායනික අවිවලට අදාළ වගකීම් ඉටුකිරීම
11. ප්‍රදීපාගාර නඩත්තුවට අදාළ වගකීම් ඉටුකිරීම (වරාය අධිකාරිය සතු ප්‍රදීපාගාර හැර)
12. ආරක්ෂක සේවයේ පුද්ගලයන් සඳහා ආරක්ෂක අධ්‍යාපනය හා පශ්චාත් සේවා අධ්‍යාපනය ලබාදීම
13. ආරක්ෂක සේවයේ පුද්ගලයින් සඳහා උසස් අධ්‍යාපනය ලබාදීම
14. පුද්ගලික ආරක්ෂක සේවා සම්බන්ධ කටයුතු
15. විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන සමඟ ජාතික ආරක්ෂාව පිළිබඳ දැනුම ඒකාබද්ධ කිරීමෙන් ආරක්ෂක අංශයේ විශිෂ්ටත්වය ඉහළ නැංවීම
16. ශ්‍රී ලංකාවේ අනන්‍ය ආර්ථික කලාපයේ (EEZ) ආරක්ෂාව සහ ස්ථාවරත්වය සහතික කිරීමට හැකිවන පරිදි ශ්‍රී ලංකා නාවික හමුදාව හා වෙරළාරක්ෂක බලකාය තාක්ෂණිකව යාවත්කාලීන කර අදාළ නීති බලගැන්වීම
17. ගලවාගැනීමේ මෙහෙයුම් සහ වෙරළ ආරක්ෂක සේවය පරිපාලනය කිරීම
18. උදර්පණයට අදාළ කටයුතු
19. වෘද්ධ රණවිරුවන් හා ආබාධිත සොල්දාදුවන් පිළිබඳ කටයුතු
20. කාලගුණය හා දේශගුණය පිළිබඳ සේවාවන් සැපයීම
21. කාලගුණ විද්‍යාත්මක සමීක්ෂණ හා පර්යේෂණ සිදුකිරීම
22. නායයෑම් ආපදා කළමනාකරණය සහ ඊට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කිරීම
23. ස්වාභාවික ව්‍යසන පෙරයීම් කිරීම හා ඒ පිළිබඳ අදාළ අංශ හා ආයතන දැනුවත් කිරීම
24. ස්වාභාවික ව්‍යසන සහ මිනිසා විසින් සිදු කරනු ලබන ව්‍යසන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම
25. ස්වාභාවික ව්‍යසන සහ මිනිසා විසින් සිදුකරනු ලබන ව්‍යසනවල දී ගලවා ගැනීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම


26. ස්වාභාවික ව්‍යසනවලට ඔරොත්තු දෙන පරිදි (ප්‍රත්‍යස්ථ) ඉදිකිරීම් ප්‍රවර්ධනය සහ තාක්ෂණික මාර්ගෝපදේශ සැපයීම

27. නිවාස හා ඉදිකිරීම් යන අංශ සඳහා යෝග්‍ය තාක්ෂණයට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු දිරිගැන්වීම

28. වර්ධනය වන තරඟකාරී වෙළඳපොළ තුළ, පොදු යහපත සුරකිමින් විදුලි සංදේශ කර්මාන්තයේ තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා විදුලි කටයුතු නියාමනය කිරීම

29. සමුද්‍රීය ජල අවකාශීය දත්ත පැවතීම සහතික කිරීම තුළින් ශ්‍රී ලංකාවේ අනන්‍ය ආර්ථික කලාපය තුළ ජාතික සහ ජාත්‍යන්තර සමුද්‍රක ආරක්ෂාව තහවුරු කිරීම

1.4 අමාත්‍යාංශයේ සංවිධාන සටහන



අතිරේක ලේකම් (පරිපාලන)
අතිරේක ලේකම් (ආරක්ෂක)
අධ්‍යක්ෂ (විමර්ශන)
නීති උපදේශක
ජේ.ස.ලේ. II (පරිපාලන)
ජේ.ස.ලේ. I (පරිපාලන)
ජේ.ස.ලේ. I
ජේ.ස.ලේ. II
ජේ.ස.ලේ. III
ජේ.ස.ලේ. IV
ස.ලේ. I
ස.ලේ. II
ස.ලේ. III
ස.ලේ. IV
නීති නිලධාරී
සහකාර / නිලධාරී අධ්‍යක්ෂ (විමර්ශන)
සහකාර / නිලධාරී අධ්‍යක්ෂ
ස.ලේ. (පරිපාලන I)
ස.ලේ. (පරිපාලන II)
ස.නි.(I)
ස.නි.(II)
භාෂා පරිවර්තක

ආරක්ෂක ඇමති
ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය
පාර්ශ්වික බුද්ධි ඒකකය
අධ්‍යක්ෂ ජනරාල් (මාලපුල්)
අධ්‍යක්ෂ
නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ
පුධාන මූලස්ථාන -II
පුධාන මූලස්ථාන -I
පුධාන අංශකාධිපති
අංශකාධිපති
අංශකාධිපති
අංශකාධිපති
අංශකාධිපති
අංශකාධිපති
අතිරේක ලේකම් (ආරක්ෂක සේවා)
අතිරේක ලේකම් (පරිපාලන)
අතිරේක ලේකම් (පර්යේෂණ සහ සංවර්ධන)
අතිරේක ලේකම් (මූල්‍ය සහ ආරක්ෂක සංවර්ධන)
ජෙ.ප්‍ර.ස.ලේ. II
ජෙ.ප්‍ර.ස.ලේ. I
ජෙ.ප්‍ර.ස.ලේ.
ජෙ.ප්‍ර.ස.ලේ. (සංවර්ධන)
ජෙ.ප්‍ර.ස.ලේ. (ඕපිල් ආරක්ෂක)
ස.ලේ. II
ස.ලේ. I
ස.ලේ.
ස.ලේ.(සංවර්ධන)
ස.ලේ. (ඕපිල් ආරක්ෂක)
නියෝජ්‍ය පුධාන ලේකම්
සහකාර පුධාන ලේකම්
අධ්‍යක්ෂ (පරීක්ෂණ සහ නඩාගාරය)
යාන්ත්‍රික ඉංජිනේරු
මාණ්ඩලික
මාණ්ඩලික
මාණ්ඩලික

අතිරේක ලේකම්
(ඉඩම්
කළමනාකරණ)
ඉඩම් කොමසාරිස්
(ඉඩම් කළමනාකරණ)
අධ්‍යක්ෂ ජනරාල්
(වැලිපුම්)
(ඉඩම්කළමනාකරණ)
ප්‍රධාන ඉඩම් නිලධාරී
(ඉඩම් කළමනාකරණ)
ප්‍රධාන අභ්‍යන්තර විගණක
(ඉඩම් කළමනාකරණ)
ප්‍රධාන අභ්‍යන්තර විගණක
ඉඩම් නිළධාරී
ප්‍රධාන ඉඩම්කොමසාරිස්
අධ්‍යක්ෂ
ප්‍රධාන ඉඩම්කොමසාරිස්
ප්‍රධාන අභ්‍යන්තර විගණක
ප්‍රධාන
අභ්‍යන්තර
විගණක II
අභ්‍යන්තර
විගණක I
ඉඩම් නිලධාරී
ඉ.ක්ෂේ.
ඉ.ක්ෂේ.
නියෝජ්‍ය/සහකාර
අධ්‍යක්ෂ I
නියෝජ්‍ය/සහකාර
අධ්‍යක්ෂ II
ප.කි.
පරිපාලන නිලධාරී
භාෂා පරිවර්තක
ලොක්.නිලධාරී

1.5 අමාත්‍යාංශය යටතේ පවතින ප්‍රධාන අංශ

1. පරිපාලන අංශය
2. ආරක්ෂක අංශය
3. තාක්ෂණ අංශය
4. ක්‍රමසම්පාදන අංශය
5. පාර්ලිමේන්තු කටයුතු හා ප්‍රතිපත්ති අංශය
6. සිවිල් ආරක්ෂක හා සංවර්ධන අංශය
7. ආරක්ෂක සේවා අංශය
8. ආපදා කළමනාකරණ අංශය
9. ගිණුම් හා මූල්‍ය අංශය
10. අභ්‍යන්තර විගණන අංශය
11. හමුදා සම්බන්ධතා නිලධාරී කාර්යාලය

1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන

1. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය
2. ශ්‍රී ලංකා යුද හමුදාව
3. ශ්‍රී ලංකා නාවික හමුදාව
4. ශ්‍රී ලංකා ගුවන් හමුදාව
5. ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව
6. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
7. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය
8. රාජ්‍ය බුද්ධි සේවාව
9. ජාතික ශිෂ්‍යභට බලකාය
10. ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය
11. ආරක්ෂක සේවා විද්‍යාලය
12. ආරක්ෂක පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය
13. ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය
14. ජාතික ආරක්ෂක විද්‍යායතනය
15 රණවිරු සේවා අධිකාරිය
16. සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගම
17. රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය
18. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
19. ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය
20. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
21. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
22. ඒකාබද්ධ සේවා භාෂා පුහුණු ආයතනය
23. අපි වෙනුවෙන් අපි අරමුදල
24. ජාතික ආරක්ෂක අරමුදල

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘති සහ විදේශ ණය යෝජනා ක්‍රම

අ. විදේශ ආධාර ලබන ව්‍යාපෘති

ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘතියේ ස්වභාවය	වෙන් කරන මුදල	අරමුදල් ප්‍රභවය (උදා- JICA, WB)	ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිත දිනය	වෙනත්
ශ්‍රී ලංකා යුද්ධ හමුදාව					
CQ-D 5.56 MM AUTOMATIC සහ CS/LM8 5.56 MM LIGHT MACHINE අවි මිලදී ගැනීම.	යුද්ධ හමුදාවට නවතමයෙන් පුද්ගලික අවියක් හදුන්වා දීම.	යුවාන් මිලියන 36 යි.	චීන රජයේ අරමුදල්.	-	අ නොරින්කෝ සැපයුම් ආයතනය වෙතින් CQ-D 5.56 MM AUTOMATIC RIFLE සහ CS/LM8 5.56 MM LIGHT MACHINE GUN නියැදි අවි ගණනින් 01 බැගින් මෙරටට ගෙන්වා ගෙන ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කරන ලදී. ආ. චීන රජයේ නව නීතිරීති අනුව ප්‍රදානයක් වශයෙන් ලබාදිය හැක්කේ චීන හමුදාව භාවිතා කරනු ලබන උපකරණ පමණක් බව දැනුම්දී ඇති අතර, CQ-D අවි එයට ඇතුළත් නොවේ. ඇ. ශ්‍රී ලංකාවට සුදුසු චීන හමුදාව භාවිතා කරනු ලබන පුද්ගලික අවි ඇතුළු සංග්‍රාමික උපකරණ ලැයිස්තුවක් ලබා දෙන ලෙස චීනයේ ශ්‍රී ලංකා ආරක්ෂක උපදේශක වෙතින් ඉල්ලුම්කර ඇත.

ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘතියේ ස්වභාවය	වෙන් කරන මුදල	අරමුදල් ප්‍රභවය (උදා- JICA, WB)	ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිත දිනය	වෙනත්
පතොරම් නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් ඉදිකිරීම (දොඹගොඩ)	යුද්ධ හමුදාව සඳහා අවශ්‍ය පතොරම් මෙරට තුළම නිෂ්පාදනය කර ගැනීම.	ආයෝජන මුදල දැනුම්දී නොමැත	ඉන්දියානු සමාගමක් වන Counter Measures Tech (Private) Limited ආයතනය වෙතින් සිදුකරනු ලබන ආයෝජනයකි.	-	අ. Counter Measures Tech Lanka (Private) Limited ආයතනය වෙතින් ආයෝජනයක් වශයෙන් දොඹගොඩ පතොරම් නිෂ්පාදන කර්මාන්ත ශාලාව ඉදිකිරීම කිරීම සබැඳිව අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික සමඟ සාකච්ඡා වට කිහිපයක් පවත්වන ලදී. ආ.දොඹගොඩ පතොරම් නිෂ්පාදන කර්මාන්ත ශාලාව ඉදිකිරීම සබැඳිව ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කරන ලදී. ඇ. දොඹගොඩ පතොරම් නිෂ්පාදන කර්මාන්තශාලා මාර්ග පද්ධතිය ඉදිකිරීම සඳහා මූලික ශාක්‍යතා අධ්‍යයනයක් සිදුකර ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් දළ ඇස්තමේන්තුවක් ඉදිරිපත්කර ඇත.
ශ්‍රී ලංකා නාවික හමුදාව					
ඒකාබද්ධ බහුවිධි සමුද්‍ර නිරීක්ෂණ පද්ධතිය	රේඩාර් (Radar)/ ඒඅයිඑස් (AIS)/ කැමරා (Cameras) ප්‍රධානය කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටී.	ඇමරිකානු ඩොලර් මිලියන 24.1	ඇමරිකානු රජය විසින්	2026 වසර තුළ	-
සැටලයිට් ඉන්ටනෙට් පද්ධතිය	චන්ද්‍රිකා දුරකථන භාවිතය හා නිරීක්ෂණ උපකරණ ලබා ගැනීම	ඇමරිකානු ඩොලර් මිලියන 1 කට ආසන්න වශයෙන්	එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය	2025 පෙබරවාරි අවසන් සතිය තුළ	-

ව්‍යාපෘතියේ නම	**ව්‍යාපෘතියේ ස්වභාවය**	**වෙන් කරන මුදල**	**අරමුදල් ප්‍රභවය (උදා- JICA, WB)**	**ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිත දිනය**	**වෙනත්**
සමුද්‍රීය මුදවා ගැනීම් සම්බන්ධීකරණ පද්ධතිය	දකුණු ආසියාතික සමුද්‍රීය ආපදා මුදවා ගැනීමේ සම්බන්ධීකරණය වෙනුවෙන් ඉන්දියන් රජයේ ආධාර මත ස්ථාපිත කරන ලද පරිත්‍යාගයකි	ඇමරිකානු ඩොලර් මිලියන 6	ඉන්දියානු රජය විසින් ලබාදෙන ලදී	2024 මාර්තු 01 වන දින නිමකරන ලදී	-
ඕස්ට්‍රේලියානු රජයේ අනුග්‍රහය යටතේ ඉන්ධන ලබා දීම	2024 වර්ෂයේ ඩීසල් ලීටර් 3,798,194.00 ප්‍රමාණයක් ලැබී ඇත	රු. 790,850,379	ඕස්ට්‍රේලියානු රජයේ අරමුදල්	2025 දෙසැම්බර් 31	
පාවෙන තටකාංගනයක් නිෂ්පාදනය කර ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත ලබා දීම	ප්‍රදානයක්	ඇමරිකානු ඩොලර් මිලියන 19.81	ඉන්දියානු රජය විසින් ලබාදෙන ලදී	2025	-
ඇමරිකා එක්සත් ජනපදය රජයෙන් කුඩා ප්‍රමාණයේ වෙරළාරක්ෂක යාත්‍රාවක් ලබා ගැනීමේ ව්‍යාපෘතිය	ප්‍රදානයක්	ඇමරිකානු ඩොලර් මිලියන 10 (ඇමරිකා එක්සත් රජයෙන් ඇමරිකානු ඩොලර් 09 ක් ශ්‍රී ලංකා රජයෙන් ඇමරිකානු ඩොලර් 01)	ඇමරිකානු රජය විසින්	2025	-
ශ්‍රී ලංකා ගුවන් හමුදාව					
ඩෝනියර්- 228 ගුවන් යානය	ප්‍රදානය කිරීමක්	නිශ්චිත අගයක් දැනුම් දී නොමැත	ඉන්දියන් ජනරජය	2024 අගෝස්තු	ප්‍රධාන ගිවිසුම 2024 අගෝස්තු මස 15 අවසන් වූ අතර 2025 පෙබරවාරි මස 15 දක්වා මාස 06 ක් සඳහා දිගු කිරීමට ඉන්දියන් ජනරජය ඉල්ලා සිටී.

ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘතියේ ස්වභාවය	වෙන් කරන මුදල	අරමුදල් ප්‍රභවය (උදා- JICA, WB)	ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිත දිනය	වෙනත්
Beach-360 ER ගුවන් යානා 02	ප්‍රදානය කිරීමක්	නිශ්චිත අගයක් දැනුම් දී නොමැත	ඇමරිකා එක්සත් ජනපදය	2023/2024	පළමුවන ගුවන් යානය 2024 ඔක්තෝබර් මස 10 වන දින ගුවන් හමුදාව වෙත ලැබුණු අතර 2024 ප්‍රතිපාදන මඟින් එය ගිණුම්ගත කිරීම සිදු කර ඇත. දෙවන ගුවන් යානය ලබා ගැනීම සඳහා ඉල්ලීමක් සිදුකර ඇත.
KA 350 ගුවන් යානය	ප්‍රදානය කිරීමක්	නිශ්චිත අගයක් දැනුම් දී නොමැත	ඕස්ට්‍රේලියාව	තහවුරු කර නොමැත	350 ගුවන් යානය 2024 ඔක්තෝබර් මස 29 වන දින නීත්‍යානුකූලව ලබාදෙන ලද අතර 2024 ප්‍රතිපාදන මඟින් එය ගිණුම්ගත කිරීම සිදු කර ඇත.
TH-57 හෙලිකොප්ටර් යානා 10	ප්‍රදානය කිරීමක්	නිශ්චිත අගයක් දැනුම් දී නොමැත	ඇමරිකා එක්සත් ජනපදය	2025	අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීමෙන් පසු 2025 වර්ෂය තුළ ලංකාව වෙත එවීමට සූදානම් කර ඇත.
FT-7 ගුවන් යානය	ප්‍රදානය කිරීමක්	නිශ්චිත අගයක් දැනුම් දී නොමැත	පකිස්ථානු ජනරජය	2023	අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීමෙන් පසු 2025 වර්ෂය මුල් කාර්තුව තුළ ලංකාව වෙත එවීමට සූදානම් කර ඇත.
භාණ්ඩ හැසිරවීමේ දොඹකර පද්ධතියක් C-130 ගුවන් යානා සඳහා සැපයීම	ප්‍රදානය කිරීමක්	නිශ්චිත අගයක් දැනුම් දී නොමැත	ඇමරිකා එක්සත් ජනපදය	2023 මාර්තු	2023 මාර්තු මස ගුවන් හමුදාව වෙත ලැබුණු අතර 2023 ප්‍රතිපාදන මඟින් එය ගිණුම් කිරීම සිදු කර ඇත.
C-130 ගුවන් යානා සඳහා අමතර කොටස් සැපයීම (විදේශීය ආරක්ෂක අංශ සඳහා භාණ්ඩ ප්‍රදානය කිරීමේ ව්‍යාපෘතිය යටතේ)	ප්‍රදානය කිරීමක්	නිශ්චිත අගයක් දැනුම් දී නොමැත	ඇමරිකා එක්සත් ජනපදය	2022 සිට ලැබෙමින් පවතී	උපකරණ භාර ගැනීමේ ලිපිය (LOA - Letter of Award) ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව ඇමරිකානු තානාපති කාර්යාලයට යවා ඇත.

ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘතියේ ස්වභාවය	වෙන් කරන මුදල	අරමුදල් ප්‍රභවය (උදා- JICA, WB)	ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිත දිනය	වෙනත්
ආපදාවකදී මුදා ගැනීමේ සහ මානුෂීය සහන සඳහා යොදා ගන්නා උපකරණ තොගයක් සැපයීම	ප්‍රදානය කිරීමක්	නිශ්චිත අගයක් දැනුම් දී නොමැත	ඇමරිකා එක්සත් ජනපදය	තහවුරු කර නොමැත	2024.02.15 තිබූ ප්‍රගතියෙහි වෙනසක් සිදු වී නොමැත.
B-200 ගුවන් යානය සඳහා ගුවන් යානා අමතර කොටස් සැපයීම	ප්‍රදානය කිරීමක්	ඇ.ඩො. 200,000.00	ඕස්ට්‍රේලියානු ජනරජය	2024 මාර්තු 31	ප්‍රදානය සම්පූර්ණම ගුවන් හමුදාව වෙත ලැබුණු අතර 2023 ප්‍රතිපාදන මඟින් එය ගිණුම්ගත කිරීම සිදු කර ඇත.
ශ්‍රී ලං ගු හ වීනවරාය විද්‍යාපීඨය සඳහා ආසන 700කින් සමන්විත අංග සම්පූර්ණ ශ්‍රවනාගාරයක් ඉදිකිරීම	ද්වීපාර්ශවික රාජ්‍යතාන්ත්‍රික සබඳතාවයන් වැඩි දියුණුකර ගැනීම සඳහා ඉන්දියානු ගුවන් හමුදාව විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත ආරක්ෂක අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි උන්නතිය උදෙසා සිදු කරන ලබන පරිත්‍යාගයකි.	ඇ.ඩො. 760,000.00	ඉන්දියන් ජනරජය	දැනට එකඟතා ගිවිසුමට අදාළ මූලික කටයුතු සිදු කරමින් පවතින බැවින් ව්‍යාපෘතිය ආරම්භ වන හෝ අවසන් කිරීමට දින තීරණය කොට නොමැත	මෙම ව්‍යාපෘතිය උදෙසා දෙපාර්ශවය අතර LOE (Letter of Exchange) ගිවිසුම් ගත වීම සඳහා ලියවිල්ල ආරක්ෂක අමාත්‍යාංශය මඟින් විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.
ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය					
Location-Based Services to Intelligent Transport Systems (LBS2ITS)	Erasmus+ (Foreign)	යුරෝ 965,465 (KDU වෙන් කළ යුරෝ 125,040)	Erasmus+ (Foreign)	2024 දෙසැම්බර්	මෙම ව්‍යාපෘතිය මඟින් පාඨමාලා හයක් සාර්ථකව නවීකරණය කර, අති නවීන උපකරණ ලබා ගෙන, ශ්‍රී ලංකාවේ සහ යුරෝපයේ බහුවිධ පුහුණු වැඩසටහන පවත්වා ඩිජිටල් ඉගෙනුම් පරිසරයක් සංවර්ධනය කර ඇත. එය ශ්‍රී ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ නවෝත්පාදනයට සහය වෙමින් ස්ථාන පාදක සේවා (LBS) සහ බුද්ධිමත් ප්‍රවාහන

ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘතියේ ස්වභාවය	වෙන් කරන මුදල	අරමුදල් ප්‍රභවය (උදා- JICA, WB)	ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිත දිනය	වෙනත්
					පද්ධති (ITS) පිළිබඳ අධ්‍යාපනය සහ පර්යේෂණ සැලකිය යුතු ලෙස ශක්තිමත් කර ඇත. ව්‍යාපෘතිය 2024 දෙසැම්බර් මාසයේදී අවසන් කිරීමට නියමිත අතර, අවසාන බෙදාහැරීමේ සම්මන්ත්‍රණය ඕස්ට්‍රේලියාවේ සහ ශ්‍රී ලංකාවේ සැලසුම් කර ඇත.
ක්ෂය රෝගය ආසාදනය, රෝග සහ එන්නත් කිරීම TB ව්‍යාපෘතියේ මානව ප්‍රතිශක්තිකරණ සලකුණු (Human Immune signatures of Mycovacterium tuberculosis Exposure in infection, disease and vaccination/ TB project)		ඇමරිකානු ඩොලර් 360,800 ඇමරිකානු ඩොලර් 151,112.41 ක් 2024 තුළ ලැබී ඇත.	ඇමරිකා එක්සත් ජනපදයේ කැලිෆෝනියාවේ ප්‍රතිශක්ති විද්‍යාව සඳහා ලාජොල්ලා ආයතනය සමඟ සහයෝගීතාව - ඇමරිකා එක්සත් ජනපදයේ ජාතික සෞඛ්‍ය ආයතනය විසින් අරමුදල් සපයනු ලැබේ.	ව්‍යාපෘතිය සතුටුදායක ලෙස සිදුවෙමින් පවතින අතර, අපට ලැබිය යුතු සියලුම මුදල් ලැබී ඇත.	

ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘතියේ ස්වභාවය	වෙන් කරන මුදල	අරමුදල් ප්‍රභවය (උදා- JICA, WB)	ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිත දිනය	වෙනත්
Proteome-wide Characterization of T cell Epitopes from mycobacterium tuberculosis in Vaccination and Active Infection	Major Goal: To define MTB-derived T cell epitopes associated with vaccination and active TB infection/ Latent TB Project	ඇමරිකානු ඩොලර් 269,684 ඇමරිකානු ඩොලර් 89,362.17 (2024 තුළ ලැබී ඇත)	ඇමරිකා එක්සත් ජනපදයේ කැලිෆෝනියාවේ ප්‍රතිශක්ති විද්‍යාව සඳහා ලාජොල්ලා ආයතනය සමඟ සහයෝගීතාව - ඇමරිකා එක්සත් ජනපදයේ ජාතික සෞඛ්‍ය ආයතනය විසින් අරමුදල් සපයනු ලැබේ.	2024 සැප්තැම්බර් මාසයේදී නිමකරන ලදී.ව්‍යාපෘතිය ඉතා හොඳින් සහ සතුටුදායක ලෙස නිමකල අතර, අපට ලැබිය යුතු සියලුම මුදල් ලැබී ඇත.	Proteome-wide Characterization of T cell Epitopes from Mycobacterium tuberculosis in Vaccination and Active Infection
TWAS (The World Academy of Sciences) මූලික විද්‍යාවන්හි පර්යේෂණ ආධාර වැඩසටහන/ Research Grants Program in Basic Sciences (Individuals) 2022 /UNESCO) – PI, 22-156 RG/CHE/AS_I	පර්යේෂණ ආධාර වැඩසටහන	ඇමරිකානු ඩොලර් 25,000	The World Academy of Science (TWAS)/ UNESCO	2022 ආරම්භ කරන ලද අතර, වැඩසටහනේ කාලරාමුව වසර 2.5 කි. ව්‍යාපෘතිය තවමත් සිදුවෙමින් පවති	
“Cultural Linkages towards an Asian Ideology – 2023/24” පිළිබඳ කෙටි පාඨමාලාව	කෙටි පාඨමාලා සඳහා අරමුදල්	ඇමරිකානු ඩොලර් 10,000	යුරේසියා පදනම (from Asia) ජපානය	2024 අප්‍රේල් මස අවසන් වන විට සම්පූර්ණ කර ඇත.	KDU උපාධි අපේක්ෂකයින් 100 ක් සඳහා ප්‍රතිලාභ

ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘතියේ ස්වභාවය	වෙන් කරන මුදල	අරමුදල් ප්‍රභවය (උදා- JICA, WB)	ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිත දිනය	වෙනත්
Read Japan Project – 2024		ඇමරිකානු ඩොලර් 3,500 වටිනා පොත්	නිපොන් පදනම, ජපානය	2024 නොවැම්බර් මස වන විට සම්පූර්ණ කර ඇත.	Nippon - Lanka සහයෝගිතා මධ්‍යස්ථානය KDU ප්‍රතිලාභීන් වේ
ශ්‍රී ලංකාවේ ස්නායු විකෘතිතා ආබාධ සහිත පුද්ගලයින් රැකබලා ගැනීම අභියෝග වලට මුහුණදීම සඳහා ධාරිතාව ගොඩනැගීම සඳහා යුරෝපීය මූලපිරිම 618596-EPP-1 - 2020 - 1- SE-EPPKA2-CBHE-JP	Erasmus+	යුරෝ 67,405.00 (KDU Allocation)	Erasmus+		Erasmus+ වැඩසටහන මඟින් සම අරමුදල් සපයන nEUROcare ව්‍යාපෘතිය, යුරෝපීය සහ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල අතර, ජාත්‍යන්තර සහයෝගිතාවයක් හරහා ස්නායු විකෘතිතා රෝග සත්කාර පිළිබඳ උසස් අධ්‍යාපනය වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. මෙම ව්‍යාපෘතිය මඟින් ස්නායු විකෘතිතා රෝග පිළිබඳ ශාස්ත්‍රපති (M.Sc.) වැඩසටහනක් සංවර්ධනය කිරීම, රෝගී සත්කාර, පර්යේෂණ සහ පුනරුත්ථාපනය පිළිබඳ උසස් දැනුමක් සහ කුසලතා ඇති සෞඛ්‍ය සේවා වෘත්තිකයන් සන්නද්ධ කිරීම අරමුණු කරයි. ව්‍යාපෘතිය සාර්ථකව නිමකර ඇති අතර, Master in Nerodegenerative Disease Care වැඩ සටහන සඳහා වන විෂය මාලාව දැනට සමාලෝචනය වෙමින් පවතී. ව්‍යාපෘතියේ බලපෑමට සහ ව්‍යාපෘතියට දායක වෙමින් වැඩමුළු සහ බෙදා හැරීමේ සිදුවීම් රාශියක් සාර්ථකව පවත්වා ඇත.

ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘතියේ ස්වභාවය	වෙන් කරන මුදල	අරමුදල් ප්‍රභවය (උදා- JICA, WB)	ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිත දිනය	වෙනත්
CAPAGE - ERASMUS Lump Sum Grants ශාස්ත්‍රීය ප්‍රවර්ධනය සහ ශ්‍රී ලංකාවේ වයස්ගත වීමේ අභියෝගවලට මුහුණ දීම සඳහා සෞඛ්‍ය සේවා වේ වෘත්තීය විශිෂ්ඨත්වය 101127234 CBHE-JP	Erasmus+	යුරෝ 67,709.00 (KDU Alocation)	Erasmus +		මෙම ව්‍යාපෘතිය 2024 පෙබරවාරි මස පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ දී සාකච්ඡා සහ තිරසාර මූලපිරීම් ඇතුළත් ආරම්භක උත්සවයක් සමඟින් දියත් කරන ලදී. CAPAGE සිය ක්‍රියාකාරකම්වල කොටසක් ලෙස පරිපූර්ණ ප්‍රවේශයන් සහ නවෝත්පාදනයන් තුළින් සෞඛ්‍ය සම්පන්න වයස්ගත වීම කෙරෙහි අවධානය යොමු කරමින් 2025 පෙබරවාරි මස කොළඹ විශ්වවිද්‍යාලයේදී දුර්වලතා සහ වයෝවෘද්ධ තක්සේරු කිරීම් පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයක් සංවිධානය කරයි. සමස්තයක් වශයෙන්, CAPAGE විසින් ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනය සඳහා වයස්ගත සත්කාර, අධ්‍යයන සහයෝගීතාවය සෞඛ්‍ය සේවා වැඩිදියුණු කිරීමේ ප්‍රගතිය අඛණ්ඩව ගෙන යයි.
පුද්ගලයන්ගේ ඉගෙනුම් සංචලනාව KDU සහ Tartu විශ්ව විද්‍යාලය, එස්තෝනියාව 2024-1-EE01-KA171-HED-000238733	Erasmus+	වෙන්කළ මුදල යුරෝ 9,000 (නමුත් සෘජු අරමුදල් මාරුකිරීමක් සම්බන්ධ නොවේ)	Erasmus+		කාර්යය මණ්ඩල හුවමාරු වැඩසටහන. බාහිර ප්‍රතිපත්ති අරමුදල් මඟින් සහය ලබන උසස් අධ්‍යාපන සිසුන්ගේ සහ කාර්යය මණ්ඩලයේ සංචලනය

ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘතියේ ස්වභාවය	වෙන් කරන මුදල	අරමුදල් ප්‍රභවය (උදා- JICA, WB)	ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිත දිනය	වෙනත්
024-1-SE01-KA171-HED-000233774 වැඩසටහන: Erasmus+ KDU සහ Kristianstad විශ්ව විද්‍යාලය, ස්වීඩනය.	Erasmus+	යුරෝ 65,040.00 (නමුත් සෘජු අරමුදල් මාරු කිරීමක් සම්බන්ධ නොවේ.)	Erasmus+		කාර්ය මණ්ඩලයේ සහ ශිෂ්‍ය හුවමාරු වැඩසටහන බාහිර ප්‍රතිපත්ති අරමුදල් මඟින් සහය ලබන උසස් අධ්‍යාපන සිසුන්ගේ සහ කාර්යය මණ්ඩලයේ සංචලනය
ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව					
කිරින්ද උසස් පුහුණු මධ්‍යස්ථානයෙහි නැව් සාමාකෘතියක් ඉදිකිරීම	-	-	ඇමරිකාව	2024.08.15	නැව් සාමාකෘතිය සාදා නිමකර ඇති අතර, භාරදීමේ සහ භාර ගැනීමේ ගිවිසුම අත්සන් කිරීමට නියමිතව ඇත
කිරින්ද උසස් පුහුණු මධ්‍යස්ථානයෙහි ඉදිකරන ලද ගොඩනැගිල්ල	-	-	UNODC	2023.01.21 දින ආරම්භ කර ඇති අතර, ව්‍යාපෘතිය අවසන් කර නොමැත	
ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය					
ස්ථායීකරණ ක්‍රමවේද මඟින් නාය යාම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය	ශ්‍රී ලංකාවේ නායයෑම් පවතින පළාත් 6ක දිස්ත්‍රික්ක 12ක් ඇතුළත නායයෑමේ අවදානම් ස්ථාන 127ක නායයාම් අවදානම් අවම කිරීම	ඇ. ඩොලර් මිලියන 62 (AIIB කොටස)	ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB)	2025.12.31 (2027.06.30 දක්වා ව්‍යාපෘති කාල සීමාව දිගු කිරීමට ඉල්ලුම් කොට ඇත)	ව්‍යාපෘති සංරචක 01 - අදියර 01 යටතේ නායයෑම් අවදානම් ස්ථාන 24 ක අවදානම් අවම කිරීමේ කටයුතු 100% සම්පූර්ණ කර ඇත. අදියර 02 යටතේ පැකේජ දහයක් (නායයෑම් ස්ථාන 51) අවදානම් අවම කිරීමේ කටයුතු සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කර එයින් ස්ථාන 35 අවදානම් අවම කිරීමේ කටයුතු නිම කොට ඇත. ඉතිරි නායයෑම් ස්ථාන සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු වෙමින් පවතී.

ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘතියේ ස්වභාවය	වෙන් කරන මුදල	අරමුදල් ප්‍රභවය (උදා- JICA, WB)	ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිත දිනය	වෙනත්
වර්ෂාපතනය වේගවත් හා දිගු දුර නායයෑම් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ තාක්ෂණය සංවර්ධනය කිරීම - (තාක්ෂණික සහයෝගීතා වැඩසටහන- SATREPS/JICA-JST)	ජපාන විද්‍යා හා නියෝජිතායතනය (JST) තිරසාර සංවර්ධනය සඳහා වූ විද්‍යා හා තාක්ෂණ පර්යේෂණ හවුල්කාරීත්වය (SATREPS) යටතේ ජාත්‍යන්තර නායයෑම් සම්මේලනය (ICL) සහ ජා. ගො. ප. සංවිධානය එක් වී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි	ඇ. ඩොලර්	JICA	2024.12.31	මෙම ව්‍යාපෘතිය යටතේ සහ පද්ධති සංවර්ධනය කරන ලදී. - පැය 24 ක කාලයකට පෙර අධික වර්ෂාපතනය පුරෝකථනය කිරීමේ තාක්ෂණය - වර්ෂාව හේතුවෙන් ඇතිවන දීර්ඝ දුරක් ගමන් කරන ක්ෂණික නායයෑම් සිදුවන ස්ථාන හඳුනාගැනීමේ හා ඒවායේ ගමන් මාර්ග හඳුනාගැනීමේ තාක්ෂණය - ප්‍රජාව වෙත ඵලදායී ලෙස අවදානම් පිළිබඳ සන්නිවේදනය කිරීම සඳහා වන තාක්ෂණය හා රාමුව - වර්ෂාව හේතුවෙන් ඇතිවන දීර්ඝ දුරක් ගමන් කරන ක්ෂණික නායයෑම් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිය මෙම ව්‍යාපෘතිය යටතේ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ (NBRO) විද්‍යාඥයින් සිව්දෙනෙකු ආචාර්ය උපාධිය (Ph.D.) ද දෙදෙනෙකු විද්‍යාපති උපාධිය ද (M.Sc.) සම්පූර්ණ කර ඇත.

ආ. විදේශ ණය යෝජනා ක්‍රම

අදාළ රට	ව්‍යාපෘතියේ ස්වභාවය	වෙන් කරන මුදල	2023 ප්‍රගතිය
රුසියානු ණය යෝජනා ක්‍රමය	MI-17SH වර්ගයේ හෙලිකොප්ටර් 04ක් මිලදී ගැනීම	ඇ.ඩො.මි 134.7	රුසියානු ණය යෝජනා ක්‍රමය විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙතින් තහවුරු වී නොමැත.
ඉන්දියානු ණය යෝජනා ක්‍රමය	නව 3D රෝහිණී රේඩාර් දෙකක් මිලදී ගැනීම	ඇ.ඩො.මි 5,210.00	මු.රෙ 136 යටතේ අනුමැතිය ලබා ගැනිමට ඉල්ලුම් කර ඇති අතර මේ දක්වා අනුමැතිය ලැබී නොමැත.
ඉන්දියානු ණය යෝජනා ක්‍රමය	ශ්‍රී ලංකා ගුවන් හමුදාව සඳහා INDRA MK II රේඩාර් පද්ධතියට අවශ්‍ය අමතර කොටස් උපාංග සහ විශේෂ පරීක්ෂණ උපකරණ මිලදී ගැනීම	ඇ.ඩො.මි 100.00	PDF/AVN/20/10068 මෙම ගිවිසුමට අදාළ අයිතම 150 න් අයිතම 134 ක් ලැබුණ අතර මෙම අයිතම සඳහා ගෙවීම් සිදු කිරීමට බිල් පත් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. ඉතිරි අයිතම 16 ලබා දිය නොහැකි බව දන්වා ඇත.

පරිච්ඡේදය 2
ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1

ප්‍රගතිය

2.1.1 ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවතින අංශවල ප්‍රගතිය

1.පරිපාලන අංශය

පරිපාලන අංශය යටතේ සන්නද්ධ හමුදා සුබසාධන අංශය, ආරක්ෂක සම්බන්ධීකරණ පාලන අංශය, තැපැල් අංශය සහ ප්‍රවාහන අංශය යන අංශයන් ක්‍රියාත්මක වේ.

අ. පරිපාලන අංශය

විස්තරය	ඉලක්ක / අරමුණු	ජයග්‍රහණ පිළිබඳ දර්ශක	ප්‍රගතිය (%)
යහපත් සේවා පරිසරයක් ඇති කිරීම	මානව සම්පත් කළමනාකරණයට අදාළ තොරතුරු පද්ධතිය නිසි ලෙස නඩත්තු කිරීම	IT විසඳුම	90
	මානව සම්පත් දැනුම සහ කුසලතා පෝෂණය කිරීම	පුහුණු වැඩසටහන් ගණන • දෙමළ භාෂා පුහුණු වැඩසටහන (පුද්ගලයින් 130 - පැය 100 පුහුණුව)	80

ආ. සන්නද්ධ හමුදා සුබසාධන අංශය

අ/අ	ක්‍රියාකාරකම	ප්‍රගතිය
1	රණවිරුවන් වෙත රජයේ ඉඩම් ලබාදීම	• දඹුල්ල දිගම්පතහ රණවිරු ඉඩමෙන් ඉඩම් කොටස් 212 ක් බෙදාදීම සඳහා ඉඩම් කච්චේරියක් දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී 2024.05.28 දින පවත්වා ඇත. • මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 609 ඒ පුබුදුගම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි රණවිරු ඉඩමෙන් රණවිරුවන් 21 දෙනෙකු වෙත ඉඩම් කොටස් ලබාදී ඇත. • ගල්නෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මුස්නව රණවිරු ඉඩමෙන් රණවිරුවන් 18 දෙනෙකු සඳහා ඉඩම් කොටස් බෙදාදීමට ඉඩම් කච්චේරියක් 2024.12.10 දින පවත්වා ඇත.
2	රණවිරුවන් පදිංචි රජයේ සහ මහවැලි ඉඩම් සඳහා දීර්ඝකාලීන බදු බලපත්‍ර /දීමනාපත්‍ර ලබාදීමට නිර්දේශ ලබාදීම	ත්‍රිවිධ හමුදාවන්ට අයත් රණවිරුවන් 378 දෙනෙකු සඳහා දීර්ඝකාලීන බදු බලපත්‍ර /දීමනාපත්‍ර ලබාදීමට නිර්දේශ ලබාදී ඇත.
3	රණවිරු කාලත්‍රයන් හට ස්ථාන මාරු ලබාගැනීම සඳහා පහසුකම් සැලසීම	ගුරු සේවයේ ස්ථාන මාරුවීම් 30ක්, සෞඛ්‍ය සේවයේ ස්ථාන මාරුවීම් 18ක් හා වෙනත් සේවාවල ස්ථාන මාරුවීම් 13ක් ලෙස සමස්ථ ස්ථාන මාරුවීම් 61ක් ලබාගැනීම සඳහා නිර්දේශ ලිපි යොමුකර ඇත.
4	රණවිරු දරුවන් රජයේ පාසල්වලට ඇතුළත් කිරීම සඳහා සහය වීම (1 හා 6 ශ්‍රේණි හැර)	සිසු, සිසුවියන් 07ක් දෙනෙකු පාසල් වෙත ඇතුළත් කර ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලිපි ඉදිරිපත් කර ඇත.

ඇ. ආරක්ෂක සම්බන්ධීකරණ පාලන අංශය

අ/අ	අංශයේ කාර්යයන්	ලද ඉල්ලීම් ප්‍රමාණය	ක්‍රියා කළ ඉල්ලීම් ප්‍රමාණය	ප්‍රගතිය (%)
1	**ස්ථාන මාරු** රාජ්‍ය බුද්ධි සේවාවට ස්ථාන මාරු වී පැමිණීම හා පිටව යාම	39	39	100
2	**නිලධාරින්ගේ වැටුප්** වැටුප් වර්ධක/ වැටුප් ප්‍රතිශෝධන/ වැටුප් පරිවර්තන හා වැටුප් ආශ්‍රිත ගැටලු	1,845	1,845	100
3	**පත් කිරීම්** අනුයුක්ත කිරීම/ පත්වීම් ස්ථිර කිරීම/ තනතුර උසස් කිරීම	565	550	98
4	**නිවාඩු** වැටුප් සහිත/අර්ධ වැටුප් සහිත/ වැටුප් රහිත දේශීය හා විදේශීය නිවාඩු	75	75	100
5	**දීමනා** යහපත් කල්ක්‍රියා ලාංඡන දීමනා / ප්‍රථමාධාර දීමනා/ භාෂා දීමනා/ සේවා ස්ථාන දීමනා	434	434	100
6	**විශ්‍රාම** අවුරුදු 55 – 60 අතර / අවු. 60 සම්පූර්ණ වීම/රා. ප. ව. 30/88 යටතේ හා රා. ප. ව. 17/2009 යටතේ විශ්‍රාම යාම	72	71	99
7	**මරණ** මරණ පාරිතෝෂික/ වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම	03	03	100
8	**සේවයේ සිදුවන වෙනස් වීම්** සේවය අතහැර යාම / සේවය නතර කිරීම/ නැවත සේවයේ පිහිටුවීම/ වැටුප් නතර කිරීම/ සේවයෙන් ඉල්ලා අස්වීම	28	28	100

ඈ. තැපැල් අංශය

අමාත්‍යාංශයට ලැබෙන තැපැල

අ/අ	තැපැල ලැබෙන ආකාරය	**2024.01.01 – 2024.12.31** දක්වා අංශය වෙත ලැබුණු ලිපි ප්‍රමාණය	**2024.01.01 – 2024.12.31** දක්වා අංශය වෙත ලැබී ක්‍රියාකළ ලිපි ප්‍රමාණය	ප්‍රගතිය (%)
1	ලියාපදිංචි තැපැල	10,029	10,029	100
2	සාමාන්‍ය තැපැල	5,600	5,600	100
3	අතින් ගෙනැවිත් භාර දෙන ලිපි	15,099	15,099	100
4	ලියාපදිංචි තැපැල (නිලධාරින්ගේ පෞද්ගලික නමට ලද ලිපි)	5,323	5,323	100
5	සාමාන්‍ය තැපැල (නිලධාරින්ගේ නමට ලද ලිපි)	1,840	1,840	100

6	අතින් ගෙනැවිත් භාර දෙන තැපෑල (නිලධාරීන්ගේ පෞද්ගලික නමට ලද ලිපි)	11,026	11,026	100
මුළු එකතුව		**48,917**	**48,917**	**100**

අමාත්‍යාංශයෙන් යැවෙන තැපෑල

අ/අ	**තැපෑල ලැබෙන ආකාරය**	**2024.01.01 – 2024.12.31 දක්වා අංශය වෙත ලැබුණු ලිපි ප්‍රමාණය**	**2024.01.01 – 2024.12.31 දක්වා අංශය වෙත ලැබී ක්‍රියාකළ ලිපි ප්‍රමාණය**	**ප්‍රගතිය (%)**
1	ලියාපදිංචි තැපෑල	13,529	13,529	100
2	සාමාන්‍ය තැපෑල	4,400	4,400	100
3	අමාත්‍යාංශයෙන් පිටතට යවන තැපෑල - අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ ආයතන වෙත අතින් රැගෙන යන ලිපි	17,871	17,871	100
මුළු එකතුව		**35,800**	**35,800**	**100**

ඉ. ප්‍රවාහන

i. නිල වාහන හිමි නිලධාරීන් 21කට ප්‍රවාහන පහසුකම් සලසා ඇත.
ii. මාණ්ඩලික නිලධාරීන් 25 කට පමණ කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සලසා ඇත.
iii. අංශ 20ක් සඳහා වාහන 38ක් මඟින් ප්‍රවාහන පහසුකම් සලසා ඇත.
iv. අවස්ථානුකූලව ඉදිරිපත් වූ කෙටි දුර රාජකාරි 1,085 කට පමණ හා දුර බැහැර රාජකාරි 410 කට පමණ ප්‍රවාහන පහසුකම් සපයා ඇත.

2. ආරක්ෂක අංශය

ත්‍රිවිධ හමුදාවට අදාළ ආයතනික කටයුතු, මානව සම්පත් සංවර්ධනය, සුබසාධන කටයුතු, ප්‍රසම්පාදන, ප්‍රතිපත්ති, සැපයුම් හා සේවා කටයුතු , ජාත්‍යන්තර ආරක්ෂක සහයෝගිතා කටයුතු මෙන්ම එක්සත් ජාතීන්ගේ සාමසාධක කටයුතු, විදේශ තානාපති කාර්යාල සඳහා ආරක්ෂක පරිවාරක නිලධාරීන් පත් කිරීම පිළිබඳ කටයුතු, ජාතික හා ජාත්‍යන්තර ද්විපාර්ශ්වික, ත්‍රෛපාර්ශ්වික සහ බහුපාර්ශ්වික ගිවිසුම් වලට එළඹීම සම්බන්ධ කටයුතු, එම ගිවිසුම්වල ප්‍රගති සමාලෝචන කටයුතු සහ ආරක්ෂක සමුළු හා මාණ්ඩලික හමුවීම් වැනි අනෙකුත් සහයෝගිතා කටයුතු හා ත්‍රිවිධ හමුදා සම්බන්ධීකරණය කරමින් සිදු කෙරෙන වෙනත් විවිධ සේවා සැපයීම් කටයුතු මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

අ. ත්‍රිවිධ හමුදාවන්හි උසස් කිරීම්, විශ්‍රාම ගැන්වීම් , අධිකාරීගත කිරීම්, පෞද්ගලික හා රාජකාරී විදේශ නිවාඩු

අ/අ	ආයතනය	අධිකාරීගත කිරීම	උසස් කිරීම්	විශ්‍රාම ගැන්වීම්	පෞද්ගලික විදේශ නිවාඩු	රාජකාරී විදේශ නිවාඩු
1	යුද හමුදාව	336	708	400	290	84
2	නාවික හමුදාව	138	340	110	126	53
3	ගුවන් හමුදාව	92	318	54	145	52
එකතුව		**566**	**1,366**	**564**	**561**	**189**

ආ. තීරුබදු අනුග්‍රහය යටතේ සන්නද්ධ හමුදා නිලධාරීන් හට නිකුත් කර ඇති වාහන බලපත්‍ර

අ/අ	නිලධාරී වර්ගය	සේවය යෙදී සිටින නිලධාරීන්ට නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව	සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරීන්ට නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව
1	යුද හමුදාව	445	59
2	ගුවන් හමුදාව	96	07
3	නාවික හමුදාව	109	26
4	සිවිල් නිලධාරීන්	20	-
5	කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයීය කාර්ය මණ්ඩලය	21	-
එකතුව		**691**	**92**

ඇ. කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය සහ විශ්ව විද්‍යාල රෝහලේ ආයතනික කටයුතු

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීමට අනුමැතිය ලබා දීම.

- ගෙවීමේ පදනම මත ශිෂ්‍යභට නිලධාරීන් පාඨමාලා අංක 42 සඳහා සිසුන් 1,514ක් බඳවා ගෙන ඇත.

i. **කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ රාජකාරී හා පෞද්ගලික විදෙස් නිවාඩු සඳහා අනුමැතිය ලබා දීම.**

අ/අ	විස්තරය	පෞද්ගලික නිවාඩු	රාජකාරී නිවාඩු	අධ්‍යයනය නිවාඩු	එකතුව
1	ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය	51	88	12	**151**
2	ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයීය රෝහල	39	-	-	**39**

ii. **කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ වීසා ඉල්ලුම් කිරීම**

කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ උපාධි හදාරනු ලබන විදේශීය සිසුන් සඳහා 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා වීසා ඉල්ලුම් කිරීම සඳහා නිර්දේශ ලබා දී ඇත.

iii. **කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ අධ්‍යයන කටයුතු සඳහා වීසා ඉල්ලුම් කිරීම**

අ/අ	විස්තරය	විශ්ව විද්‍යාලය	විශ්ව විද්‍යාල රෝහල
1	සේවා දිගු ලබාදීම්	23	-
2	නව පත්වීම් ලබාදීම්	209	117
3	නව තනතුරු බඳවා ගැනීම් සඳහා අනුමැතිය	01	-

ඈ. විදේශ දූත මණ්ඩලවලට පත්කර ඇති ආරක්ෂක පරිවාරක නිලධාරීන් සම්බන්ධ කටයුතුවල ප්‍රගතිය

පැවති තනතුරු සඳහා නැවත පත්කළ ආරක්ෂක පරිවාරක නිලධාරීන් සම්බන්ධ විස්තර

අ/අ	රට	නව පත්කිරීම් සිදුකළ දිනය	කාල සීමාව
1	ඕස්ට්‍රේලියාව	2024.04.02	වසර 2
2	ඉන්දියාව	2024.04.03	වසර 2
3	චීනය	2023.04.10	වසර 2

ඉ. ශ්‍රී ලංකා හමුදා සාමාජිකයන් සාමසාධක රාජකාරියේ යෙදවීමේ විස්තර

අ/අ	මෙහෙයුම	රට	යුද හමුදාව			ගුවන් හමුදාව		
			මාණ්ඩලික නිලධාරීන්	ඒකක	සාමාජිකයින් ගණන	මාණ්ඩලික නිලධාරීන්	ඒකක	සාමාජිකයින් ගණන
1	UNIFIL	ලෙබනන්	1	1	125	-	-	-
2	UNMISS	දකුණු සුඩානය	1	1	66	-	-	-
3	MINUSCA	මධ්‍යම අප්‍රිකාව	1	-	-	3	1	110
4	MINUSRO	බටහිර සහරා	-	-	-	1	-	-
එකතුව			**3**	**2**	**191**	**4**	**1**	**110**

අ/අ	මෙහෙයුම	රට	නාවික හමුදාව		
			මාණ්ඩලික නිලධාරීන්	ඒකක	සාමාජිකයින් ගණන
1	UNIFIL	ලෙබනන්	1	-	-
2	UNMISS	දකුණු සුඩානය	-	-	-
3	MINUSCA	මධ්‍යම අප්‍රිකාව	-	-	-
4	MINUSRO	බටහිර සහරා	1	-	-
එකතුව			**2**	-	-

ඊ. පුහුණු පාඨමාලා (ලැයිස්තු ගත පාඨමාලා)

i. විදේශ රාජ්‍යයන් මඟින් ප්‍රදානය කළ පුහුණු පාඨමාලා

අ/අ	රට	යුද හමුදා	නාවික හමුදා	ගුවන් හමුදා	එකතුව
1	ඉන්දියාව	130	73	61	**264**
2	පකිස්තානය	95	09	47	**151**
3	චීනය	56	16	21	**93**
4	ඇමරිකා එක්සත් ජනපදය	54	63	46	**163**
එකතුව		**335**	**161**	**175**	**671**

ii.ජාතික ආරක්ෂක පාඨමාලා

අ/අ	පාඨමාලාව ලබා දෙනු ලබන රට	යුද හමුදාව	නාවික හමුදාව	ගුවන් හමුදාව	එකතුව
1	පකිස්තානය	01	01	-	**02**
2	බංගලාදේශය	01	-	01	**02**
3	ඉන්දියාව	01	01	01	**03**
4	චීනය	03	01	01	**05**
5	ඕස්ට්‍රේලියාව	01	01	-	**02**
එකතුව		**07**	**04**	**03**	**14**

iii. මාණ්ඩලික පාඨමාලා

අ/අ	පාඨමාලාව ලබා දෙන රට	යුද හමුදාව	නාවික හමුදාව	ගුවන් හමුදාව	එකතුව
1	ඉන්දියාව	03	-	02	**05**
2	ඇමරිකා එක්සත් ජනපදය	-	01	01	**02**
එකතුව		**03**	**01**	**03**	**07**

උ. පුහුණු පාඨමාලා (ලැයිස්තු ගත නොවන පාඨමාලා)

අ/අ	විස්තරය	යුද හමුදාව	නාවික හමුදාව	ගුවන් හමුදාව
1	සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව	64	47	32

i. විදේශීය සංචාර

අ/අ	විස්තරය	යුද හමුදාව	නාවික හමුදාව	ගුවන් හමුදාව
1	පාඨමාලා	05	07	04

ඌ. විදේශීය හමුදා පුද්ගලයින් හට වීසා නිෂ්කාශන නිකුත් කිරීම

අ/අ	රට	යුද හමුදාව	නාවික හමුදාව	ගුවන් හමුදාව	එකතුව
1	බංගලාදේශය	10	01	08	**19**
2	මාලදිවයින	08	02	05	**15**
3	සැම්බියාව	06	-	05	**11**
එකතුව		**24**	**03**	**18**	**45**

එ. ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ට වන්දි, වැටුප් හා දීමනා ගෙවීම

- **2009.05.19 දිනට පෙර පැවති යුද්ධය හේතුවෙන් හා රාජකාරියේ යෙදී සිටියදී තුවාල ලබා ආබාධිත තත්ත්වයට පත්වූ සාමාජිකයින් හා මියගිය සාමාජිකයින්ගේ යැපෙන්නන් වෙත සහන හිමිගැන්වීම**

අ/අ	කාරණය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව			
		යුද හමුදාව	නාවික හමුදාව	ගුවන් හමුදාව	එකතුව
1	ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් තුවාල ලබා ආබාධිත වූ අයවලුන් වෙත වැටුප් හා දීමනා /වන්දි ගෙවීම හා සේවයෙන් ඉවත්වීමට ඉඩ සලසා දීම	132	04	-	**136**
2	ක්‍රියාන්විත ප්‍රදේශවල රාජකාරියේ යෙදී සිටියදී ඉදුරාම ත්‍රස්තවාදී නොවන වෙනත් හේතු මත මියගිය හා ආබාධිත රණවිරුවන්ට වැටුප් හා දීමනා ගෙවීම	05	01	-	**06**
3	රාජකාරියේ යෙදී සිටියදී තුවාල ලබන, පූර්ණ ආබාධිත තත්ත්වයට පත්වන රාජ්‍ය නිලධාරින්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93 (iv) ප්‍රකාරව වයස අවුරුදු 55 දක්වා වැටුප් ගෙවීම	-	01	-	**01**
4	ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් දුබලතාවයට පත්ව එකී දුබලතා ප්‍රතිශතය 50% ට වඩා අඩුවීම හේතුවෙන් අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/1982(305)(09) යටතේ ප්‍රතිලාභ නොලබා අදාළ සේවා කාලය සම්පූර්ණ කොට විශ්‍රාම ගොස් හෝ අස් වී ගොස් සිටින ත්‍රිවිධ හමුදා සේවා පුද්ගලයන් වෙත හිඟ වැටුප් ගෙවීම	63	-	-	**63**
5	රාජකාරියේ යෙදී සිටියදී තුවාල ලබන, පූර්ණ ආබාධිත වන හා මියයන රාජ්‍ය නිලධාරින්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93 හා එහි සංශෝධනයන්ට අනුව වන්දි ගෙවීම	147	50	21	**218**
6	වයස අවුරුදු 26ට අඩු අවිවාහක රැකියා විරහිත අධ්‍යාපනය ලබන දරුවන්ට වැටුප් හා දීමනා ගෙවීම	36	01	-	**37**
7	මියගිය රණවිරුවන්ගේ දෙමාපියන්ට වැටුප් හා දීමනා ගෙවීම	06	20	02	**28**
8	වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ලබා සිටියදී වයස අවුරුදු 55ට පෙර මියයන අයවළුන් වෙත වයස අවුරුදු 55 දක්වා වැටුප් හා දීමනා දීම	244	-	01	**245**
එකතුව		**633**	**77**	**24**	**734**

ඒ. ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ට වන්දි, වැටුප් හා දීමනා ගෙවීමට අදාළව අංශය වෙතින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ විස්තර

යුදමය වාතාවරණය පැවති වකවානුවේ ක්‍රියාන්විත ප්‍රදේශවල හා ක්‍රියාන්විත ප්‍රදේශ ලෙස නම් නොකරන ලද ප්‍රදේශවල රාජකාරියේ යෙදී සිටියදී සෘජුවම ත්‍රස්ත ක්‍රියා හේතුවෙන් ආබාධිත වූ හා මියගිය ත්‍රිවිධ හමුදා සහ ශ්‍රී ලංකා පොලිසියේ සාමාජිකයින් සඳහා ප්‍රතිලාභ සැලසීමේ ප්‍රගතිය පහත පරිදි වේ.

අ/අ	විස්තර	ප්‍රතිලාභීන් ගණන
1	වයස අවුරුදු 55 සම්පූර්ණ වනතෙක් ගෙවන ලද වැටුප් හා දීමනා, මියගිය සාමාජිකයාගේ යැපෙන්නන් ජීවත්ව සිටින තෙක් සහ ආබාධිත සාමාජිකයා ජීවත්ව සිටින තෙක් ලබා දීම සඳහා වූ අංක අමප/19/2618/103/069-1 හා 2019.09.24 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ආවරණය වන ත්‍රිවිධ හමුදා සහ ශ්‍රී ලංකා පොලිසියේ සාමාජිකයින් සංඛ්‍යාව	249

ඒ. ත්‍රිවිධ හමුදා පුද්ගලයින් වෙත පදක්කම් හා සන්දාර ප්‍රදානය කිරීම

අ/අ	පදක්කම් වර්ගය	යුද හමුදාව	නාවික හමුදාව	ගුවන් හමුදාව	එකතුව
1	සන්නද්ධ සේවා දීර්ඝ සේවා පදක්කම	-	775	-	**775**
2	ප්‍රශංසනීය සේවා පදක්කම සහ විභූෂණය	-	58	-	**58**
3	උත්තම සේවා පදක්කම	1,208	363	216	**1,787**
එකතුව		**1,208**	**1,196**	**216**	**2,620**

ඔ. විවිධ ඉල්ලීම්

- සන්නද්ධ හමුදා පුද්ගලයින් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් විසින් සෘජුවම සහ ජනාධිපති ලේකම් කාර්යාලය, විවිධ මැති ඇමතිවරුන්, පුද්ගලයින් හා ආයතන විසින් ආරක්ෂක අංශය වෙත යොමු කළ ලිපි සඳහා කටයුතු කිරීමේ ප්‍රගතිය පහත පරිදි වේ.

අ/අ	කාරණය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව		
		යුද හමුදාව	නාවික හමුදාව	ගුවන් හමුදාව
1	විවිධ පාර්ශවයන් වෙතින් ලද දුක්ගැනවිලි සඳහා වාර්තා කැඳවීම	585	75	45
2	විවිධ පාර්ශවයන් දැනුවත් කිරීම	410	48	37
3	විශ්‍රාම වැටුප් සම්බන්ධ දුක්ගැනවිලි ලිපි වලට අදාළව කටයුතු කිරීම	80	32	12

ඕ. අවබෝධතා ගිවිසුම්

අ/අ	විස්තරය	ගිවිසුම් ගණන	අදාළ රටවල්
1	01/01/2024 සිට 31/12/2024 දක්වා කාලය තුළ වූ යෝජිත ද්විපාර්ශ්වික, ත්‍රෛපාර්ශ්වික සහ බහුපාර්ශ්වික ගිවිසුම් ගණන	08	පකිස්තානය, තායිලන්තය, රුසියාව, මැලේසියාව, රුවන්ඩාව, බංගලාදේශය, තුර්කිය
2	සාකච්ඡා මට්ටමේ පවතින ද්විපාර්ශ්වික, ත්‍රෛපාර්ශ්වික සහ බහුපාර්ශ්වික ගිවිසුම් ගණන	23	ඊජිප්තු, තුර්කිය, සැම්බියාව, රුසියාව, ඕස්ට්‍රේලියාව, ඉන්දියාව, බ්‍රසීලය, ලෙබනනය, පිලිපීනය, ඉන්දුනිසියාව, එක්සත් අරාබි ඒමීර් රාජ්‍ය, තායිලන්තය, ඕමානය, ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, මැලේසියාව ,


අ/අ	විස්තරය	ගිවිසුම් ගණන	අදාළ රටවල්
3	අදාළ විදේශ රාජ්‍යයන්ගේ එකඟතාවය ලබා ගැනීම සඳහා යවන ලද සහ අවසන් නිගමනයකට එළඹෙන ලද ගිවිසුම් හෝ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලද ද්විපාර්ශ්වික, ත්‍රෛපාර්ශ්වික සහ බහුපාර්ශ්වික ගිවිසුම් ගණන	15	එක්සත් රාජධානිය, ඉතාලිය, බෙලරුසය, ජෝර්දානය, දකුණු අප්‍රිකාව, ඉන්දියාව, තායිලන්තය, පකිස්ථානය ,නේපාලය
4	01/01/2024 සිට 30/09/2024 දක්වා කාලය තුළ අත්සන් කරන ලද ද්විපාර්ශ්වික, ත්‍රෛපාර්ශ්වික සහ බහුපාර්ශ්වික ගිවිසුම් ගණන	06	ඇමරිකා එක්සත් ජනපදය, චීනය, ඕස්ට්‍රේලියාව
5	නිරීක්ෂණ ලබා ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇති ගිවිසුම් සංඛ්‍යාව උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ විදේශ විශ්වවිද්‍යාල අතර අවබෝධතා ගිවිසුම් ගණන	87	ජර්මනිය, තුර්කිය, එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව, ජපානය, මැලේසියාව, රුමේනියාව, දකුණු කොරියාව, ස්වීඩනය, ඉන්දියාව, චීනය, බෙලරුසය, ඇමරිකා එක්සත් ජනපදය, සිංගප්පූරුව, නෝර්වේ, ඕස්ට්‍රේලියාව, පකිස්තානය, රුසියාව, ප්‍රංශය, ග්‍රීසිය

3. තාක්ෂණ අංශය

තාක්ෂණ අංශය විසින් රේඛීය අමාත්‍යාංශ සහ ආයතනයන් සමඟ ජාතික ආරක්ෂාවට අදාළ සන්නිවේදන සහ ඉංජිනේරුමය කාර්යයන් සම්බන්ධයෙන් සමායෝජන සහ සම්බන්ධීකරණ කාර්යයන් ඉටු කරනු ලබයි.


අ. ආරක්ෂණ නිෂ්කාශනයන් සැපයීම

2024.01.01 සිට 2024.12.31 දක්වා තාක්ෂණ අංශය මඟින් ස්වයං ආධාරක / ගොඩනැගිලි මත ඉදිකරන ලද හා බිත්ති ආධාරක කුළුණු 531ක් ඉදිකිරීම සඳහා සන්නිවේදන සේවා සැපයුම්කරුවන්ට අවශ්‍ය ආරක්ෂණ නිෂ්කාශන ලබාදෙන ලද අතර, විද්‍යුත් /සන්නිවේදන උපාංගයන් 421,935 ක් සහ විකුණුම් බලපත්‍ර 331 ක් සඳහා ද ආරක්ෂණ නිෂ්කාශන ලබා දෙන ලදී.



සන්නිවේදන සහ විදේශීය රටවල් සඳහා මෙරට නිෂ්පාදනය කරනු ලබන නෞකා හා බෝට්ටු, නාවික උපකරණ, බහුකාර්ය වර්ණ මුද්‍රණ යන්ත්‍ර, ඩ්‍රෝන (Quad Copter, Airplane, UAV), අනාවරක, දුරස්ථ පාලක සෙල්ලම්බඩු සහ ආධුනික ගුවන් විදුලි බලපත්‍ර හිමියන්ට ගුවන් විදුලි උපකරණ (දේශීය/විදේශීය),

නව රූපවාහිනී හා ගුවන් විදුලි විකාශන ආයතන ආරම්භ කිරීමට සහ ජීපීඑස්(GPS) ආනයනය කිරීම සඳහා ආරක්ෂක නිෂ්කාශන ලබා දී ඇත.



විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සමඟ එක්ව ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී ඇති ධීවර ට්‍රෝලර් යාත්‍රා 515 ක් සඳහා ගුවන් විදුලි සංඥා / සංඛ්‍යාත බෙදාදීම මත ආරක්ෂක නිෂ්කාශන ලබාදෙන ලදී. තවද, තොරතුරු තාක්ෂණ අංශයට අදාළව පරිගණක උපාංග අලුත්වැඩියා කිරීම් 1,878ක් ද සිදු කර ඇති අතර, ඉංජිනේරු අංශයට අදාළව ආරක්ෂණ නිෂ්කාශන 22ක් ලබා දී ඇත.

ආ. ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය

1979 කොළඹ ප්‍රධාන සැලසුමට අනුව, වාණිජ සංවර්ධනය උදෙසා ඉහළ වාණිජමය වටිනාකමකින් යුත් ඉඩම් විශාල සංඛ්‍යාවක් මුදාහැරීමට හැකි වන අයුරින් රජයේ කාර්යාල කොළඹ සිට නව පරිපාලන අගනුවර වන ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ වෙත රැගෙන යාමට සැලසුම් කරන ලදී. සියලු ආරක්ෂක අංශ එක් ආරක්ෂක මූලස්ථාන සංකීර්ණයක් යටතට ගෙනයාම තුළින් මූලිකවම බලාපොරොත්තු වනුයේ මේ වන විට ආයතන කිහිපයක් අතර බෙදී පවතින සම්පත් ඵලදායී අන්දමින් ප්‍රයෝජනයට ගැනීම, යටිතල පහසුකම් ද්විකරණය වීම අවම කිරීම, ඔවුන්ගේ මෙහෙයුම්/පරිපාලන/ප්‍රවර්ධන යන කාර්යයන්හි කාර්යක්ෂමතාව තවදුරටත් වර්ධනය වන පරිදි ආරක්ෂක අංශ සාමාජිකයන් වෙත නවීන පහසුකම් වලින් සමන්විත කාර්යාල සංකීර්ණයක් ලබාදීම සහ සංකේන්ද්‍රගත සංවර්ධන කලාපය තුළ පිහිටි අධි ආරක්ෂිත කලාප සංඛ්‍යාව අවම කිරීම තුළින් ආර්ථික ක්‍රියාකාරකම් සහ මහජනතාවට ඇතිවන අපහසුතාවන් අවම කිරීම යනාදිය දැක්විය හැකිවේ.

ඉදිකිරීම් කටයුතු කළමනාකරණය කිරීමේ පහසුව සහ මූල්‍යමය ශක්‍යතාව පවත්වා ගැනීම සඳහා පහත සඳහන් ආකාරයට 2012 වසරේදී ඉදිකිරීමේ කටයුතු අදියර 02කට වෙන් කර ඇත.

පළමු අදියර

i. ප්‍රධාන ගොඩනැගිලි සංකීර්ණය (ගොඩනැගිලි 08ක්)
   - ආරක්ෂක අමාත්‍යාංශය - ගොඩනැගිලි අංක 01 හා 02
   - ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය - ගොඩනැගිලි අංක 03
   - ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය - ගොඩනැගිලි අංක 04
   - ශ්‍රවණාගාරය - ගොඩනැගිලි අංක 05
   - ශ්‍රී ලංකා යුද හමුදා මූලස්ථානය - ගොඩනැගිලි අංක 06 සහ 07
   - ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලය- ගොඩනැගිලි අංක 08

ii. සන්නිවේදන ගොඩනැගිල්ල
iii. ආරක්ෂක ගොඩනැගිල්ල
iv. ජලාපවාහන පද්ධතිය සහ ජල පොම්පාගාරය
v. විදුලි ජනක යන්ත්‍රාගාර ගොඩනැගිල්ල
vi. අපජල පිරිපහදු ඒකක ගොඩනැගිල්ල

දෙවන අදියර

ත්‍රිවිධ හමුදා නිලධාරීන් හට සහ සෙසුනිලයන් සඳහා නේවාසික හා භෝජනාගාර පහසුකම් සැපයීම මෙම ව්‍යාපෘතියේ දෙවන අදියර වේ.

i. විවිධ අපහසුතා මධ්‍යයේ වුව ද මෙම ව්‍යාපෘතිය 2024.12.31 දිනට 89.70% ක සමස්ත භෞතික ප්‍රගතියක් ළඟා කරගෙන ඇති අතර, ප්‍රධාන ගොඩනැගිලි 13න් ගොඩනැගිලි 09 ක් සම්පූර්ණයෙන් නිම කර අදාළ අංශ වෙත භාරදීම් සිදු කර ඇත.

ii. ඉදිකිරීම් අවසන් කර ඇති ගොඩනැගිලි වලට අමතරව, මේ වන විට ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතින අනෙකුත් ගොඩනැගිලිවල ප්‍රගතිය පහත පරිදි වේ.

ගොඩනැගිලි		ප්‍රගතිය	විස්තරය
ගොඩනැගිලි අංක 01	ආරක්ෂක අමාත්‍යාංශය	96.6%	
ගොඩනැගිලි අංක 02		96.2%	
ගොඩනැගිලි අංක 03	ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය	94.1%	
ගොඩනැගිලි අංක 05	ශ්‍රවණාගාරය	18.7%	තාවකාලිකව නවතා ඇත.
ගොඩනැගිලි අංක 09		97.6%	
අනෙකුත් බාහිර වැඩ කටයුතු	ව්‍යාපෘතියේ අදියර 01 යටතේ	92.59%	

ඇ. උපායමාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතිය

දිවයින පුරා පිහිටි ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ සහ විශේෂ කාර්ය බලකායේ කලින් තෝරාගත් ස්ථාන හා සම්බන්ධ විය හැකි ක්ෂුද්‍ර තරංග සබඳතා 37ක් හා ජාල කළමනාකරණ පද්ධතියකින් සමන්විත සුරක්ෂිත පොදු සන්නිවේදන මූලාධාරකයක් සැපයීම මෙම ව්‍යාපෘතිය මඟින් ඉටුවේ.

2020 ජූලි 15 වන දා වන විට ස්වයං ආධාරක සන්නිවේදන කුළුණු 11ක් විවිධ ස්ථාන 11 ක නිමැවීමේ කටයුතු අවසන් කර ඇත. 2020 දෙසැම්බර් 31 දින වන විට ස්ථාන 21 ක ධ්වනි රෝධක විදුලි උත්පාදන යන්ත්‍ර 22 ක් ස්ථාපනය කිරීමේ කටයුතු ද නිමවා ඇත. එමෙන්ම, මෙම ව්‍යාපෘතියේ මූලිකම අංගය, මයික්‍රෝවේව් ක්ෂුද්‍ර තරංග පද්ධතිය මිල දී ගැනීම හා ස්ථාපනය වන අතර, අකුරේගොඩ දක්වා ප්‍රකාශ තන්තු ඇදීමට මයික්‍රෝ තරංග පද්ධතිය ස්ථාපනය කිරීම අත්‍යවශ්‍ය කරුණකි. එහෙත් මයික්‍රෝ තරංග පද්ධතියේ ප්‍රසම්පාදන කටයුතු 03/2022 ජාතික අයවැය චක්‍රලේඛයට අනුව කෙටි කාලයකට නතර කිරීම වූ අතර, ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් 2023 හා 2024 වර්ෂ වල දී ව්‍යාපෘතියේ කටයුතු තාවකාලිකව නතර කරන ලදී. ව්‍යාපෘතියේ අවසන් අදියර නිම කිරීමට, නතර කරන ලද කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා ජාතික මෙහෙයුම් මැදිරියේ අනුමැතිය මේ වන විට ලබා ගෙන ඇති අතර 2025 හා 2026 වර්ෂ සඳහා කාලය දීර්ඝ කිරීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට මේ වන විට කටයුතු කෙරෙමින් පවතී. එසේම මෙම ව්‍යාපෘතියේ බුස්ස සන්නිවේදන කුළුණ මේ වන විට ඩයලොග් ආසියාටා ආයතනයට අවශ්‍ය ඇන්ටනා සවි කර ගැනීම සඳහා හුවමාරු කර ඇති අතර එමඟින් රු.272,300 ක මාසික ආදායමක් අමාත්‍යාංශය වෙත ලැබේ.

2022 වසරේ ව්‍යාපෘතිය තාවකාලිකව නතර කරන විට පැවති භෞතික ප්‍රගතිය 71.4% ක් මේ වන විට ද නොවෙනස්ව පවතින අතර මුල්‍යමය ප්‍රගතිය රු.මිලියන 659.03 ක් වේ.

4. ක්‍රමසම්පාදන අංශය

රජයේ ඒකාබද්ධ අරමුදලින් ආරක්ෂක වැය ශීර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන්කර ගැනීමට අවශ්‍ය අයවැය සැකසීම සඳහා සහයවීම හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව සමඟ එක්ව ඇස්තමේන්තු සලකා බැලීම, අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතන සඳහා වාර්ෂිකව වෙන්කරනු ලබන ප්‍රතිපාදන කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කිරීම සඳහා මඟ පෙන්වීම, එකී කාර්යයන් අධීක්ෂණය කිරීම, නව ව්‍යාපෘති හඳුනාගැනීම, සැකසීම, ඇගයීම හා අධීක්ෂණය රාජ්‍ය ආයෝජන වැඩසටහන සකස් කිරීම හා රජයේ ප්‍රතිපත්තීන්ට අනුකූලව එකී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ප්‍රාග්ධන ප්‍රතිපාදන යෙදවීමේ ප්‍රගතිය සමාලෝචනය හා අධීක්ෂණය ආරක්ෂක අමාත්‍යාංශයේ ක්‍රමසම්පාදන අංශයේ ප්‍රධාන හා සුවිශේෂී කාර්යයන් වේ.

i. ජාතික ප්‍රතිපත්තීන්ට අනුකූල වන සේ අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතනවල කෙටි කාලීන හා මධ්‍යකාලීන සැලසුම් සකස් කිරීම හා ඒ අනුව, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම

ii. සංවර්ධන ව්‍යාපෘති යෝජනා ඇගයීම හා නිර්දේශ / අනුමැතිය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

iii. විවිධ ව්‍යාපෘති, වැඩසටහන් සහ වාර්තා සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ යොමු කිරීම

iv. ආරක්ෂක අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතන මඟින් සිදු කරනු ලබන ව්‍යාපෘතින්හි ප්‍රගතිය අධීක්ෂණය, එකී ව්‍යාපෘතිවල ප්‍රගතිය මාසිකව සහ ත්‍රෛමාසිකව සමාලෝචනය කිරීම සහ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත වාර්තා කිරීම

v. අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ ප්‍රගතිය සමාලෝචනය ව්‍යාපෘති සම්බන්ධ තොරතුරු හා ප්‍රගතිය අනෙකුත් රාජ්‍ය ආයතන වෙත ලබා දීම

vi. රේඛීය අමාත්‍යාංශ විසින් ක්‍රියාත්මක කරන රජයේ විශේෂ වැඩසටහන් සඳහා අවශ්‍ය සහාය ලබා දීම

vii. අමාත්‍යාංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කිරීමට අදාළ සියලු කටයුතු සහ එම වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සහ අමාත්‍යාංශය යටතේ ඇති අනෙකුත් ආයතනවල කාර්යසාධන වාර්තා හා වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම

viii. අයවැය කාරක සභා විවාද අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතු අමාත්‍යාංශයේ ප්‍රගති වාර්තාව සකස් කිරීම සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම

ix. තිරසර සංවර්ධන අභිමතාර්ථ ක්‍රියාත්මක කිරීම හා එහි ප්‍රගතිය අධීක්ෂණය කිරීම

x. ළමා ආරක්ෂණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ළමා ආරක්ෂක අධිකාරියට අවශ්‍ය තොරතුරු ලබාදීම

xi. කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ ප්‍රඥප්තියට (CEDAW) අදාළ මෙම අමාත්‍යාංශයට අදාළ තොරතුරු කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම

xii. ලේකම්වරුන්ගේ කාර්යසාධන ඇගයීම් ගිවිසුම - 2024 (Secretaries' Performance Agreement-2024) යටතේ ආරක්ෂක ලේකම්තුමාගේ ප්‍රගතිය අර්ධ වාර්ෂික වශයෙන් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම

xiii. ගැටලු සහිත ව්‍යාපෘති ජාතික මෙහෙයුම් මැදිරිය (NOR) වෙත යොමුකර විසඳුම් ලබාගැනීම

xiv. රාජ්‍ය ආයෝජන වැඩසටහන 2025-2027 සකස් කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ සහ අනෙකුත් අනුබද්ධ ආයතනවල තොරතුරු රැස්කිරීම, සකස් කිරීම හා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය

අ. අංශයේ කාර්යයන්හි ප්‍රගතිය (2024.01.01 දින සිට 2024.12.31 දක්වා)

i. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම

2024 වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලද අතර එම සැලැස්ම ජනාධිපති ලේකම් කාර්යාලය, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, ජාතික විගණන කාර්යාලය හා අදාළ අනෙකුත් ආයතන හා අංශ වෙත ඉදිරිපත් කරන ලද අතර, ක්‍රියාකාරී සැලැස්ම අනුව වාර්ෂික ප්‍රතිපාදන යෙදවීම සඳහා සියලු දෙපාර්තමේන්තු/ආයතන මෙහෙයවන ලදී. කාර්තුමය ප්‍රගතිය අභ්‍යන්තර හා රජයේ විගණන අංශ වෙත යොමු කරන ලදී.

ii. කාර්යසාධන වාර්තා/වාර්ෂික වාර්තා සකස් කිරීම සහ පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

ආරක්ෂක අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතනයන්හි ක්‍රියාකාරී සැලසුම් සකස් කර එක් එක් ආයතන මඟින් අදාළ ඉලක්ක සපුරා ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ගයන්හි ප්‍රගතිය මාසිකව සහ ත්‍රෛමාසිකව සමාලෝචනය කරන ලදී. කාර්තුමය වශයෙන් ප්‍රගතිය අධීක්ෂණය කිරීම සඳහා අමාත්‍යාංශයට අදාළ අනුබද්ධ සියලුම ආයතනයන්හි සහභාගීත්වයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් 2ක් පවත්වන ලදී. එසේම, ආරක්ෂක අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතන හරහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි මාසික හා කාර්තුමය ප්‍රගතිය පිළිබඳ වාර්තා සකස් කර මාසික ප්‍රගති වාර්තා 08ක් හා කාර්තුමය ප්‍රගති වාර්තා 04ක් ව්‍යාපෘති අධීක්ෂණ හා කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී. මීට අමතරව, අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවලට අදාළ මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතිවල (මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.බි. 1ට වැඩි) කාර්තුමය ප්‍රගතිය ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

iii. රජයේ ඒකාබද්ධ අරමුදලින් ප්‍රතිපාදන වෙන්කර ගැනීම සඳහා ඇස්තමේන්තු සකස් කිරීම හා අයවැය සාකච්ඡා පැවැත්වීම

2025 වර්ෂයට අදාළ අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතනයන්ට මඟපෙන්වීම සඳහා පූර්ව අයවැය සාකච්ඡා පැවැත්වීම, ජාතික අයවැය දෙපාර්තමේන්තුව සමඟ ඇස්තමේන්තු සලකා බැලීම, භාණ්ඩාගාරයේ ලේකම් සමඟ සාකච්ඡා පැවැත්වීම 2024.12.13 දින සිදු කරන ලදී.

iv. ව්‍යාපෘති සම්බන්ධයෙන් වන ගැටලු ජාතික මෙහෙයුම් මැදිරිය වෙත යොමුකර විසඳුම් ලබාගැනීම පහත සඳහන් ව්‍යාපෘති සම්බන්ධයෙන් ගැටලු ජාතික මෙහෙයුම් මැදිරිය වෙත යොමුකර විසඳුම් ලබාගැනීම සිදු කරන ලදී

- ආරක්ෂක මූලස්ථාන සංකීර්ණයේ විශේෂ පුද්ගලයන් (VVIP) සඳහා ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම
- තාවකාලිකව අත්හිටුවන ලද උපායමාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතිය (SDCN) නැවත ක්‍රියාත්මක කිරීම
- ත්‍රිවිධ හමුදා පතොරම් හා වාණිජමය පුපුරණ ද්‍රව්‍ය ගබඩා ඉදිකිරීම
- යුද්ධ හමුදා රෝහල් ව්‍යාපෘතිය - තෙවන අදියර

v. රාජ්‍ය ආයෝජන වැඩසටහන 2025-2027 සකස් කිරීම

- රාජ්‍ය ආයෝජන වැඩසටහන 2025-2027 සකස් කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ සහ අනෙකුත් අනුබද්ධ ආයතනවල තොරතුරු රැස්කිරීම, සකස් කිරීම හා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය
- රජයේ මධ්‍යකාලීන අයවැය රාමුව තුළ රාජ්‍ය ආයෝජන වැඩසටහන 2025-2027 සකස් කිරීම සඳහා පහත සඳහන් ආයතන මඟින් ඉදිරිපත් කළ ව්‍යාපෘති සම්බන්ධයෙන් තොරතුරු ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති		
අ/අ	ආයතනය	ව්‍යාපෘති සංඛ්‍යාව
1	ආරක්ෂක අමාත්‍යාංශය	03
2	ශ්‍රී ලංකා යුද හමුදාව	56
3	ශ්‍රී ලංකා නාවික හමුදාව	74
4	ශ්‍රී ලංකා ගුවන් හමුදාව	08
5	ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව	02
6	ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය	07
7	රණවිරු සේවා අධිකාරිය	23
8	ආරක්ෂක පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය	88

නව ව්‍යාපෘති -		
අ/අ	ආයතනය	ව්‍යාපෘති සංඛ්‍යාව
1	ශ්‍රී ලංකා නාවික හමුදාව	162
2	ශ්‍රී ලංකා ගුවන් හමුදාව	80
3	ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව	03
4	රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය	01
5	රණවිරු සේවා අධිකාරිය	01
6	ආරක්ෂක පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය	08

vi. ලේකම්වරුන්ගේ කාර්යසාධන ගිවිසුම - 2024

ආරක්ෂක ලේකම් සහ ජනාධිපති ලේකම් විසින් එළඹෙන ලද කාර්යසාධන ඇගයීම් ගිවිසුම - 2024 (Secretary's Performance Agreement)හි ප්‍රගතිය අර්ධ වාර්ෂිකව ජනාධිපති ලේකම් කාර්යාලයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

5. පාර්ලිමේන්තු කටයුතු හා ප්‍රතිපත්ති අංශය

පාර්ලිමේන්තු විෂය පථය යටතට ගැනෙන, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් යොමු කරන ලද වාචික ප්‍රශ්න, ස්ථාවර නියෝග යටතේ ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්න සහ උපදේශක කාරක සභා, අමාත්‍යාංශයීය ආංශික අධීක්ෂණ කාරක සභා සහ මහජන පෙත්සම් කාරක සභා අවස්ථාවන්හිදී ඉදිරිපත් වන ගැටලු සහ යෝජනා මෙන්ම එම කාරක සභාවන්හිදී ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමට ආරක්ෂක අමාත්‍යාංශය සහ අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු, ආයතන සහ අංශ සම්බන්ධීකරණය කිරීම සිදු කරනු ලබන්නේ පාර්ලිමේන්තු කටයුතු සහ ප්‍රතිපත්ති අංශය මඟිනි.

අ/අ	විස්තරය	පැවැත්වූ රැස්වීම් ගණන	ඉදිරිපත් වූ ප්‍රශ්න/ යෝජනා සංඛ්‍යාව	පිළිතුරු දුන් ප්‍රශ්න/ යෝජනා සංඛ්‍යාව
1	වාචික පිළිතුරු අපේක්ෂිත පාර්ලිමේන්තු ප්‍රශ්න	-	09	09
2	පාර්ලිමේන්තුව කල්තබන අවස්ථාවේදී අසනු ලබන ප්‍රශ්න	-	06	06
3	ස්ථාවර නියෝග යටතේ අසන ප්‍රශ්න	-	02	02
4	ආරක්ෂක අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත ඉදිරිපත් වූ යෝජනා තීරණ සම්බන්ධයෙන් ආයතන සම්බන්ධීකරණ සහ අවශ්‍ය කටයුතු ඉටු කිරීම	01	11	10
5	මහජන පෙත්සම් කාරක සභාව වෙත පිළිතුරු සැපයීම සහ සහභාගීත්වය	01	23	20
6	පොදු ව්‍යාපාර කාරක සභාව වෙත පිළිතුරු සැපයීම හා සහභාගීත්වය	-	00	00

7	රජයේ ගිණුම් කාරක සභාව වෙත පිළිතුරු සැපයීම හා සහභාගීත්වය	-	05	05
8	ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ විවෘත හා වගකිව යුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත වාර්තා සැපයීම	-	00	00
9	ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව	06	-	02
10	ආර්ථික අර්බුදයේ බලපෑම සමනය කිරීමේ ආංශික අධීක්ෂණ කාරක සභාව	01	-	-
11	ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව වෙත පිළිතුරු සැපයීම සහ සහභාගීත්වය	01	-	02
12	ජාතික ආර්ථික හා භෞතික සැලැස්ම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත පිළිතුරු සැපයීම සහ සහභාගීත්වය	01	-	-
13	රාජ්‍ය මුදල් පිළිබඳ කමිටුව (Committee on Public Finance)	02	-	01
14	ආචාර ධර්ම හා වරප්‍රසාද කමිටුව	01	-	-
15	ආරක්ෂක අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සඳහා යොමුකර තිබූ අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා ආරක්ෂක අමාත්‍යතුමාගේ නිරීක්ෂණ ලබා දීම	-	ඉදිරිපත් වූ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සංඛ්‍යාව - 53	නිරීක්ෂණ ලබා දුන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකා - 37
16	අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණ අදාළ අංශ වෙත දැනුම් දීම්	-	දැනුම් දුන් තීරණ ගණන - 193	-

- ආරක්ෂක අමාත්‍යාංශය සහ ඒ යටතේ වන දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතනවලට අදාළ පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා එම ආයතනයන් සම්බන්ධීකරණය කරමින් නියමිත දිනට ත්‍රෛභාෂාවෙන් සකස් කරන ලද පිළිතුරු පාර්ලිමේන්තුව වෙත යොමු කර ඇත.

අ. රජයේ ඉඩම් පවරා ගැනීම සහ පෞද්ගලික ඉඩම් අත්පත් කර ගැනීම

ආරක්ෂක අමාත්‍යාංශය සඳහා සහ අමාත්‍යාංශය යටතේ වන ත්‍රිවිධ හමුදාව, ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව ඇතුළු ආයතන සඳහා ඉල්ලුම් කර ඇති රජයේ ඉඩම් පවරා ගැනීමටත්, පෞද්ගලික ඉඩම් අත්පත් කර ගැනීම සඳහා ඉඩම් අමාත්‍යාංශය, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව ඇතුළු රජයේ ආයතන සමඟ කටයුතු කරනු ලබයි. ඉඩම් රාජකාරී ඉටු කිරීමේ දී පහත කාර්යයන් සඳහා ප්‍රමුඛතාවය ලබා දී කටයුතු කර ඇත.

2024.01.01-2024.12.31 දක්වා ඉඩම් රාජකාරි සම්බන්ධ ප්‍රගතිය

ආයතනය	2024 වර්ෂයේදී ලද නව ඉල්ලීම්	ත්‍රා.ලේ. වාර්තා කැඳවීම්	මූ.රෙ. අනුමැතිය සඳහා යොමු කිරීම	සක්ෂේරු වාර්තා සඳහා යොමු කිරීම	ඉ.කොං.ජ. යොමු කිරීම්	නාගරික සංවර්ධන අධිකාරියට ලිපි යොමු කිරීම	ඉඩම් අමාත්‍යාංශයට ලිපි යොමු කිරීම.අත්පත් කර ගැනීම්	මහඩැලි අධිකාරිය	ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව	පැවරීම් සහතික ලබා ගැනීම	විවිධ අවසර පත්‍ර ලබා ගැනීම	
											වන ජීවී	වන සංරක්ෂණ
ශ්‍රී ලංකා යුද හමුදාව	23	28	17	14	38	05	32	04	04	07	-	05
ශ්‍රී ලංකා නාවික හමුදාව	09	07	02	03	07	01	02	-	-	-	-	-

ශ්‍රී ලංකා ගුවන් හමුදාව	05	11	02	02	02	01	05	-	-	-	-	-
ජාතික ශිෂ්‍යභට බලකාය	-	-	-	-	03	-	-	-	-	-	-	-
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව	-	01	-	01	01	-	-	-	01	-	-	-

ආ. තොරතුරු හා මහජන පැමිණිලි

i. සෘජුවම මෙම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද මහජන ඉල්ලීම් සහ දුක්ගැනවිලි සංඛ්‍යාව - 22 ඉහත සියලු ඉල්ලීම් සහ දුක්ගැනවිලි සඳහා පිළිතුරු යැවීමට හා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත.

ඇ. තොරතුරු පනතට අදාළ නම් කළ නිලධාරියාගේ කාර්යභාරය ඉටු කිරීම

i. ආරක්ෂක අමාත්‍යාංශය සම්බන්ධයෙන් නම් කළ නිලධාරියා වෙත අභියාචනා 07 ක් යොමු කර ඇති අතර, ඒ සඳහා නියමිත ක්‍රියාමාර්ග ගෙන ඇත.

ii. ආරක්ෂක අමාත්‍යාංශයේ නම් කළ නිලධාරියා වශයෙන් තොරතුරු අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව හමුවේ පෙනී සිටීම. (මෙම කාල සීමාවට අදාළව කැඳවීම් සිදුකර නැත.)

6. සිවිල් ආරක්ෂක හා සංවර්ධන අංශය

අ. අමාත්‍යාංශයේ සිවිල් ආරක්ෂක හා සංවර්ධන අංශය විසින් ලබාදෙන ආරක්ෂක නිෂ්කාශනයන් පහත දැක්වේ.

අ/අ	ක්‍රියාකාරකම	මුළු ගණන
1	**පුපුරණ ද්‍රව්‍ය අවසරපත්‍ර / බලපත්‍ර නිකුත් කිරීම හා අනුමැතිය**	
	• පුපුරණ ද්‍රව්‍ය නිෂ්පාදන බලපත්‍ර	10
	• පුපුරණ ද්‍රව්‍ය සපයන්නා බලපත්‍ර	144
	• පුපුරණ ද්‍රව්‍ය ආනයන බලපත්‍ර	70
	• ගිනි කෙළි භාණ්ඩ නිෂ්පාදන බලපත්‍ර	248
	• ගිනි කෙළි භාණ්ඩ සපයන්නා බලපත්‍ර	1,099
	• පුපුරණ ද්‍රව්‍ය අවසරපත්‍ර	2,740
2	**අන්තරායකර බහාලුම් සහිත නැව් සඳහා අවසරපත්‍ර ලබාදීම.**	1,072
	ගිනිඅවි බලපත්‍ර	
	• වගා ආරක්ෂාව/ සත්ව පාලනය සඳහා අවි ඉල්ලීම/ බලපත්‍ර ලබාදීම	506
	• අබලන් ගිනි අවි වෙනුවෙන් නව ගිනි අවි නිකුත් කිරීම	35
	• ගිනි අවි පැවරීම සඳහා ලද අයදුම්පත්‍ර/බලපත්‍ර නිකුත් කිරීම	137
	• දේපළ හා ජීවිත ආරක්ෂාව සඳහා -.38 හා මිමි 9 අවි ඉල්ලීම	354
	• .38 හා මිමි 9 අවි - බලපත්‍ර අලුත් කිරීම්	1,151
	• .38 හා මිමි 9 අවි පැවරීම්	06
	• ක්‍රීඩා කටයුතු සඳහා අවි ඉල්ලීම්	62
	• ක්‍රීඩා කටයුතු සඳහා නිකුත්කර ඇති ගිනිඅවි බලපත්‍ර අලුත් කිරීම	506

අ/අ	ක්‍රියාකාරකම	මුළු ගණන
3	• ආනයනය කරන ලද වායු රයිෆල්	3,156
	• අඳුරු වීදුරු සඳහා බලය ලබාදීම් (වාහන)	28
	• නිදහස් ගිනි අවි බලපත්‍ර / අලුත් කිරීම් - මහජන නියෝජිතයින්	03
	• නිදහස් ගිනි අවි බලපත්‍ර/ නව නිකුත් කිරීම් - මහජන නියෝජිතයින්	40
	• රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල ආරක්ෂාව සඳහා ගිනි අවි ඉල්ලීම	23
	• රාජ්‍ය හා පෞද්ගලික බැංකු ආරක්ෂාව සඳහා ගිනි අවි ඉල්ලීම	00
4	**පෞද්ගලික ආරක්ෂක ආයතන සඳහා ගිනි අවි ඉල්ලීම**	13
5	**පෞද්ගලික ආරක්ෂක ආයතන ලියාපදිංචිය සඳහා බලපත්‍ර නිකුත් කිරීම**	307

අවි ගබඩා කිරීම හා ප්‍රවාහනයට අදාළ අනුමැතීන්

6	**ක්‍රියාකාරකම්/ මෙහෙයුම්**	**සමුද්‍රාරක්ෂක නිලධාරීන් සංඛ්‍යාව**	**ගිනි අවි සංඛ්‍යාව**	**පතොරම් සංඛ්‍යාව**	**සම්පූර්ණ මෙහෙයුම් සංඛ්‍යාව**
	විදේශීය පෞද්ගලික සමුද්‍රාරක්ෂක සමාගම්වලට අයත් ගිනි අවි සහ උපකරණ සමඟ සමුද්‍රාරක්ෂක නිලධාරීන් ගොඩබැසීමට අදාළ මෙහෙයුම්	3,329	4,609	1,322,248	1,092
	විදේශීය පෞද්ගලික සමුද්‍රාරක්ෂක සමාගම්වලට අයත් ගිනි අවි සහ උපකරණ සමඟ සමුද්‍රාරක්ෂක නිලධාරීන් නැව් නැගීමට අදාළ මෙහෙයුම්	3,089	4,274	1,256,142	1,038
	සමුද්‍රාරක්ෂක නිලධාරීන් රහිතව විදේශීය පෞද්ගලික සමුද්‍රාරක්ෂක සමාගම්වලට අයත් ගිනි අවි සහ උපකරණ පැටවීමට අදාළ මෙහෙයුම්	-	38	9,786	09
	සමුද්‍රාරක්ෂක නිලධාරීන් රහිතව විදේශීය පෞද්ගලික සමුද්‍රාරක්ෂක සමාගම්වලට අයත් ගිනි අවි සහ උපකරණ ගොඩබෑමට අදාළ මෙහෙයුම්	-	27	6,347	09
	විදේශීය පෞද්ගලික සමුද්‍රාරක්ෂක සමාගම්වලට අයත් ගිනි අවි සහ උපකරණ සමඟ සමුද්‍රාරක්ෂක නිලධාරීන් නෞකාවේ රැඳී සිටියදීම සිදුකරනු ලබන නෞකාවන්ට සේවා පහසුකම් සැපයීමේ මෙහෙයුම්	16	22	4,520	07
	වරායන් තුළදී, නෞකාවේ භාණ්ඩ පැටවීම් /ගොඩබෑම් (Cargo Operations) සම්පූර්ණ වනතුරු, සමුද්‍රාරක්ෂක නිලධාරීන් සතු විදේශීය පෞද්ගලික සමුද්‍රාරක්ෂක සමාගම්වලට අයත් අවි හා උපකරණ ගොඩබිම් අවි ගබඩාවල තාවකාලිකව ගබඩා කිරීමට අදාළ මෙහෙයුම්	263	379	86,320	115

අ/අ	ක්‍රියාකාරකම			මූළු ගණන	
	ගුවන් මඟින් විදේශීය පෞද්ගලික සමුද්‍රාරක්ෂක සමාගම් වලට අයත් අවි හා උපකරණ මෙරටින් පිටත් කිරීමට අදාළ මෙහෙයුම්	-	20	4,754	01
7	විදේශීය ප්‍රභූන් සඳහා අවසර ලබාදීම	12			
8	වීසා නිකුත් කිරීම සඳහා අවසර ලබාදීම	01			
9	සමුද්‍රාරක්ෂක නිලධාරීන් පුහුණු කිරීම්	09			

ආ. 2024.01.01 සිට 2024.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය

අ/අ	විස්තරය	**2024.01.01.සිට 2024.12.31 දක්වා මූළු ආදායම රු.**
1	ගිනි අවි	6,544,490.00
2	පතොරම්	422,000.00
3	අන්තරායකර බහාලුම් සහිත නැව් මෙහෙයුම්	21,480,000.00
4	සමුද්‍රාරක්ෂක මෙහෙයුම් කටයුතු	13,140,000.00
5	පෞද්ගලික ආරක්ෂක නියෝජිත ආයතන	12,191,000.00
එකතුව		**53,777,490.00**
දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත මුදල් ලැබීම්		
6	ගිනි අවි බලපත්‍ර ගාස්තු	6,562,357.00
7	පූපුරණ ද්‍රව්‍ය අවසර පත්‍ර/බලපත්‍ර ගාස්තු	15,445,520.00
මුළු එකතුව		**75,785,367.00**

(කෘෂිකාර්මික හා දේපළ ආරක්ෂාව සඳහා නිකුත් කර ඇති ගිනි අවි බලපත්‍ර හා පුපුරණ ද්‍රව්‍ය අවසර පත්‍ර/ බලපත්‍ර ගාස්තු දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් රැස්කරනු ලබන අතර, දැනට ලැබී ඇති වාර්තා අනුව ගණනය කිරීම් කර ඇත)

7. ආරක්ෂක සේවා අංශය

අ. පරිපාලන කටයුතු

i. ආරක්ෂක පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය, රණවිරු සේවා අධිකාරිය, ආරක්ෂක සේවා විද්‍යාලය හා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය යන ආයතනයන්හි ආයතනික පරිපාලනමය කටයුතු හා නඩත්තු කටයුතු සිදුකිරීම සහ එම ආයතනයන්ට අදාළව නව පනත් කෙටුම්පත් කිරීම හා පවතින පනත් වර්තමානයට ගැළපෙන පරිදි සංශෝධනය සිදු කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව හා නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණ කිරීම සිදුකර ඇත.

නව පනත් කෙටුම්පත් කිරීම

- ආරක්ෂක සේවා විද්‍යාලය
- ජාතික ආරක්ෂාව සඳහා බලපානු ලබන රසායනික ද්‍රව්‍ය නියාමනය කිරීම

රෙගුලාසි සංශෝධන කිරීම

- 2007/58 රසායනික අවි සම්මුති පනතට අදාළ රෙගුලාසි සංශෝධන කිරීම

ආ. සංවර්ධන කටයුතු

i. ආරක්ෂක සේවා විද්‍යාලය (කොළඹ/කුරුණෑගල)

- **සිවිමහල් නේවාසිකාගාර ගොඩනැඟිල්ල ඉදිකිරීම (ආරක්ෂක සේවා විද්‍යාලය - කොළඹ)**

  මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2014/15 වර්ෂයේ දී ආරම්භ වී ඇති අතර, 2024 වර්ෂය අවසන් වන විට භෞතික හා මූල්‍ය ප්‍රගතිය 95%ක් පමණ වේ. (2024 වර්ෂය සඳහා වෙන්කළ ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 170 කි).

- **පොදු පහසුකම් ගොඩනැඟිල්ල ඉදිකිරීම (ආරක්ෂක සේවා විද්‍යාලය - කුරුණෑගල)**

  මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2017 වර්ෂයේ ආරම්භ වී ඇති අතර, 2024 වර්ෂය අවසන් වන විට භෞතික හා මූල්‍ය ප්‍රගතිය 89%ක් වේ. (2024 වර්ෂය සඳහා වෙන්කළ ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 80 කි)

8. ආපදා කළමනාකරණ අංශය

අ. පාලන කටයුතු

i. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සහ ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයන්හි පරිපාලනමය කටයුතු සඳහා අමාත්‍යාංශයීය මැදිහත්වීම ලබාදීම හා අනෙකුත් ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් ආපදා කළමනාකරණ ක්ෂේත්‍රයේ කටයුතු වලට දායකත්වය ලබාදී ඇත.

ii. අමාත්‍ය මණ්ඩල සංදේශ 08ක් ඉදිරිපත් කර ඇති අතර, පාර්ලිමේන්තු ප්‍රශ්න 04ක් සඳහා පිළිතුරු සපයා ඇත. එමෙන්ම වෙනත් අමාත්‍යාංශ මඟින් ඉදිරිපත් කළ මෙම අංශයට අදාළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සඳහා ද නිරීක්ෂණ ඉදිරිපත් කිරීම සිදුකර ඇත.

ආ. සැලසුම් හා අධීක්ෂණ කටයුතු

i. 2024 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සිදුකරන ලද අතර, මහා භාණ්ඩාගාරය මඟින් කාර්තුමය වශයෙන් නිකුත් කරනු ලැබූ මූල්‍ය වියදම් වාර්තාවට අනුකූලව එක් එක් ආයතනය මඟින් සකස් කරන ලද සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනුමැතියට යොමුකිරීම හා එම සැලැස්මේ ක්‍රියාකාරකම් සම්බන්ධව ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වන ලදී.

ii. 2024 ක්‍රියාකාරී සැලැස්මට අනුව ආපදා කළමනාකරණ අංශය යටතේ ඇති ආයතන මඟින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති/වැඩසටහන්වල ප්‍රගතිය ජනාධිපති ලේකම් කාර්යාලය, ආරක්ෂක අමාත්‍යාංශය, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව හා රජයේ විගණන දෙපාර්තමේන්තුව වෙත වාර්තා කිරීම හා මහා පරිමාණ විශේෂිත ව්‍යාපෘති වල (රු.මි.1,000ට වැඩි) ප්‍රගතිය මාසිකව වාර්තා කිරීම සිදු කරන ලදී.

iii. ලේකම්වරුන්ගේ කාර්යසාධන ගිවිසුමට අනුව අර්ධ වාර්ෂික වශයෙන් පිළියෙල කරනු ලබන ආරක්ෂක ලේකම්තුමන්ගේ කාර්යසාධනයට අදාළ ආපදා කළමනාකරණ අංශයේ ප්‍රගතිය ජනාධිපති ලේකම් කාර්යාලයට වාර්තා කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයට යොමු කිරීම සිදු කරන ලදී.

iv. 2025 වර්ෂයේ අයවැය යෝජනා යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා ආපදා කළමනාකරණ අංශයට අයත් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මඟින් ව්‍යාපෘති යෝජනා හයක් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද අතර, ඉන් එක් ව්‍යාපෘතියක් සඳහා මේ වන විට අනුමැතිය ලැබී ඇත.

v. ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා වයස අනුව වර්ගීකරණය කරන ලද දත්ත හා තොරතුරු රැස්කිරීමේ ජාතික ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම සම්බන්ධ ප්‍රගතිය අවශ්‍යවූ විටක අදාළ අමාත්‍යාංශය වෙත වාර්තා කරන ලදී.

vi. රේඛීය අමාත්‍යාංශ වලට අදාළ ප්‍රතිපත්ති හා ක්‍රියාකාරී සැලසුම්වල ආපදා කළමනාකරණයට අදාළ දායකත්වය සම්බන්ධීකරණය හා ප්‍රගතිය වාර්තා කිරීම සිදු කරන ලදී.

ඇ. විගණන කටයුතු

i. ආරක්ෂක අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ අංශයේ සහ ඒ යටතේ ඇති ආයතනයන් හි භෞතික හා මූල්‍ය, මානව සම්පත් වල ආරක්ෂාව තහවුරු කිරීමටත්, මහජන මුදල් ඵලදායි හා කාර්යක්ෂම ලෙස වියදම් කිරීම සිදුවන බව තහවුරු කිරීම සඳහාත්, ආයතනය විසින් ස්ථාපිත කර ඇති අභ්‍යන්තර පාලන ක්‍රම නිසි පරිදි ක්‍රියාත්මක වන්නේද යන්න ඇගයීම හා ආයතනයේ ප්‍රතිපත්ති හා භාවිතයන් සමාලෝචනය කිරීම හා පරීක්ෂා කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශය ස්ථාපිත කර ඇත.

ii. අභ්‍යන්තර විගණන පරීක්ෂණ හා විශේෂ විමර්ශන 17 ක් පවත්වා අති අතර විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 06 ක් පවත්වා ඇත.

iii. අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්හි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 10 ක් පවත්වා ඇත.

iv. ඒ අනුව ඉදිරිපත් කර ඇති අභ්‍යන්තර විගණන වාර්තා සංඛ්‍යාව 17 වන අතර 100% ප්‍රගතියක් මේ වන විට ළඟා කරගෙන ඇත.

v. මීට අමතරව අවදානම් පාදක කරගත් අභ්‍යන්තර විගණන සැලැස්මකට අනුව 2025 වර්ෂයේ අභ්‍යන්තර විගණන අංශයේ කාර්යයන් කිරීමට අපේක්ෂා කෙරේ.

9. ගිණුම් හා මූල්‍ය අංශය

ආරක්ෂක අමාත්‍යාංශයේ ගිණුම් හා මූල්‍ය අංශය යටතේ මුදල්, ප්‍රසම්පාදන, ප්‍රසම්පාදන ආහාර හා ආවේක්ෂණ, සැපයුම්, ගෙවීම්, ආදායම් හා වත්කම් කළමනාකරණ හා වැටුප් සහ ණය අත්තිකාරම් වශයෙන් උප අංශ 06 කි.

අමාත්‍යාංශයේ සමස්ත මූල්‍ය ප්‍රගතිය

වැය විෂය	ප්‍රතිපාදන වටිනාකම (රු.මි.)	2024.12.31 දිනට වියදම (රු.මි.)	වියදම් ප්‍රතිශතය %
පුනරාවර්තන			
103-01-01	49.980	29.639	59%
103-01-02	3,142.424	2,955.658	94%
103-01-03	3,068.913	3,019.290	98%
103-01-04	882.570	622.803	71%
103-01-07	90.885	88.210	97%
103-01-14	193.301	177.675	92%
103-01-15	111.880	96.157	86%
103-01-16	24.080	22.443	93%
103-02-12	3,747.580	3,450.089	92%
103-02-17	315.040	315.040	100%
103-02-18	1,196.000	1,141.367	95%

103-02-19	42.000	42.000	100%
	12,864.654	**11,960.371**	**93%**
ප්‍රාග්ධන			
103-01-01	7.500	0.801	11%
103-01-02	9,107.770	4,614.761	51%
103-01-03	112.300	109.568	98%
103-01-04	49.900	45.621	91%
103-01-07	3.000	1.850	62%
103-01-14	35.250	27.261	77%
103-01-15	12.650	10.823	86%
103-01-16	62.900	52.310	83%
103-02-12	70.000	32.307	46%
103-02-17	245.394	181.610	74%
103-02-18	1,534.088	1,468.058	96%
103-02-19	10,689.000	3,492.232	33%
	21,929.752	**10,037.206**	**46%**
එකතුව	**34,794.405**	**21,667.577**	**63%**

අ. මුදල් අංශය

i. **2024.01.01 සිට 2024.12.31 දක්වා අංශයේ ප්‍රගතිය**

විසර්ජන ඇස්තමේන්තුව මඟින් වෙන්කර ඇති ප්‍රතිපාදන හා භාණ්ඩාගාරයේ අක්මුදල් නිදහස් කිරීම පිළිබඳ ප්‍රගතිය පහත පරිදි වේ.

විස්තරය	2023 (රු.මි.)		2024 (රු.මි.)	
	ප්‍රතිපාදනය	අක්මුදල් ලැබීම	ප්‍රතිපාදනය	අක්මුදල් ලැබීම
පුනරාවර්තන	14,233.62	7,322.76	12,864.654	4,599.868
ප්‍රාග්ධන	12,804.60	4,936.96	21,929.752	5,335.383

ii. **2024.01.01 දින සිට 2024.12.31 දිනට මු.රෙ 115 අනුමැතිය සඳහා ඉදිරිපත් කළ අයදුම්පත් හා වටිනාකම**

අ/අ	ආයතනය	අනුමැතිය සඳහා එවා ඇති අයදුම්පත් ප්‍රමාණය	වටිනාකම (රු.මි.)
1	ශ්‍රී ලංකා යුද හමුදාව	23	72,594.44
2	ශ්‍රී ලංකා නාවික හමුදාව	27	33,298.93
3	ශ්‍රී ලංකා ගුවන් හමුදාව	5	3,991.19
4	සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව	23	2,212.11
5	ආරක්ෂක පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය	6	2,113.60
6	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය	2	0.622,55

අ/අ	ආයතනය	අනුමැතිය සඳහා එවා ඇති අයදුම්පත් ප්‍රමාණය	වටිනාකම (රු.මි.)
7	ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය	6	3,049.93
8	ජාතික ශිෂ්‍යභට බලකාය	19	1,890.42
9	ජාතික ආරක්ෂක විද්‍යාතනය	9	2,087.62
10	ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය	10	3,129.34
11	රාජ්‍ය බුද්ධි සේවය	6	65,715.08
12	ආරක්ෂක අමාත්‍යාංශය	38	29,201.52
13	වෙනත්	2	1,460.23

iii. **මු.රෙ.66/69 යටතේ වැය විෂයන් අතර ප්‍රතිපාදන මාරු කිරීම (2024.01.01 සිට 2024.12.31 දක්වා)**

අ/අ	ආයතනය	අනුමැතිය සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අයදුම්පත්		ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලද අයදුම්පත්	
		ප්‍රමාණය	වටිනාකම (රු.මි.).	ප්‍රමාණය	වටිනාකම (රු.මි.)
1	ආරක්ෂක අමාත්‍යාංශය	21	433.024	21	433.024
	i. ආපදා කළමනාකරණ අංශය	12	51.705	12	51.705
	ii. රාජ්‍ය බුද්ධි සේවාව	9	40.020	9	40.020
	iii. ජාතික ශිෂ්‍යභට බලකාය	9	104.445	8	102.445
	iv. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය	4	6.235	4	6.235
	v. ආරක්ෂක පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය	11	6.010	11	6.010
2	ශ්‍රී ලංකා යුද හමුදාව	16	13,879.3	16	13,879.3
3	ශ්‍රී ලංකා නාවික හමුදාව	16	5,545.975	14	5,035.975
4	ශ්‍රී ලංකා ගුවන් හමුදාව	9	673.123	6	525.231
5	සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව	13	636.266	12	635.780
6	කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව	18	18.475	16	17.525
7	ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව	4	3.2	4	3.2
එකතුව		**142**	**21,397.778**	**133**	**20,736.450**

ආ. ප්‍රසම්පාදන අංශය

vi. 2024.01.01 සිට 2024.12.31 දක්වා ප්‍රගතිය

- ප්‍රසම්පාදන බල අධිකාරිය (අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ප්‍රසම්පාදන කමිටු බල සීමාව- SCAPC)

අ/අ	ආයතනය	ප්‍රසම්පාදන ප්‍රමාණය	වටිනාකම (රු.මි.)	දැනට පවතින තත්ත්වය								
				ලංසුලේඛන කොටුම්පත් කිරීම	ලංසුලේඛන නිකුත් කිරීම	ලංසුලේඛන ලැබීම	ප්‍රසම්පාදන කමිටු තීරණ	අභියාචනා	ප්‍රදානය කළ	යළි කැඳවීම	අවලංගු කළ	අත්හිටුවූ
1	ශ්‍රී ලංකා යුද හමුදාව	01	1,187.80						01			
2	ශ්‍රී ලංකා නාවික හමුදාව	06	28,716.00				01					05
3	ශ්‍රී ලංකා ගුවන් හමුදාව	15	14,110.17	05	05		05					
4	ආරක්ෂක අමාත්‍යාංශය - ත්‍රිවිධ හමුදාවට ආහාර සම්පාදනය	01	44,984.00			01						
5	ආරක්ෂක මූලස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය	05	9.60						01		04	

- **ප්‍රසම්පාදන බල අධිකාරිය- (අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු බල සීමාව - MPC)**

අ/අ	විස්තරය	ප්‍රසම්පාදන ප්‍රමාණය	වටිනාකම (රු.මි.)	දැනට පවතින තත්වය								
				ලංසුලේඛන කොටුම්පත් කිරීම	ලංසුලේඛන නිකුත් කිරීම	ලංසුලේඛන ලැබීම	ප්‍රසම්පාදන කමිටු තීරණ	අභියාචනා	ප්‍රදානය කළ	යළි කැඳවීම	අවලංගු කළ	අත්හිටුවූ
1	ආරක්ෂක අමාත්‍යාංශය	213	581.75						213			
2	ශ්‍රී ලංකා යුද හමුදාව	03	1,016.20					01	01		01	
3	ශ්‍රී ලංකා නාවික හමුදාව	04	1445.00					02				02
3	ශ්‍රී ලංකා ගුවන් හමුදාව	11	4,723.00	02	04							
4	ආරක්ෂක මූලස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය	02	348.70						01			
5	ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය	01	539.00	02								

ii. මූලික හා වෙනත් අනුමැතින්

- මු.රෙ. 136 අනුමැතිය ලබා දීම

  2024.01.01 සිට 2024.12.31 දක්වා වූ කාලය තුළ පහත පරිදි මු.රෙ. 136 අනුමැතිය ලබා දීම සහ පහත ආයතනයන්හි ප්‍රසම්පාදන කටයුතු වලදී අවශ්‍ය ණයවර ලිපි විවෘත කිරීම සඳහා අනුමැතිය ලබා දීම සිදු කර ඇත.

අ/අ	ආයතනය	අනුමැතිය දුන් ප්‍රමාණය මු.රෙ. 136 (රු.මි.)	ණයවර ලිපි
1	ශ්‍රී ලංකා යුද හමුදාව	1,037.76	15.01
2	ශ්‍රී ලංකා නාවික හමුදාව	6,892.55	1,838.14
3	ශ්‍රී ලංකා ගුවන් හමුදාව	7,567.04	797.18
4	රාජ්‍ය බුද්ධි සේවය	-	-
5	ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය	-	-
6	ආරක්ෂක මූලස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය	1,290.56	-

- **තාක්ෂණික ඇගයීම් කමිටු පත්කිරීම**

  2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු බල සීමාවේ සහ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවල අමාත්‍යාංශ නියෝජිතයන් ලෙස කටයුතු කිරීම සඳහා පහත පරිදි නියෝජිතයන් පත් කර ඇත.

අ/අ	ආයතනය	පත්කළ නාමයෝජනා ගණන
1	ශ්‍රී ලංකා යුද හමුදාව	17
2	ශ්‍රී ලංකා නාවික හමුදාව	63
3	ශ්‍රී ලංකා ගුවන් හමුදාව	30
4	ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය	-
5	ආරක්ෂක මූලස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය	03

- **වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම් අනුමත කර දීම**

  අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ආයතනවල වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම් අනුමත කරදීමට අදාළ කටයුතු සිදුකරනු ලැබේ.

ඇ. සැපයුම් අංශය

i. 2024 වර්ෂයේ ජනවාරි සිට මේ දක්වා අමාත්‍යාංශයට සහ ඊට අනුබද්ධ ආයතන සඳහා අවශ්‍ය වූ පාරිභෝජ්‍ය සහ ප්‍රාග්ධන භාණ්ඩ ප්‍රසම්පාදන සැලැස්මට අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු කොට මිලදී ගෙන අවශ්‍යතාවයන් සපුරා ඇත.

ii. 2024 වර්ෂය සඳහා අමාත්‍යාංශයට, ත්‍රිවිධ හමුදාවට හා ඊට අනුබද්ධ ආයතන සඳහා භාණ්ඩ හා සේවා සපයන සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සිදු කොට ඇත.

ඈ. ගෙවීම් අංශය

i. ප්‍රධාන වශයෙන්ම ආරක්ෂක අමාත්‍යාංශයීය අයවැය ලේඛනයට ඇතුළත් ප්‍රධාන ව්‍යාපෘති 07කට අදාළ පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සඳහා ගෙවීම් කටයුතු සිදු කරනු ඇත. පහතින් දැක්වෙන්නේ එම ව්‍යාපෘති 07යි.

   - අමාත්‍ය කාර්යාලය
   - පරිපාලනය හා ආයතනික සේවා
   - රාජ්‍ය බුද්ධි සේවාව
   - ශ්‍රී ලංකා ජාතික ශිෂ්‍යභට බලකාය
   - ඒකාබද්ධ මෙහෙයුම් මූලස්ථානය
   - පරිපාලනය හා ආයතනික සේවා (ආරක්ෂක සේවා)
   - පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය

ii. මූල්‍ය රෙගුලාසි අංක 138 හා 139 ට යටත්ව වවුවර සහතික කිරීම හා වවුවර වලට මුදල් ගෙවීම යන ප්‍රධාන කාර්යයන් දෙක මෙම අංශය යටතේ සිදු වේ.

iii. ගෙවීම් අංශය වෙත 2024 ජනවාරි - දෙසැම්බර් මාසය දක්වා ගෙවීම් කටයුතු වෙනුවෙන් ඉදිරිපත් කර ඇති වවුවර්පත් අතරින් 99% ක වවුවරපත් සඳහා 2024.12.31 වන විට ගෙවීම් කටයුතු සිදු කර ඇත.

ඉ. ආදායම් හා වත්කම් කළමනාකරණ අංශය

අමාත්‍යාංශයට අදාළ ආදායම් ඇස්තමේන්තු සකස් කිරීම, අධීක්ෂණය සහ වාර්තා කිරීම ආදායම් හා වත්කම් කළමනාකරණයට අදාළව සිදු කරනු ලැබේ.

2024.01.01 සිට 2024.12.31 දක්වා ප්‍රගතිය

අ/අ	ක්‍රියාකාරකම්	2024 ආදායම් ඇස්තමේන්තුව (රු.මි.)	2024.12.31 දිනට සත්‍ය ආදායම (රු.මි.)	ප්‍රගතිය (% ක් ලෙස)
1	ආදායම් කළමනාකරණය - 10.03.07.05 - 20.03.06.00	 59.00 5,300.00	 80.00 2,865.88	 135% 54.07%
2	හානි හා පාඩු පිළිබඳ කටයුතු	-	-	100%
3	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු	-	-	100%
4	භාණ්ඩ අපහරණ කටයුතු	-	-	100%
5	වත්කම් කළමනාකරණ තොරතුරු පද්ධතිය යාවත්කාලීන කිරීම.	-	-	100%
6	ගොඩනැඟිලි කුලියට ලබාදීම.	-	-	90%
7	ගබඩා කළමනාකරණය	-	-	100%

ii. එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් තුළින් ලද ආදායම් අයකර ගැනීමේ වර්තමාන ප්‍රගතිය - ආදායම් සංකේතය - 20.03.06.00

- මෙම ආදායම සෘජුවම ශ්‍රී ලංකා යුද හමුදාව හා ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත ලැබෙන අතර එම ආදායම අයකර ගැනීමේ ප්‍රගතිය පමණක් මෙම අංශය වෙත දැනුම් දෙනු ලැබේ.

අ/අ	ආයතනය	2024 ආදායම් ඇස්තමේන්තුව (රු.මි)	2024.12.31 දිනට සත්‍ය ආදායම (රු.මි)	ප්‍රගතිය % ක් ලෙස
1	ශ්‍රී ලංකා යුද හමුදාව	2,100.00	545.88	26%
2	ශ්‍රී ලංකා ගුවන් හමුදාව	3,200.00	2,320.00	72.5%
එකතුව		**5,300.00**	**2,865.88**	

- ශ්‍රී ලංකා යුද හමුදාව වෙත 2024.01.11 හා 2024.01.12 යන දිනවල දී ලබා දුන් පිළිවෙලින් රුපියල් 309,830,927.22 හා රු. 221,340,686.15 ක අත්තිකාරම් මුදලක් ලබා දී ඇත. එම අත්තිකාරම් පියවීම ලෙස රු. 483,784,476.42ක් ද ණයවර ලිපි පියවීම ලෙස රු. 47,374,549.34 ක් හා බැංකු ගාස්තු ලෙස රු. 12,587,.61 ක් පියවා ගැනීමට කටයුතු කර ඇත.

ඒ අනුව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත බැර කළ මුළු ආදායම රු.මිලියන 977.13 ක් වේ. එය ඇස්තමේන්තු කළ ආදායමෙන් 46.53% ක් වේ. නමුත් එම අගයන් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු ගිණුමේ ගිණුම්ගත වී නොමැත.

- ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත 2024.01.11 දින ලබා දුන් රුපියල් 161,408,704.82 හා බැංකු ගාස්තු ලෙස රු. 6,295.18ක මුදල පියවා ගැනීමට කටයුතු කර ඇත.

ඒ අනුව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත බැර කළ මුළු ආදායම රු.මිලියන 2,706.55 ක් වේ. එය ඇස්තමේන්තු කළ ආදායමෙන් 84.52% ක් වේ. නමුත් එම අගයන් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු ගිණුමේ ගිණුම්ගත වී නොමැත.

iii. ගිනිඅවි / පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර ගාස්තු අයකර ගැනීමේ වර්තමාන ප්‍රගතිය - ආදායම් සංකේතය - 10.03.07.05

මෙම ආදායම සිවිල් ආරක්ෂක හා සංවර්ධන අංශයට සෘජුවම සම්බන්ධ වන අතර, එම ආදායම අයකර ගැනීමේ ප්‍රගතිය පමණක් මෙම අංශයට දැනුම් දෙනු ලැබේ.

අ/අ	විස්තරය	**2024 ආදායම් ඇස්තමේන්තුව (රු.මි)**	**2024.12.31 දිනට සත්‍ය ආදායම (රු.මි)**	**ප්‍රගතිය % ක් ලෙස**
1	බලපත්‍ර ගාස්තු	59.00	80.00	135%

ඊ. වැටුප් අංශය

i. මෙම අමාත්‍යාංශයේ හා රාජ්‍ය බුද්ධි සේවාවේ 2,700කට ආසන්න කාර්ය මණ්ඩලයක් සඳහා වැටුප් ගෙවනු ලැබේ.මෙම අංශයේ ප්‍රධාන කාර්යයන් පහත වේ.

- ආරක්ෂක අමාත්‍යාංශයේ හා රාජ්‍ය බුද්ධි සේවයේ නිලධාරින්ගේ වැටුප් GPS (GOVERNMENT PAYROLL) මෘදුකාංගය ඇසුරින් සැකසීම, පඩිනඩි කාඩ්පත් හා ලෙජරයන් යාවත්කාලීන කර පවත්වාගෙන යාම
- වැටුප් ගෙවීමට අදාළ වැය විෂයන්ගේ ප්‍රතිපාදන කළමනාකරණය කිරීම
- වැටුප් ගෙවීම සඳහා අදාළ වැය ලෙජර යාවත්කාලීනව පවත්වාගෙන යාම හා භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් සමඟ නිසි පරිදි සැසඳුම් කර අවශ්‍ය සංශෝධනයක් සිදු කිරීම
- නිලධාරින්ගේ අතිකාල / නිවාඩු දින වැටුප් සහ සංයුක්ත දීමනා / ගමන් වියදම් පරීක්ෂා කර ගෙවීම් කටයුතු සඳහා අප්‍රමාදව ඉදිරිපත් කිරීම
- වැටුපෙන් සිදු කරන අවකරණයන් අදාළ ආයතන වෙත නිසි කලට ප්‍රේෂණය කිරීම
- ආරක්ෂක අමාත්‍යාංශයේ නිලධාරින්, රාජ්‍ය බුද්ධි සේවාවේ නිලධාරින් සහභාගීවන විදේශීය සංචාර සඳහා දීමනා ගණනය කර ගෙවීම් කටයුතු සඳහා ඉදිරිපත් කිරීම
- රාජ්‍ය බුද්ධි සේවාවේ නිලධාරින්ගේ වැටුපෙන් අයකරන පොලිස් ඉතිරි කිරීම් සංගමයේ ඉතුරුම් හා ණය වාරික අයකිරීම්, එම ආයතනයේ වාර්තා සමඟ සැසඳුම් කර නිසිකලට වෙනස්කම් පොලිස් ඉතිරිකිරීම් සංගමය වෙත වාර්තා කිරීම

උ. ණය අත්තිකාරම් අංශය

රාජ්‍ය සේවකයින්ගේ සුබසාධනය සඳහා රජය මඟින් සහනදායී පොලී ක්‍රමයක් යටතේ ආරක්ෂක අමාත්‍යාංශයේ, ජාතික ශිෂ්‍යභට බලකායේ (සිවිල්), රාජ්‍ය බුද්ධි සේවයේ හා ආපදා කළමනාකරණ අංශයේ නියුතු නිලධාරින් හා සේවකයන් සඳහා ණය පහසුකම් ලබා දීම සහ ඒ සඳහා අවශ්‍ය පහසුකම් සලසා ඇත.

i. ලබා දුන් ණය වර්ගීකරණය

වර්ගය	**2023**	
	මුදල (රු.මි.)	**නිලධාරින් සංඛ්‍යාව**
ආපදා ණය	61,043.43	380
උත්සව අත්තිකාරම්	18,810.00	1,881
විශේෂ අත්තිකාරම්	2,316.00	579
එකතුව	**82,169.43**	**2,840**

10. අභ්‍යන්තර විගණන අංශය

i. 2024.12.31 දින වන විට විගණකාධිපති විගණන විමසුම් 31ක් ලැබී ඇති අතර, එම විගණන විමසුම් 28කට පිළිතුරු ලබා දී ඇත.

ii. රාජ්‍ය ගිණුම් කාරක සභාව / පොදු ව්‍යාපාර කාරක සභාව විසින් ලබා දෙන නියෝග ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසු විපරම් කිරීම සිදු කර ඇත.

iii. 2024 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් හතරක් පවත්වා ඇත.

11. හමුදා සම්බන්ධතා නිලධාරී කාර්යාලය

අ. 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා කාලය තුළදී පහත සඳහන් රාජතාන්ත්‍රික විදේශීය ප්‍රභූවරුන්ගේ ශ්‍රී ලංකා සංචාරයන් සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ සහාය ලබාදීම.

i. විදේශීය ප්‍රභූවරුන්ගේ සංචාර

අ/අ	විස්තරය	කාලය
1	පකිස්ථාන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ සංචාරය	2024.01.01 දින සිට 05 දක්වා
2	චීනයේ මහජන සමූහාණ්ඩුවේ මධ්‍යම හමුදා කොමිසමේ ජාත්‍යන්තර හමුදා සහයෝගිතා කාර්යාලයේ නියෝජ්‍ය කොමසාරිස් ඇතුළු නියෝජිත පිරිසගේ සංචාරය	2024.03.06 සිට 09 දක්වා
3	රුසියානු සමූහාණ්ඩුවේ සන්නද්ධ හමුදා උසස් අණදෙන නිලධාරී ඇතුළු නියෝජිත පිරිසකගේ සංචාරය	2024.04.22 සිට 25 දක්වා
4	රුසියානු සන්නද්ධ හමුදාවන්ගේ සාමාන්‍ය කාර්ය මණ්ඩලයේ හමුදා ඇකඩමියේ නියෝජිත පිරිසකගේ සංචාරය	2024.09.09 සිට 13 දක්වා

ii. විදේශ අධ්‍යයන චාරිකා

අ/අ	විස්තරය	කාලය
1	ඉන්දියානු උසස් ආරක්ෂක කළමනාකරණ පාඨමාලාව සබැඳිව ජාත්‍යන්තර උපාය මාර්ග කළමනාකරණ චාරිකාව	2024.02.04 සිට 10 දක්වා
2	ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ පාඨමාලා අංක 18 හදාරනු ලබන දේශීය/විදේශීය නිලධාරීන්ගේ මෙම අමාත්‍යාංශ සංචාරය	2024.03.04 දින
3	පකිස්ථානු ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලයේ ශ්‍රී ලංකා අධ්‍යයන චාරිකාව	2024.05.05 සිට 10
4	චීන ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලයේ ශ්‍රී ලංකා අධ්‍යයන චාරිකාව	2024.06.16 සිට 19
5	ඉන්දියානු ජාතික ආරක්ෂක විද්‍යාලයේ ශ්‍රී ලංකා අධ්‍යයන චාරිකාව	2024.09.02 සිට 06
6	බංගලාදේශ ජාතික ආරක්ෂක විද්‍යාලයේ සන්නද්ධ හමුදා යුද පාඨමාලාව	2024.09.08 සිට 19 දක්වා
7	ඉන්දියානු උසස් ආරක්ෂක කළමනාකරණ පාඨමාලාව	2024.10.14 සිට 18 දක්වා
8	ඕස්ට්‍රේලියානු ආරක්ෂක සහ උපායමාර්ගික අධ්‍යයන පාඨමාලාව	2024.10.20 සිට 26 දක්වා
9	ඇමරිකා එක්සත් ජනපද ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලයේ ශ්‍රී ලංකා අධ්‍යයන චාරිකාව	2024.11.06 සිට 08 දක්වා

ආ. **2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා පහත සඳහන් පරිදි විදේශීය නාවික යාත්‍රා වලට රට තුළට පැමිණීම සඳහා ආරක්ෂක නිෂ්කාශන ලබාදී ඇත.**

අ/අ	රට	නැව් සංඛ්‍යාව
1	ඉන්දියාව	12
2	චීනය	05
3	ජපානය	02
4	ඇමෙරිකා එක්සත් ජනපදය	07
5	සිංගප්පූරුව	01
6	ජර්මනිය	01
7	පකිස්ථානය	01
8	ඉරානය	02
9	රුසියාව	01
10	මහා බ්‍රිතාන්‍ය	01
11	ඉන්දුනීසියාව	02
12	තුර්කිය	01
13	ඕමානය	01
14	ඉතාලිය	02
එකතුව		39

ඇ. **2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා පහත සඳහන් පරිදි විදේශීය ගුවන් යානා වලට දිවයිනට පැමිණීමට හා රට හරහා ගමන් කිරීමට ආරක්ෂක නිෂ්කාශන ලබාදී ඇත.**

අ/අ	රට	ගුවන් යානා සංඛ්‍යාව
1	ජපානය	05
2	ඉන්දියාව	07
3	ඕමානය	03
4	ඕස්ට්‍රේලියාව	06
5	රුසියාව	07
6	ඉන්දුනීසියාව	08
7	සෞදි ආරාබිය	04
8	ජර්මනිය	10
9	මැලේසියාව	02
10	එක්සත් රාජධානිය	07
11	ප්‍රංශය	15
12	ස්පාඤ්ඤය	02
13	සමක ගිනියාව	10
14	ඉතාලිය	41
15	ඉරානය	02
16	යුක්‍රේනය	02
17	ඇමරිකා එක්සත් ජනපදය	50
18	ටැන්සානියාව	01
19	තායිලන්තය	03

අ/අ	රට	ගුවන් යානා සංඛ්‍යාව
20	කටාර්	03
21	නෙදර්ලන්තය	01
22	තුර්කිය	01
23	සිම්බාබ්වේ	01
24	දකුණු අප්‍රිකාව	02
25	දකුණු කොරියාව	01
26	මොරොක්කෝව	03
27	කැනඩාව	02
28	ඝානාව	02
29	සියොරා ලියොන්	01
30	ඉතියෝපියාව	01
එකතුව		**203**

i 2024.01.01 දින සිට 2024.12.31 දක්වා කාලය තුළ රූගත කිරීම් වෙනුවෙන් ඩ්‍රෝන කැමරා භාවිතා කිරීම සඳහා ආයතන/ පුද්ගලයින් 1,444 දෙනෙකු සඳහා ආරක්ෂක නිෂ්කාශන ලබා දී ඇත.

ii. ශ්‍රී ලංකාවේ පිහිටි ජාත්‍යන්තර ගුවන් තොටුපල, ගුවන් යානා අංගන සහ ගුවන් යානා සඳහා අවැසි විශේෂ ආරක්ෂාවක් ඉල්ලුම් කළ අවස්ථාවන් වලදී සිවිල් ගුවන් සේවා අධිකාරිය සමඟ සම්බන්ධතාවයෙන් යුතුව එම ආරක්ෂාව ලබාදීමට කටයුතු කර ඇත.

ඈ. සිද්ධස්ථාන හා පාසල් සංවර්ධනය සඳහා ශ්‍රම දායකත්වය/ද්‍රව්‍ය සැපයීම

i. 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා කාලය තුළ දිවයිනේ වෙහෙර විහාරස්ථාන, පාසල් සහ විවිධ ආයතන 53ක සංවර්ධන කටයුතු වෙනුවෙන් ත්‍රිවිධ හමුදාව සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු හට පිරිස් ශ්‍රම දායකත්වය ලබාදීමට කටයුතු සිදුකර ඇත.

ඉ. මහජනතාව වෙනුවෙන් කරනු ලබන මානුෂීය සත්කාර හා සේවාවන්

i. ඩෙංගු මර්දන රාජකාරි සඳහා හට පිරිස් යොදවා ඇත.

ii. මියගිය/ ආබාධිත තත්ත්වයට පත් රණවිරුවන් සහ ඔවුන්ගේ පවුල්වල ගැටලු සහ සුබසාධක කටයුතු සිදු කර ඇත.

ඊ. සඳහිරුසෑය ව්‍යාපෘතිය

i. සඳහිරුසෑය ස්තූපය උසින් අඩි 282.6ක් හා විශ්කම්භය අඩි 255ක් වන අතර, ස්තූපයේ ඉදිරිකිරීම් අවසන් කර මහජනතාවගේ වන්දනාමාන කටයුතු සඳහා අවස්ථාව සළසා දී ඇති අතර, ස්තූපය වටා ඇති අනෙකුත් ඉදිකිරීම් කටයුතු ත්‍රිවිධ හමුදාව සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ හට පිරිස් යොදා ගනිමින් සිදුකරමින් පවතී.

උ. දීසවාපිය ව්‍යාපෘතිය

i. ආරක්ෂක ලේකම්හාර කත්‍ය සහ පළමුවන හාරකරු වශයෙන් කටයුතු කරන දීසවාපි අරුණ හාරයේ පූර්ණ සම්බන්ධීකරණය යටතේ දීසවාපිය ව්‍යාපෘතිය කොටස් 04 කින් යුක්ත වන අතර දීසවාපිය චෛත්‍ය සම්පූර්ණ උස අඩි 268.5ක් වන අතර, මේ වන විට චෛත්‍ය ඉදිකිරීම් උසින් අඩි 66’ 8’’ දක්වා නිම කර ඇත. තවද, චෛත්‍ය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අවශ්‍ය ස්තූප ගඩොල් නිෂ්පාදන කටයුතු යුද හමුදාවේ සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සාමාජිකයින් විසින් සිදු කරනු ලබයි.

ii. දීසවාපිය චෛත්‍ය රාජයාණන් වහන්සේගේ ගර්භයේ ධාතූන් වහන්සේලා සහ නිදන් වස්තූන් තැන්පත් කිරීමේ පුණ්‍ය මහෝත්සවය ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2024.07.14 වන දින පවත්වන ලදී.

iii. නාවික හමුදාව විසින් දීසවාපිය විශ්‍රාම ශාලාවේ ඉදිකිරීම් කටයුතු අවසන් කර දරණාගම කුසලධම්ම නාහිමි අනුස්මරණ සන්ථාගාර ශාලාව නමින් විවෘතකර ඇති අතර, විශ්‍රාම ශාලාවේ අලංකරණය සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

iv. දාන ශාලාවේ සහ ධාතු මන්දිරයෙහි ඉදිකිරීම් ශ්‍රී ලංකා ගුවන් හමුදාව මඟින් සිදු කළ අතර, ඉදිකිරීම් අවසන් කර ඇත.

v. තවද, දීසවාපිය විහාරයේ පැරණි බුද්ධ මන්දිරය නවීකරණය කරමින් එහි ඉදිකිරීම් කටයුතු යුද හමුදාව මඟින් සිදුකරමින් පවතී.

ඌ. ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා වන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම

i. ප්‍රතිපත්ති මට්ටම
රටේ ඇතිවන විවිධ අර්බුදයන් මධ්‍යයේ ත්‍රිවිධ හමුදා සේවයේ යෙදවීම තුළින් ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන්ට සහාය දැක්වීම වෙනුවෙන් පුළුල් ආරක්ෂක උපාය මාර්ගයන් ක්‍රියාත්මක කරන ලදී. පුරවැසියන්ගේ මානව හිමිකම් ආරක්ෂා කරමින් දේපළවල ආරක්ෂාව සහතික කිරීමට ත්‍රිවිධ හමුදාව සම්බන්ධීකරණය කරන ලදී.

ii. මෙහෙයුම් මට්ටම
ශ්‍රී ලංකාවේ විදේශ දූත මණ්ඩලවල අනුයුක්ත ආරක්ෂක/උපදේශක ප්‍රජාව සහ නවදිල්ලියේ ශ්‍රී ලංකාවට අනුයුක්ත ආරක්ෂක උපදේශක ප්‍රජාව සමඟ සමීප සබඳතාවයක් තුළින් රටෙහි තත්ත්වය නිරන්තරයෙන් තක්සේරු කිරීමට කටයුතු කළ අතර තවදුරටත්, ශ්‍රී ලංකාව තුළ ඔවුනගේ මෙහෙයුම් සඳහා පහසුකම් සලසමින් සන්නද්ධ සේවා වෙත සහය ලබා ගැනීමට ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත.

එ. ආපදා කළමනාකරණයට සහය දැක්වීම

i. දිවයින පුරා ආපදා කළමනාකරණය සහ ආපදාවන් අවම කිරීමේ මෙහෙයුම් සඳහා ත්‍රිවිධ හමුදාවේ සහාය සම්බන්ධීකරණය කරන ලදී. තවද, ජනතාවගේ ජීවිත හා දේපළ සුරක්ෂිත කිරීම සඳහා අමාත්‍යාංශ සහ හදිසි ප්‍රතිචාර ආයතන අතර අන්තර් ක්‍රියාකාරිත්වය සහතික කිරීමටත්, ඔවුන්ගේ වගකීම් ඉටු කිරීමට අවශ්‍ය හැකියාවන් සහ සම්පත් නොමැති අවස්ථාවලදී ඔවුන්ට අවශ්‍යය සහය ලබා දීමටත් කටයුතු කර ඇත.

2.1.2 අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල ප්‍රගතිය

1. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලය

අ. 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලය මඟින් පහත සඳහන් අවස්ථාවන්හි දී ආරක්ෂාව ලබාදීම සිදු කර ඇත.

i. 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා පැවති පාර්ලිමේන්තු සැසිවාරයන් 27 ක් සඳහා ත්‍රිවිධ හමුදාව වෙතින් ආරක්ෂාව ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී

ii. 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා කොළඹ නගරය කේන්ද්‍ර කරගනිමින් පැවැත්වූ විරෝධතාවයන් 115 ක් පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා පොලිසිය වෙත ත්‍රිවිධ හමුදා සහය ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී

iii. 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා සමස්ත දිවයිනම ආවරණය වන පරිදි විශේෂ මෙහෙයුම් 134 ක් ක්‍රියාත්මක කිරීම සඳහා අවැසි සහයන් ත්‍රිවිධ හමුදාව වෙතින් ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී

iv. 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා දිවයින පුරා දේවස්ථානයන්හි පැවැත්වූ උත්සවයන් 24 ක් සඳහා ත්‍රිවිධ හමුදාව වෙතින් ආරක්ෂාව ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී

v. බ්‍රිතාන්‍ය රාජකීය පවුලේ ඇන් කුමරිය දිවයිනට පැමිණීම මහනුවර සංචාරය, ගරු තායිලන්ත අග්‍රාමාත්‍ය තුමන්ගේ මෙරට සංචාරය, අතිගරු ඉරාන ජනාධිපති මෙරට සංචාරය සහ ගරු ඉන්දීය විදේශ අමාත්‍ය තුමන්ගේ මෙරට සංචාරය වෙනුවෙන් ත්‍රිවිධ හමුදා සහය ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී

vi. 2024.06.21 වන දිනයට යෙදී ඇති ජාතික පොසොන් උත්සවයට සමගාමීව තන්තිරිමලේ රජමහා විහාරස්ථානයේ පැවැත්වූ පොසොන් ආලෝක පූජාව අම්පාර නගරය කේන්ද්‍ර කර ගනිමින් පැවැත්වෙන උත්සවය වෙනුවෙන් යුද හා ගුවන් හමුදා සහය ලබාදීමට සම්පාදනය කරන ලදී

vii. 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා පැවැති උත්සවයන් හා සංචාරයන් 16 ක් සඳහා හිටපු ගරු අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමන් පැමිණීම වෙනුවෙන් ආරක්ෂාව ලබා දීම සඳහා අවශ්‍ය හට පිරිස් සහය ත්‍රිවිධ හමුදාව වෙතින් ලබාදීම සඳහා කටයුතු සම්පාදනය කරන ලදී

viii. 2024.01.11,16 සහ 2024.02.01, 2024.02.13, 2024.04.02 වන දින පැවැත්වූ සෞඛ්‍ය සේවා වැඩ වර්ජනය හේතුවෙන් අවැසි සහයක සේවාවන් ත්‍රිවිධ හමුදාව වෙතින් ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී

ix. 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා පැවති විවිධ ආගමික උත්සවයන් 08 ක් සඳහා පැමිණෙන බැතිමතුන්ගේ හා දේපළ ආරක්ෂාව සඳහා ත්‍රිවිධ හමුදා සහය ලබාදීම සඳහා කටයුතු සම්පාදනය කරන ලදී

x. 2024.02.04 දින 76 වන නිදහස් සැමරුම් උත්සවයක් මඩකලපුව වෙබර් ක්‍රීඩාංගණයේදී පැවැත්වූ බැවින් එහි ආරක්ෂාව සඳහා යුද හමුදා සේවා සහය ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී

xi. 2024.02.09 සිට 2024.02.14 වන දින දක්වා සහ 2024.02.19 සිට 2024.02.21 පල්ලෙකැලේ ජාත්‍යන්තර ක්‍රිඩාංගණයේ පැවැත්වූ ශ්‍රී ලංකා ඇෆ්ගනිස්ථාන ක්‍රිකට් තරඟාවලිය සඳහා යුද හමුදා ආරක්ෂාව ලබාදීම සඳහා කටයුතු සම්පාදනය කරන ලදී

xii. 2024.02.09 වන දින ආහාර හා කෘෂිකර්ම සංවිධාන ආසියානු පැසිපික් කලාපීය 37 වන සමුළුව සඳහා අවැසි සේවා සහයන් යුද හා නාවික හමුදාව වෙතින් ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී

xiii. 2024.03.26 දින මහ සිකුරාදා සහ පාස්කු දිනයන්හි දේව මෙහෙයන්ට සිදුවිය හැකි කඩාකප්පල්කාරී ක්‍රියාවන් වැළැක්වීම සඳහා නුවරඑළිය පළාත සඳහා යුද සහ ගුවන් හමුදාවන් වෙතින් බුද්ධි අංශ නිලධාරී සහය ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී

xiv. 2024.05.01 දින මැයි දින කිලිනොච්චිය පොලිස් වසමේ මැයි දින සැමරුම් පෙළපාලි හා රැස්වීම් සඳහා යුද හමුදා ආරක්ෂාව ලබාදීම සඳහා කටයුතු සම්පාදනය කරන ලදී

xv. IORA DAY 2024 සමුළුව වර්ණවත් කිරීම සඳහා පැරෂුට් භටයින් ත්‍රිවිධ හමුදාව වෙතින් ලබා දීමට කටයුතු සම්පාදනය කරන ලදී

xvi. 2024.10.24 දින හංවැල්ල පොලිස් වසමේ අපරාධයන් වැළැක්වීමේ අරමුණින් පැවැත්වෙන විශේෂ සෝදිසි මෙහෙයුම් සඳහා යුද හමුදා භට කණ්ඩායම් සහය ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී

xvii. 2024.11.20 දින ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පවතින ගොඩනැගිල්ලේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ගුවන් හමුදා සේවා සහය ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී

xviii. 2024.12.04 අපොස (උ:පෙළ) විභාග ප්‍රශ්න පත්‍ර ප්‍රවාහනය සඳහා අවැසි සහය ත්‍රිවිධ හමුදාවන් වෙතින් ලබාදීම සඳහා කටයුතු සම්පාදනය කරන ලදී

ආ. ආපදා තත්ත්වයන් සඳහා සහන සැලසීම

i. ගාල්ල දිස්ත්‍රික්කයේ ගිංගඟ හරහා ඉදිකර ඇති පාලම් ආශ්‍රිතව එකතුවී ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා නාවික හමුදා කණ්ඩායම් 6 ක් ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

ii. මාතලේ දිස්ත්‍රික්කයේ සහ මඩකලපුව දිස්ත්‍රික්කයේ ජාතික ජලසම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ ජලය ලබා ගන්නා ස්ථානයේ ජලනල වල සිරවී ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා නාවික හමුදා කිමිදුම් සේවා කණ්ඩායම් 3ක් ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

iii. පුත්තලම දිස්ත්‍රික්කයේ නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, මාතර දිස්ත්‍රික්කයේ අකුරැස්ස, අතුරලිය, කඹුරුපිටිය, මාලිම්බඩ, තිහගොඩ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි ගං වතුර ආපදාවට ලක් වී ඇති ප්‍රදේශවල අපවිත්‍ර ළිං ඉස පිරිසිදු කිරීම සඳහා යුද හමුදා සහය ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

iv. 2024.01.26 බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ වංගෙඩිවල නැමැති ස්ථානයේ අනතුරකින් ඒ අසල පිහිටි ජලාශයකට පුද්ගලයෙකු වැටී මියගොස් ඇති බැවින් මළසිරුර සෙවීම සඳහා නාවික හමුදා කිමිදුම්කරුවන්ගේ සහය ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

v. 2024.02.28 ගම්පහ දිස්ත්‍රික්කයේ සපුගස්කන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බියගම බණ්ඩාරවත්ත ප්‍රදේශයේ ජල සම්පාදන මණ්ඩලය විසින් රැගෙන එන ලද ජලනල තොගයක් ගිනි ගැනීම හේතුවෙන් යුද හමුදා සහය ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

vi. අධික වර්ෂාව සහ සුළං හේතුවෙන් පොදු ස්ථානයන්, නිවාසයන්හි විදුලි රැහැන් කඩා වැටීම, ගස් කඩාවැටීම් සහ සුළඟට ගසා ගෙන ගොස් ඇති වහලවල් අළුත්වැඩියා කිරීම සඳහා යුද හමුදා සහය කණ්ඩායම් 5 ක් ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

vii. 2024.05.29 දින කොළඹ දිස්ත්‍රික්කයේ ජලයෙන් යටවූ ප්‍රදේශ නිරීක්ෂණය සඳහා ඩ්‍රෝන සහය ගුවන් හමුදාව වෙතින් ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

viii. 2024.08.29 දින ගම්පහ දිස්ත්‍රික්කයේ කැලණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බෝ ගස ඉවත් කර ගැනීම සඳහා යුද හමුදා සහය ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

ix. 2024.08.25 දින ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පේද්දුව ප්‍රදේශයේ දැදුරු ඔයේ දිය නෑමට ගිය මවක් සහ දරුවන් දෙදෙනෙකු දියේ ගිලී ඇති අතර, නාවික හමුදා සහය ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

x. 2024.10.16 දින කොළඹ දිස්ත්‍රික්ක සඳහා බලපා ඇති අධික වර්ෂාව හේතුවෙන් කැළණි ගඟ අවට මුදවා ගැනීම සඳහා නාවික හමුදා සහය ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

xi. 2024.10.29 දින පුත්තලම දිස්ත්‍රික්කයට බලපා ඇති අධික වර්ෂාව හේතුවෙන් ජලය බැස නොයාම නිසා ජල පොම්ප කිරීම සඳහා යුද හමුදා සහ නාවික හමුදා සහය ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

xii. 2024.11.24 දින මාතර දිස්ත්‍රික්කයට බලපා ඇති වර්ෂාව හේතුවෙන් අ.පොස. උසස් පෙළ විභාගයේ ගමනාගමන කටයුතු සඳහා යුද හමුදා සහය ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

xiii. 2024.11.24 දින මාතර දිස්ත්‍රික්කයට බලපා ඇති වර්ෂාව හේතුවෙන් අ.පොස. උසස් පෙළ විභාගයේ ප්‍රශ්න පත්‍ර ප්‍රවාහනය කිරීම සඳහා නාවික හමුදා සහය ලබාදීම.

xiv. 2024.11.24 දින පුත්තලම දිස්ත්‍රික්කයට බලපා ඇති වර්ෂාව හේතුවෙන් අ.පොස. උසස් පෙළ විභාගයේ ගමනාගමන කටයුතු සඳහා යුද හමුදා සහය ලබාදීම.

xv. 2024.11.27 දින කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිකවැරටිය දළදාගම මාර්ගයේ විශාල ගසක් වැටී ඇති බැවින් එය ඉවත් කිරීම සඳහා යුද හමුදා සහය ලබාදීම.

xvi. 2024.11.27 දින කුරුණෑගල දිස්ත්‍රික්කයට බලපා ඇති වර්ෂාව හේතුවෙන් වියලි ආහාර බෙදාදීම සඳහා යුද හමුදා සහය ලබාදීම.

xvii. 2024.11.28 දින පුත්තලම දිස්ත්‍රික්කයට බලපා ඇති වර්ෂාව හේතුවෙන් සහන කණ්ඩායම් වලට ලගාවිය නොහැකි ස්ථාන හා මුදවා ගැනීමේ කටයුතු සැලසීමට ගුවන් හමුදා සහය ලබාදීම.

xviii. 2024.12.03 දින බලපා ඇති ගං වතුර හේතුවෙන් ආපදාවන්ට ලක් වූ දිස්ත්‍රික්කයට පානීය ජල අවශ්‍යතා සපුරා ගන්නා ළිං පිරිසිදු කිරීම සඳහා ත්‍රිවිධ හමුදාව සහය ලබාදීම.

xix. 2024.12.04 දින වව්නියාව පාවට්ටිකුලම් ජලාශයේ සොරොව්ව අක්‍රීය වීම හේතුවෙන් නාවික හමුදා කිමිදුම්කරුවන්ගේ සහය ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

xx. 2024.12.16 වන දින අනුරාධපුර දිස්ත්‍රික්කයේ රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 114 මහවැව ග්‍රාම නිලධාරී වසමේ මහවැව විහාරස්ථානයේ බෝධි වෘක්ෂය කඩා වැටීම හේතුවෙන් එය ඉවත් කිරීම සඳහා යුද හමුදා සේවා සහය ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

xxi. පසුගිය දිනයන් හි ඇදහැලුනු වර්ෂාපතනය හේතුවෙන් බදුල්ල දිස්ත්‍රික්කයේ හාලිඇල අධ්‍යාපන කාර්යාලයේ ගොඩනැගිල්ලක් වෙත පස්කණ්ඩියක් කඩාවැටීම හේතුවෙන් එම පස්කණ්ඩිය ඉවත්කර ගැනීම සඳහා යුද හමුදා සේවා සහය ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

ඇ. නාවික හා ගුවන් මෙහෙයුම්

i. 2024 ජනවාරි මස 01 වන දින සිට 2024 දෙසැම්බර් මස 31 වන දින දක්වා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය වෙතින් නියමුවන් රහිත යානා ක්‍රියාකරවීම සඳහා ආරක්ෂක නිෂ්කාශන ලබා ගැනීමට අයදුම්කරුවන් 9,550 ක් ඉල්ලුම්කර ඇත.

ii. 2024 ජනවාරි මස 01 වන දින සිට 2024 දෙසැම්බර් මස 31 වන දින දක්වා කාල සීමාව තුළදී උස් ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා ආරක්ෂක නිෂ්කාශන වාර්තා ලබා ගැනීම සඳහා අයදුම්පත් 03ක් ඉදිරිපත් කර ඇති අතර, ඒ සඳහා ආරක්ෂක නිෂ්කාශන වාර්තා ලබාදී ඇත.

2. ශ්‍රී ලංකා යුද හමුදාව

ශ්‍රී ලංකා යුද හමුදාව දේශයේ ඒකීයත්වය ස්වෛරීත්වය හා භෞමික අඛණ්ඩතාවය සුරැකීමේ ප්‍රධාන වගකීමෙන් බැඳුණු ගොඩබිම් ක්‍රියාන්විත සඳහා වන විශාලතම හමුදා සේවයයි. තම රාජකාරී ඉහළ වෘත්තීමයභාවයකින් යුතුව ඉටුකරමින් සාමකාමී පරිසරයක් නිර්මාණය කිරීමට සහ රටේ ආරක්ෂාව සහ සෙසු කටයුතු වලට ශ්‍රී ලංකා යුද හමුදාව අසමසම දායකත්වයක් දරනු ලැබේ.

අ. ආයතනයේ සාමාන්‍ය කටයුතුවල ප්‍රගතිය

i. රාජ්‍ය මූල්‍ය කටයුතු විනිවිදභාවයෙන් හා වගවීමෙන් පවත්වාගෙන යාම තහවුරු කිරීම සඳහා අභ්‍යන්තර විගණන කටයුතු සිදුකරන අතර, මේ වනවිට සම්පූර්ණ අභ්‍යන්තර විගණන 238 ක සංඛ්‍යාවක් සිදුකර ඇත. කළමනාකරණ විගණන චක්‍රලේඛ අනුව ඉදිරිපත් කළයුතු වාර්තා නියමිත කාලසීමාව තුළ ඉදිරිපත්කර ඇති අතර, කළමනාකරණ විගණන රැස්වීම් නියමිත පරිදි සිදුකර ඇත.

ii. වත්කම් කළමනාකරණ අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් 2024.12.31 දින වන විට විවිධ කාර්යයන් මඟින් උපයන ලද ආදායම් මුදල් රජයේ ඒකාබද්ධ අරමුදල වෙත බැරකර ඇති මුදලේ වටිනාකම රු. 31,778,565.65 ක් වේ.

iii. 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා කාලය තුළ නැතිවීම් හා අලාභ හානිවීම් සම්බන්ධ සිදුවීම් 105 කට අදාළ ලිපිගොනු අවසන්කර ඇත. එම සිදුවීම් 105 අතුරින් සිදුවීම් 66 කට අදාළව මුදල් රෙගුලාසි 109 යටතේ රු. මිලියන 141.48 ක වටිනාකමක් පොත්පත් වලින් කපාහැර ඇත. තවද, ඉන්

සිදුවීම් 39 කට අදාළව රු මිලියන 2.29ක මුදලක් වගකිවයුතු අයවලුන්ගෙන් අයකර ගැනීමෙන් පසු ගිණුම් කටයුතු නිරවුල්කර ඇත.

ආ. සාමසාධක මෙහෙයුම් සඳහා සහභාගි වීම

i. හට පිරිස් රපෝර්තු කරවීමේ සාරාංශය

අ/අ	හටපිරිස් ස්ථානගතකර ඇති රාජ්‍ය	හටපිරිස් සංඛ්‍යාව	
		නිලධාරි	සෙසුනිල
1	ලෙබනන්	11	114
2	දකුණු සුඩානය	17	49
එකතුව		**28**	**163**

ii. සාමසාධක රාජකාරී සඳහා රැගෙන යන ලද භාණ්ඩ/උපකරණ වෙනුවෙන් ලද විදේශ විනිමය අදායම

- 2024 වර්ෂයේ I වන සහ II වන කාර්තූන් සඳහා ලද විදේශ විනිමය ආදායම - ඇ.ඩො 2,466,266.10
- 2024 වර්ෂයේ III වන සහ IV වන කාර්තූන් සඳහා ලැබීමට නියමිත හිඟ විදේශ විනිමය ආදායම - ඇ.ඩො 1,166,813.70

ඇ. අන්තර්ජාතික ක්‍රීඩා ජයග්‍රහණ - 2024

අ/අ	තරඟාවලි	ජයග්‍රහණ		
		රන් පදක්කම	රිදී පදක්කම	ලෝකඩ පදක්කම
1	19	10	12	49

ඈ. යුද හමුදාව තුළ කඩදාසි භාවිතය අවම කිරීම (තාක්ෂණික ප්‍රගතිය)

i. යුද හමුදාව තුළ කඩදාසි භාවිතය අවම කිරීම සඳහා Army Digital Correspondence Platform (ADCP) නමින් මෘදුකාංග පද්ධතියක් 2024/2025 වර්ෂයන්හිදී සියලු යුද හමුදා ආයතන වෙත හඳුන්වාදීමේ කටයුතු මේ වන විට සිදුකරමින් පවතී.

ඉ. කෘෂි කර්මාන්තය සඳහා ශ්‍රී ලංකා යුද හමුදාව වෙතින් ලබාදී ඇති දායකත්වය

i. 2024 වර්ෂයේදී ශ්‍රී ලංකා යුද හමුදාව සතු ගොවිපල හා ජාතික පශුසම්පත් සංවර්ධන මණ්ඩලය සතු භාවිතා නොකරන ඉඩම් උපයෝගි කර ගනිමින් ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාවය ඉහළ නැංවීම සඳහා කෙටි කාලීන/දිගුකාලීන බෝග වගා ව්‍යාපෘතීන් ආරම්භ කර ඇත.

අ/අ	වගාව	භූමිය (අක්කර)
1	මිරිස්	55
2	පොල්	836
3	අඹ	178
4	ගස්ලබු	4
5	කැරට්	20
6	ගෝවා	25

අ/අ	වගාව	භූමිය (අක්කර)
7	ලීක්ස්	15
8	අර්තාපල්	10
9	වී	62
10	බඩ ඉරිගු	7
11	වැල් දොඩම්	1.5

ඊ. **ක්‍රියාත්මක කර ඇති සංවර්ධන වැඩසටහන්/ව්‍යාපෘති**

අ/අ	වැඩසටහන/ ව්‍යාපෘතිය	ඇස්තමේන්තුගත මුළු පිරිවැය (රු.මි.)	2024 වර්ෂය සඳහා වෙන් වූ ප්‍රතිපාදන (රු.මි.)	2024.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මි.)		2024.12.31 දිනට භෞතික ප්‍රගතිය (%)	
				වියදම	සමුච්චිත වියදම	භෞතික ප්‍රගතිය	සමුච්චිත භෞතික ප්‍රගතිය
1	යාපනය, පලාලි ජාත්‍යන්තර ගුවන් තොටුපල ප්‍රදේශයේ ඇති පඳුරු සහිත කැළෑ ප්‍රදේශය එළිකිරීම	12.57	12.57	7.046		100%	100%
2	ගලේවෙල ප්‍රාදේශීය සභාව අවට මහජන ආරක්ෂාව සඳහා මහජනතාව එක්රැස් වන ස්ථානයේ ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය	43.29	මෙම ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තුගත වටිනාකම 2023 වර්ෂයේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් මාතලේ දිස්ත්‍රික් ලේකම් වෙත නිකුත් කර ඇත. (මෙම ව්‍යාපෘතිය සඳහා යුද හමුදා යන්ත්‍ර/වාහන හා හටපිරිස් පමණක් යොදවා ඇත)			100%	100%

උ. **වෙනත් සංවර්ධන ව්‍යාපෘති**

අ:අ	දිස්ත්‍රික්කය	ව්‍යාපෘතිය පිළිබඳ විස්තර	ඇස්තමේන්තුගත වියදම (රු.මි.)
1	අනුරාධපුර	අනුරාධපුරයේ සඳහිරුසෑය ස්ථූපය ඉදිකිරීම	ශ්‍රම දායකත්වය
2	අම්පාර	දීඝවාපිය චෛත්‍යය ප්‍රතිසංස්කරණය කිරීම	ශ්‍රම දායකත්වය

ඌ. **ආදායම් උපයන ව්‍යාපෘති/කාර්යයන්**

ශ්‍රී ලංකා යුද හමුදාව විසින් 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා කාලසීමාව තුළ එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් රාජකාරී වෙනුවෙන් උපයන ලද ආදායම, වියදම සහ ලැබීමට නියමිත ආදායම පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.

අ:අ	විස්තරය	(ඇ.ඩො)	(රු)
1	උපකරණ සඳහා ලද ආදායම (M/E)	1,391,642.51	422,402,399.05
2	ස්වයං නඩත්තු සේවා සඳහා ලද ආදායම (S/S)	1,074,623.59	325,094,182.13
3	වැටුප් වෙනුවෙන් මේ දක්වා ලද මුදල	4,614,959.89	1,391,642,271.64
4	සත්‍ය වියදම 2024.11.30 (USD 1 = RS 292.31)	691,474.71	202,124,972.38
5	වැටුප් වෙනුවෙන් තවදුරටත් ලැබිය යුතු ආදායම (USD 1 = RS 292.31)	829,704.00	242,530,776.24
6	උපකරණ සඳහා තවදුරටත් ලැබිය යුතු ආදායම (ME) (USD 1 = RS 292.31)	502,222.42	146,804,635.59
7	ස්වයං නඩත්තු සේවා තවදුරටත් ලැබිය යුතු ආදායම (SS) (USD 1 = RS 292.31)	533,588.16	155,973,155.05

ඒ. **2024 වර්ෂය තුළ ආරම්භ කර ඇති මූලධන සේවාවන්හි ප්‍රගතිය**

i. ශ්‍රී ලංකා යුද හමුදාවේ සේවයේ නියුතු නිලධාරි/සෙසු නිලයින්ගේ සුබසාධන/ පුහුණු කටයුතු වෙනුවෙන් 2024 වර්ෂය තුළ ආරම්භ කර ඇති ඉදිකිරීම්/ ව්‍යාපෘති පහත සඳහන් පරිදි වේ.

අ/අ	වැඩසටහන/ව්‍යාපෘතිය	**2024** භෞතික ප්‍රගතිය
1	7 කාඉරෙ 80'-9"x20' දෙමහල් නිලධාරි නිවස්නය	85%
2	4 ශ්‍රීලපාහ 100'x20' සෙසුනිල නේවාසිකාගාරය	50%
3	1 ගරෙ 100'x20' දේශන ශාලාව	60%
4	5(සෙව්) ගරෙ 100'x30' කාර්යාල ගොඩනැගිල්ල	50%
5	රෙම විපාරෙ 36.2mx8.4m තෙමහල් සෙසුනිල නේවාසිකාගාරය	70%
6	විබපුපා 100' උස 40'x40' පුහුණු ආධාරක කුළුණ (රැප්ලිං කුළුණ)	40%
7	රෙමඉසේබ 100'x92' සිව්මහල් බනි/සැර නිවස්න නේවාසිකාගාරය	70%
8	8 ශ්‍රීලයුසේබ 144'x30' ගබඩා ගොඩනැගිල්ල	85%
9	රෙම ශ්‍රීලංසිරෙ 150' - 9" x 58' - 10" උත්සව ශාලාව	80%
10	රෙම ශ්‍රීලංසංබ 116'x32' තෙමහල් බනි/සැර නිවස්නය	40%
11	රෙම යාපාරෙ 144'x66'-4" කාය වර්ධනාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම	40%
12	රෙමශ්‍රීලයුපොදුසේබ 120'x20' කාන්තා සෙසුනිල හට නිවාසය	30%

3. ශ්‍රී ලංකා නාවික හමුදාව

අ. ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා වන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම

i. නාවික හමුදා ප්‍රතිපත්තිවලට අනුව ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන ක්‍රියා, නීති විරෝධී අවි ජාවාරම්, නීති විරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම්, නීති විරෝධී සංක්‍රමණිකයින් රට තුළට ඇතුළුවීම්, රේගු නීති උල්ලංඝනය කිරීම්, නීති විරෝධී මසුන් මැරීම හා සාගරය දූෂණය කිරීම් වැනි ක්‍රියාකාරකම් මැඩලීම සඳහා දේශීය සහ විදේශීය බුද්ධි අංශ සමඟ සම්බන්ධීකරණය වී කටයුතු කරන ලදී.

ii. පවතින අඩු මිනිස් බලය තුළින් විශාල භූමි ප්‍රමාණයක් ආවරණය කිරීම සඳහා ATV සහ යතුරුපැදි කණ්ඩායම් පුහුණු කොට වෙරළ තීරයේ සිදු වන අනවසර ක්‍රියාකාරකම් පාලනය කිරීමට කටයුතු කරන ලදී.

ආ. නාවික හමුදා පුද්ගලයින්හට වැටුප් හා දීමනා ගෙවීම

විස්තරය	වැටුප් හා දීමනා රු.
මූලික වැටුප - නිත්‍ය	රු. 14,653,048,032.50
මූලික වැටුප - ස්වේච්ඡා	රු. 4,547,438,272.50
අනෙකුත් දීමනා - නිත්‍ය	රු. 19,597,685,331.48
අනෙකුත් දීමනා - ස්වේච්ඡා	රු. 6,568,665,171.87
එකතුව	රු. 45,366,836,808.35

ඇ. නාවික හමුදා පුද්ගලයින්හට උසස්වීම් ලබා දීම

නිලධාරීන්

අ/අ	උසස් කරන ලද නිලය	උසස් කරන ලද ගණන
1	අද්මිරාල්	01
2	වයිස් අද්මිරාල්	01
3	රියර් අද්මිරාල්	17
4	කොමදෝරු	23
5	කපිතාන්	48
6	කොමාණ්ඩර්	103
7	ලුතිනන් කොමාණ්ඩර්	163
8	ලුතිනන්	104
9	උප ලුතිනන්	125
10	වැඩ බලන උප ලුතිනන්	118
11	මධ්‍ය නිලධාරි	76
එකතුව		**779**

නාවිකයින්

අ/අ	උසස් කරන ලද තරාතිරම	උසස් කරන ලද ගණන
1	පාලක ප්‍රධාන සුළු නිලධාරි	374
2	සමූහ ප්‍රධාන සුළු නිලධාරි	1,051
3	ප්‍රධාන සුළු නිලධාරි	1,439
4	සුළු නිලධාරි	1,793
5	නායක නැවි	909
6	බල නැවි	935
7	සාමාන්‍ය නැවි	788
එකතුව		**7,289**

ඇ. නාවික හමුදා පුද්ගලයින් හට පුහුණු හා පාඨමාලා ලබා දීම

පාඨමාලා වර්ගය	පුහුණුව ලැබූ ප්‍රමාණය	
	නිලධාරීන්	නාවිකයින්
අභ්‍යන්තර	530	8,814
බාහිර	676	1,445
විදේශීය	189	52
විභාග	196	4,431

ඉ. නාවික හමුදා පුද්ගලයින් හට පදක්කම් පිරිනැමීම

අ/අ	පදක්කම	නාවික පුද්ගලයින් ගණන
1	ශ්‍රී ලංකා සන්නද්ධ සේවා දීර්ඝ සේවා පදක්කම	773
2	ප්‍රශංසනීය සේවා විභූෂණය සහ ප්‍රශංසනීය සේවා පදක්කම	58
3	එක්සත් ජාතීන්ගේ සාම සාධක පදක්කම	3
4	නාවික හමුදාධිපතිගේ ප්‍රශංසාත්මක පළඳනාව	388
5	ජාතික ආරක්ෂක විද්‍යාලයීය පාඨමාලාව සඳහා වූ පළඳනාව	8
6	මුහුදු සංග්‍රාමික පළඳනාව	791
7	මුහුදු විධාන පළඳනාව	10
8	4 වන වේග ප්‍රහාරක මුර යාත්‍රා පළඳනාව	775
9	ලෝක සමුද්‍ර විශ්ව විද්‍යාලය පළඳනාව	1
10	මාණ්ඩලික නිලධාරී සුදුසුකම් ලැබීමේ පුහුණු පළඳනාව	29
11	නාවික ගුවන් නිරීක්ෂණ පළඳනාව	7
12	පූර්ණ කාලීන පාඨමාලාවන් සඳහා වූ පළඳනාව	16

ඊ. නාවික හමුදා පුද්ගලයින්ගේ සුබසාධනයට අදාළ කටයුතු ඉටු කිරීම

i. ඉඳුරාම ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් මියගිය සහ අතුරුදහන් වූ නාවික පුද්ගලයින්ගේ ළඟම ඥාතීන් සහ ආබාධිතව විශ්‍රාම ගන්වන ලද නාවික පුද්ගලයින් සහ ඔවුන්ගේ පවුල් සඳහා වාර්ෂිකව සිදු කරනු ලබන සුවදුක් විමසීමේ වැඩසටහන 2024 වර්ෂය සඳහා දෙසැම්බර් මාසය තුළ ක්‍රියාත්මක කරන ලද අතර, එහිදී ප්‍රේෂණපත් මඟින් රු.15,144,000.00ක වටිනාකමින් යුතු මුදලක් සහ නාවික දින දර්ශන නාවික පුද්ගලයින් සහ ඔවුන්ගේ පවුල් සඳහා ලබා දීමට කටයුතු කරන ලදී.

ii. ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී මියගිය/ අතුරුදහන් වූ නාවික පුද්ගලයින්ගේ ළඟම ඥාතීන් සහ ආබාධිත විශ්‍රාමික නාවික පුද්ගලයින් වෙත ඔවුන්ගේ හදිසි ප්‍රතිකාර සඳහා සහ සුබසාධන කටයුතු වෙනුවෙන් ප්‍රතිලාභීන් 42ක් සඳහා රු. 7,973,133.21ක මූල්‍යාධාර ලබා දීමට කටයුතු කර ඇත.

iii. ශ්‍රී ලංකා නාවික හමුදා සේවයෙන් විශ්‍රාම ගොස් සිටියදී මිය ගිය නාවික පුද්ගලයින්ගේ අවමංගල්‍යකදී අවමංගල්‍යාධාර මුදලක් වශයෙන් ළඟම ඥාතීන් හට රු. 100,000.00ක මුදලක් ලබා දෙනු ලබන අතර, 2024 වර්ෂය සඳහා මියගිය විශ්‍රාමික නාවික පුද්ගලයින් 47 දෙනෙකුගේ ළඟම ඥාතීන් හට රු. 4,700,000.00ක මුදලක් අවමංගල්‍යාධාර ලෙස ලබා දී ඇත.

iv. නැවිරු සවිය (නාවික සුවසහන) අරමුදල මඟින් 2024 වර්ෂය තුළ නාවික හමුදා සාමාජිකයින් සහ ඔවුන්ගේ ළඟම ඥාතීන් සඳහා බරපතල රෝගාබාධ හා සැත්කම් වෙනුවෙන් රු. 313,107,688.77ක මුදලක් ලබා දී ඇත.

v. ආරක්ෂක අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන ක්‍රියාන්විතයේදී දිවි පිදූ, ආබාධිත වූ හා අතුරුදන් වූ නාවික පුද්ගලයින් වෙනුවෙන් 'මෙත් සෙවණ' නිවාස ව්‍යාපෘතිය මඟින් නිවාස 06 ක් ලබා දී ඇති අතර, එම නිවාසවල ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවති. එමෙන්ම, ආරක්ෂක අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන සේවයේ නියුතු හා විශ්‍රාමික නාවික පුද්ගලයින් වෙනුවෙන් 'අපි වෙනුවෙන් අපි' නිවාස ව්‍යාපෘතිය යටතේ අර්ධ නිවාස 87ක් ලබා දී ඇති අතර, එම නිවාස 87 අතරින් නිවාස 19ක වැඩ කටයුතු අවසන් කර ඇත.

vi. 2024 වර්ෂය තුළ නාවික සමාජීය මෙහෙවර අරමුදල (ස්වේච්ඡා දායක සමුච්චිත අරමුදල්) මඟින් ශල්‍යකර්ම සහ වෛද්‍යාධාර ලබා දීම සඳහා රු.35,895,271.63 ක මුදලක් ලබාදී ඇත.

උ. මුහුදු සීමා උල්ලංඝනය කරමින් නීති විරෝධී භාණ්ඩ හා සේවා ජාවාරම් වැළැක්වීම

i. අවි ආයුධ අත්අඩංගුවට ගැනීම් සහ සොයා ගැනීම්

අ/අ	විස්තරය	ප්‍රමාණය
1	දේශීය නිෂ්පාදිත ගිනි අවි	09
2	අත් බෝම්බ	02
3	මිමි 60 මෝටාර් බෝම්බ	01
4	දුම් බෝම්බ	02
5	පුද්ගල නාශක බෝම්බ	04
6	මිමි 7.62 x 45 ජීව උණ්ඩ	02
7	පැති අවි ජීවී උණ්ඩ	04
8	ක්ලේමෝර් බෝම්බ	02
9	මිමි 7.62 x 54 ජීව උණ්ඩ	15
10	මිමි 7.62 x 39 ජීව උණ්ඩ	4,523
11	වෝටර් ජෙල් කරල්	665
12	TNT	ග්‍රෑම් 170
13	දේශීය නිෂ්පාදිත චාජර්ස්	122
14	විදුලිමය නොවන ඩෙටනේටර්	30
15	සේවා නූල	අගල් 16
16	LTTE නිල ඇඳුම්	03
17	අත්අඩංගුවට ගත් පුද්ගලයින්	16

ii. නීති විරෝධී ධීවර කටයුතුවල දී අත්අඩංගුවට ගැනීම්

අ/අ	විස්තරය	ප්‍රමාණය
1	ට්‍රෝලර් යාත්‍රා (දේශීය)	09
2	ට්‍රෝලර් යාත්‍රා (ඉන්දියානු)	73
3	ඩිංගි යාත්‍රා	278
4	වල්ලම්	02
5	නීති විරෝධී දැල් ආම්පන්න	2594
6	වෝටර් ජෙල්	කි.ග්‍රෑ. 99.70
7	අත්අඩංගුවට ගත් පුද්ගලයින් (දේශීය)	927
8	අත්අඩංගුවට ගත් පුද්ගලයින් (ඉන්දියානු)	554

iii. නීති විරෝධී වෙනත් ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම් සහ සොයා ගැනීම්

අ/අ	විස්තරය	ප්‍රමාණය
1	බීඩි කොළ	කි.ග්‍රෑ. 52355.12
2	දුම්වැටි	26890
3	මත්පැන්	බෝතල් 226
4	බියර්	කෑන් 137
5	කෘමි නාශක	බෝතල් 433ක් සහ පැකට් 27,169
6	රත්‍රං	කි.ග්‍රෑ. 4.74
7	ගජමුතු	11
8	කැස්බෑ මස්	කි.ග්‍රෑ. 35.90
9	හරක් මස්	කි.ග්‍රෑ. 70
10	අම්බර්	කි.ග්‍රෑ. 64.22
11	කහ	කි.ග්‍රෑ. 6237.20
12	වාලම්පුරි	11
13	හක් බෙල්ලෝ	19846
14	ගවයින්	8
15	කපුු	කි.ග්‍රෑ. 50
16	ඉඟුරු	කි.ග්‍රෑ. 368.85
17	වල් ඌරු මස්	කි.ග්‍රෑ.7
18	පැරණි කාසි	263
19	ව්‍යාජ මැණික්	11
20	අත්අඩංගුවට ගත් පුද්ගලයින්	127

ඌ. අන්තර්ජාතික ආරක්ෂක සහයෝගීතාව හා සාම සාධක රාජකාරී

i. 2024 ජනවාරි මස 01 වන දින සිට 2024 දෙසැම්බර් මස 31 වන දින දක්වා නිලධාරින් දෙදෙනෙකු එක්සත් ජාතික සාමසාධක රාජකාරී සඳහා විදෙස්ගත කිරීමට කටයුතු කර ඇත.

ii. ඉන්දියාව, පකිස්ථානය සහ බංගලාදේශය වැනි රටවල්වල සහභාගීත්වය ඇතිව "Blue whale" භූජලතරණ අභ්‍යාසය සාර්ථකව පැවැත්වීම මඟින් කලාපීය රටවල නාවික හමුදා සමඟ සහයෝගීතාවය වර්ධනය සහ දැනුම බෙදාගැනීමට කටයුතු කර ඇත.

එ. මත්ද්‍රව්‍ය උවදුරෙන් නිදහස් රටක් ඇති කිරීම සඳහා වන උපායමාර්ග

i. නාවික හමුදා බුද්ධි අංශ සාමාජිකයින් විසින් සපයනු ලැබූ තොරතුරුවලට අනුව 2024 වර්ෂය තුළ අත්අඩංගුවට ගන්නා ලද/ සොයා ගන්නා ලද නීති විරෝධී මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

අ/අ	මත් ද්‍රව්‍ය වර්ගය	මත්ද්‍රව්‍ය ප්‍රමාණය
1	හෙරොයින්	කි.ග්‍රෑ. 622.83
අ/අ	**මත් ද්‍රව්‍ය වර්ගය**	**මත්ද්‍රව්‍ය ප්‍රමාණය**
2	ක්‍රිස්ටල් මෙතපිටමයින් (අයිස්)	කි.ග්‍රෑ. 1,211.51
3	කේරළ ගංජා	කි.ග්‍රෑ. 1,483.34
4	දේශීය ගංජා	කි.ග්‍රෑ. 119.86 පැල 1,07626
5	මෝදක	952
6	මත්පෙති	1,178,237.00
7	කසිප්පු	ලීටර් 100
8	ගෝඩා	ලීටර් 440
9	අත්අඩංගුවට ගත් පුද්ගලයින්	215

ii. 2024 වර්ෂය තුළ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් 924 ක ප්‍රමාණයක් සියලුම නාවික විධානයන් ආවරණය වන පරිදි පැවැත්වීමට කටයුතු කිරීම සහ මත්ද්‍රව්‍ය හා විවිධ ඇබ්බැහිවීම්වලට ගොදුරු වූ නාවික පුද්ගලයින් 49 ක ප්‍රමාණයක් පුනරුත්ථාපනය කර සමාජගත කිරීමට කටයුතු කිරීම.

ඒ. ග්‍රාමීය ප්‍රජා ආරක්ෂාව හා සුබසාධනය සහ ජීවනෝපාය දායකත්වය, රැකියා උත්පාදනය හා ආපදා කළමනාකරණයට සහය දැක්වීම.

i. දැනට ශ්‍රී ලංකාව තුළ තැලසීමියා රෝගීන් 3500 - 4000 අතර ප්‍රමාණයක් වාර්තා වන අතර, මෙය නව දරු උපත් සමඟ වාර්ෂිකව වැඩි වීමකට ලක්වේ. මෙම රෝගීන් සඳහා අත්‍යාවශ්‍ය Desferrioxamine infusion system එක් පද්ධතියක් පිටරටින් ආනයනය කිරීම සඳහා රු. 100,000.00ක පමණ මුදලක් වැය වන අතර 2011 වර්ෂයේ සිට නාවික හමුදාව මඟින් එකක් රු.10,000.00ක පමණ මුදලකට වර්ෂයකදී පද්ධති 400ක ප්‍රමාණයක් නිපදවීමට කටයුතු කර ඇත. මේ සඳහා සියලු නාවික පුද්ගලයන්ගේ දායකත්වයෙන් පවත්වාගෙන යනු ලබන නාවික සමාජ මෙහෙවර අරමුදලෙන් සිදුකරනු ලබයි. තවද, 2023 සහ 2024 වර්ෂයන්වලදී සෞඛ්‍ය අමාත්‍යාංශයේද සහයෝගය ලබා දී ඇති අතර, රෝගීන්ගේ සුබසාධනය සඳහා නාවික හමුදාව මඟින් මෙම කටයුත්ත ඉදිරියටත් සිදු කිරීමට බලාපොරොත්තු වේ. දැනට පද්ධති 3,164 ක් නිපදවා සෞඛ්‍ය අමාත්‍යාංශයට ලබා දී ඇත.

ii. සොරොව් අලුත්වැඩියා කිරීම්, ආගමික උත්සව, ජල ක්‍රීඩා තරඟ, ගංවතුර තත්ත්වයන්, ඉදිකිරීම් සහ සංවර්ධන යන කටයුතුවලදී අවස්ථාවන් 48ක දී කිමිදුම් කණ්ඩායම්හි දායකත්වය ලබා දීමට කටයුතු කර ඇත.

iii. ආගමික උත්සව, ගංවතුර තත්ත්වයන් සහ ජල ක්‍රීඩා තරඟ යන කටයුතු සඳහා අවස්ථා 23ක දී ජීවිතාරක්ෂක රාජකාරි වෙනුවෙන් ජීවිතාරක්ෂක කණ්ඩායම්හි දායකත්වය ලබා දී ඇත.

iv. 2024 ජනවාරි 01 සිට 2024 දෙසැම්බර් 31 දක්වා මෘත ශරීර 38 ක් සෙවීමේ කටයුතු සඳහා සහභාගී වී ඇති අතර, ඉන් මෘත ශරීර 13 ක් සොයා ගෙන ඇත.

v. 2024 ජූලි මස 03 වන දින 1930 පැයට කුරිකට්ටුවාන් ජැටියේ සිට නාගදීප ජැටිය වෙත බඩු ප්‍රවාහනය කරමින් තිබූ සිවිල් යාත්‍රාවක් පෙරලී අනතුරට පත් වූ පිරිස බේරාගැනීමටත්, 2024 සැප්තැම්බර් මස 09 වන දින කුරිකට්ටුවාන් ජැටියේ සිට ඩෙල්ෆ් දූපත දක්වා ගමන් කිරීමට තිබූ සිවිල් යාත්‍රාවකට නැඟීමට ගොස් ජලයට වැටී අනතුරට පත් වූ සිවිල් පුද්ගලයෙකු බේරා ගැනීමට සහ 2024 නොවැම්බර් මස 27 වන දින ගං වතුර ආපදාවට ලක්ව සිටි දුටුවැව ප්‍රදේශයේ ගසක රැඳී සිටි පුද්ගලයෙකු බේරා ගැනීමට කටයුතු කර ඇත.

ඔ. බාහිර ආයතන සඳහා සිදු කරන ලද ව්‍යාපෘතීන්

අ/අ	විස්තරය	ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල (රු. මිලි)	2024 වර්ෂය තුළ නිම කරන ලද ව්‍යාපෘති ගණන	2024 වර්ෂය තුළ නිම නොවූ ව්‍යාපෘති ගණන	2024 වර්ෂය තුළ සිදු කරන ලද මුළු ව්‍යාපෘති ගණන
1	ආගමික ස්ථාන	1,711.80	34	66	100
2	ආගමික නොවන ස්ථාන	11,042.73	56	32	88

ඕ. නාවික පර්යේෂණ හා සංවර්ධන ඒකකය (ප්‍රති ආශ්‍රැතිකරණ යන්ත්‍ර) විසින් සිදු කරන ලද ව්‍යාපෘති පිළිබඳ විස්තර

ජනාධිපති ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කර සිදු කරන ලද ව්‍යාපෘති		සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර සිදු කරන ලද ව්‍යාපෘති		විවිධ පරිත්‍යාගශීලීන් විසින් ඉදිරිපත් කර සිදු කරන ලද ව්‍යාපෘති		එකතුව	
වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති	වැඩ සිදු කරමින් පවතින ව්‍යාපෘති	වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති	වැඩ සිදු කරමින් පවතින ව්‍යාපෘති	වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති	වැඩ සිදු කරමින් පවතින ව්‍යාපෘති	වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති	වැඩ සිදු කරමින් පවතින ව්‍යාපෘති
45	46	05	-	37	09	87	55

ඖ. නාවික පුද්ගලයින් සහ සිවිල් ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය නගා සිටුවීම සඳහා සහය දැක්වීම

i. නිරෝගිමත් නාවික හමුදාවක් (Healthy Navy) - මෙම වැඩසටහන මඟින් නාවික පුද්ගලයන් හට බෝ නොවන රෝග (NCDs) ඇති වීම අවම කිරීම සඳහා සෞඛ්‍යමය පුරුදු ඇති කිරීම, ව්‍යායාම කිරීම සඳහා පෙළඹවීම, නිවැරදි පෝෂණය සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම සහ සෞඛ්‍ය අධ්‍යාපනය ලබා දීම.

ii. Healthy Living Center HLC - මෙම වැඩසටහන සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් වලට සමගාමීව සුවදිවි මධ්‍යස්ථානය මඟින් දියවැඩියාව, අධි රුධිර පීඩනය සහ තරබාරුකම වැනි බෝ නොවන රෝග සම්බන්ධයෙන් දිනපතා සෞඛ්‍ය අධ්‍යාපන දැනුවත් කිරීම් නාවික රෝහල්වල සිදු කිරීම.

iii. සියලුම නාවික කඳවුරු ආවරණය වන පරිදි එම ආයතනයන්හි රාජකාරී නියුතු සියලුම නාවික පුද්ගලයින් සඳහා බෝ නොවන රෝග සම්බන්ධයෙන් දැනුවත් කිරීම සහ සෞඛ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන්, ලිංගාශ්‍රිත රෝග බෝ වීම වැළැක්වීම, පෞද්ගලික සනීපාරක්ෂාව, ආහාර ආරක්ෂාව, මාර්ග අනතුරු වළක්වා ගැනීම සහ බෝ නොවන රෝග පිළිබඳ විශේෂ වැඩසටහන් පැවැත්වීම.

iv. කිමිදුම් වෛද්‍ය ප්‍රතිකාර (Diving Treatment – Decompression Sickness) 2024 වර්ෂයෙදී දේශීය සහ විදේශීය කිමිදුම්කරුවන් 07 දෙනෙකු හට සිදු වූ කිමිදුම් රෝගී තත්ත්වයන් වලදී ඔවුන් හට ප්‍රතිකාර කටයුතු සිදු කිරීම.

v. රජයේ රෝහල් වල සිදු වන වැඩ වර්ජන අවස්ථාවන්හිදී රෝහල් කටයුතු අඛණ්ඩව සිදු කර ගෙනයාම සඳහා නාවික හමුදා වෛද්‍ය කාර්ය මණ්ඩලයේ සහයෝගය ලබා දීම.

vi. දිවයින තුළ උද්ගතවන ස්වභාවික ව්‍යසන අවස්ථාවන් වලදී සිවිල් ප්‍රජාව වෙත වෛද්‍ය පහසුකම් සැපයීම.

vii. සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් සංවිධානය කරන විවිධ නිවාරණ වැඩසටහන් සහ පා ගමන් සඳහා නාවික හමුදාවේ සහභාගීත්වය ලබා දීම.

viii. රජයේ රෝහල් හා සම්බන්ධීකරණය වී සියලුම නාවික විධානයන් ආවරණය වන පරිදි ලේ දන් දීමේ වැඩසටහන් පැවැත්වීම (2024 වර්ෂය සඳහා වැඩසටහන් 24 ක් සිදු කර ඇත)

ix. නාවික පුද්ගලයින්, නාවික පුද්ගලයින්ගේ පවුල්වල සාමාජිකයින්, නාවික හමුදා සිවිල් සේවකයින්, විශ්‍රාමික නාවික හමුදා පුද්ගලයින්, ආබාධිත නාවික පුද්ගලයින්, ආරක්ෂක අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය සහ ජනාධිපති ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර නාවික රෝහල් මඟින් ලබා දීම.

x. නාවික හමුදා පුද්ගලයින්ගේ සහ සිවිල් ජනතාවගේ මුඛ සෞඛ්‍ය තත්ත්වය උසස් මට්ටමකට ළඟාකර ගැනීම සඳහා විධාන දන්ත ශල්‍යාගාර හා ජංගම දන්ත ශල්‍යාගාර බස් රථය මඟින් සියලුම නාවික විධානයන් දිවයිනේ විවිධ ප්‍රදේශ ආවරණය වන පරිදි ජංගම දන්ත වෛද්‍ය සායන හා මුඛ සෞඛ්‍ය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

ඔ. නාවික හමුදාව ලද සුවිශේෂී ජයග්‍රහණ

i. ශ්‍රී ලංකා නාවික හමුදා පුද්ගලයින් විසින් 2024 වර්ෂය තුළ පහත සඳහන් ප්‍රධාන ක්‍රීඩා ජයග්‍රහණ ලබා ගැනීමට කටයුතු කර ඇත.

අ/අ	ක්‍රීඩා තරඟාවලිය සම්බන්ධ විස්තර	රන් පදක්කම්	රිදී පදක්කම්	ලෝකඩ පදක්කම්
1	18 වන ජාතික වූෂූ ශූරතාවලිය 2024	17	04	06
2	NSSF ශ්‍රී ලංකා රයිෆල්/පිස්ටල් විවෘත තරඟාවලිය 2024	07	08	03
3	ජාතික මල්ලවපොර ශූරතාවලිය 2024	07	04	05
4	06 වන ලෝක ශූරතා කැරම් තරඟාවලිය 2024 - ඇමරිකාව (කැලිෆෝනියා)		02	
5	60 වන ජාතික ජූඩෝ ශූරතාවලිය 2024	02	01	05
6	ශ්‍රී ලංකා මුෂ්ටි ප්‍රහාරක සම්මේලන තරඟාවලිය 2024	03	03	10
7	ජාතික කරාතේ ශූරතාවලිය 2024	04	03	08
8	75 වන Mr.Sri Lanka කායවර්ධන ශූරතාවලිය 2024	01	04	
9	ජාත්‍යන්තර ජූඩෝ ශූරතාවලිය 2024 - තායිලන්තය	නායක කාන්තා නැවි කේවීඑස්ඩී කුමාරසිංහ ඩබ්වීඑස් 73587 විසින් ලෝකඩ පදක්කම දිනාගන්නා ලදී.		
10	GRAND SLAM කැරම් තරඟාවලිය 2024	නායක කාන්තා නැවි ජේ රොෂිතා ඩබ්වීඑස් 74028 විසින් ශූරතාවය දිනාගන්නා ලදී.		

ii. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය මඟින් සංවිධානය කරන ලද "ටෙක්නො ශ්‍රී ලංකා" නව නිපැයුම් ප්‍රදර්ශනයේ දී ශ්‍රී ලංකා නාවික හමුදාවේ සිවිල් ඉංජිනේරු අංශය වෙනුවෙන් නැගෙනහිර නාවික විධානය, දකුණු නාවික විධානය සහ උතුරු නාවික විධානයන් වෙතින් ඉදිරිපත් කරන ලද නව නිපැයුම් සඳහා සම්මාන ලබා ගැනීම.

iii. 2024 වර්ෂය තුළදී විදුලි හා විද්‍යුත් අංශයේ නාවිකයින් 95 දෙනෙකු ජාතික වෘත්තීය පුහුණු සහතික පත්‍ර IV ලබා ගැනීම මෙන්ම නාවිකයින් 130 දෙනෙකු ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ සාමාජිකත්වය හිමිකර ගැනීම.

iv. අධ්‍යක්ෂ ජෙනරාල් විදුලි හා විද්‍යුත් දෙපාර්තමේන්තුව වෙත ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය මඟින් 2024 සැප්තැම්බර් 18 වන දින සිට වසර 03ක කාල සීමාවක් තුළ වරකට ඉංජිනේරුවන් 05 දෙනෙකු බැඟින් පුහුණු කිරීමේ අනුමැතිය හිමිකර ගන්නා ලදී.

ක. නාවික හමුදාවට මුහුණ පෑමට සිදු වී ඇති අභියෝග

i. නාවික හමුදා පිරිස් බලයෙහි ඌණතාවය සහ 2024 දෙසැම්බර් මස 31 වන දිනට පිරිස් බලය සම්බන්ධ විස්තර පහත පරිදි වේ.

අ/අ	විස්තරය	අනුමත පිරිස් බලය	පවතින පිරිස් බලය	ඌණතාවය
1	නිලධාරින්	3,768	3,133	-635
2	නාවිකයින්	49,232	39,341	-9,891
3	එකතුව	53,000	42,474	-10,526

ii. පවතින පිරිස් බල ඌණතාවයට සාපේක්ෂව ආවරණය කළ යුතු භූමි ප්‍රමාණයේ විශාලත්වය මත ඇති වන ගැටලු.

iii. ශ්‍රී ලංකා නාවික හමුදාව සතුව පවතින විශාල නාවික යාත්‍රා නවතා තැබීම සඳහා ත්‍රිකුණාමල නාවික කඳවුරෙහි ප්‍රමාණවත් ජැටි පහසුකම් නොමැතිවීම නිසා දැනට ඉදිකරමින් පවතින නාවික ජැටිය 2025 වර්ෂය තුළ කඩිනමින් නිම කිරීම.

iv. අත්අඩංගුවට ගනු ලබන පුද්ගලයින් සඳහා ඉදිරි නීති ක්‍රියාමාර්ග ගැනීමේ දී ඇතිවන පහත සඳහන් ප්‍රායෝගික ගැටලු;

- නීති විරෝධී ධීවර කටයුතුවල නිරත පුද්ගලයින් අත්අඩංගුවට ගැනීමේ දී ධීවර පරීක්ෂකවරුන් සම්බන්ධකර ගැනීමට අපහසු වීම.
- දඩ මුදල් වටිනාකම් දිර්ඝ කාලීනව සංශෝධනය නොවීම.
- නීති අර්ථකථනයේ දී ඇති වන ගැටලු.
- සාක්ෂි සම්පිණ්ඩනයේ දී සහ ආවර්ජනය කිරීමේ දී ඇති වන අපහසුතාවයන්.
- මෙහෙයුම් කටයුතුවලට සම්බන්ධ නාවික පුද්ගලයින් සේවයෙන් ඉවත්වීම/ විශ්‍රාම යාම.

4. ශ්‍රී ලංකා ගුවන් හමුදාව

අ. ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු පියාසර හා මෙහෙයුම් ශක්‍යතාවයන් ඉහළ නැංවීම හා ශක්තිමත් කිරීම.

i. Kfir ගුවන්යානා අලුත්වැඩියා කිරීම හා SMH 582 SMH 581 MI 17V-5 හෙලිකොප්ටර් යානයේ 500 Hrs පිරිවැඩියාව අවසන් කිරීම.

ii. SMR-844 King Air 360ER ගුවන් යානය ප්‍රදානයක් ලෙස ලබා ගැනීම හා SMR-845 King Air 350 ගුවන් යානය ප්‍රදානයක් ලෙස ලබා ගැනීම.

ආ. ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා වන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම

ආරක්ෂක අංශ ශක්තිමත් කිරීම.

i. ආරක්ෂක හමුදාවල ශක්තීන් වර්ධනය උදෙසා අවශ්‍ය වන නවීන යුධෝපකරණ සහ ආයිත්තම් මිලට ගැනීම සහ සාමාන්‍ය ඉංජිනේරු පක්ෂාංග, කර්මාන්ත ශාලාවල සන්නාහ යුද ඇඳුම් ආයිත්තම නිෂ්පාදනයන් හා සහ අවි ආයුධ අලුත්වැඩියා හා ප්‍රතිසංස්කරණය කිරීමේ පක්ෂාංගයේදී යුධෝපකරණ නවීකරණය කිරීම සහ අලුත්වැඩියා කටයුතු කරවීම.

ii. රෙජිමේන්තු නිලධාරින්ගේ සහ ගුවන් භටයින්ගේ සඵලතාවය වර්ධනය කිරීම සඳහා දේශීය හා විදේශීය වශයෙන් පාඨමාලා ආරම්භ කර පුහුණු කටයුතු සිදු කර ඇත.

iii. 2024 වර්ෂයේ රෙජිමේන්තු කාර්යසාධනය වැඩි දියුණු කිරීමේ අරමුණින් හා සටන් කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සඳහා අවිකරු අඛණ්ඩ පුහුණුවීම් (GCT) පවත්වනු ලැබේ.

iv. ජාතික අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි රෙජිමේන්තු නිලධාරින්ගේ සහ ගුවන් භටයින්ගේ දැනුම වර්ධනය සඳහා විශේෂ පුහුණු වැඩසටහන් පැවැත්වීම.

v. රට තුළ ඇතිවන හදිසි කැරලි අවස්ථාවන්හිදී ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා හමුදා සාමාජිකයින් යෙදවීමේදී ඔවුන් හට ආරක්ෂිතව කැරලි මර්ධනය කිරීම සඳහා භාවිතා කිරීමට අවශ්‍ය වන ආරක්ෂිත ඇදුම් හා විෂ වායූන්ගෙන් ආරක්ෂා වීම සඳහා භාවිතා කරන මුහුණු ආවරණ ලබා දීම.

vi. ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ශ්‍රී ලංකාවේ ගුවන් ආරක්ෂක ආවරණය වැඩිදියුණු කිරීම සහ තිරසාර කිරීම සඳහා 2024 වසරට අදාළව සිදුකර ඇති කාර්යය සාධක විස්තරය පහත සඳහන් පරිදි වේ.

- ශ්‍රීලංගුහ කටුනායක කඳවුරෙහි පැවති සමුහ ගුවන් ආරක්ෂණ මධ්‍යස්ථානය අකුරේගොඩ නව ගුවන් හමුදා මූලස්ථානය වෙත රැගෙන ඒම තුළින් වඩා කාර්යක්ෂමව හා සඵලදායි වැඩ පරිසරයක් කර ගැනීමට හැකි වීම.
- අංක 1 ප්‍රහාරක පාලක නිලධාරි පළමු පාඨමාලාව (FC) වර්ගීකරණයට අදාළ පුහුණු පාඨමාලාව දේශීය වශයෙන් ප්‍රථම වතාවට සාර්ථකව නිම කරන ලදී.
- ප්‍රහාරක පාලක නිලධාරීගේ වර්ගීකරණයට අනුව (CAT “BEE”) නිලධාරින් සඳහා විශේෂ වැඩමුලුවක් පවත්වන ලදී.
- ප්‍රහාරක පාලක නිලධාරින් සඳහා JY–11 රේඩාර් පද්ධතියට අදාළව විශේෂ පුහුණු පාඨමාලාවක් පවත්වන ලදී.
- නව ගුවන් ගමන් පාලන කළමනාකරණ පද්ධතිය (ATMS) ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත ලබා ගැනීම සඳහා සිවිල් ගුවන් සේවා අධිකාරිය සමඟ සාකච්ඡා පවත්වා ඒ සඳහා මූලික ක්‍රියාමාර්ග ගැනීමට හැකි වීම.
- 2024 වසර තුළදී ගුවන් ආරක්ෂක අංශයේ නිලධාරින් 06 දෙනෙකු හා ගුවන් භටයින් දෙදෙනෙකු හට විදේශගත පුහුණුව ලබාදීමට කටයුතු සිදුකරන ලදී. තවද ගුවන් ආරක්ෂක අංශයේ සේවා පුද්ගලයින්ගේ කාර්යක්ෂමතාවය හා නිපුණතාවය වර්ධනය කිරීම සඳහා 2024 වර්ෂයේ ගුවන් භටයින් 91 දෙනෙකු හට දේශීය පාඨමාලාවන් ලබාදෙන ලදී.
- ගුවන් ආරක්ෂක ආවරණය වැඩිදියුණු කිරීම සඳහා 2024 අප්‍රේල් මස 21 වන දින ඩ්‍රෝන යානා වලින් ඇතිවන ප්‍රහාර මැඩපැවැත්විය හැකි පහත සඳහන් උපකරණ මිලදී ගන්නා ලදී.

අ/අ	විස්තරය	ප්‍රමාණය
01	QR-07S3 Portable Hand Held Drone Gun	EA 02
02	JSSZY-QR-10 Portable Backpack Drone Jammer	EA 04

- ජාතික ගුවන් ආරක්ෂක පද්ධතිය ආවරණය කිරීම සඳහා ගුවන් ආරක්ෂක මුරකුටි දෙකක් ස්ථාපනය කරන ලදී.

බුද්ධි අංශවල ක්‍රියාකාරිත්වය ශක්තිමත් කිරීම

i. සියලුම කඳවුරුවල බුද්ධි අංශයන්හි මෙහෙයුම් සාර්ථක කරගැනීම සඳහා තොරතුරුකරුවන් වෙනුවෙන් ලබා දෙන බුද්ධි දීමනාව පෙර වසරට සාපේක්ෂව වැඩිකර ලබාදීම.

ii. මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ අවශ්‍යතාවය මත 2024 වර්ෂය සඳහා අවස්ථා 07 කදී ඩ්‍රෝන යානා අලුත්වැඩියා කර ඇත.

iii. 2024 ජනවාරි මස 01 වන දින සිට 2024 දෙසැම්බර් මස 31 වන දින දක්වා නිලධාරීන් 05 දෙනෙකු හා ගුවන් භටයින් 35 දෙනෙක් සඳහා ඩ්‍රෝන පුහුණු පාඨමාලාවක් ලබා දීම.

iv. 2024 මාර්තු මස 18 වන දින සිට 2024 ජූලි මස 30 වන දින දක්වා නිලධාරියෙකු හා ගුවන් භටයින් 16 දෙනෙකු සඳහා මූලික බුද්ධි පුහුණු පාඨමාලාවක් ලබා දීම.

v. 2024 ජනවාරි මස 08 වන දින සිට 2024 පෙබරවාරි මස 20 වන දින දක්වා විවිධ වෘත්තීන් වල නියැලෙන නිලධාරින් 03 දෙනෙකු හා ගුවන් භටයින් 09 දෙනෙක් සඳහා මූලික බුද්ධි පුහුණු පාඨමාලාවක් ලබා දීම.

vi. 2024 අප්‍රේල් මස 24 වන දින සිට 2024 අගෝස්තු මස 08 වන දින දක්වා ගුවන් භටයින් 18 දෙනෙකු සඳහා දෙමළ භාෂා පුනරීක්ෂණ පාඨමාලාවක් ලබා දීම.

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සේවා අංශයේ වැටුප්, දීමනා, උසස්වීම්, පදක්කම් පිරිනැමීම්, පුහුණුව හා සුබසාධනයට අදාළ කටයුතු

i. සේවා අංශයේ වැටුප් සහ දීමනා

සමාලෝචිත කාල සීමාව තුළදී සේවා අංශයේ වැටුප් හා වේතන ගෙවීම් ආදිය ඇතුළත් පරිපාලන සේවා සඳහා පහත පරිදි වියදම් කර ඇත.

අ/අ	ශීර්ෂය	වියදම (රු.මි)
පුනරාවර්තන වියදම්		
01	වැටුප් හා වේතන (1001)	13,848.71
02	වෙනත් දීමනා (1003)	11,160.90

ii. 2024 වර්ෂයේ නිලධාරින්ගේ සහ සෙසු නිලයන්ගේ උසස්වීම් පිළිබඳ තොරතුරු

අ/අ	නිලධාරී වර්ගය	සංඛ්‍යාව
1	නිලධාරින්	606
2	සෙසු නිලයන්	6,641

iii. 2024 ජනවාරි මස 01 දින සිට 2024 දෙසැම්බර් 31 දක්වා සේවා පුද්ගලයින්හට පිරිනමන ලද පදක්කම් විස්තරය

අ/අ	පදක්කම්	එකතුව
1	සන්නද්ධ සේවා දීර්ඝ සේවා පදක්කම	161
2	සන්නද්ධ සේවා දීර්ඝ සේවා සන්දාරය	232
3	උත්තම සේවා පදක්කම	216
මුළු එකතුව		**609**

ඇ. ආපදා කළමනාකරණය සහ ඊට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදුකිරීම.

i. ආපදා අවස්ථාවන්හිදී මුදවාගැනීම්, අපදා අවමකිරීම හා ආපදා කළමනාකරණය පිළිබඳ පෙරහුරු දිවයින පුරා ඇති ගුවන් හමුදා කඳවුරුවල සිදු කිරීම.

ii. 2024 වසරේ මුලතිව් ආපදා කළමනාකරණ පුහුණු පාසල මඟින් ගුවන් හමුදාවේ 13 දෙනෙක්ද, යුද හමුදාවේ 03 දෙනෙක්ද, නාවික හමුදාවේ 04 දෙනෙක්ද, ආපදා කළමනාකරණ පාඨමාලාව සාර්ථකව හදාරා ඇත.

iii. හදිසි ආපදා අවස්ථාවන් වලදී භාවිතා කිරීම සඳහා Manila Rope ලබා ගෙන ආපදා ප්‍රතිචාර දැක්වීමේ කණ්ඩායම් වෙත ලබා දී ඒවා ගංවතුර අවස්ථාවන් විපතට පත් වූවන් මුදවා ගැනීම සඳහා භාවිතා කිරීම.

iv. ආපදා ප්‍රතිචාර දැක්වීමේ කණ්ඩායම් සඳහා අවශ්‍ය කරනු ලබන ප්‍රායෝගික දැනුම වඩාත් උසස් අන්දමින් ලබා දීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා ආපදා කළමනාකරණ පුහුණු පාසල ශ්‍රී ලංකා ගුවන් හමුදා දිගන පහිනාංකයෙහි ප්‍රතිස්ථාපිත කිරීම.

v. 2024 වර්ෂයේ ශ්‍රීලංගුහ ගිනි නිවීම් හා ජීවිත බේරා ගැනීමේ සේවාව විසින් බාහිර ආයතන සඳහා ගිනි නිවීම් හා පුහුණු සැසි ලබා දී ඇත.

vi. 2024 වර්ෂය තුළ ශ්‍රී ලංකාව අයත් භූමි ප්‍රදේශය හා මුහුදු කලාපය ආවරණය වන පරිදි ගුවන් ආවේක්ෂණයන්හි සාරාංශය පහත දැක්වේ.

අ/අ	නිරීක්ෂණයන්	නිරීක්ෂණයන් ගණන
1	සැක කටයුතු ඉන්දීය ධීවර යාත්‍රා	36
2	සැක කටයුතු නැව්	08
3	කසල බැහැර කිරීම්	03
4	සාගරයෙහි තෙල් කාන්දුවීම්	05
එකතුව		52

ඈ. **එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් තුළින් රජය වෙනුවෙන් උපයා ඇති ආදායම**

i. මධ්‍යම අප්‍රිකාව

අ/අ	ආදායම පිළිබඳ තොරතුරු	2024 ලද ආදායම (ඇ.ඩො.)	2024 ලැබිය යුතු ආදායම (ඇ.ඩො.)
1	පියාසර දීමනා	2,881,305.00	1,864,305.00
2	ප්‍රධාන උපකරණ හා දෛනික උපකරණ	690,153.83	04 වන කාර්තුව සඳහා ලැබී නැත

ii. එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් සඳහා අනුයුක්ත කර ඇති සේවා පුද්ගලයින් සංඛ්‍යාව

අ/අ	සාම සාධක මෙහෙයුම	අනුයුක්ත කර ඇති සේවා පුද්ගලයින් සංඛ්‍යාව
1	මධ්‍යම අප්‍රිකාව (මාණ්ඩලික නිලධාරි)	04
2	මධ්‍යම අප්‍රිකාව (නිලධාරීන් සහ සෙසු නිළයන්)	110

ඉ. **කාර්යක්ෂමතාව ඉහළ නැංවීම හා වෘත්තීමය දක්ෂතා වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ දැනට ක්‍රියාත්මක පුහුණු වැඩසටහන් පද්ධතිය හා එහි ක්‍රියාවලියන් සමාලෝචනය කිරීම**

i. නිලධාරින්ගේ සහ ගුවන්භටයින්ගේ සඵලතාවය වර්ධනය කිරීම සඳහා දේශීය හා විදේශීය වශයෙන් පාඨමාලා ආරම්භ කර පුහුණු කටයුතු සිදු කිරීම සහ කැඩෙට් නිලධාරින්ගේ මූලික පුහුණුවීම් හා අධිකාරී නොලත් නිලධාරින්ගේ මූලික පුහුණුවීම් 2024 වසරේ ආරම්භ කර පුහුණු කටයුතු සිදු කිරීම.

අ/අ	පුහුණු ධාරාව	2024 වර්ෂය තුළ පවත්වන ලද පාඨමාලාවන් ගණන
1	කැඩෙට් නිලධාරින්ගේ මූලික පුහුණුවීම්	01
2	ශිෂ්‍ය නිලධාරින්ගේ මූලික පුහුණුවීම්	02
3	කැඩෙට් නිලධාරින්ගේ වෘත්තිය පුහුණුවීම්	16
4	කැඩෙට් නිලධාරින්ගේ මූලික පරිපාලන පුහුණුවීම්	02
5	කැඩෙට් නිලධාරින්ගේ උපාධි පුහුණුවීම්	01
6	අධිකාරී නොළත් නිලධාරින්ගේ මූලික පුහුණුවීම්	03
7	අධිකාරී නොළත් නිලධාරින්ගේ උසස් පුහුණුවීම්	44
8	ඩිප්ලෝමා ලබා ගැනීමේ පාඨමාලා	04

ii. 2024 වර්ෂයේ රෙජිමේන්තු කාර්යසාධනය වැඩි දියුණු කිරීමේ අරමුණින් හා සටන් කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සඳහා අවිකරු අඛණ්ඩ පුහුණුවීම් පැවත්වීම.

iii. වැඩි දියුණු කල යුතු ක්ෂේත්‍ර හඳුනාගෙන අඛණ්ඩව පුහුණුවීම් සඳහා ලක්කරනු ලබන අතර, පහත පරිදි සෙසු පුහුණුවීම් කොටස් වර්ග කර පුහුණුවීම් කරනු ලැබේ.

පුහුණු ධාරාව	**2024** වර්ෂය තුළ පවත්වන ලද පාඨමාලාවන් ගණන
සංවර්ධනය පදනම් කරගත් පුහුණු	104
වෘත්තිය පදනම් කරගත් පුහුණු 1. මූලික වෘත්තිය පුහුණු පාඨමාලාව 2. උසස් වෘත්තිය පුහුණු පාඨමාලාව 3. ගිනිහට පුහුණු පාඨමාලා 4. උපස්ථායන සේවා පුහුණු පාඨමාලා 5. පරිගණක පුහුණුවීම්	 48 40 02 04 06
පුද්ගල සංවර්ධනය පදනම් කරගත් විදේශ පුහුණු හා විදේශ සංචාර	304
ඩිප්ලෝමා ලබා ගැනීමේ පාඨමාලා	04

iv. ගුවන් හමුදාව විසින් ලබා ගන්නා ලද ඩ්‍රෝන එක් එක් ගුවන් හමුදා කඳවුරු ප්‍රදේශයන්හි මෙහෙයුම් අවශ්‍යතාවය මත පහත පරිදි 2024 ජනවාරි මස 01 වන දින සිට 2024 දෙසැම්බර් මස 31 වන දින දක්වා නිලධාරීන් හා ගුවන් භටයින් හට ඩ්‍රෝන පුහුණු පාඨමාලාවක් ලබා දීම.

අ/අ	පාඨමාලාව	පාඨමාලා සංඛ්‍යාව	ස්ථානය
01	Drone Operator Couse	08	ගුවන්හමුදා කඳවුර කටුකුරුන්ද (111 UAV Sqn)
02	Drone Operator Instructors Couse	03	

v. ගුවන් හමුදා ක්‍රීඩා සංවිතයන්හි ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහ සේවා පුද්ගලයින්ගේ ජාතික සහ අන්තර්ජාතික තරග ජයග්‍රහණ ලබාගැනීමට ඔවුනට අවශ්‍ය ක්‍රීඩා උපකරණ ලබා දීම සහ පුහුණුවීම් වලදී සහයෝගය ලබාදීම.

ඊ. අතිරේක සුබසාධන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම තුළින් ගුවන් භටයින්ගේ ඉහළ චිත්ත ධෛර්යය පවත්වා ගැනීම සහ දක්ෂ ශ්‍රම බලකායක් රඳවා තබා ගැනීම.

i. ශ්‍රීලංගුහ රෝහල් මඟින් ලබාදෙන වෛද්‍ය ප්‍රතිකාර සහ සේවාවන් ඉහළ මට්ටමක පවත්වා ගැනීම සහ වෛද්‍ය සේවාවන් පුළුල් කිරීම තුළින් සේවා පුද්ගලයින්ගේ සමීපතම ඥාතීන් සඳහා වෛද්‍ය සේවාවන් ලබාදීම.

ii. විවාහ විමට බලාපොරොත්තු වන සේවා පුද්ගලයින් ඉලක්ක කරගනිමින් උපදේශන සැසි පැවැත්වීම.

iii. සේවයේ නියුතු නිලධාරීන්, සෙසුනිලයින් මෙන්ම යුද්ධයේදී මියගිය සහ ආබාධිත ගුවන් හමුදා රණවිරුවන්ගේ යැපෙන්නන් වෙත සුබසාධන ක්‍රමවේදයන් ස්ථාපිත කිරීම.

iv. යුද්ධයේදී මියගිය සහ ආබාධිත ගුවන් හමුදා රණවිරුවන්ගේ පවුල්වල සුබසාධන කටයුතු ස්ථාපිත කිරීම සඳහා සුදුසු අධ්‍යාපනයන් හා සමීක්ෂණ කටයුතු වෙත යාමේ සැලසුම් ක්‍රියාත්මක කිරීම.

v. යුද්ධයේදී ආබාධිත හා සේවයේ යෙදී සිටින ගුවන් හමුදා රණවිරුවන් සඳහා පුනරුත්ථාපන පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

vi. ගුවන් හමුදා සේවා පුද්ගලයින්ගේ පවුල් සඳහා රැකියා ඉලක්ක කර ගත් වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

vii. ශ්‍රී ලංකා ගුවන් හමුදා සාමාජිකයින්, ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සහ සිවිල් පුද්ගලයින් හට ලබාදෙන දන්ත වෛද්‍ය පහසුකම් අඛණ්ඩව වර්ධනය කිරීම තුළින් සේවා හා සිවිල් පුද්ගලයින් හට ඔවුන්ගේ රාජකාරීන් බාධාවකින් තොරව නිදහස් මානසිකත්වයකින් යුතුව ඉටු කිරීමට හැකි වටපිටාවක් ඇති කිරීමට දායකත්වය ලබාදීම සඳහා රෝගීන් 21,096 සඳහා ප්‍රතිකාර ලබා දීම.

viii. ජීවිත අවදානම ඇතිව රාජකාරියේ නියුතු වන සේවා පුද්ගලයින් සඳහා රක්ෂණ ආවරණ ලබා දීම.

ඌ. මත්ද්‍රව්‍ය උවදුරෙන් නිදහස් රටක් ඇතිකිරීම සඳහා වන උපායමාර්ග ක්‍රියාත්මක කිරීම

i. මාසිකව අහඹු තෝරාගත් ගුවන් හමුදා සේවා පුද්ගලයන් ඉලක්ක කර අන්තරාදායක ඖෂධ භාවිතය හඳුනා ගැනීම සඳහා වෛද්‍ය පරීක්ෂණ පැවැත්වීම.

ii. ගුවන් හමුදා සේවා පුද්ගලයන් සහ සිවිල් පුද්ගලයන් ඉලක්ක කර ගනිමින් මත් උවදුරින් වැළකීම පිළිබඳ දැනුවත් කිරීම් වැඩසටන් පැවැත්වීම.

iii. 2024 වර්ෂයේ ගුවන් බුද්ධි තොරතුරු මත මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම් පහත පරිදි වේ.

අ/අ	මත්ද්‍රව්‍ය වර්ග	මත්ද්‍රව්‍ය ප්‍රමාණයන්	අත්අඩංගුවට ගත් පුද්ගලයින් සංඛ්‍යාව
1	ගංජා(කිලෝ ග්‍රෑම්)	කිලෝ47 ග්‍රෑම්771	44
2	හෙරොයින් (ග්‍රෑම්)	ග්‍රෑම්803 මිලි ග්‍රෑම්839	72
3	අයිස් (කිලෝ ග්‍රෑම්)	කිලෝ2 ග්‍රෑම්333	69
4	මත්පෙති	945	05
5	දේශීය මත්පැන්	ලීටර් 135	12
6	නිති විරෝධී මත්පැන් (කසිප්පු/ස්ප්‍රිතු/ගෝඩා)	ලීටර් 1,246	22
7	නිති විරෝධී දුම් වැටි (සිගරට්)	24,529	24
8	ගංජා පැළ	244,849	04
අත්අඩංගුවට ගත් මුළු පුද්ගලයින් ගණන			**252**

ඍ. අපදා කළමනාකරණයට සහය දැක්වීම

i. 2024.11.27 වන දින තොඩුවිලච්චි ප්‍රදේශයෙන් එක් පුද්ගලයකු ගංවතුරෙන් මුදවාගැනීමේ මෙහෙයුම

ii. 2024.11.28 වන දින ඩෙල්ෆ් දුපතේ සිට පලාලි දක්වා රෝගීන් තිදෙනෙකු ගුවනින් ප්‍රවාහනය කිරීම .

iii. 2024.11.29 වන දින ඩෙල්ෆ් දුපතේ සිට පලාලි දක්වා විභාග ප්‍රශ්නපත්‍ර ගුවනින් ප්‍රවාහනය කිරීම.

iv. 2024.05.07 දින ඒකල Allumex යකඩ කර්මාන්ත ශාලාවේ ඇතිවූ ගින්නක් මැඩ පැවත්වීම සඳහා ගිනි නිවාරණ රථ දෙකක් සහ ජල බවුසරයක් සමඟින් ගුවන් භටයින් 12 දෙනෙකු සහභාගී වී ගින්න මැඩ පැවැත්වීම සඳහා කටයුතු කරන ලදී.

v. 2024.10.01 දුන්හිඳ ප්‍රදේශයේ සිදුවූ බස් රථ අනතුරින් විපතට පත් වූවන් මුදවා ගැනීම සඳහා දියතලාව ගුවන් හමුදා කඳවුරේ ආපදා සහන සේවා සැපයීමේ කණ්ඩායමේ නිලධාරියෙකු සහ ගුවන් භටයින් 08 දෙනෙකු අනතුර සිදුවූ ස්ථානයට ගොස් විපතට පත් වූවන් මුදවා ගැනීම සඳහා කටයුතු කළ අතර අසාධ්‍ය රෝගීන් දියතලාව සිට කොළඹට ප්‍රවාහනය සඳහා Bell-412 යානයක් යෙදවීම.

vi. බෝම්බ තර්ජන ඇතැයි සැක සහිත ලෙස කටුනායක ගුවන්තොටුපල වෙත ගොඩබාන ලද ගුවන් යානා තුනක් ආරක්ෂිතව ගුවන් හමුදා බෝම්බ නිශ්ක්‍රීය අංශ නිලධාරීන්ගේ හා ගුවන් භටයින් විසින් පරීෂාකර ගුවන් මගීන් සහ කාර්ය මණ්ඩලයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමෙන් පසු ඇති වූ තර්ජන තත්ත්වය ඉවත් කිරීම. එහි සැක කටයුතු පාර්සල් පරීක්ෂා කිරීම සඳහා භාවිතයට යොදා ගැනීමට ගෙන්වන ලද නව එක්ස් කිරණ යන්ත්‍රය යොදා ගැනීම මඟින් කාර්යය වඩාත් කාර්යක්ෂමව ඉටු කරන ලදී. එම අවස්ථාවන් වල විස්තර පහත පරිදි වේ.

අ/අ	දිනය	ගුවන් යානා වර්ගය	ගුවන් මඟීන් ගණන	කාර්ය මණ්ඩල ප්‍රමාණය	පරීක්ෂා කිරීම සඳහා සහභාගී වූ පිරිස
01	2024.10.19	Visthara UK 131	96	08	නිලධාරීන් - 05 ගුවන් හටයින් - 37
02	2024.10.24	Visthara UK 131	108	11	නිලධාරීන් - 06 ගුවන් හටයින් - 30
03	2024.10.28	Air India AI 281	109	08	නිලධාරීන් - 06 ගුවන් හටයින් - 37

vii. 2024 වර්ෂයේ ශ්‍රීලංගුහ චීන වරාය, වව්නියාව, කොළඹ, අම්පාර, කොග්ගල, පාලවි යන ගුවන් හමුදා කඳවුරු වල ගිනි නිවීම් හා ජීවිත බේරා ගැනීමේ සේවාව මඟින් එක් එක් ප්‍රදේශයන්හි බාහිර ආයතන වල ඇතිවූ ගිනි පාලනය සඳහා සහභාගීත්වය.

viii. රට තුළ ඇතිවන විවිධ ආපදා අවස්ථාවන්හිදී ආපදා කළමනාකරණ කාර්යයන් සඳහා අවශ්‍යවන වාහන, රියදුරන් සහ කාර්මික ශ්‍රමබලකාය නිසි පරිදි ස්ථානගත කර සමාලෝචිත වර්ෂයේ ජාතික ආපදා ව්‍යසන හා තර්ජන අවස්ථා වලදී ශ්‍රී ලංකා ගුවන් හමුදාව නියෝජනය කිරීමට සෘජුවම මැදිහත්වීම.

එ. බඳවා ගැනීමේ සැලැස්ම සංශෝධනය කිරීම සහ නව තාක්ෂණයන් හඳුන්වා දීම මඟින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ බලකා ව්‍යුහයේ නියම ප්‍රමාණය සාක්ෂාත් කර ගැනීම

ඒ. ගුවන් හමුදාව සහ ජාතික වැදගත් ඩිජිටල් යටිතල පහසුකම් ආරක්ෂා කිරීම සඳහා අති නවීන තොරතුරු තාක්ෂණ හැකියාවන් ස්ථාපිත කිරීම

i. ජනාධිපතිවරයාගේ වෙබ් අඩවිය සහ ආරක්ෂක අමාත්‍යාංශයේ වෙබ් අඩවිය ඇතුළුව තීරණාත්මක රාජ්‍ය ආයතන වෙබ් අඩවි 24x7x365 අධීක්ෂණය සපයා ඇත.

ii. ජනාධිපති නිල වෙබ් අඩවිය සහ ජනාධිපති ලේකම් කාර්යාල වෙබ් අඩවි සඳහා අවධානම් තක්සේරු කිරීම් සිදු කරන ලදී.

iii. ශ්‍රී ලංකාවේ රසායනික අවි සම්මුතීන් ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු ජාතික අධිකාරිය සඳහා SLT Cloud වේදිකාවේ නව වෙබ් සේවාදායකයක් ස්ථාපිත කිරීම.

iv. ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර හි සයිබර් මෙහෙයුම් මධ්‍යස්ථානයේ රූපවාහිනී නිරීක්ෂණ බිත්තිය සාර්ථකව නිම කරන ලදී.

ඔ. ග්‍රාමීය ප්‍රජා ආරක්ෂාව හා සුබසාධනය සහ ජීවනෝපාය දායකත්වය, රැකියා උත්පාදනය කිරීම

- **ග්‍රාමීය ප්‍රජා ආරක්ෂාව හා සුබසාධනය**

i. ශ්‍රීලංගුහ කොළඹ, කටුනායක, රත්මලාන යන කඳවුරු වල ගුවන් හමුදා දන්ත වෛද්‍ය අංශයන් මඟින් ස්ථාන 08ක් තුළ රෝගීන් 1,170 ක් සඳහා ජංගම දන්ත වෛද්‍ය සායන පැවැත්වීම හා එහි රෝගීන් 885 ක් වෙනුවෙන් ප්‍රතිකාර කළ අතර මුඛ රෝග නිවාරණ වැඩසටහන් පැවැත්වීම තුළින් ග්‍රාමීය ප්‍රජාවන්ගේ දන්ත සෞඛ්‍ය වර්ධනය කිරීමට දායකත්වය ලබාදෙන ලදී.

ii. ග්‍රාමීය ජනතාවගේ දන්ත සෞඛ්‍ය වර්ධනය කිරීම උදෙසා ගුවන් හමුදා දන්ත වෛද්‍ය අංශය මඩකලපුව කඳවුරේ භාවිතා කරන ලද දන්ත පුටුව කාන්තන්කුඩි රෝහල වෙත ශ්‍රීලංගුහ විසින් පරිත්‍යාග කරන ලදී.

iii. රජයේ පාසල් 46 ක් සංවර්ධනය හා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම් සඳහා තාක්ෂණික සහාය සහ ශ්‍රම දායකත්වය සැපයීම.

iv. සෞඛ්‍ය සේවා ස්ථාන 05ක් සංවර්ධනය හා අලුත්වැඩියා සඳහා තාක්ෂණික සහාය සහ ශ්‍රම දායකත්වය සැපයීම.

v. කෘෂි ඉදිකිරීම් ස්ථාන 01ක් සංවර්ධනය සඳහා තාක්ෂණික සහාය සහ ශ්‍රම දායකත්වය සැපයීම.

vi. වැඩිහිටි නිවාසයක නඩත්තු කාර්යයන් සඳහා තාක්ෂණික සහාය සහ ශ්‍රම දායකත්වය සැපයීම.

vii. පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ක්‍රීඩා කුසලතා වර්ධනය කිරීම සහ යහපත් ශාරීරික යෝග්‍යතාවයකින් යුත් තරුණ ප්‍රජාවක් සමාජයට යොමුකිරීම සඳහා පාසල් 04ක් තුළ ක්‍රීඩා පිටි සකස් කිරීම, අලුත්වැඩියා කිරීම සහ ක්‍රීඩාංගන සකස් කිරීම.

viii. පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ හා පුද්ගලික ආයතනයන්හි කාර්ය මණ්ඩලයන් තුළ නායකත්වය වර්ධනය කිරීම සඳහා බාහිර ආයතන 03ක් තුළ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

ix. ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් අපේක්ෂා කරනු ලබන සහයෝගිතාවය ක්‍රමවත්ව ලබාදීම සහ ජාතික ක්‍රීඩා තරග සංවිධානය කිරීම සඳහා උපදේශකත්වය සහ සහයෝගිත්වය ලබාදීම.

x. ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු ජංගම අක්ෂි සායන පහසුකම් භාවිතයට ගනිමින් සිවිල් ජනතාව වෙනුවෙන් අක්ෂි සායනයන් පැවැත්වීම.

xi. ත්‍රිවිධ හමුදා සහභාගිත්වයෙන් සිදු කරනු ලබන ජාතික ඩෙංගු මර්ධන වැඩසටහන් සඳහා දායකත්වය සැපයීම.

- **සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණයට සහ සංවර්ධනයට සහය වීම**.

i. ආගමික ස්ථාන 14 ක නව ඉදිකිරීම්, අලුත්වැඩියාවන්, වැඩිදියුණු කිරීම් සහ නඩත්තු කාර්යයන් සඳහා තාක්ෂණික සහාය සහ ශ්‍රම දායකත්වය සැපයීම.

ii. ස්ථාන 05 ක පෞරාණික ආගමික ස්ථාන හා වෙහෙර ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා තාක්ෂණික සහාය සහ ශ්‍රම දායකත්වය සැපයීම.

iii. ප්‍රජා ආරක්ෂාව හා සුබසාධනය, සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණයට සහ සංවර්ධනයට සහාය වීම වෙනුවෙන් අවශ්‍ය කාර්මික ශිල්පීන්, රියදුරන්, වාහන සහ සාමාන්‍ය ඉංජිනේරු යන්ත්‍රෝපකරණ ශ්‍රී ලංකා ගුවන් හමුදාව නියෝජනය කරමින් ලබා දීම.

ඕ. ආරක්ෂක හමුදාවල ශක්තීන් ජාතික සංවර්ධනයට දායක කර ගැනීම.

i. රටේ පවතින අභ්‍යන්තර ගැටුම් (උදාහරණ ලෙස වැඩවර්ජන) ඇතිවූ අවස්ථාවලදී රට සමාන්‍ය තත්ත්වයෙන් පවත්වාගන යාමට හටපිරිස් යෙදවීම.

ii. ප්‍රදර්ශන කුටි පවත්වන අවස්ථා වලදී ශ්‍රී ලංකා ගුවන් හමුදාව නියෝජනය කරමින් නව සංවර්ධන හා පර්යේෂණ නිමැයුම් හඳුන්වා දීම.

iii. ජාතික පරිසර දිනය වෙනුවෙන් රුක් රෝපණ වැඩසටහන් සඳහා සේවා පුද්ගලයින් යෙදවීම.

iv. ඉවතලන කඩදාසි එක්රැස්කොට නැවත ගුවන් හමුදාව පරිහරණය සඳහා භාවිතා කිරීම.

v. වසර 2030 වන විට දැනට පවතින හරිත ආවරණය 27% සිට 32% දක්වා වැඩි කිරීමට දායක වීම සඳහා නව බීජ පැල 40,000 ක් රෝපණය කිරීමෙන් සහ බීජ බොම්බ 80,000 ක් හෙලීමෙන් ගුවන් හමුදාව ක්‍රියාකාරීව සම්බන්ධ වීම.

vi. ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු වෛද්‍ය පුහුණු පහසුකම් භාවිතා කරමින් ගුවන් හමුදාවෙන් විශ්‍රාම ලබා නික්මයන පිරිස සහ සිවිල් ප්‍රජාව වෙනුවෙන් සාත්තු සේවක පුහුණු පාඨමාලා පැවැත්වීම (NVQ පාඨමාලා 04ක්) තුළින් විදේශ ශ්‍රමික සංඛ්‍යාව ඉහළ නැංවීම.

ක. වැදගත් ගුවන් වත්කම් සහ ස්ථාපිතයන් සඳහා පුළුල් පිරිස් බල ආරක්ෂාවක් ලබා දීම සහ අනතුරට පත්විය හැකි ප්‍රදේශ (VAs) සහ අනතුරට පත්විය හැකි ස්ථාන (VPs) සඳහා ආරක්ෂාව සැපයීම.

i. ගුවන් කඳවුරු ආරක්ෂාවට තර්ජනයක් ඇති විය හැකි ස්ථාන හඳුනාගෙන එම ස්ථානයන්හි ආරක්ෂක වැට ශක්තිමත් කිරීම හා වැට අබලන් වී ඇති ස්ථානයන් සඳහා අවශ්‍යය වැටකණු, chain link සහ කටු කම්බි ලබා දීම.

ii. කඳවුරු වල ආරක්ෂක වැට රාත්‍රී කාලයේදී ආලෝකමත් කිරීම සඳහා අවශ්‍ය කරනු ලබන උපකරණ (LED Light) කඳවුරු සඳහා ලබා දීම සහ ආරක්ෂක හටයින් සඳහා රාත්‍රී කාලයේ දී භාවිතා කිරීමට අවශ්‍ය විදුලි පන්දම් ලබා දීම.

ඛ. ජාතික අවශ්‍යතාවයට සහයවීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු සම්පත් ප්‍රශස්තකරණය

i. බෝම්බ නිශ්ක්‍රිය රාජකාරි කිරීමේදී බෝම්බ නිශ්ක්‍රිය භටයාගේ ජීවිතයට ඇති අවධානම අවම කිරීම සඳහා යොදා ගත හැකි නව එක්ස් කිරණ යන්ත්‍රයක් හා ලෝහ සංවේදක උපකරණ මිලදී ගැනීම.

ii. හදිසි මුදවා ගැනීමේ රාජකාරීන් වල නියුතු විශේෂ හමුදා කණ්ඩායම්වල හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය කිමිදුම් කට්ටල, Rappelling rope, Fast Rope, හිස් ආවරණ ලබා දීම.

iii. ශ්‍රී ලංකා ගුවන් හමුදා එක්සත් ජාතීන්ගේ පහත සඳහන් අන්තර් රාජකාරීන් සිදුකිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය වෙත කැමැත්ත ප්‍රකාශ කර ඇත.

- Utility Helicopter Unit
- MP Unit (හමුදා පොලිස් ඒකකය)
- Quick Reaction Force
- Signal Company

iv. එක් එක් අධ්‍යක්ෂකයට අදාළ තනතුරු ප්‍රතිව්‍යුහගත කිරීම.

v. ශ්‍රී ලංකා ගුවන් හමුදා නිලධාරීන් සහ සෙසු නිලයන් සඳහා අනුමත සේවක සංඛ්‍යාව නිවැරදි ලෙස අඩු/වැඩි කර සැකසීම.

vi. ඒ අනුව නව ස්ථාපිත නියෝග නිකුත් කිරීම.

vii. කාලානුරූපිව නව ගුවන් හමුදා ඒකක පිහිටුවීම (විශේෂ ව්‍යාපෘති කළමණාකරණ ඒකකය).

viii. ජාතික ආරක්ෂාව සඳහා අත්‍යවශ්‍ය නොවන ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුරු අඩු කිරීම.

ix. විවෘත පත්විම්/තනතුරු සංශෝධනයට ලක්කිරීම.

x. වෘත්තීය කාණ්ඩය යටතේ ශ්‍රී ලංකා ගුවන් හමුදාව සෘජුවම බඳවා ගන්නා නිලධාරීන්ගේ බඳවා ගැනීමේ නිර්ණායක මනා ප්‍රමිතියකට අනුව සකස් කිරීම.

ග. ශ්‍රීලංගුහ විසින් ක්‍රියාත්මක කරන ලද වෙනත් විශේෂ ව්‍යාපෘති වැඩසටහන් පිළිබඳ විස්තර

පහත සඳහන් පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති 2024 තුළ අධ්‍යක්ෂක පර්යේෂණ හා සංවර්ධන හරහා නිම කරන ලදී**.**

i. අර්ධ ස්වයංක්‍රීය **Foreign Object Debris** එකතු කිරීමේ යන්ත්‍රය නිෂ්පාදනය කිරීම.

ii. නියමු කුටියේ හඬ පටිගත කිරීමේ යන්ත්‍රය නිෂ්පාදනය කිරීම.

iii. YLC-18M RADAR පද්ධතියේ මනාව මැෂින් අතුරු මුහුණත (HMI) ක්‍රමලේඛනය නිෂ්පාදනය කිරීම.

iv. සුලං බලැති අතින් ගෙනයා හැකි බැටරි ආරෝපණය නිෂ්පාදනය කිරීම.

v. පොයින්ටර් 3000 ELT (Emergency Locational Transmitter) සඳහා ELT බැටරි ඇසුරුම් නිෂ්පාදන කිරීම.

vi. ELT බැටරි ධාරිතා පරීක්ෂක යන්ත්‍රය සැලසුම් කිරීම සහ නිෂ්පාදන කිරීම.

vii. AN 32B ගුවන් යානයේ අවර පෙති මත සවිකර ඇති අගුලු ඉවත් කිරීම සඳහා විශේෂ අදින උපකරණ නිෂ්පාදනය කිරීම.

viii. සම්පින්ඩිත වායු වැකුම් ක්ලීනර් නිෂ්පාදනය කිරීම.

ix. වායුසමීකරණ ගෑස් **(R-134 A)** ප්‍රතිසාදන ඒකකය සැලසුම් කිරීම සහ සැකසීම.

x. නියමු කුටියේ පරාමිතීන් සඳහා රැහැන් රහිත නිරීක්ෂණ පද්ධතිය නිෂ්පාදනය කිරීම.

xi. බිම ගොඩබෑමේ ආම්පන්න මෙහෙයවීම සඳහා B-200 ගුවන් යානා සඳහා වායුපීඩන නියාමකය සැකසීම.

ඍ. ජාතික ආරක්ෂක ප්‍රතිපත්ති සම්පාදනය සහ ආරක්ෂක නීති සංශෝධනය

i. නීති ඒකකය වෙත නිශ්චිතව හිමි නෛතික ක්‍රියාවලියට පරිභාහිරව ත්‍රිවිධ හමුදා සාමාජිකයන් වශයෙන් සාමය පවතින කාලයන් හි අවස්ථානුකූලව සිදුකළ යුතු මෙහෙයුම් කටයුතු සඳහා යොදා ගැනීමට අවශ්‍ය මැදිහත් වීමේ නීති මාලාවක් සකස් කිරීමේ ක්‍රියාවලිය සිදු කිරීම.

ii. ත්‍රස්තවාදය වැළැක්වීමේ නව නීති සම්පාදනය/කෙටුම්පත් කිරීම සඳහා සහභාගි වීම.

iii. ආරක්ෂක අමාත්‍යාංශය විසින් නිරීක්ෂණ සඳහා ගුවන් හමුදාව වෙත යොමු කරනු ලබන "ගිවිසුම්, අවබෝධතා ගිවිසුම්, ජාත්‍යාන්තර සම්මුතින්" ආදිය සඳහා නිරීක්ෂණ ලබාදීම.

5. ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව

අ. ජීවිතාරක්ෂක රාජකාරින්

i. වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව මඟින් 2024 වසර තුළ ජීවිතාරක්ෂක මුරකුටි 16ක ජීවිතාරක්ෂක මෙහෙයුම් කටයුතු සිදුකර ඇත.

ii. මුහුදේ අනතුරට පත් ජීවිත 252 ක් බේරාගනු ලැබූ අතර, ඉන් 132ක් විදේශිකයින් විය.

ආ. නීති විරෝධී ක්‍රියා වැළැක්වීම සඳහා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව මඟින් ගෙන ඇති ඉදිරි ක්‍රියාමාර්ග

i. දිවයින වටා ඇති මුහුදු තීරයේ සිදුවන සියලුම නීති විරෝධී ක්‍රියාවන් වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවෙහි ඇති සියලුම යාත්‍රා යොදවනු ලබන අතර, ඉන් වේග ප්‍රහාරක මුර යාත්‍රා (FPB) 10ක් සහ වෙරළබඩ මුර යාත්‍රා (IPC) 02ක් උතුර විධානයට අනුයුක්තව මෙහෙයුම් කටයුතු සිදු කර ඇත. ඉතිරි මුර යාත්‍රා නැගෙනහිර, වයඹ, බටහිර සහ දකුණේ තෝරාගත් ප්‍රධාන/ධීවර වරායන්වල රාජකාරින් හි යොදවා ඇති අතර, මිරිස්ස හා කල්පිටිය ප්‍රදේශයන්හි තල්මසුන් නැරඹීමේ කටයුතු සිදුකරන යාත්‍රා නිරීක්ෂණයටද වෙරළ ආරක්ෂක යාත්‍රා යොදවනු ලබයි.

ඇ. නීති විරෝධී, අක්‍රමවත්, වාර්තා නොවන මසුන් මැරීම් නිරීක්ෂණය

i. මේ සඳහා ධීවර නිරීක්ෂණ ස්ථාන 26 ක් ස්ථාපිත කර ඇත.

ii. සියලුම ධීවර යාත්‍රා මහ මුහුදට යාමට පෙර පරීක්ෂාවට ලක් කරනුයේ ධීවර ආඥාපන්න, බෝට්ටු කාර්ය මණ්ඩලය සහ යාත්‍රාවේ ඇති උපකරණවල නීත්‍යානුකූලභාවය සහතික කිරීම සඳහා වන අතර, යාත්‍රා පැමිණෙන විට ද මසුන් ඇල්ලීමේ නීත්‍යානුකූලභාවය සහතික කිරීම සඳහා එම පරීක්ෂණ ක්‍රියාවලියම සිදු කර ඇත.

iii. ධීවර පිරික්සුම් මධ්‍යස්ථාන රාජකාරි අතරතුර රාජකාරියේ නියුතු ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරින් විසින් මත්ද්‍රව්‍ය සහ නීති විරෝධී ලෙස ධීවර කටයුතු සිදුකරන ලද යාත්‍රා හා පුද්ගලයින් අත්අඩංගුවට ගැනීමට සමත් විය. එසේ අත්අඩංගුවට පත් භාණ්ඩ හා පුද්ගලයින් අදාළ ධීවර උපදේශකවරුන් (FIs) හරහා අධිකරණයට නඩු ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

ඈ. මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්

i. වෙරළ තීරයේ ජීවත්වන ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී වර්ෂය ආරම්භයේ සිට අවසානය දක්වා මුහුදේදී ජීවිත ආරක්ෂාව, සමුද්‍ර දූෂණය වැළැක්වීම සහ සමුද්‍රීය පරිසර ආරක්ෂණය, වෙරළ ආරක්ෂණය, ජීවිත බේරාගැනීම් සම්බන්ධව, වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන්, නීති විරෝධීව මසුන් මැරීම වැළැක්වීම සඳහා ධීවර ප්‍රජාව දැනුවත් කිරීම සහ වෙරළ ආරක්ෂිත කඩොලාන ශාඛ සිටුවීම යන වැඩසටහන් ක්‍රමානුකූලව පවත්වා ඇත.

ඉ. සෝදිසි සහ බේරා ගැනීමේ මෙහෙයුම්

මෙම ආයතනය සතුව ඇති සම්පත් උපයෝගි කර ගෙන ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් සිදු කරන සෝදිසි කිරීම් සහ බේරාගැනීම් කටයුතුවලට සහය ලබා දීම සිදු කරන අතර තවද, ශ්‍රී ලංකා පොලීසිය විසින් සහය ඉල්ලා සිටි අවස්ථාවන්හිදි ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීමද සිදු කරයි. ජීවිත ආරක්ෂක මධ්‍යස්ථාන (Life Saving Point) සහ ධිවර නිරීකෂණ මධ්‍යස්ථාන (Fishing Monitoring Point) සඳහා සංවෘත පරිපථ රූපවාහිනී (CCTV) පද්ධති සවිකිරීම සහ එම පද්ධති ජාලගත කිරීම මඟින් සෝදිසි කිරීම් සහ බේරා ගැනීම් පිළිබඳ තොරතුරු සුරක්ෂිතව තබාගැනීමට හැකිවීම හේතුවෙන් මෙහෙයුම් කටයුතු පහසු කර ගැනීමට සහ අදාළ අවස්ථාවන්හිදි භාවිත කිරීමට හැකියාව ලැබී ඇත.

ඊ. සමුද්‍රීය පරිසර ආරක්ෂණය

i. ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව මෙරට තෙල් කාන්දුවීම් පිළිබඳ කටයුතු කරන අතර ශ්‍රී ලංකා මුහුදු තීරයේ සිදුවන තෙල් කාන්දුවීම්වලට ප්‍රතිචාර දැක්වීමට සුදානමින් සිටී. එබැවින් උතුරු, නැගෙනහිර, දකුණ සහ බටහිර යන වෙරළ ආරක්ෂක කලාප සඳහා තෙල් කාන්දු ප්‍රතිචාර දැක්වීමේ කණ්ඩායම් සුදානම්ව තබා ඇත.

ii. මුහුදට ප්ලාස්ටික් අපද්‍රව්‍ය බැහැර කිරීම වැළැක්වීම සඳහා ධීවර යාත්‍රාවල රැගෙන යන ප්ලාස්ටික් බෝතල් ප්‍රමාණයම නැවත වරායට ගෙන ඒම පිළිබඳව ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සහතික කරයි.

iii. කැස්බෑ බිත්තර සංරක්ෂණය කිරීමේ වැඩසටහන යටතේ කැස්බෑ පැටවුන් ආරක්ෂා සහිතව මුහුදට මුදාහැරීමේ කටයුතු අඛණ්ඩව සිදුකරන අතර, ඒ අනුව මෙම කාලසීමාව තුළ (2024) කැස්බෑ බිත්තර 60,473ක ප්‍රමාණයකින් පැටවුන් 36,743ක ප්‍රමාණයක් මුහුදට මුදාහැර ඇත.

iv. පරිසර හිතකාමී වැඩසටහන් යටතේ වෙරළ ආරක්ෂක කඳවුරු ආශ්‍රිත මුහුදු තීරයන්වල කඩොලාන ශාක වගාකිරීමේ කටයුතු අඛණ්ඩව සිදුකර ඇත.

ඊ. අන්තර්ජාතික සහ කලාපීය සහයෝගීතා වර්ධනය

i. ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව, අන්තර්ජාතික සහ කලාපීය සහයෝගීත්වය වර්ධනයෙහි ලා එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ ආයතනය (UNODC), ආසියානු වෙරළ ආරක්ෂක ආයතන නියෝජිතායතන රැස්වීමේ ප්‍රධානීයා (HACGAM), ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායනය (JICA), යුරෝපීය සංගමය, ඉන්දියානු සාගර සහයෝගිතා සංගමය (IORA) සමඟ සම්බන්ධ වී ජාත්‍යන්තර සහ කලාපීය සහයෝගිතාවය වර්ධනය කිරීම සඳහා කටයුතු කරන ලදී.

6. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

i. රටේ ආහාර ඉල්ලුමට සරිලන වී, ධාන්‍ය, එළවළු වැනි මහා පරිමාණ කෘෂි, පශු ව්‍යාපෘතීන් ද, ගඩොල්, බ්ලොක් ගල් වැනි ඉදිකිරීම් කර්මාන්තයට අවශ්‍ය ව්‍යාපෘතීන් ද ආරම්භ කර රටේ ජාතික සංවර්ධනයට අඛණ්ඩ දායකත්වයක් සපයනු ලබයි.

ii. දෙපාර්තමේන්තු භටයන් රාජ්‍ය ආයතන වල ආරක්ෂක රාජකාරි, නර්තන හා සංගීත කණ්ඩායම් සේවා, ඉදිකිරීම්, නඩත්තු හා විවිධ සේවා සැපයීම තුළින් ද ආදායම් උත්පාදනය කිරීමට සමත් වී ඇත. රාජ්‍ය ආදායම ඉහළ නැංවීම සඳහා පහත පරිදි දෙපාර්තමේන්තුවේ දායකත්වය ලබා දී ඇත.

ව්‍යාපෘති කාණ්ඩය	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023	2024
	රු. මි	රු. මි	රු. මි	රු. මි	රු. මි	රු. මි	රු. මි	රු. මි	රු. මි	රු. මි
ව්‍යාපෘති	295	631	541	375	382	482.5	379.2	655.3	907.8	1,363.18
ආරක්ෂක සේවා	25	204	12	491	606	375.7	320.5	741.7	528.9	638.30
නර්තන හා සංගීත	-	27	11	6	17	3	1.6	4.6	4.6	1,60
නඩත්තු සේවා	-	23	19	22	24	17.5	25.58	67.3	28.5	79.87
ඉදිකිරීම් සේවා	-	30	58	87	102	90.5	1.57	6.4	8.6	27.09
විවිධ	3	141	202	16	5	9	41.06	89.7	67.1	63.77
එකතුව	**323**	**1,056**	**1,143**	**997**	**1,156**	**978.2**	**769.5**	**1565.0**	**1545.5**	**2,173.81**

iii. පරිපූරක හමුදාවක් ලෙස ක්‍රියාකිරීම සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු මානව සම්පත් කළමනාකරණය.

iv. ජාතික උත්සව සහ වෙනත් වැදගත් අවස්ථා සඳහා දායකත්වය සැපයීම.

v. ඉදිකිරීම් සඳහා සහාය වීම.(2024 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ඉදිකිරීම් ව්‍යාපෘති සාරාංශය පහත පරිදි වේ.)

අ/අ	ඉදිකිරීම් ව්‍යාපෘතියේ විස්තර	යොදවා ඇති භටයින් ගණන
1	පල්ලන්සේන බන්ධනාගාරයේ දෙමහල් ගොඩනැඟිලි 04 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා පූහුණු/නුපුහුණු ශ්‍රම දායකත්වය ලබා දීම.	24
2	අවිස්සාවේල්ල දිස්ත්‍රික් රෝහල නවීකරණය කිරීමේ සේවාව	18
3	රත්තොට ප්‍රාදේශිය ලේකම් ගම්පෙරළිය කඩිනම් සංවර්ධන වැඩසටහන යටතේ සෙවිලි තහඩු භාවිතා කර ලැයිම් කාමර දේසවිලි කිරීමේ ව්‍යාපෘතිය	13

vi. විදුලි වැට ඉදිකිරීම් හා නඩත්තු කටයුතු සිදු කිරීම.

අලිමිනිස් ගැටුම් බහුලව පවතින ප්‍රදේශවල මිනිසුන්ගේ හා අලි ඇතුන්ගේ ජීවිත බේරා ගැනීම සඳහා වනජීවී අමාත්‍යාංශය හා ඒකාබද්ධව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වන අලි කළමනාකරණ හා පලවා හැරීම්, අලිවැට ඉදිකිරීම් හා නඩත්තු ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කර ඇත. මේ යටතේ සිවිල් ආරක්ෂක භටයන් 3,856 ක් යොදවා 2,113,356 Km ක දිගින් යුක්ත වන විදුලි වැටවල් 201 ක් නඩත්තු කර පවත්වාගෙන යනු ලබයි.

vii. ගුරු හිඟය පවතින දුෂ්කර ප්‍රදේශවල පිහිටි පාසල් වෙත ස්වේච්ඡා ගුරුවරුන් අනුයුක්ත කිරීම .

දිවයිනේ ඉතා දුෂ්කර ප්‍රදේශයන්හි පිහිටි ගුරුවරුන් නිහ පාසල්වල දරුවන්ගේ අධ්‍යාපනය ලැබීමේ අයිතිය තහවුරු කරනු වස්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මඟින් සුදුසුකම් ලත් ගුරුවරුන් 183 ක් උතුරු, උතුරු මැද හා නැගෙනහිර පළාත් වල පාසල් 138 ක් වෙත අනුයුක්ත කර ඇත.

viii. දෙපාර්තමේන්තුව යටතේ පවතින බලකා මූලස්ථාන වෙතින් විවිධ ව්‍යාපෘතින් ක්‍රියාවට නැංවීම.

- කෘෂී ව්‍යාපෘති
  වගාව, එළවළු සහ සුළු අපනයන බෝග ව්‍යාපෘති පවත්වාගෙන යන අතර එයින් ලැබෙන අදායම ඒකාබද්ධ අරමුදලට බැර කර ඇත
- කපු ව්‍යාපෘති
- ගඩොල් ව්‍යාපෘති
- සැලුන් ව්‍යාපෘති

ix. ඩෙංගු මර්ධන වැඩසටහන් පැවැත්වීම.
රට පුරා විවිධ ප්‍රදේශයන්හි විවිධ ආයතන විසින් පවත්වන ලද ඩෙංගු මර්ධන වැඩසටහන් ස්ථාන 13 ක් සඳහා සාමාජික/සාමාජිකාවන් 220 ක් යොදවා ඇත.

x. මත්ද්‍රව්‍ය උවදුරෙන් නිදහස් රටක් ඇති කිරීම සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධව විශේෂ පුහුණුව ලත් උපදේශකයින් යොදවා උපදේශන වැඩසටහන් 30ක් පමණ ක්‍රියාත්මක කර ඇත.

xi. දෙපාර්තමේන්තුමය සුබසාධන ක්‍රියාකාරකම්.
සිවිල් ආරක්ෂක පවුල්වල පාසල් දරුවන් සඳහා අභ්‍යාස පොත් බෙදා දීම සහ නව නිවාස ඉදිකරදීම සහ විල්පත්තුව මියගිය රණවිරු පවුල් සඳහා වියලි ආහාර ද්‍රව්‍ය බෙදා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

7.ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය

අ. උපාධිධාරීන් බිහිකිරීම.

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයෙහි වාර්ෂික උපාධි ප්‍රධානෝත්සවය 2024 ඔක්තෝබර් මස 14 සහ 15 දෙදින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැති අතර, එහිදී ප්‍රථම සහ පශ්චාත් උපාධිධාරීන් 1732 ක් උපාධි ලබා ගන්නා ලදී.

ආ. ශිෂ්‍ය බඳවා ගැනීම්

2025 අධ්‍යයන වර්ෂය සඳහා පාඨමාලා අංක 42 වෙනුවෙන් 2024.12.31 වන විට මුදල් ගෙවීමේ පදනම මත සිසුන් 1851 ක් සහ කැඩෙට් නිලධාරීන් 205 ක් බඳවා ගෙන ඇත.

ඇ. විශ්වවිද්‍යාලය ලැබූ ජයග්‍රහණ

i. ශ්‍රී ලංකාවේ සංවිධානය කරනු ලබන ප්‍රධානතම වෙබ් අඩවි නිර්මාණ තරඟාවලිය වන Bestweb.lk තරඟාවලියේදී 2024 වර්ෂයෙහි වඩාත් ජනප්‍රිය උසස් අධ්‍යාපන ආයතන වෙබ් අඩවිය සඳහා වන සම්මානය විශ්වවිද්‍යාල වෙබ් අඩවිය සඳහා හිමිවිය .

ii. වෙනිසියුලාවේ පැවති සිව්වන CISM ලෝක කැඩෙට් තරඟාවලියට සහභාගි වූ කැඩෙට් නිලධාරීන් සුවිශේෂී දස්කම් දැක්වීමට සමත් විය. එහිදී උස පැනීමේ ඉසව්වේ රන් පදක්කම දිනා ගැනීමට කැඩෙට් කෝප්‍රල් ටී.ටී.කේ.ඒ.ජී.ඩබ්ලිව්. චතුරංග සමත් වූ අතර, කාන්තා කැඩෙට් නිලධාරිනී ජේ.එච්.එස්. සවින්දි මීටර් 50 නිදහස් ආර පිහිනුම් ඉසව්වෙන් ලෝකඩ පදක්කම දිනා ගැනීමට සමත් විය.

iii. 2024 ජූලි මස 13 සිට 16 දක්වා දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගනයේදී පැවති කණිෂ්ඨ ජාතික මළල ක්‍රීඩා ශූරතාවලියේදී සුවිශේෂී දස්කම් දැක්වීමට විශ්වවිද්‍යාලයීය මළල ක්‍රීඩා කණ්ඩායම සමත්විය. මෙහිදී කණිෂ්ඨ කැඩෙට් නිලධාරී යූ.එම්.එස්.එම්. අබේසිංහ විසින් 23 න් පහළ යගුලිය විසිකිරීමේ ඉසව්වෙහි ලෝකඩ පදක්කම දිනා ගන්නා ලදී.

iv. ශක්ති ජාතික බර ඉසිලීමේ තරඟාවලියේ සමස්ත ශූරතාවය දිනා ගැනීමට විශ්වවිද්‍යාලයීය බර ඉසිලීමේ කණ්ඩායම සමත්විය. එහිදී රන් පදක්කම් 4ක්, රිදී පදක්කම් 2ක් සහ ලෝකඩ පදක්කම් 2ක් දිනා ගැනීමට විශ්වවිද්‍යාලයීය බර ඉසිලීමේ කණ්ඩායම සමත්විය. මෙහිදී වෛද්‍ය පීඨයෙහි පී.ඒ.පී.ඒ. වතුගෙදර සහ සම සෞඛ්‍ය විද්‍යා පීඨයෙහි අයි.ඩී.එස්.එස්.බී. ගුණවර්ධන විසින් නව ජාතික වාර්තා 3ක් පිහිටුවන ලදී.

v. විවෘත කරාතේ තරඟාවලියේදී කණිෂ්ඨ කැඩෙට් නිලධාරි එච්.එස්.එස්.පී. ප්‍රනාන්දු කිලෝග්‍රෑම් 67 ජොෂ්ඨ පිරිමි කුමිතේ ඉසව්වෙහි තෙවන ස්ථානය දිනා ගැනීමට සමත් විය.

vi. ජාතික වයස් කාණ්ඩ පිහිණුම් ශූරතා තරඟාවලියේදී විවෘත කාණ්ඩයේ ශූරතාවය දිනාගැනීමට විශ්වවිද්‍යාල පිහිණුම් කණ්ඩායම සමත්විය. මෙහිදී රන් පදක්කම් 3ක්, රිදී පදක්කමක් සහ ලෝකඩ පදක්කමක් දිනාගැනීමට එස්.එම්.තෙන්නකෝන් සමත් විය.

vii. තිස් නමවන (39) ජාතික ඔරු පැදීමේ ශූරතා තරඟාවලියේදී රිදී පදක්කම් 4ක් සහ ලෝකඩ පදක්කම් 12ක් දිනා ගනිමින් විශේෂ දක්ෂතා දැක්වීමට විශ්වවිද්‍යාලයීය ඔරු පැදීමේ කණ්ඩායම සමත් විය.

viii. ශ්‍රී ලංකා බර ඉසිලීමේ සංගමය විසින් සංවිධානය කරන ලද සමස්ත ලංකා බර ඉසිලීමේ bench press ශූරතාවලියේදී විශිෂ්ඨ දස්කම් දැක්වීමට විශ්වවිද්‍යාලයීය බර ඉසිලීමේ කණ්ඩායම සමත් විය. එහිදී ප්‍රථම ස්ථාන 7ක් , දෙවන ස්ථාන 1ක්, තෙවන ස්ථාන 3ක් සහ සිව්වන ස්ථාන 3ක් දිනා ගැනීමට විශ්වවිද්‍යාලයීය බර ඉසිලීමේ කණ්ඩායම සමත්විය.

ix. ජාතික ගෘහස්ථ ඔරු පැදීමේ තරඟාවලියේදී විශ්වවිද්‍යාලය නියෝජනය කළ කණ්ඩායම වයස 23න් පහළ කාණ්ඩයෙහි කාන්තා සහ පිරිමි ප්‍රථම, දෙවන සහ තෙවන ස්ථාන දිනා ගැනීමට සමත්විය.

x. ඉන්දියාවේ ගෝව නගරයේදී පැවැති “Lex Infinitum” ජාත්‍යන්තර ආරවුල් නිරවුල් කිරීමේ තරඟාවලියේදී
(International Dispute Resolution Competition) විශ්වවිද්‍යාලය නියෝජනය කළ කණ්ඩායම අනුශූරතාවය දිනා ගැනීමට සමත් විය.

ඇ. විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්

i. 2024 වර්ෂය සඳහා වූ Times Higer Education (THE) Impact ශ්‍රේණිගත කිරීම්හි පහත කාණ්ඩයන්හි, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අතර, ප්‍රථම ස්ථානය දිනා ගැනීමට ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සමත්විය.

- ගුණාත්මක අධ්‍යාපනය
- ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව
- පිරිසිදු ජලය හා සනීපාරක්ෂාව
- විනීත කාර්යය සහ ආර්ථික වර්ධනය
- අසමානතා දුරලීම
- වගකීම් සහගත පරිභෝජනය සහ නිෂ්පාදනය

ii. 2024 වර්ෂය සඳහා වූ Times Higer Education (THE) Impact ශ්‍රේණිගත කිරීම්හි පහත කාණ්ඩයන්හි, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අතර දෙවන ස්ථානය දිනා ගැනීමට ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සමත්විය.

- ළඟාවිය හැකි පිරිසිදු ශක්තිය
- යහපත් සෞඛ්‍ය සහ දියුණුව

8. රාජ්‍ය බුද්ධි සේවය

ආරක්ෂක අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන රාජ්‍ය බුද්ධි සේවාව ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් පවතින තර්ජනයන් හඳුනාගෙන ඒ පිළිබඳව පූර්ව බුද්ධි තොරතුරු අදාළ පාර්ශවයන් වෙත ලබාදෙමින් එම තත්ත්වයන් වළක්වා ගැනීමේ අරමුණෙන් ස්ථාපිත කර ඇති රජයේ ප්‍රමුඛතම බුද්ධි ආයතනය වේ.

9. ජාතික ශිෂ්‍යභට බලකාය

2024 ශිෂ්‍යභට බලකායේ අරමුණු කාර්යක්ෂමව සාක්ෂාත් කරගැනීම හා කටයුතු වඩාත් ඵලදායී කරගැනීම සඳහා සීඝ්‍ර ගමනක යෙදුණි.

අ. **2024** වර්ෂයට අදාළ නිලධාරි නිල උසස් කිරීම්

අ/අ	නිල උසස් කිරීම	සංඛ්‍යාව
1	ලුතිනන් කර්නල් නිල ස්ථිර කිරීම	24
2	තා/ලුතිනන් නිල උසස් කිරීම	19
3	තා/කර්නල් නිල උසස් කිරීම	06
4	2/ලුතිනන් සිට ලුතිනන්	38
5	ලුතිනන් සිට තාවකාලික කපිතන්	25
6	කපිතන් සිට තාවකාලික මේජර්	43

ආ. **2024** වර්ෂයට අදාළ පුහුණු කටයුතු පිළිබඳ විස්තර

පුහුණු වැඩ සටහන	කාලසීමාව	ඛණ්ඩ සංඛ්‍යාව		නිලධාරි සංඛ්‍යාව		ඉරුමහක්ම මහතුන්	ශිෂ්‍යභට ජොයකොනොනි		ශිෂ්‍යභටයින්		එකතුව
		බාලක බාලිකා		නිලධාරි සංඛ්‍යාව	නිලධාරිණි		බාලක	බාලිකා	බාලක	බාලිකා	
ආධුනික නිලධාරී පාඨමාලාව	2024.01.15 - 2024.03.08			51	21						
නිදහස් දින පෙළපාලි කඳවුර	2024.01.25 - 2024.02.05			27	9				282	198	480
කොනොනි ආරක්ෂක/පොලිස් පුහණු කඳවුරු අදියර I	2024.01.07 - 2024.01.13			26	3	-	16	10	649	340	1015
කොනොනි ආරක්ෂක/පොලිස් පුහණු කඳවුරු අදියර II	2024.01.15 - 2024.01.21			23	7	1	14	11	629	344	998
කොනොනි ආරක්ෂක/පොලිස් පුහණු කඳවුරු අදියර III	2024.02.08 - 2024.02.14			26	6	3	12	11	664	326	1013
බටහිර තූර්ය වාදන කොනොනී කඳවුර	2024.02.17 - 2024.02.25			21	4	2	3	3	639	125	770
පෙරදිග තූර්ය වාදන කොනොනී කඳවුර	2024.05.16 - 2024.05.22			15	5	5	11	11	324	132	478
ආරක්ෂක පළාත් ඇගයීම් කඳවුර අදියර I බස්නාහිර	2024.06.02 - 2024.06.06	39	20	39	10	10	22	14	968	497	1501
ආරක්ෂක පළාත් ඇගයීම් කඳවුර අදියර II නැගෙනහිර/බස්නාහිර	2024.06.09 - 2024.06.13	39	19	39	11	9	22	15	955	461	1453
ආරක්ෂක පළාත් ඇගයීම් කඳවුර අදියර III බස්නාහිර/ඌව	2024.06.16 - 2024.06.20	40	20	39	4	16	29	16	982	489	1516
ආරක්ෂක පළාත් ඇගයීම් කඳවුර අදියර IV දකුණ	2024.06.24 - 2024.06.28	40	20	40	5	15	22	17	991	496	1526
පොලිස් ඇගයීම් කඳවුර අදියර I	2024.07.01 - 2024.07.05	40	20	38	1	19	24	15	991	498	1528
ආරක්ෂක පළාත් ඇගයීම් කඳවුර අදියර V සබරගමුව	2024.07.08 - 2024.07.12	40	20	34	6	15	21	14	981	493	1509
පොලිස් ඇගයීම් කඳවුර අදියර II	2024.07.15 - 2024.07.19	40	23	37	1	22	23	17	994	573	1607

10.ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය

දේශීය විදේශීය ත්‍රිවිධ හමුදා නිලධාරීන් සහ ශ්‍රී ලංකා පොලිස් නිලධාරීන්ට ඉතා උසස් මට්ටමේ වෘත්තිමය පුහුණුවක් ලබාදීම මෙන්ම විදෙස් රටවල ත්‍රිවිධ හමුදා නිලධාරීන් සමඟ අධ්‍යයන කටයුතුවල නිරත වෙමින් අන්තර්ජාතික සහයෝගිතාවය වර්ධනය කරගැනීමට අවස්ථාව සැලසීම මෙම ආයතනය වෙතින් සිදු කරනු ලබන මහඟු කටයුත්තක් වන අතර, වර්තමානයට මෙන්ම අනාගතයට උචිත පරිදි නිර්මාණාත්මක ඵලදායි පුහුණු සැලසුම් තුළින් වෘත්තිමය නිපුණත්වයක් ලබාදීම සහ නිවැරදි මාර්ගෝපදේශයන් තුළින් සාර්ථකත්වයට මඟ පෙන්වීම සිදු කරනු ලබයි.

i. 2024 වර්ෂයේ උපාධි ප්‍රදානෝත්සවය 2024.12.12 දින නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ රඟහලේදී පැවැත්විණි.

ii. අණ හා මාණ්ඩලික රාජකාරි සඳහා නිලධාරීන්/නිලධාරිණියන් පුහුණු කිරීම තුළින් ප්‍රධාන වශයෙන්ම රටේ ජාතික ආරක්ෂාවට මහත් පිටිවහලක් වීම මෙන්ම දැනුමෙන් සන්නද්ධ වූ නිලධාරීන් සමාජයට අවතීර්ණ වීමෙන් පසු යහපත් මෙන්ම ක්‍රමානුකූල සමාජයක් ඇති කර ගැනීමට හැකිවීම.

iii. මෙම පාඨමාලාව සඳහා රටවල් 12 ක් (බංගලාදේශය, ඉන්දියාව, ඉන්දුනිසියාව, මාලදීවයින, මැලේසියාව, නේපාලය, පකිස්ථානය, රුවන්ඩාව, සෞදි අරාබිය, සෙනගල්, ඇමරිකා එක්සත් ජනපදය, සැම්බියාව) නියෝජනය කරමින් විදේශ නිලධාරීන් 26 ක් සහභාගී වීම තුළින් රටට සැලකිය යුතු විදේශ විනිමයක් ලබාගත හැකි වනවා සේම එම රටවල් අතර, අනෝන්‍ය සම්බන්ධතාවය හා සහජීවනය වර්ධනය කර ගැනීමට හැකිවීම.

iv. යුද හා සාමකාමී යන අවස්ථාවන් දෙකෙහිදීම ක්‍රියා කළ යුතු ආකාරය හා ඊට අදාළ ශිල්පීය ක්‍රම පිළිබඳව න්‍යායාත්මක සහ ප්‍රායෝගිකව දැනුවත්ව සිටීම මෙන්ම ඕනෑම අන්දමක යුද්මය මෙහෙයුමකදී හමුදාවක අන්තර්ගත වී ඇති යුද මූලධර්ම හා ශිල්පීය ක්‍රම පිළිබඳ දැනුවත් කිරීම ත්‍රිවිධ හමුදාවම තුළින් පොදුවේ ඒකාබද්ධව ක්‍රියා කිරීම හා විදේශීය රටවල් අතර අනෝන්‍ය සම්බන්ධතාවය වර්ධනය කරගැනීම.

v. ශ්‍රී ලංකා යුද හමුදා, නාවික හා ගුවන් හමුදාවේ ඕනෑම ක්ෂේත්‍ර මූලස්ථානයක මෙන්ම ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ අණදීමේ යාන්ත්‍රණයේ ක්‍රියාකාරකම් පිළිබඳ විශ්ලේෂණාත්මක දැනුම.

vi. ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවන්හි භූමිකාවල ව්‍යුහය, සංවර්ධනය සහ අන්තර් සබඳතා පිළිබඳව දැනුවත් වීම.

vii. ශ්‍රී ලංකාවේ ආරක්ෂක ප්‍රතිපත්තිය සකස් වී ඇති ආකාරය සහ හමුදා දර්ශනය ඊට සම්බන්ධව ඇති අයුරු අවබෝධ කරගැනීම.

viii. ශ්‍රී ලංකාවේ හා මිත්‍ර රටවල ආරක්ෂක ප්‍රතිපත්තිවලට බලපෑම් ඇති කරනු ලබන ජාතික හා ජාත්‍යන්තර කරුණු පිළිබඳව විග්‍රහය.

අ. ලබාගත් විශේෂ ජයග්‍රහණ, අභියෝග

i. රටේ අයහපත් ආර්ථික තත්ත්වය හමුවේ වුවද පාඨමාලා කටයුතු කිසිදු අඩුපාඩුවකින් තොරව නිම කිරීමට හැකි වූ අතර, ඉදිරි වර්ෂයන් තුළදී ද අඛණ්ඩව පාඨමාලාව පවත්වා ගෙන යාමට කටයුතු කිරීම.

ii. ශිෂ්‍ය නිලධාරීන් හට විදේශ අධ්‍යයන සංචාරයට සහභාගී වීමේ අවස්ථාව තුළින් නව අන්තර්ජාතික තාක්ෂණික ක්‍රම භාවිතය, බහුවිධ ඉගැන්වීම් ක්‍රම, ප්‍රායෝගික දැනුම ආදි විවිධ අධ්‍යාපන ක්‍රම භාවිතයෙන් විදේශීය රටවල් සමඟ නව දැනුම වර්ධනය කර ගැනීමට හා හුවමාරුකර ගැනීමට හැකි වීම.

11. ආරක්ෂක සේවා විද්‍යාලය

අ. කොළඹ සහ කුරුණෑගල ආරක්ෂක සේවා විද්‍යාලයන්හි දැනට ඉගෙනුම ලබන සිසු සිසුවියන් සංඛ්‍යාව පහත පරිදිවේ.

පන්තිය	ආරක්ෂක සේවා විදුහල (කොළඹ)		ආරක්ෂක සේවා විදුහල (කුරුණෑගල)	
	ගැහැණු	පිරිමි	ගැහැණු	පිරිමි
1 වසර	62	88	59	78
2 වසර	94	108	57	79
3 වසර	83	114	60	97
4 වසර	74	133	70	84
5 වසර	82	145	60	100
6 වසර	125	218	95	109
7 වසර	136	163	103	102
8 වසර	114	199	95	118
9 වසර	124	190	96	116
10 වසර	132	165	98	119
11 වසර	135	173	101	114
12 වසර	91	85	49	45
13 වසර	105	124	63	48
එකතුව	1357	1905	1006	1209
මුළු එකතුව	**3262**		**2215**	

ආ. කොළඹ සහ කුරුණෑගල ආරක්ෂක සේවා විද්‍යාලයන්හි අධ්‍යාපන ප්‍රගතිය

i. ආරක්ෂක සේවා විදුහල (කොළඹ)

අ/අ	විස්තර	2023	2024
1	5 වසර ශිෂ්‍යත්වය විභාගය සමත් සිසුන් සංඛ්‍යාව (කඩඉම් ලකුණු හා ඉන්ඉහළ)	39	-
2	අ.පො.ස (සා/පෙළ) සමත් සිසුන් සංඛ්‍යාව	285	-
3	අ.පො.ස (උ/පෙළ) සමත් සිසුන් සංඛ්‍යාව	114	-

ii. ආරක්ෂක සේවා විදුහල (කුරුණෑගල)

අ/අ	විස්තර	2023	2024
1	5 වසර ශිෂ්‍යත්වය විභාගය සමත් සිසුන් සංඛ්‍යාව (කඩඉම් ලකුණු හා ඉන් ඉහළ)	41	-
2	අ.පො.ස (සා/පෙළ) සමත් සිසුන් සංඛ්‍යාව (ප්‍රථම වරට පෙනී සිටි කණ්ඩායම 2019 වසර)	105	-
3	අ.පො.ස (උ/පෙළ) සමත් සිසුන් සංඛ්‍යාව	41	-

ඇ. කොළඹ සහ කුරුණෑගල ආරක්ෂක සේවා විද්‍යාලයන්හි සිසු සිසුවියන්ගේ ක්‍රීඩා සහ අනෙකුත් කාර්යයන්හි ප්‍රගතිය

i. ආරක්ෂක සේවා විදුහල (කොළඹ) - ක්‍රීඩා ජයග්‍රහණ

අ/අ	දරුවාගේ නම	ක්‍රීඩාව	වයස් කාණ්ඩය	ලබාගෙන ඇති ජයග්‍රහණ	
1	වර්ෂා දෙව්මිණි	මීටර් 200	18 න් පහළ බාලිකා	3 වන ස්ථානය	සමස්ථ ලංකා මලල තරඟාවලිය
2	පී එස් බී එස් ඩී සේනානායක	මීටර් 50 පසුපස ආර මීටර් 100 පසුපස ආර මීටර් 200 පසුපසු ආර	18 න් පහල බාලිකා	3 වන ස්ථානය 3 වන ස්ථානය 2 වන ස්ථානය	49 වන ශ්‍රී ලංකා පාසල් ජල ක්‍රීඩා ශූරතාවලිය
3	එච් ඩී අදිත රවිලු එස් ඒ ඩී ශාමිලා රංගනී	තෙයිකොන් ඩෝ	19 න් පහළ	2 වන ස්ථානය (රීදි පදක්කම)	ජාතික පාසල් තෙයිකොන්ඩෝ තරඟාවලිය - 2024
4	එල් සංදීපනි ජී සිනෙත්	තෙයිකොන් ඩෝ	17 න් පහළ	3 වන ස්ථානය (ලෝකඩ පදක්කම්)	ජාතික පාසල් තෙයිකොන්ඩෝ තරඟාවලිය - 2024
5	එස් ඒ ඩී ශ්‍යාමිලා රංගනී කේ එච් හංසලි	තෙයිකොන් ඩෝ	17 න් පහළ	3 වන ස්ථානය (ලෝකඩ පදක්කම්)	2024 පුන්සේ ජාතික නිදහස් කුසලාන තෙයිකොන්ඩෝ තරඟාවලිය
6	ඩී ආර් එස් චන්දිමාල් එම් කේ එල් කේ අකලංක බී ඩබ්ලිව් ඒ සංජය	වායු රයිෆලය	19 න් පහළ 17 න් පහළ	පාසල් වර්ණ	සමස්ථ ලංකා වෙඩි තැබීම් තරඟාවලිය
7	ඩී ආර් ආර් එස් චන්දිමාල් එම්කේ එල් කේ අකලංක එච් පී එම් එම් පතිරණ එන් එම් එන් නවගමුව බී ඩබ්ලිව් සංජය ඒ කේ බී අක්මීමන ආර් ආර් ජේ සෙනවිරත්න ඩී ජී කාවින්ද්‍යා එම් එම් එන් සඳමිණි කේ සී ටී ටී වික්‍රමසිංහ ආර් ඊ එම් සී එස් මඩුගල්ල	වායු රයිෆල්	15 න් පහළ 17න් පහළ 19 න් පහළ බාලික සහ බාලිකා	ෂාප් ශූටර් පදක්කම	සමස්ථ ලංකා වෙඩි තැබීම් තරඟාවලිය

ii. වෙනත් විෂය බාහිර ක්‍රියාකාරකම් - ජයග්‍රහණ

අ/අ	විස්තරය	ක්‍රීඩාව	ලබාගෙන ඇති ජයග්‍රහණ (2024)
1	කණිෂ්ඨ ශිෂ්‍යාහට (බාලිකා)	ශිෂ්‍යා හඬ තරඟාවලිය	කනිෂ්ඨ ශිෂ්‍යාහට බාලිකා කණ්ඩායම පළාත් තරඟාවලි සඳහා සහභාගි වීම
2	ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යාහට (බාලක)	තූර්ය වාදක	ශිෂ්‍යාහට තූර්යවාදක (බාලක) කණ්ඩායම ප්‍රථම වරට සමස්ත ලංකා තරඟාවලිය සඳහා සහභාගි වී
3	ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යාහට (බාලක)	ශිෂ්‍යාහට තරඟාවලිය	ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යාහට බාලක පළාත් තරඟාවලි සඳහා සහභාගි වීම
4	කණිෂ්ඨ ශිෂ්‍යාහට (බාලක)	ශිෂ්‍යාහට තරඟාවලිය	ජෝන් බී කල් අභියෝගතා කුසලාන තරඟාවලිය දක්වා සහභාගි වීම

iii. ආරක්ෂක සේවා විදුහල (කුරුණෑගල) - ක්‍රීඩා ජයග්‍රහණ

අ/අ	දරුවාගේ නම	ක්‍රීඩාව	වයස් කාණ්ඩය	ලබාගෙන ඇති ජයග්‍රහණ	
1	තෙනුකි රණසිංහ	හෙල්ල විසි කිරීම	16 න් පහළ	3 වන ස්ථානය	2023 සමස්ථ ලංකා ජෝන් ටාබට් ජයග්‍රහණ
2	කවිදු ඒකනායක	උස පැනීම (බාලික)	13 න් පහළ	2 වන ස්ථානය	

ඈ. ක්‍රියාත්මක කර ඇති සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධ මූල්‍ය සහ භෞතික ප්‍රගතිය

- ආරක්ෂක සේවා විදුහල (කොළඹ) සිසු නේවාසිකාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම

දුර බැහැර ප්‍රදේශයන්හි සිට පාසල වෙත පැමිණෙන සිසුන්ට ක්‍රීඩා කටයුතුවල නිරතවීමට, නේවාසික අධ්‍යාපන ආධාර වැඩසටහන් සහ විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා වැඩි කාලයක් ලබාගැනීම ප්‍රධාන අරමුණ කරගනිමින් සිසු නේවාසිකාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම් ව්‍යාපෘතිය ආරම්භකර ඇත. ව්‍යාපෘතියේ 2024.12.31 වන දිනට භෞතික හා මූල්‍ය ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ. ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ශ්‍රමදායකත්වය ශ්‍රී ලංකා යුද හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙතින් නොමිලේ ලබාදී ඇත.

ඉදිකිරීම් ව්‍යාපෘතිය භාර ආයතනය	භෞතික	මූල්‍ය (රු.මි.)	
		2024 වර්ෂයට වෙන්කරන ලද ප්‍රතිපාදන	2024.12.31 දිනට වියදම
6 (ස්වෙච්ඡා) ඉංජිනේරු සේවා රෙජිමේන්තුව, ශ්‍රී ලංකා යුද හමුදාව	95%	170.00	115.954 (අතිරේක ලේකම් ආරක්ෂක සේවා වෙතින් 2025.01.16 දින ලබා ගන්නා ලදී)

- ආරක්ෂක සේවා විදුහල (කුරුණෑගල) නව පොදු පහසුකම් ගොඩනැගිල්ල ඉදිකිරීම.

ආරක්ෂක සේවා විදුහල (කුරුණෑගල) වෙනුවෙන් පොදු පහසුකම් ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු 2017 වර්ෂයේ ලබාදී ඇති අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව ආරම්භකර ඇති අතර, එහි 2024.12.31 වන දිනට භෞතික හා මූල්‍ය ප්‍රගතිය පහත සඳහන් පරිදිවේ. එම ගොඩනැගිල්ලෙහි විද්‍යාගාර, පුස්තකාල, සුහුරු පංති කාමර, වෛද්‍ය අංශය සහ ශ්‍රවණාගාර යනාදී පොදු පහසුකම් සිසු දරුවන්ට ලබාදීමට නියමිතය. ඉදිකිරීම් සඳහා පූර්ණ ශ්‍රමදායකත්වය ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් නොමිලේ ලබාදෙන අතර, ඉංජිනේරු උපදේශනය වයඹ පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව වෙතින් සිදුකෙරේ.

ඉදිකිරීම් ව්‍යාපෘතිය භාර ආයතනය	භෞතික	මූල්‍ය (රු. මිලියන)	
		2024 වර්ෂයට වෙන්කරන ලද ප්‍රතිපාදන	**2024.12.31** දිනට වියදම
ශ්‍රී ලංකා නාවික හමුදාව	55% (සම්පූර්ණ ව්‍යාපෘතියේ ප්‍රගතිය)	80.00	71.08(ඩීජීසිඉ/ඩීඅයිආර්/ඛබ්ලිව්ඊඑස්ටී/28/2017 හා 2025.01.02 දිනැති නාවික හමුදා මුලස්ථාන ලිපියට අනුව 2024.12.31 දිනට වියදම)

12. ආරක්ෂක පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය

i. පර්යේෂණ ව්‍යාපෘති හා සංවර්ධන ව්‍යාපෘති වලට අමතරව විවිධ ක්ෂේත්‍ර කෙරෙහි සම්බන්ධතා වර්ධනය කර ගෙන ඇත.

ii. මනා පරිසරයක් ඇති කිරීමට පර්යේෂණාගාර පහසුකම්, නවාතැන් පහසුකම්, තාක්ෂණික ගබඩා පහසුකම්, ආයතන සේවකයන් හට ලබා දී ඇත.

iii. රාජ්‍ය සහ පෞද්ගලික විශ්වවිද්‍යාල සිසුන් සම්බන්ධ කරගනිමින් සීමාවාසික පුහුණුව සඳහා ඉලෙක්ට්‍රෝනික, විදුලි, යාන්ත්‍රික ඉංජිනේරු, සයිබර් ආරක්ෂණ සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයන්හි පුහුණුව ලබාදෙමින් පර්යේෂණ ව්‍යාපෘති සඳහා සම්බන්ධ කර ගෙන ඇත.

iv. 2024 වර්ෂයේදී ව්‍යාපෘතින් 103 ක ප්‍රමාණයක් (2024 වර්ෂය ආරම්භ වීමට පෙර සිදුකරමින් පැවති ව්‍යාපෘති සහ එම වර්ෂය තුළ ආරම්භ කරන ලද ව්‍යාපෘති) සිදු කිරීමට සැලසුම් කළ අතර, ඉන් ව්‍යාපෘති 13ක ප්‍රමාණයක් සාර්ථකව අවසන් කර ප්‍රතිලාභීන් වෙත ප්‍රදානය කර ඇත. 2024 වර්ෂයේ ජූලි මස 04 දින පැවති මෙහෙයුම් කමිටු සාකච්ඡාවේදී ව්‍යාපෘති 05ක් ඉදිරියට කරගෙන යාමට ඇති අපහසුතාවය සලකා බලා ඉවත් කර ඇත.

13. ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය

i. **සංවිධානය කරන ලද වැඩසටහන්**

අ/අ	වැඩසටහන් කාණ්ඩය	ප්‍රමාණය
1	දියත් කිරීම	1
2	ආරක්ෂක මැදිරි	1
3	පුහුණු සැසිය	1
4	වෙබිනාර්	1
5	වෙබිනාර් (අතථ්‍ය සම්මන්ත්‍රණය)	1
6	ජාත්‍යන්තර ගිම්හාන පාසල	1
7	විදේශ නියෝජිතයින්ගේ සංචාරය	1
8	රැස්වීම	1
9	වට මේස සාකච්ඡාව	3
10	මහජන දේශන	1
එකතුව		**12**

ii. **වැඩසටහන් සංවිධානය (ජාතික ආරක්ෂාවේ විවිධ පැතිකඩයන් ඔස්සේ)**

අ/අ	ආරක්ෂක මානය	ප්‍රමාණය
1	සමාජ සහ දේශපාලන ආරක්ෂාව	02
2	පරිසර ආරක්ෂාව	02
3	ආර්ථික ආරක්ෂාව සහ සමුද්‍ර ආරක්ෂාව	06
4	මානව/පුද්ගල ආරක්ෂාව	02
එකතුව		**12**

iii. **දේශකයින් ලෙස ආයතනයේ කාර්ය මණ්ඩලය නියෝජනය කරන ලද වැඩසටහන්**

අ/අ	වැඩසටහන	ප්‍රමාණය
1	ජාත්‍යන්තර වැඩමුළු	01
2	සංවාද සැසි	01
3	රැස්වීම	01
4	ජාත්‍යන්තර සමුළු	02
5	සම්මන්ත්‍රණ	02
6	ජාත්‍යන්තර සම්මන්ත්‍රණය	01
7	වෙබිනාර්	01
8	වට මේස සාකච්ඡාව	01
එකතුව		**10**

iv. **ආයතනික සහයෝගිතාවය පැවැත්වීම**

අ/අ	සහයෝගිතාවයට සම්බන්ධ ආයතනය	ප්‍රමාණය
1	සත්‍ය පර්යේෂණ	01
2	බණ්ඩාරනායක ජාත්‍යන්තර අධ්‍යයන මධ්‍යස්ථානය (BCIS)	01
3	බංගලාදේශයේ සාමය සහ ආරක්ෂක අධ්‍යයන ආයතනය (BIPSS)	02
4	ලක්ෂ්මන් කදිරගාමර් ආයතනය (LKI)	01
5	පාත්ෆයින්ඩර් පදනම	01
6	අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය	01
එකතුව		**07**

v. **ප්‍රකාශන තත්ත්වය**

අ/අ	කාණ්ඩය	ප්‍රමාණය
1	පුවත්පත් ලිපි	36
2	වෙබ් ලිපි	14
3	සංක්ෂිප්ත	03
4	ප්‍රකාශිත පර්යේෂණ පත්‍රිකා	13
5	කාර්තුමය ආරක්ෂක ප්‍රකාශන	02
6	ජාතික ආරක්ෂක ලේඛන	02
7	සඟරා ලිපි	01
8	ජාත්‍යන්තර සඟරා ලිපිය	01
එකතුව		**72**

14. ජාතික ආරක්ෂක විද්‍යායතනය

හමුදා සහ සිවිල් නිලධාරීන් සඳහා ජාතික ආරක්ෂාව පිළිබඳ උපායමාර්ගික අධ්‍යයනය සිදුකිරීමට ඇති එකම හා ප්‍රධානතම අධ්‍යයන ආයතනය මෙය වේ. එමඟින් හමුදා හා සිවිල් අංශයේ පරිපාලනය උදෙසා අවශ්‍ය බුද්ධිමය දායකත්වය ලබාදීම හා ආරක්ෂක ක්‍රමෝපායික මාර්ගෝපදේශ ලබාදීම සිදුකරනු ලබයි. ජාතික ආරක්ෂක විද්‍යායතනය දේශීය මෙන්ම විදේශීය ආරක්ෂක අංශවල නිලධාරීන් සඳහා තම අත්දැකීම් හා ක්‍රියාපිළිවෙත් පිළිබඳ දැනුම බෙදා ගැනීමටත්, පශ්චාත් උපාධි සුදුසුකම ලබාගැනීමටත් අවකාශය සලසා දෙන අධ්‍යයන ආයතනයකි.

i. ආරක්ෂාව සහ උපාය මාර්ගික අධ්‍යයන පිළිබඳ අධ්‍යයන හා පුහුණු වැඩසටහන් පවත්වා ඇත.

ii. ජාතික ආරක්ෂක විද්‍යායතනය හි අධ්‍යයන පාඨමාලා හැදෑරීමට ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවන්හි ජ්‍යෙෂ්ඨ නිලධාරින්, පොලිස් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් සහ ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරින් ඇතුළත් කරගෙන ඇත.

iii. ජාතික ආරක්ෂක විද්‍යායතනයහි අධ්‍යයන පාඨමාලා හැදෑරීමට විදේශ රටවල සන්නද්ධ හමුදාවන්හි ජ්‍යෙෂ්ඨ නිලධාරින් ඇතුළත් කර ගන්නා ලදී.

iv. උපායමාර්ගික ආරක්ෂාව සම්බන්ධ අධ්‍යයන ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමු කරන සහ පර්යේෂණ කටයුතු පැවැත්වීම සඳහා පහසුකම් සැලසෙන වෙනත් අදාළ අධ්‍යාපන පාඨමාලා ලබා දී ඇත.

v. ඒකාබද්ධ හා ඒකාබද්ධ උපාය මාර්ගික පරිසරයක් තුළ අවිනිශ්චිතතාවයන්ට ප්‍රතිචාර දැක්වීමට වෘත්තිකයන් සංවර්ධනය කරන ලදී.

vi. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන ශාස්ත්‍රපති උපාධිය හා දර්ශනපති උපාධිය සඳහා සහභාගිවන්නන් සූදානම් කරන ලදී.

15.රණවිරු සේවා අධිකාරිය

- යුද ව්‍යසනය කළමනාකරණය කර ආරක්ෂක අංශ සාමාජික සාමාජිකාවන්ගේ මෙන්ම රණවිරුවන්ගේ ළඟම ඥාතීන්ගේ පසු උවටැන හා පුනරුත්ථාපන කාර්යයන් ඉටුකිරීමේ විධිමත් මෙන්ම වෘත්තීමය ආයතනය ලෙස රණවිරු සේවා අධිකාරිය 2000 වර්ෂයේ සිට මේ දක්වා දශක දෙකකට වැඩි කාලයක් සේවා සපයා ඇත.
- 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා රණවිරු සේවා අධිකාරියේ ප්‍රගතිය පහත දැක්වේ.

අ.අ.	ව්‍යාපෘතිය/ වැඩසටහන	2024 වර්ෂය තුළ කාර්යසාධනය			
		මූල්‍ය		භෞතික	
		වෙන්කිරීම (රු.මි)	ප්‍රගතිය (රු.මි)	අපේක්ෂිත ඉලක්කය	ප්‍රගතිය
1	මාපිය රැකවරණ වැඩසටහන	310.0	226.9	මාසික ප්‍රතිලාභීන් 34000	මාසික ප්‍රතිලාභීන් 25214
2	ආබාධිත රණවිරුවන් සඳහා උපකරණ ලබාදීමේ වැඩසටහන	55.6	41.414	ප්‍රතිලාභීන් 2825	ප්‍රතිලාභීන් 1255
3	සනීපාරක්ෂක පහසුකම් සැපයීම	20	10.571	ප්‍රතිලාභීන් 142	ප්‍රතිලාභීන් 240
4	ක්‍රීඩා සංවර්ධන වැඩසටහන	1	0.574	වැඩසටහන් 11	වැඩසටහන් 11
5	රණවිරු ගම්මානවල යටිතල පහසුකම් සංවර්ධනය	5	0.145	ඉල්ලීම් මත	වැඩසටහන් නැත
6	හදිසි ආපදා ආධාර	4	2.418	ඉල්ලීම් මත	ප්‍රතිලාභීන් 59
7	වෛද්‍ය ආධාර	10	4.10	ඉල්ලීම් මත	ප්‍රතිලාභීන් 24
8	ශිෂ්‍යාධාර වැඩසටහන	29.2	28.63	මාසික ප්‍රතිලාභීන් 2400	මාසික ප්‍රතිලාභීන් 2386
9	මාපිය කැපකරු ව්‍යාපෘතිය	3.96	2.705	මාසික ප්‍රතිලාභීන් 200	මාසික ප්‍රතිලාභීන් 112
10	ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන	1	0.349	වැඩසටහන් 10	වැඩසටහන් 07
11	රණවිරු අනුස්මරණ දිනය	5	3.79	වැඩසටහන් 01	වැඩසටහන් 01

අ.අ.	ව්‍යාපෘතිය/ වැඩසටහන	2024 වර්ෂය තුළ කාර්යසාධනය			
		මූල්‍ය		භෞතික	
		වෙන්කිරීම (රු.මි)	ප්‍රගතිය (රු.මි)	අපේක්ෂිත ඉලක්කය	ප්‍රගතිය
12	මයිලපිටිය උද්‍යානය නඩත්තු කිරීම	2	0.459	ව්‍යාපෘති 01	ව්‍යාපෘති 01
13	මා පිය සුරකුම	18.5	11.087	ප්‍රතිලාභීන් 800	ප්‍රතිලාභීන් 497
14	රණවිරු ප්‍රජා සංවර්ධන වැඩසටහන	5	3.228	වැඩසටහන් 20	වැඩසටහන් 13
15	රණවිරු ස්මාරක නඩත්තු වැඩසටහන	3	0.03	වැඩසටහන් 07	වැඩසටහන් 07
16	සෙනෙහස අධ්‍යාපන සම්පත් සහ තොරතුරු මධ්‍යස්ථානය	10	5.85	වැඩසටහන් 20	වැඩසටහන් 10
17	විරු සහන නිවාස ණය වැඩසටහන	75	63.9	ප්‍රතිලාභීන් 106	ප්‍රතිලාභීන් 107
18	කුසලතා ප්‍රවර්ධන ණය වැඩසටහන	15	5.507	ප්‍රතිලාභීන් 40	ප්‍රතිලාභීන් 30
19	රණවිරු දිරිය ණය වැඩසටහන	69	37.65	ප්‍රතිලාභීන් 100	ප්‍රතිලාභීන් 60
20	වෛද්‍ය ණය	10	.57	ඉල්ලීම් මත	ප්‍රතිලාභීන් 01

- **රණවිරු සේවා අධිකාරියට මුහුණදීමට සිදුවූ අභියෝග**

i. දිවයින පුරා විසිරි සිටින රණවිරු ප්‍රජාව වෙත සුබසාධනය සැලසීම අරමුණ පෙරදැරිව ස්ථාපනය කළ රණවිරු සේවා අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 92කි. නමුත් විවිධ හේතූන් මත සේවකයින් සේවයෙන් ඉවත්වී යාමේ ප්‍රතිඵලක් ලෙස වර්තමානය වන විට අධිකාරියෙහි සේවයේ නියුතු සේවකයන් සංඛ්‍යාව 56 දක්වා අඩු වී ඇත. මෙම අධිකාරිය දිස්ත්‍රික් මට්ටමින් දිවයින පුරා විසිර සිටින රණවිරු ප්‍රජාවගේ සුබසාධන කටයුතු ඉටු කරනු ලබන ආයතනයකි. මේ වන විට දිස්ත්‍රික් රාජකාරී සඳහා යොදවා ඇති වැඩසටහන් නිලධාරී තනතුරු 17 ක් පුරප්පාඩුව පවතී. එම හේතුවෙන් එක් නිලධාරියෙකුට දිස්ත්‍රික් දෙකක් ආවරණය කිරීමට සිදුව ඇති අතර, සුබසාධනය සැලසීම අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා පුරප්පාඩු වූ සේවක අවශ්‍යතාවය ත්‍රිවිධ හමුදාවේ හා පොලිස් අනුයුක්ත නිලධාරීන් වෙතින් ආවරණය කර, අධිකාරියේ වාර්ෂික ඉලක්ක සපුරාලමින් ක්‍රියාත්මක වේ.

ii. 2009 වර්ෂයේදී ත්‍රස්තවාදය අවසන් වී මේ වන විට දශක දෙකකට වැඩි කාලයක් ඉකුත්ව ඇති අතර, ශරීරාංග අහිමි වූ ආබාධිත රණවිරුවන් වයෝවෘද්ධ වීමත් සමඟ ඔවුන් බෝ නොවන රෝග මෙන්ම නොයෙකුත් කායික දුබලතාවයන්ට සහ මනෝසමාජීය ගැටලු රාශියකට මුහුණ දෙන පිරිසක් වීම නිසා ඔවුන් පිළිබඳව සොයාබැලීමේ දී විශේෂයෙන්ම ඔවුන්ගේ නිවෙස් වෙත ගොස් ගැටලු හා අවශ්‍යතාවයන් හඳුනා ගැනීමේ අත්‍යවශ්‍යයෙන් ම සිදු කළ යුතු වුවත්, ප්‍රතිපාදන අවම වීම මත ප්‍රවාහන පහසුකම් සපයා ගැනීම වැනි දුෂ්කරතාවයන්ට මුහුණ දීම ක්ෂේත්‍ර නිලධාරීන් මුහුණපාන අභියෝගයකි.

iii. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී විශේෂයෙන්ම පියා අහිමි රණවිරු දුදරුවන් අතුරින් සුළු ප්‍රතිශතයක් පාසල් අධ්‍යාපනය අපේක්ෂිත අයුරින් සම්පූර්ණ නොකිරීමත් සමාජ ජීවිතයට අවශ්‍ය කුසලතාවයන්ගෙන් පොහොසත් නොවීමත් දක්නට ලැබීම අභියෝගයකි. එමෙන්ම සැලකිය යුතු ආබාධිත රණවිරුවන් හා රණවිරු බිරින්දෑවරුන් ප්‍රමාණයක් තම නිවාස ඉදිකිරීමේදී නිවාසයක තිබිය යුතු මූලික අවශ්‍යතාවයට වඩා විශාල නිවාස ඉදිකිරීමට උත්සාහ ගැනීම හේතුවෙන් පෞද්ගලික මූල්‍ය ආයතන වල ණයකරුවන් බවට පත්වී ආර්ථිකමය වශයෙන් ගැටලුවලට මුහුණදෙන අවස්ථා ඇත.

iv. රණවිරු සේවා අධිකාරිය වෙත අරමුදල් සම්පාදනය වන ප්‍රධාන මූලයක් වන්නේ ජාතික ලොතරැයි මණ්ඩලයෙන් ලබා දෙන අරමුදල් වේ. නමුත් 2024 වර්ෂයේ දී රණවිරු සේවා අධිකාරිය වෙත හිමි විය යුතු ලොතරැයි මණ්ඩල පැවරුම් ප්‍රමාණවත් පරිදි නිදහස් නොකළ නිසා මූල්‍යමය ගැටලුකාරී තත්ත්වයක් ඇති වූ අතර මේ වන විට රු.මි. 414ක් රණවිරු සේවා අධිකාරියට හිමි විය යුතු ව පවතී.

16. සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගම

i. සමුද්‍ර ආරක්ෂක සේවා සැපයීම, රාජ්‍ය සහ පෞද්ගලික අංශ සඳහා කර්මාන්ත හා වාණිජ ආරක්ෂක සේවා සැපයීම, විශේෂ නිපුණතා සේවා සැපයීම සහ ආහාර සැපයුම් සේවා සැපයීම රක්නා ආරක්ෂක ලංකා ආයතනයෙහි ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන් වේ.

ii. වර්තමානය වනවිට, මෙරට ප්‍රමුඛතම පෞද්ගලික හා රාජ්‍ය අංශයේ ආයතන සහ විදේශීය ආයතන 600කට පමණ සේවා සපයන අතර 3,000කට අධික ඉහළ සුදුසුකම් සහ මනා පුහුණුවක් සහිත සේවක මණ්ඩලයකින් යුතු වේ.

කාල පරිච්ඡේදය	මාසය	2023		2024	
		ආදායම (රු.)	බදු පෙර ලාභය (රු.)	ආදායම (රු.)	ශුද්ධ ලාභය බදු පෙර (රු.)
2023/2024-Q4	ජනවාරි	231,526,047	40,176,983	229,863,697	31,589,180
	පෙබරවාරි	213,136,935	38,093,938	212,137,129	27,207,888
	මාර්තු	226,613,094	40,883,666	227,005,934	41,866,080
2024/2025-Q1	අප්‍රේල්	214,264,894	32,222,616	225,745,676	29,986,438
	මැයි	224,868,487	32,927,482	240,454,416	33,154,172
	ජූනි	223,979,188	31,105,864	255,825,520	35,415,743
2024/2025-Q2	ජූලි	228,206,558	37,411,975	273,657,239	38,619,244
	අගෝස්තු	225,430,550	37,110,659	280,065,522	44,828,635
	සැප්තැම්බර්	223,151,019	35,573,311	270,214,690	42,258,178
2024/2025-Q3	ඔක්තෝබර්	227,060,829	27,345,632	255,318,376	40,086,084
	නොවැම්බර්	217,343,488	23,956,521	249,489,965	43,575,016
	දෙසැම්බර්	227,752,180	25,096,600	260,084,743	36,768,179
එකතුව		2,683,333,269	401,905,248	2,979,862,908	445,354,836
ප්‍රගතිය රු.				296,529,639	43,449,589
ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස				**11%**	**11%**

17. රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය

අ. ලැයිස්තුගත රසායනික ද්‍රව්‍ය අධීක්ෂණය සඳහා යාන්ත්‍රනයක් හඳුන්වා දීම

i. 58/2007 රසායනික අවි සම්මුති පනතට අනුව, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ ජාතික අධිකාරිය (CWC) පිහිටුවන ලදී. රසායනික අවි සංවර්ධනය කිරීම, නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම සහ භාවිතය තහනම් කරන සහ ඒවා විනාශ කිරීම සඳහාවූ ජාත්‍යන්තර ගිවිසුමකි.

ආ. ජාතික ක්‍රියාත්මක කිරීමේ වැඩපිළිවල

i. රසායනික අවි සම්මුති පනතට අදාළ ලැයිස්තුගත රසායනික ද්‍රව්‍ය පරිහරණය කරනු ලබන නව කර්මාන්ත/ආයතන 05ක් ජාතික අධිකාරිය යටතේ ලියාපදිංචි කළ අතර සමස්ථ ලියාපදිංචි වී ඇති මුළු කර්මාන්ත/ආයතන සංඛ්‍යාව 62කි. මෙම කාලවකවානුව තුළ රසායනික කර්මාන්ත/ආයතන 20ක් කාලානුරූපිව පරීක්ෂාවට ලක්කර ඇත.

ii. ජාතික ආරක්ෂාව සඳහා බලපානු ලබන රසායනික ද්‍රව්‍ය, රසායනික අවි සම්මුති පනතට අදාළ ලැයිස්තුගත රසායනික ද්‍රව්‍ය හා විවිධ රසායනික ද්‍රව්‍ය ශ්‍රී ලංකාව තුළට ආනයනය කිරීම සඳහා ආනයනය හා අපනයන පාලක දෙපාර්තමේන්තුවට හා ශ්‍රී ලංකා රේගුව වෙත නිර්දේශිත ලිපි 204 ඉදිරිපත් කර ඇත.

iii. 2007 අංක 58 දරණ රසායනික අවි සම්මුති පනත අදාළ පුද්ගලයින් ලියාපදිංචියට අදාළ හා ආනයන හා අපනයන නිෂ්කාශන වලට අදාළ රෙගුලාසි සංශෝධනය කිරීම.

ඇ. **රසායනික හදිසි අවස්ථා කළමනාකරණය**

i. 2024 වර්ෂය තුළ පමණක් ජාතික තලයේ රසායනික හදිසි අනතුරු තුනක් සහ කුඩා ප්‍රමාණයේ හදිසි අවස්ථා රාශියක් කළමනාකරණය කිරීම සඳහා ප්‍රථම ක්‍රියාකාරීන් වෙත තාක්ෂණික උපදෙස් හා සහයෝගය ලබාදීම.

- හෝමාගම වොටර්කෙයා ටෙක්නොලොජීස් ආයතනයේ ඇතිවූ රසායනික හදිසි අනතුර මැඩ පැවැත්වීම හා අවසානයේ ඉතිරිවූ රසායනික අපද්‍රව්‍ය ඉවත්කිරීම - 2024.01.20-28 දක්වා
- ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ ඇතිවූ රසායනික හදිසි අවස්ථා කළමනාකරණය 2024.10.28
- ජෙනට් ආයුර්වේද කර්මාන්ත ශාලාවේ ඇතිවූ රසායනික ද්‍රව්‍ය කාන්දුව කළමනාකරණය - 2024.06.12

ඈ. **ජාතික ආරක්ෂක ප්‍රතිපත්ති සම්පාදනය සහ ආරක්ෂක නීති සංශෝධනය**

i. ජාතික ආරක්ෂාව සඳහා බලපානු ලබන රසායනික ද්‍රව්‍ය නියාමනය කිරීම මැයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 23/1743/603/035 සඳහා 2023.10.02 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලැබුනු අතර එම රසායනික ද්‍රව්‍ය නියාමනය කිරීම සඳහා වන පනත් කෙටුම්පත සකස් කිරීම සඳහා අදාළ කටයුතු සිදු කිරීම සහ එය අධීක්ෂණය කිරීම සඳහා පරිගණක මෘදුකාංගයක් සැකසීම ආරම්භ කරන ලදී.

ඉ. **හදිසි රසායනික අනතුරකදී පළමු ප්‍රතිචාර දක්වන්නන්ගේ හැකියා වර්ධනය**

i. රසායනික හදිසි අවස්ථා වලදී පළමු ප්‍රතිචාර දක්වන භූමිකාව වැඩිදියුණු කිරීම සඳහා ජාතික අධිකාරිය විසින් පළමු ප්‍රතිචාර දක්වන්නන් වන ශ්‍රී ලංකා යුද හමුදාවේ CBRN ඒකකය, ශ්‍රී ලංකා පොලිසියේ විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් හට සහ ශ්‍රී ලංකා පොලිසියේ අපරාධ ස්ථාන පරීක්ෂා කරන නිලධාරීන් හට දේශන සහාය ලබා දීම හා ඔවුන්ගේ දැනුම, කුසලතා වර්ධනය සඳහා දායකත්වය ලබාදෙන ලදී.

ඊ. **කර්මාන්ත හා පාර්ශවීය ආයතන සඳහා වූ වැඩමුළු හා පුහුණු වැඩසටහන්**

පවත්වන ලද දිනය	වැඩමුළුවේ නම	සහභාගිවූ සංඛ්‍යාව	වියදම
පෙබ 26 සිට මාර්තු 1 දක්වා	ආරක්ෂාව හා සුරක්ෂිතතාවය සම්බන්ධ මාර්ගෝපදේශ සකස් කිරීම හා සම්බන්ධ ජාත්‍යන්තර වැඩමුළුව	15	174,780
මාර්තු 26	ශ්‍රී ලංකාවේ රසායනික ආරක්ෂාව සහ සුරක්ෂිතතාවය සහ රසායනික අවි ප්‍රගුණනය වැළැක්වීම හා සම්බන්ධ උපාය මාර්ග පිළිබඳ ආරක්ෂක අමාත්‍යාංශයේ ඉහළ කළමනාකරණ අංශ දැනුවත් කිරීමේ වැඩසටහන	75	70,992
ජූනි 24-28	මැලේසියාව හා ශ්‍රී ලංකාව එක්ව රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීම උපදේශකත්වය/හවුල්කාරිත්වය වැඩසටහන	50	270,000

පවත්වන ලද දිනය	වැඩමුළුවේ නම	සහභාගිවූ සංඛ්‍යාව	වියදම
අගෝස්තු 29	රසායනික ආරක්ෂාව සහ සුරක්ෂිතතාවය සහ රසායනික අවි ප්‍රගුණනය වැළැක්වීම හා සම්බන්ධ උපාය මාර්ග පිළිබඳ කර්මාන්තකරුවන් හා ආරක්ෂක අංශ දැනුවත් කිරීමේ වැඩසටහන	110	97950
01.-21සැප්.	රසායනික අවි තහනම් කිරීමේ ජාත්‍යන්තර සංවිධානය විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන සහයෝගිතා වැඩසටහනෙහි කාර්මික පුහුණුව සඳහා පැමිණි විදේශ නියෝජිතයන් සඳහා අවස්ථාව සැලසීම	2	15,000

18.ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

2025 අංක 13 දරණ ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතින් අදාළ සියලුම පාර්ශවකරුවන්ගේ සහයෝග ඇතිව ආපදා අවම කිරීම සඳහා ජාතික සහ ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් ඉටු කරනු ලබයි.

අ. ආයතනයේ කාර්යයන්හි ප්‍රගතිය

i. සාමාන්‍ය පෙළ විභාගය 2024 මැයි මස 06 වන දින සිට මැයි මස 15 වන දින දක්වා පවත්වන ලද අතර, ශිෂ්‍යත්ව විභාගය 2024 සැප්තැම්බර් මස 15 වන දින පවත්වන ලදී. එලෙසම උසස් පෙළ විභාගය 2024 නොවැම්බර් මස 25 වන දින සිට දෙසැම්බර් මස 31 වන දින දක්වා පවත්වන ලදී. මෙම විභාග කාලසීමාවන් තුළ ෆෙන්ගල් සුළි කුණාටුව සක්‍රීයව පැවති කාලසීමාවක් බැවින් සිදුවූ ආපදාවලින් බාධාවකින් තොරව සිසු සිසුවියන්ට විභාගයන්ට සහභාගී වීමට අවශ්‍ය පහසුකම් සලසා දීම සඳහා සම්බන්ධීකරණ කටයුතු පැය 24×7 ක්‍රියාත්මක හදිසි මෙහෙයුම් මැදිරියේ එක් එක් දිස්ත්‍රික්වල පිහිටි දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකක (DDMCU) සමඟ ක්‍රියාත්මක වීමත්, හදිසි මෙහෙයුම් සැලැස්ම ක්‍රියාත්මක කිරීමත් තුළින් සිදු කරන ලදී. (උදා: ෆෙන්ගල් සුළිකුණාටුවෙන් බලපෑමට ලක් වූ අම්පාර දිස්ත්‍රික්කයේ සිසුන් සුරක්ෂිතව විභාග මධ්‍යස්ථාන වෙත ප්‍රවාහනය කිරීම, විභාග මධ්‍යස්ථානයන් වෙත විභාග ප්‍රශ්න පත්‍ර ප්‍රවාහනය කිරීමට අවශ්‍ය සහාය ලබා දීම.)

ii. නිරිත දිග මෝසමට අදාළව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් මෝසම් පෙර සූදානම් වැඩසටහන් මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ සිදුකර ඇත. දිස්ත්‍රික් මෝසම් පෙර සූදානම් වැඩසටහන් 18ක් සහ ප්‍රාදේශීය මෝසම් පෙර සූදානම් වැඩසටහන් 75ක් මේ වනවිට පවත්වා ඇත.

iii. ශ්‍රී ලංකාවේ වසර මුල පැවති අධික රස්නය සහ වියළි කාලගුණික තත්ත්වය පිළිබඳ සලකා බැලීම සඳහා විශේෂ රැස්වීමක් 2024.03.12 වන දින ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ දී පවත්වන ලදී. මෙම රැස්වීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් පැවති අතර, මේ සඳහා ප්‍රධාන පාර්ශවකාර ආයතන වූ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය අමාත්‍යාංශය, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය, මධ්‍යම පරිසර අධිකාරිය, ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය, ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය සහ එක්සත් ජාතීන්ගේ ලෝක සෞඛ්‍ය සංවිධානය නියෝජනය කරමින් නියෝජිත මහත්ම මහත්මීන් සහභාගී විය.

iv. 2024.03.11 වන දින ලෝක ආහාර සංවිධානයේ නියෝජිත කණ්ඩායම සමඟ "ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ යාන්ත්‍රනය හා ස්වාභාවික ව්‍යසන සඳහා කාර්යක්ෂම ආපදා කළමනාකරණය" යන මාතෘකාව යටතේ 2024 වර්ෂය සඳහා ලෝක ආහාර වැඩසටහනේ (WFP) ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩසටහන් සම්බන්ධයෙන් සාකච්ඡාවක් පවත්වන ලදී. එහිදි ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රමුඛතාවයට අනුකූලව සහයෝගිතාවය දැක්විය යුතු අංශ කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ අතර, අදාළ කාල රාමුව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවදානය යොමු විය. මේ සඳහා ජනාධිපති කාර්යාලය නියෝජනය කරමින්, ලෝක ආහාර වැඩසටහනේ සහයෝගිතාව සඳහා වූ හවුල්කාරිත්ව ලේකම් කාර්යාලයේ පූර්වාපේක්ෂක ක්‍රියාමාර්ග වැඩමුළුව සඳහා කලාපීය උපදේශක පැමිණෙන ලදී.

v. ලෝක ආහාර වැඩසටහනේ (WFP) ප්‍රතිපාදන මඟින් සිදුකරන ලද පෙර සූදානම් වැඩසටහන්

- පාර්ශවකාර ආයතන සමඟ ජාතික මෝසම් රැස්වීමක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේදී 2024.05.16 වන දින පාර්ශවකරුවන් 50ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

- මහනුවර, ගම්පහ, මාතර, කෑගල්ල, කළුතර, නුවර එළිය, හම්බන්තොට, බදුල්ල හා රත්නපුර යන දිස්ත්‍රික් 9ක නිරිත දිග මෝසම් පෙර සූදානම් වැඩසටහන් සඳහා රු.900,000/-ක ප්‍රතිපාදන නිකුත් කරන ලදී.

vi. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) මූල්‍ය දායකත්වය මඟින් "ප්‍රාදේශීය ආපදා අවදානම් අවම කිරීම සඳහා වන ජාතික ක්‍රමෝපාය" වැඩසටහන 2022 වසරේදී අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුමට අනුව, අදාළ කාර්යය සඳහා රු.මි. 40ක මූල්‍ය ප්‍රදානයක් ලබා දීමට එකඟ වූ නමුත් නිකුත් කරන ලද්දේ රු.මිලියන 30ක් පමණි. එම මුදලින් රු. මි. 15ක් 2022 වසරේද තවත් රු.මි. 15ක් 2023 වසරේදී ද ලබා දෙන ලදී. ඒ අනුව, එම 2022 හා 2023 වර්ෂයේ වියදම් සිදු කර 2024 වසර සඳහා ඉතිරි මුදල්වලින්, 2024 ජනවාරි 01 දින සිට සැප්තැම්බර් 30 වන දින වන විට රු.මි. 4.5 ක් වැය කර සැලසුම් 32ක් සකස් කරන ලදී.

vii. ජාත්‍යන්තර සුනාමි අනුස්මරණ වැඩසටහන 2024.11.04 වන දින කොළඹ දී පවත්වන ලදී. වසර 20ක් තුළ ආපදා කළමනාකරණයේ සංවර්ධනය, උගත් පාඩම් හා ඉදිරියේ දී මෙවැනි ස්වාභාවික විපත්වලින් ශ්‍රී ලංකාවට බලපෑම් ඇතිවිය හැකි උවදුරු සම්බන්ධව විද්වත් සම්මන්ත්‍රණයක් මෙහිදී පවත්වන ලදී. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ත්‍රිවිධ හමුදාව, එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධ ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන නියෝජිතයින් ඇතුළු ආපදා කළමනාකරණ ක්‍රියාවලිය හා සම්බන්ධ රාජ්‍ය හා රාජ්‍ය නොවන පාර්ශවකාර ආයතන නියෝජිතයින් මේ අවස්ථාවට සහභාගී විය.

viii. 2024 සැප්තැම්බර් මස 21 දින පැවති ජනාධිපතිවරණයට සමගාමීව විශේෂ මැතිවරණ මෙහෙයුම් මැදිරියක්, JEEOps (Join Election Emergencies Operation Unit) සැප්තැම්බර් මස 19 දින සිට 23 දක්වා ක්‍රියාත්මක කරන ලදී. 2024 නොවැම්බර් මස 14 දින පැවති මහමැතිවරණයට සමගාමීව JEEOps විශේෂ මහමැතිවරණ මෙහෙයුම් මැදිරියක් නොවැම්බර් මස 12 දින සිට 16 දක්වා ක්‍රියාත්මක කරන ලදී. ජනාධිපතිවරණය හා මහමැතිවරණය පැවැති කාලසීමාවන් තුළ නිරිත දිග මෝසම් සක්‍රීයව පැවති කාලසීමාවක් බැවින් සිදුවූ ආපදාවලින් බාධාවකින් තොරව ජනතාවට මැතිවරණයන් සඳහා සහභාගී වීමට අවශ්‍ය කටයුතු සලසා දෙමින් හදිසි මෙහෙයුම් සැලැස්ම ක්‍රියාත්මක කිරීම.

ix. නිරිත දිග මෝසමට අදාළව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් ත්‍රිවිධ හමුදා සහ පොලිසිය සම්බන්ධීකරණයෙන් හදිසි මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කරන ලද අතර, අනෙකුත් පාර්ශවකාර ආයතන සමඟ සම්බන්ධීකරණය වී ඔවුනට අවශ්‍යය සහන ලබා දීම සඳහා කටයුතු සිදු කරන ලදී.

x. CResMPA ව්‍යාපෘතිය යටතේ ලෝක බැංකු නියෝජිතයින් හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමඟ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සිදුකිරීමට අපේක්ෂිත කාර්යයන් පිළිබඳව සැලසුම් කිරීමේ සාකච්ඡාවන් ගණනාවක් 2024 වර්ෂයේ දී පැවැත්විණි. මෙහිදී දේශගුණික ඔරොත්තු දීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශය යටතේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ප්‍රධාන අරමුණු 02ක් යටතේ ක්‍රියාත්මකව ඇත. එනම්,

- හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය (EOC), දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහ සම්බන්ධීකරණ ඒකක 25 (DDMCU), 117 ඇමතුම් මැදිරිය වැඩි දියුණු කිරීම හා සන්නිවේදන ජාලය සහ පූර්ව අනතුරු ඇඟවීම් යාන්ත්‍රණය වැඩිදියුණු කිරීම. මේ සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 03ක් වෙන්කර ඇත. මේ වන විට එම වැඩසටහනේ සැලසුම් සැකසීම සඳහා උපදේශන ආයතනයක් (Consultancy Firm) තෝරා පත් කර ගෙන එහි කටයුතු සිදු කරගෙන යමින් පවතී. තවද මේ යටතේ පහත සඳහන් භාණ්ඩ මිලදී ගෙන ආපදා කළමනාකරණ යාන්ත්‍රණය වැඩිදියුණු කිරීමට කටයුතු සිදු කරන ලදී.

අයිතමය (Equipment)	ප්‍රමාණය (No of Units)
අධි බලැති නැවත ආරෝපණය කළ හැකි පන්දම් (අමතර බැටරිය සමඟ) (High Power Rechargeable Torch - With extra battery)	75
ජෙනරේටර් 5KW (5KW Generator)	25
මැනිලා ලණු (අඩි 200) (Manila rope -200ft)	50
සෙවුම් පහන් (Emergency lights)	125

- ආපදා කළමනාකරණ අවම කිරීම, පෙර සූදානම් කිරීම, ක්ෂණික ප්‍රතිචාර දැක්වීමේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සඳහා තීරණ ගැනීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා (Decision Support System- DSS) Application Programmatic Interface (API) පද්ධතියක් නිර්මාණය කිරීම. මේ සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 1.5ක මුදලක් වෙන් කරමින් අදාළ කාර්යයන් සිදුකරමින් පවතී.

xi. 117 ඇමතුම් මැදිරියට 254,397ක දුරකතන ඇමතුම් ප්‍රමාණයක් ලැබුනු අතර ඒ හා සබැඳි තොරතුරු හා දත්ත බෙදාහැරීම සිදු කරමින් ඇමතුම් සඳහා ප්‍රතිචාර දැක්වීම සිදු කිරීම.

xii. වර්ෂය පුරා සිදු වූ නායයෑම්, ගංවතුර, සුළි සුළං හා කැලෑ ගිනි ආදී ආපදා තත්ත්වයන්ට අවශ්‍ය පූර්ව අනතුරු ඇඟවීමේ නිවේදන නිකුත් කිරීම් හා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු 24x 7 පුරා සිදු කරමින් ආපදාවන්ට ලක්වූ පිරිස් බේරා ගැනීම, මුදවා ගැනීම හා ආරක්ෂිත ස්ථාන කරා යොමු කිරීම මඟින් ජනතාවගේ සුරක්ෂිතභාවය තහවුරු කරන ලදී. උදාහරණ ලෙස,

- අම්පාර දිස්ත්‍රික්කයේ ට්‍රැක්ටර් රථයක් පෙරලී යාමෙන් අනතුරට ලක් වූ පිරිස් මුදවා ගැනීමට ත්‍රිවිධ හමුදාව හා සම්බන්ධීකරණයෙන් අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- මැයි හා ජූනි මස ඇතිවූ නිරිත දිග මෝසම් තත්ත්වය හේතුවෙන් ඇතිවූ ගං වතුර, නාය යෑම් මඟින් සිදුවූ ආපදා තත්ත්වයන්ට ක්ෂණික ප්‍රතිචාර දැක්වීමත් මුදවා ගැනීම් කටයුතු සඳහා ත්‍රිවිධ හමුදාව හා සම්බන්ධීකරණයෙන් අවශ්‍ය කටයුතු සිදු කිරීම.

xiii. ආපදා අවදානම් අවම කිරීමේ ක්‍රියාවලිය සක්‍රීයව පවත්වා ගෙන යාම සඳහා ආපදා කළමනාකරණ පනත ඍරකාරව හඳුනාගෙන ඇති රසායනික, ජීවවිද්‍යාත්මක, විකිරණශීලී හා න්‍යෂ්ටික ආපදා අවදානම අවම කිරීම පාදක කරගනිමින් ජාතික හා ජාත්‍යාන්තර ක්‍රමවේද භාවිතයෙන් ශක්තිමත් කිරීමට වැඩපිළිවෙලක් ආරම්භ කරන ලදී. මෙහිදී ජාතික හා ජාත්‍යන්තරව කටයුතු කරන පාර්ශවකාර ආයතනයන්හි සහභාගීත්වයෙන් සැසි 02ක් සංවිධානය කරන ලද අතර, ආයතනයේ සියලුම දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකයන්හි නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන් හා දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහකාරවරුන් ඇතුළු 75ක පිරිසක් පුහුණු කිරීමත් අවදානම පදනම් කරගෙන දිස්ත්‍රික්ක 08ක දිස්ත්‍රික් ආපදා සම්බන්ධීකරණ ඒකක රැස්වීම් පැවැත්වීමට හා පාර්ශවකාර ආයතන හඳුනාගැනිමටත් සැලසුම් කර ඇත.

xiv. ආපදා අවදානම් ක්‍රියාවලිය සඳහා දායකවන විවිධ පාර්ශවකාර ආයතන, රාජ්‍ය නිලධාරීන්, ත්‍රිවිධ හමුදාව, විශ්වවිද්‍යාල හා පාසල් සිසුන් පාදක කර ගනිමින් වැඩසටහන් 17ක් ජාතික මට්ටමින් සිදුකර ඇති අතර, පුද්ගලයින් 1,325 දෙනෙකු සඳහා ආපදා අවදානම් ක්‍රියාවලිය පිළිබඳව දැනුම, අවබෝධය ලබා දී ඇත.

xv. පුහුණු මොඩියුල, මෙවලම්, අත්පත්‍රිකා හා මාධ්‍ය භාවිත කරමින් සිදු කරන ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා භාවිත කිරීමට නාම පුවරු (Pull Up Banners) 25ක් මුද්‍රණය කර ඇත. විවිධ මෙවලම් භාවිත කරමින් ප්‍රජාව දැනුවත් කිරීමේ ප්‍රදර්ශන 05ක් දිස්ත්‍රික්ක මට්ටමින් සිදුකර ඇති අතර, නිරිත දිග හා අන්තර් මෝසම් සක්‍රියවීමත් සමඟ ඇතිවූ ආපදා තත්ත්වය කළමනාකරණය කිරීම සහ ඇතිවිය හැකි අවදානම් කළමනාකරණ කිරීම සම්බන්ධව මෙන්ම හදිසි මෙහෙයුම් ක්‍රියාවලිය පිළිබඳව මහජනතාව පූර්ව අනතුරු ඇඟවීම් දැනුවත් කිරීම සඳහා මාධ්‍ය සාකච්ඡා 05ක් පවත්වා ඇත. තවද ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් පිළිබඳව දැනුවත් කිරීමේ අරමුණින් මුද්‍රණය කරනු ලබන ත්‍රෛමාසික පුවත් සඟරාව 2023 වර්ෂයේ 4 වන කාර්තුවට අදාළව සහ 2024 වර්ෂයේ මුල් කාර්තු දෙකට අදාළව මුද්‍රණය කර ඇත.

xvi. ආපදා කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ දිස්ත්‍රික් මට්ටමින් රාජ්‍ය නිලධාරීන්, ත්‍රිවිධ හමුදාව, පොලිසිය හා මහජනතාව දැනුවත් කිරීම දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක මඟින් සිදු කරනු ලබන අතර, දිස්ත්‍රික්කය තුළ අවදානම් පැතිකඩ (Risk Profile) මඟින් හඳුනාගත් අවදානම් ප්‍රදේශ ඉලක්ක කර ගනිමින් 2024 වර්ෂය සඳහා ප්‍රජාව දැනුවත් කිරීමේදී ප්‍රමුඛතාවය දිය යුතු වැඩසටහන් පිළිබඳ විස්තර දිස්ත්‍රික් ඒකක මඟින් ලබා ගන්නා ලදී. ඒ අනුව 2024 වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් 30 දක්වා වැඩසටහන් 145ක් සිදු කර ඇති අතර, මහා භාණ්ඩාගාර සීමිත මූල්‍ය ප්‍රතිපාදන යොදාගෙන වැඩසටහන් 97ක් සහ අරමුදල් රහිතව දැනුවත් කිරීමේ වැඩසටහන් 48ක් ලෙස ක්‍රියාත්මක කර ඇත.

xvii. ලෝක ආහාර වැඩසටහනේ මූල්‍ය දායකත්වයෙන් 2021, 2022 වර්ෂයන්හි මුද්‍රණය කරන ලද ආපදා සම්බන්ධ පොත් කට්ටල 7 දමිළ භාෂාවට පරිවර්තනය සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන් වී තිබුණි. එම ක්‍රියාවලියට අදාළ සියලුම ක්‍රියාකාරකම් ලෝක ආහාර වැඩසටහනට අදාළ නිලධාරීන් විසින් සිදු කරන අතර, අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු හා තාක්ෂණික දායකත්වය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් සිදු කරනු ලබයි. පොත් කට්ටලයේ එක් පොතකට අදාළව පොත් 500ක් මුද්‍රණය කර ඇති අතර, තවත් පොත් 03ක පරිවර්තන කටයුතු අවසන් කර අවසන් මුද්‍රණයට සැලසුම් කර ඇත. 2024 වර්ෂයට අදාළව ලෝක ආහාර වැඩසටහන්වලින් ලබාදෙන මූල්‍ය ප්‍රතිපාදන යොදාගෙන සිදුකරනු ලබන වැඩසටහන් සඳහා සංකල්ප පත්‍රිකා, මූල්‍ය ඇස්තමේන්තු, කාල රාමු පිළිබඳ තොරතුරු ලෝක ආහාර වැඩසටහන සඳහා ඉදිරිපත් කර ඇත.

xviii. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය සඳහා බඳවා ගැනීමේ පටිපාටියට අනුව සිදු කරන කඩඉම් පරීක්ෂණ, පශ්චාත් උපාධි මෙන්ම රජය මඟින් හඳුන්වා දී ඇති භාෂා ප්‍රවීණතා පරීක්ෂණ සඳහා 2024 වර්ෂයේ සැප්තැම්බර් 30 දක්වා නිලධාරීන් 82 දෙනෙකු වෙනුවෙන් වැඩසටහන් 06ක් සිදුකර ඇත. එමෙන්ම, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හා දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකවල සේවය කරන විවිධ ශ්‍රේණි නියෝජනය කරන නිලධාරීන් 53 දෙනෙකුගෙන් නිලධාරීන් 13 දෙනෙකු සඳහා ආපදා කළමනාකරණය සම්බන්ධ දැනුම ප්‍රවර්ධනයටත් කුසලතා වර්ධනයටත් විවිධ විෂයානුබද්ධ කෙටිකාලීන වැඩසටහන් සිදු කර ඇත. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කළමනාකරණ ගණයේ නිලධාරීන් 12ක් සඳහා විදේශ පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ, අභ්‍යාස ආදියට සහභාගී කරවීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

xix. ආපදා පිළිබඳ තොරතුරු සහ දිස්ත්‍රික් මට්ටමින් ඉදිරිපත් කරන ලද යෝජනා පදනම් කරගනිමින් ඉදිරිපත් කරන ලද අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 200 ක් 2024 වර්ෂ සඳහා මහා භාණ්ඩාගාරය මඟින් අනුමත කරන ලදී. එම ප්‍රතිපාදනවලින් මිලියන 25ක් නිවාස ගොඩනැඟිලි අලුත්වැඩියා කිරීම සඳහා යොදන ලදී. කෙසේ වුවද, 2023 වර්ෂයේ සිට අඛණ්ඩව 2024 වර්ෂයේදී ද ක්‍රියාත්මක වන (අවිච්ඡේද වන) මහනුවර දිස්ත්‍රික්කය තුළ ව්‍යාපෘතියක් සඳහා ඉන් රුපියල් මිලියන 28.96 ක මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමක් ද පෙර සඳහන් කරන ලද පූර්ණ ප්‍රතිපාදනය තුළින්ම සිදු විය. 2024 වර්ෂයේ නොවැම්බර් 30 වන විට අවම කිරීමේ ව්‍යාපෘති යටතේ උක්ත ප්‍රතිපාදන වෙන් කිරීමට අදාළ රු. මිලියන 61.40ක මූල්‍ය ප්‍රගතියක් සහ 93.32% ක භෞතික ප්‍රගතියක් ලබා ගැනීමට සමත් වී ඇත.

xx. නාගරික සංවර්ධනයේදී ආපදා කළමනාකරණය කෙසේ ඇතුළත් විය යුතුද යන්න පිළිබඳව මාර්ගෝපදේශ සැකසීම සඳහා වැඩමුළුවක් 2024.08.28 වන දින නාගරික සැලසුම් නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ රැස්වීම් ශාලාවේදී පවත්වන ලදී. ඒ සඳහා නාගරික සැලසුම් නිලධාරීන් 33 දෙනෙකු නාගරික සංවර්ධන අධිකාරියේ විවිධ අංශ නියෝජනය කරමින් පැමිණි අතර, ඒ අනුව කෙටුම්පත් කරන ලද මාර්ගෝපදේශය නැවත විශ්ලේෂණාත්මකව පරීක්ෂා කොට බලා නාගරික සංවර්ධන අධිකාරියේ ක්‍රියාවලිය හා ආයතනික කාර්ය විෂයට අනුගතවන බවට තීරණය කරන ලදී. ඔවුන්ගේ අධීක්ෂණය අනුව එහි වැඩකටයුතු අවසන් කොට මාර්ගෝපදේශය මුද්‍රණය සඳහා ලබාදී ඇත. ඒ අනුව 100% ක ප්‍රගතියක් අත්කරගෙන ඇත.

xxi. 2023 වර්ෂයේදී අවසන් කරන ලද පාසල් දත්ත රැස්කිරීමට අදාළව අවදානම් දර්ශකය සැකසීමේ ඉදිරි කටයුතු අදාළ කාර්යය මණ්ඩලය නොමැති වීම මත ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇති අතර, 2024 ජූලි මස මෙම අංශයේ පැවති තනතුරු පුරප්පාඩු සඳහා නව බඳවා ගැනීම් සිදුවූ අතර, ව්‍යාපෘතියට අදාළ කාර්යයන් ක්‍රියාත්මක කරන ලදී. එහි වැඩකටයුතු අවසන් කොට පාසල් ආපදා අවදානම් තක්සේරුව මුද්‍රණය සඳහා ලබාදී ඇත. ඒ අනුව 100% ක ප්‍රගතියක් අත්කරගෙන ඇත.

xxii. පාර්ශවකාර ආයතනවල ඔවුන්ගේ පවතින නීති, අණ පනත් සහ රෙගුලාසිවලට අනුව ආපදා කළමනාරණය සඳහා පවතින වගකීම් සහ කාර්යභාරයන් ඇතුළත් කර අත් පොත කෙටුම්පත් කිරීම හඳුනාගන්නා ලද ආයතන 52ක් සඳහා දැනට සිදුකර තිබේ. මාර්ගෝපදේශය පිළිබඳ පාර්ශවකාර ආයතනයනගේ අවසන් එකඟතාවය ලබාගැනීමෙන් පසුව මුද්‍රණය සිදුකරනු ලබයි. ඒ අනුව මේ වනවිට 50% ප්‍රගතියක් වාර්තාකොට ඇත.

xxiii. MODIS වන්ද්‍රිකා දත්ත භාවිතයෙන් නියඟය නිරීක්ෂණය කිරීම - මෙම නිර්දේශිත පරිවයේ පරමාර්ථය වන්නේ කාලගුණ විද්‍යාත්මක නියඟය ස්වභාවික වෘක්ෂලතාවලට (වැසි සහිත වනාන්තර සහ වනාන්තර) බලපෑම් නිරීක්ෂණය කිරීමයි. මේ දත්ත නියඟය පිළිබඳ තීරණ ගැනීම්, පුරෝකථන, නියං කාල සඳහා පෙරසූදානම් වීමට උපකාරී වේ. මේ වන විට 80%ක පමණ ප්‍රගතියක් ළඟා කරගෙන ඇත.

xxiv. Desinventra සහ RiskInfo දත්ත ගබඩාව යාවත්කාලීන කිරීම - මේ සඳහා අත්‍යාවශය කාර්යය මණ්ඩලය නොමැති වීම හේතුවෙන් යාවත්කාලීන කිරීම ප්‍රමාද වූ අතර, නවක බඳවා ගැනීම සමඟ 2023.09.31 දක්වා සක්‍රීයව යාවත්කාලීන කර ඇති අතර, ඉතුරු කොටස් යාවත්කාලීන කරමින් පවතී.

xxv. ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සි (JICA) සහය ඇතිව, කැළණි ගංගා ද්‍රෝණිය තුළ ආපදා අවදානම් අවම කිරීම ප්‍රාදේශීය යාන්ත්‍රණය තුළට අන්තර්ග්‍රහණය කිරීමේ තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘතිය - මෙම ව්‍යාපෘතියට අදාළව සාකච්ඡා තුනක් (2024.03.20, 2024.03.21 සහ 2024.05.21) පවත්වන ලදී. ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අදාළ ආයතන දැනුවත් කිරීම සඳහා වැඩමුළු තුනක් (2024.04.29 සිට 2024.04. 30 සහ 2024.08.07) පවත්වන ලදී. තවද ව්‍යාපෘතියේ පාර්ශවකරුවන් සඳහා 2024.05.25 දින සිට 2024.06.08 දක්වා පුහුණු වැඩසටහන ජපානයේදී පවත්වන ලදී.

xxvi. 2024 දෙසැම්බර් 17-18 දිනවල කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර අධ්‍යයන මධ්‍යස්ථානයේ (Bandaranaike Center for International Studies - BCIS) පැවති ආපදා අවදානම් අවම කිරීම සඳහා වූ සෙන්දායි රාමුව (Sendai Framework for Disaster Risk Reduction - SFDRR) ක්‍රියාවට නැංවීමේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම පිළිබඳ දෙදින තුළ වැඩමුළුව සාර්ථකව පවත්වන ලදී. මෙම වැඩසටහන දැනුම් හුවමාරුව, සහයෝගිතා වර්ධනය කිරීම, සහ සෙන්දායි රාමුවේ ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීමට ක්‍රමෝපායන් සොයා ගැනීම සඳහා වටිනා වේදිකාවක් විය.

xxvii. රසායනික, ජීව විද්‍යාත්මක, විකිරණශීලී සහ න්‍යෂ්ටික (CBRN) ආපදා අවදානම් අවම කිරීම සම්බන්ධව පවත්නා ධාරිතාවන්, ගැටලු සහ අවස්ථාවන් හඳුනාගැනීම සඳහා අධ්‍යයනයක් සිදුකර ජාතික මට්ටමේ පාර්ශවකාර ආයතනවල කේන්ද්‍රීය නිලධාරීන්ගෙන් සමන්විත සම්බන්ධීකරණ කමිටුවක් පත් කිරීම, (National Coordinating Platform – NCP CBRN DRR). එමෙන්ම සියලුම දිස්ත්‍රික්යන්හි නියෝජ්‍ය අධ්‍යක්ෂකවරු / සහකාර අධ්‍යක්ෂවරු සහ දිස්ත්‍රික් කළමනාකරණ සහකාරවරුන් සඳහා වැඩසටහන් 03ක් පැවැත්වීම සහ දිස්ත්‍රික් 08 ක දිස්ත්‍රික් කේන්ද්‍රීය නිලධාරීන්ගෙන් සමන්විත කමිටු 08ක් ස්ථාපනය කිරීම. (District Coordinating Platform – DCP CBRN DRR).

xxviii. රසායනික, ජීව විද්‍යාත්මක, විකිරණශීලී සහ න්‍යෂ්ටික (CBRN) ආපදා අවදානම් අවම කිරීම සඳහා ප්‍රජාව සහ පාසල් සිසුන් දැනුවත් කිරීම සඳහා ප්‍රදර්ශන පුවරු (Pull-up Banners) සකස් කර දිස්ත්‍රික්ක 25 තුළ බෙදා හැරීම.

xxix. ආපදා කළමනාකරණ ක්‍රියාවලියට සහය වන ත්‍රිවිධ හමුදාව, විශ්වවිද්‍යාල සහ පාසල් ප්‍රජාව ඇතුළු පාර්ශවකාර ආයතනයන්හි නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

xxx. හඳුනාගත් ආපදා අවදානම් සම්බන්ධව ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් දිස්ත්‍රික්ක මට්ටමින් සිදුකරන ලදී.

xxxi. ජාතික සුරක්ෂිත දින වැඩසටහන ජාතික හා දිස්ත්‍රික් මට්ටමින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේදී සහ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකයන්හි සංවිධානය කර සිදුකරන ලද අතර එහිදි සුනාමි සහ අනෙකුත් ආපදා හේතුවෙන් මියගිය ජනාතව සිහිකර සර්ව ආගමික කටයුතු සිදුකරන ලදී.

xxxii. ජාතික සුරක්ෂිත දින තේමාව "අනාගත පරපුර සවිබල ගැන්වීම මඟින් ආපදා ප්‍රත්‍යාස්ථතා සමාජයක් බිහිකිරීම (Empowering the Next Generation for a Resilient Future)" යටතේ ස්වේච්ඡාවෙන් ඉදිරිපත්වන තරුණ තරුණියන් ඇතුළත් කණ්ඩායමක් ස්ථාපිත කිරීම සඳහා ජාතික තරුණ සේවා සභාවේ තරුණ තරුණියන් 1,400ක් සහභාගි කර ගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහන් ජාතික හා දිස්ත්‍රික් මට්ටමින් පවත්වන ලදී.

xxxiii. ආපදා කළමනාකරණය සම්බන්ධ තොරතුරු මහජනතාව සඳහා සම්ප්‍රේෂණය කිරීම සඳහා වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම.

xxxiv. ආපදා තත්ත්වයන්හිදි පුර්ව අනතුරු ඇඟවීම් සහ ආපදා සම්බන්ධ තොරතුරු මාධ්‍ය ප්‍රකාශන මඟින් ලබාදීම සහ මාධ්‍ය සාකච්ඡා පැවැත්වීම.

xxxv. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරීන් සඳහා විෂයානුබද්ධ සහ කණ්ඩායම් වශයෙන් නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග සහ උසස්වීම්වලට අදාළ සුදුසුකම් සපුරාලීම සඳහා ලබාගත යුතු පුහුණු වැඩසටහන් වන භාෂා ප්‍රවීණතාවය, ඩිප්ලෝමා පාඨමාලා ආදි ධාරිතා වර්ධන පුහුණු වැඩසටහන් කිහිපයක් පවත්වන ලදී.

xxxvi. ආපදා කළමනාකරණය සම්බන්ධ දැනුම වර්ධනය කිරීම සඳහා මෙන්ම රාජකාරී විෂය ක්ෂේත්‍රයන්හි ප්‍රවීණතාවය වැඩිදියුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන් ලබාදී ඇත.

xxxvii. කළමනාකරණ සේවා ගණයේ නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය සඳහා විදේශ පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් සම්බන්ධ කිරීම.

19. ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය

අ. කාර්යක්ෂම ආපදා සහන සේවාවක් තුළින් විපතට පත්වූවන් සඳහා කඩිනමින් සහන ලබාදීම.

2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා දිවයිනට බලපාන ලද ස්වභාවික ආපදා හේතුවෙන් පවුල් 417,421 ක පුද්ගලයින් 1,476,585 පීඩාවට පත්ව ඇත. එම ජනතාව අතුරින් පවුල් 28,026 ක පුද්ගලයින් 96,548 සුරක්ෂිත මධ්‍යස්ථාන 890 ක රඳවා තිබූ අතර, පුද්ගල මරණ 129 ක් වාර්තා වී ඇත. එම විපතට පත් පිරිස් වෙත මූලික පහසුකම් සැලසීම සඳහා රු. 704,765,636.4 වියදම් දරා ඇත.

ආ. ආපදා හේතුවෙන් හානියට පත් වූ නිවාස, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හානි ප්‍රතිපූර්ණය කිරීම

i. ස්වාභාවික ආපදාවන්ගෙන් නිවාස, ගෘහ උපකරණ සහ වෙනත් රක්ෂණාවරණයකින් ප්‍රතිලාභ නොලබන වාර්ෂික ආදායම රු.මි. 10 නොඉක්මවන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ගොඩනැගිලි, උපකරණ හා තොග වලට සිදුවන හානි සඳහා තක්සේරු කමිටුවක් මඟින් සිදුකරනු ලබන හානි තක්සේරු ඇස්තමේන්තුව පදනම් කරගනිමින් රුපියල් මිලියන 2.5 ක උපරිමයකට යටත්ව වන්දි ලබා දීම සිදු කරනු ලබයි.

ii. ස්වාභාවික ආපදා හේතුවෙන් හානියට පත් නිවාස වෙනුවෙන් වන්දි මුදල් ලබාදීම සඳහා හානි තක්සේරු කටයුතු සිදු කර අයදුම්පත් ඉදිරිපත් කරන තෙක් එම නිවාස කඩිනමින් පිළිසකර කරගැනීම සඳහා හානියට පත්වූවන් වෙත රුපියල් 10,000ක අත්තිකාරම් මුදලක් ද ලබා දීම සිදු කර ඇත. සම්පූර්ණ කරන ලද අයදුම්පත් තක්සේරු කමිටුව මඟින් තහවුරු කිරීමෙන් පසු ඉතිරි වන්දි මුදල් ලබා දීම සිදු කර ඇත.

iii. 2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා දිවයිනට බලපාන ලද ස්වභාවික ආපදා හේතුවෙන් පූර්ණ නිවාස හානි 566 හා අර්ධ නිවාස හානි 34,568 ක් හා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හානි 5,237 ක් වාර්තා වී ඇත. එම නිවාස හා දේපළ හානි වන්දි වෙනුවෙන් 2024 වර්ෂයේ වන්දි ලබා දීම වෙනුවෙන රු. 834,357,364.79 ක වන්දි ලබා දී ඇත.

ආ. ආපදා හා ආපදා අවදානම හේතුවෙන් ඉවත් කරනු ලබන පවුල් නැවත පදිංචි කිරීම

i. 2016 වර්ෂයේ කෑගල්ල දිස්ත්‍රික්කයේ හා 2017 වර්ෂයේ තවත් දිස්ත්‍රික්ක කිහිපයක සිදු වූ නායයෑමේ ආපදා තත්ත්වයන් හේතුවෙන් නිවාස හානි වූ හා නායයෑමේ අධි අවදානම හේතුවෙන් තම පදිංචි ස්ථානයන්ගෙන් ඉවත් කළයුතු ලෙස ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් හඳුනාගන්නා ලද පවුල් නැවත පදිංචි කිරීමේ වැඩසටහන දිස්ත්‍රික්ක 15ක ක්‍රියාත්මක වේ.

ii. 2021 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා සුරක්ෂිත මධ්‍යස්ථානය 106 ක් අලුත්වැඩියා කිරීම සඳහා රු.මි 154.37 ක් වියදම් දරා ඇත. (2024/11/30 දිනට)

ඇ. සුරක්ෂිත මධ්‍යස්ථානවල පහසුකම් වැඩිදියුණු කිරීම

i. ආපදාවන්ට නිරන්තරයෙන් ගොදුරුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි විපතට පත්විය හැකි ජනතාව වඩාත් සුරක්ෂිතව රඳවා තැබීමට හා ඔවුන්ගේ මූලික අවශ්‍යතාවයන් සපුරාලිය හැකි පරිසරයක් නිර්මාණය කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් තෝරාගත් සුරක්ෂිත මධ්‍යස්ථාන 325 ක සනීපාරක්ෂක හා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම 2018 වර්ෂයේ ආරම්භ කරන ලදී.

ii. එම ජනතාව වෙනුවෙන් පානීය ජල අවශ්‍යතාව සපුරාලීම සඳහා දිවයිනේ සියලුම දිස්ත්‍රික් ලේකම් කොට්ඨාස වෙත ට්‍රැක්ටර් බවුසර් 364ක් ලොරි බවුසර් 133ක් හා ජල ටැංකි 11,936ක් ලබා දී ඇත.

ඈ. ආපදා සහන සේවා තොරතුරු පද්ධතීන් ශක්තිමත් කිරීම

ආපදා හේතුවෙන් හානියට පත්වන නිවාස සඳහා කාර්යක්ෂමව හා වඩාත් ඵලදායී ලෙස ප්‍රතිලාභියා වෙත අත්තිකාරම් ගෙවීමේ අරමුණින් 2018 වර්ෂයේ සිට නිවාස හානි වන්දි ලබාදීමේ දී ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ඇතුළත් කිරීම සඳහා මාර්ගගත දත්ත පද්ධතියක් (On Line System) නිර්මාණය කොට ඇත. http://housing.ndrsc.lk/authentication

20. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

අ. කාලගුණ විද්‍යාව සහ දේශගුණ විද්‍යාව ආශ්‍රිත සේවා සැපයීමේ රජයේ ව්‍යවස්ථාපිත ආයතනය වශයෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව කටයුතු කරයි. කාලගුණ ව්‍යසන සහ සුනාමි පිළිබඳව පූර්ව අනතුරු ඇඟවීම් සඳහා බලයලත් ජාතික ආයතනය වනුයේ ද කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවයි.

i. මෙම මධ්‍යස්ථානයන් දියුණු ගෝලීය සංඛ්‍යාත්මක කාලගුණ අනාවැකි ආකෘති භාවිතා කරමින් විස්තීර්ණ කාලගුණ නිරීක්ෂණ දත්ත විශ්ලේෂණය සිදු කරයි. එය දේශීය සංඛ්‍යාත්මක කාලගුණ අනාවැකි සකස් කිරීම, කාලගුණ සාරාංශ සකස් කිරීම සහ අයහපත් කාලගුණික තත්ත්වයන් මෙන්ම සුනාමි සඳහා කාලෝචිත කාලගුණ අනාවැකි සහ පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කරයි. මෙම මධ්‍යස්ථාන දවසේ පැය 24 පුරාම ක්‍රියාත්මක වන අතර, එහි තොරතුරු අන්තර්ජාලය සහ සමාජ මාධ්‍ය ජාල හරහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ජන මාධ්‍ය ආයතන සහ මහජනතාව වෙත හා ගුවන් සේවා සඳහා සම්ප්‍රේෂණය කරයි.

ii. 2024 දෙසැම්බර් 31 වන විට, ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානය විසින් ආපදා කළමනාකරණ බලධාරීන්ට සහ ධීවර දෙපාර්තමේන්තුවට ඔවුන්ගේ සූදානම් වීමේ ප්‍රයත්නයන් සඳහා ආධාර කරමින්, සාමාන්‍ය ජනතාවට පුරෝකථන 4,557 ක් සහ පූර්ව අනතුරු ඇඟවීම් 505 ක් නිකුත් කර ඇත. මීට අමතරව, පුරෝකථන 1,316 ක් පුද්ගලික ආයතනවලට සහ වෙනත් පාර්ශවවලට ලබා දී ඇත.

iii. කාලගුණ නිරීක්ෂණ කාර්යාලය විසින් ගුවන් සේවා අංශය වෙත මෙට් ෆෝල්ඩර් (met folders) 17,106 ක් සහ සිග්මෙට්ස් (SIGMETS), ගුවන් යානා අනතුරු ඇඟවීම්, අකුණු අනතුරු ඇඟවීම්, සුළං ආවරණ අනතුරු ඇඟවීම් වැනි පූර්ව අනතුරු ඇඟවීම් 1,296 ක් නිකුත් කර ඇත.

ආ. දැනුවත් කිරීමේ සහ පුහුණු වැඩසටහන්

ක්‍රම වේදය	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගිවූ සංඛ්‍යාව
පාසල් කණ්ඩායම් දැනුම්වත් කිරීම	130	14,006
උසස් අධ්‍යාපන ආයතන දැනුම්වත් කිරීම	33	1,084
ත්‍රිවිධ හමුදා කණ්ඩායම් දැනුම්වත් කිරීම	15	464
රාජ්‍ය/ පෞද්ගලික ආයතන හා වෙනත් සංවිධාන	11	479

i. "දේශගුණික විපර්යාස සහ එහි ප්‍රතිවිපාක" පිළිබඳ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගුරුවරුන් සහ රජයේ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩ සටහන් 2ක් ලෝක ආහාර වැඩ පිළිවෙල අනුග්‍රහයෙන් පවත්වන ලදී.

ii. FAO /UNICEF මඟින් අනුග්‍රහය දක්වන ලද ජාතික තරුණ සේවා සභාවේ තරුණ තරුණියන් සහ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද වෛද්‍යවරුන් සඳහා වූ "දේශගුණ විපර්යාස" පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් සඳහා දෙපාර්තමේන්තුව විසින් සම්පත් දායකත්වය ලබා දෙන ලදී.

iii. කාලගුණ විද්‍යා නිරීක්ෂකයින්/සන්නිවේදකයන් 102 සඳහා තෙදින නේවාසික 'අඛණ්ඩ පුහුණු වැඩසටහන් 2 ක් (CET group 1 & 2)' සහ රියදුරන්, කාලගුණ විද්‍යා සහකාරවරුන් සහ කාර්යාල සහකාරවරුන් 82ක් සඳහා දෙදින නේවාසික ධාරිතාව ගොඩනැගීමේ වැඩසටහන් 2 ක් (group 1 & 2) පවත්වන ලදී.

iv. විශ්වවිද්‍යාල සිසුන් 28 දෙනෙකුට සීමාවාසික පුහුණුව සඳහා පහසුකම් සලසන ලදී.

v. දෙපාර්තමේන්තු නිලධාරීන් 39 (සංවර්ධන සහකාර/කළමනාකරණ සේවා නිලධාරීන්) සඳහා විවිධ ආයතන විසින් පවත්වනු ලබන පුහුණු වැඩමුළු (ශ්‍රීලංකා සංවර්ධන පරිපාලන ආයතනය) සාර්ථකව නිම කර ඇත.

vi. මාධ්‍යවේදීන් සඳහා දේශගුණ විපර්යාස පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුවක් පවත්වන ලදී.

vii. හම්බන්තොට සහ ගාල්ල දිස්ත්‍රික්ක වල රජයේ නිලධාරීන් සහ මහජනතාව 200 කට වැඩි පිරිසකට ආපදා පෙර සුදානම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 2ක් සහ කුරුණෑගල සහ අනුරාධපුර දිස්ත්‍රික්ක වල රජයේ නිලධාරීන් 120 ට වැඩි පිරිසකට දේශගුණ විපර්යාස පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් 2ක් පැවැත් වීම.

viii. 2024 තුළ අපේක්ෂා කරන ලද දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මෙන්ම, අනෙකුත් පුහුණු වැඩසටහන් 100% ක් වසර තුළ සම්පූර්ණ කරන ලද අතර, ඒ සඳහා ප්‍රතිපාදන රාජ්‍ය මුදල් වලට අමතරව ලෝක ආහාර වැඩසටහන (WFP) මඟින් ලබාදෙන ලදී.

ඇ. නඩත්තු හා අලුත්වැඩියා කටයුතු

i. ස්ටීවන්සන් ආවරණ 11 ක් අලුත්වැඩියා කිරීම, සාම්ප්‍රදායික සහ ඉලෙක්ට්‍රොනික කාලගුණ සංවේදක 150ක් ක්‍රමාංකනය කිරීම සහ එම උපකරණ 130 ක් පමණ නිකුත් කිරීම සිදු කර ඇති අතර, ක්‍රමාංකන සහතික හා පරිවර්තී වගුද 22 ක් නිකුත් කර ඇත. කටුනායක AWS පද්ධතිය නැවත ස්ථාපනය සහ ත්‍රිකුණාමලය AWS පද්ධතිය ස්ථාපනයට අවශ්‍ය මූලික ඉදිකිරීම් කටයුතු සිදු කිරීම ඇතුළු AWS පද්ධති 39 ක නඩත්තු සිදු කරන ලදී. ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා සහ වර්ෂාපතන මධ්‍යස්ථාන සඳහා

නව බැටරි 112 ක් සහ නව සූර්ය පාලක 27 ක් ස්ථාපනය කරන ලදී. ස්වයංක්‍රීය වර්ෂාපතන මධ්‍යස්ථාන 19 ක් සඳහා දත්ත සටහන් ගබඩා (data loggers) ස්ථාපනය කරන ලද අතර, ARG නඩත්තු කිරීම් 95 ක් ද සිදු කරන ලදී.

ii. පාසල් ප්‍රදර්ශන 11 ක් සඳහා අවශ්‍ය පුහුණුව හා භාණ්ඩ ලබාදීම් කර ඇති අතර පාසැල් ප්‍රදර්ශන 02කට සහභාගී වී ඇත. උපකරණ අංශයේ ගබඩා ධාරිතාව වැඩි කිරීම සඳහා නව ගබඩාවක් ප්‍රතිසංස්කරණය කර භාවිතයට ගැනීම සිදු කරන ලදී.

iii. සර්වර් කාමරය (server room) සඳහා නව ආරක්ෂණ කැමරා පද්ධතියක් ස්ථාපනය කරන ලදී.

iv. බාහිර කාර්යාලයන්හි යටිතල පහසුකම් අලුත්වැඩියා කිරීම් සහ ප්‍රතිසංස්කරණ පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.

- සියලුම දෛනික රාජකාරීන් නිසි පරිදි සිදුකර ඇත. කෙසේ වෙතත් සුළිකුණාටුවේ බලපෑම හේතුවෙන් පුත්තලම කාර්යාලය ගංවතුරට යට වීම නිසා දින 5 ක් වසා තැබීමට සහ එම කාලයේ මඩකලපුව කාර්යාලයේ ඇති වූ අනාරක්ෂිත තත්ත්වය හේතුවෙන් රාත්‍රී නිරීක්ෂණ කටයුතු සිදු නොකිරීමටත්, පසුව තාවකාලිකව කාර්යාලය වෙනත් ස්ථානයක ස්ථාපනය කර නිරීක්ෂණ කටයුතු අඛණ්ඩව සිදු කිරීමටත් කටයුතු කර ඇත.
- පුත්තලම සහ මඩකලපුව කාර්යාල අබලන්ව අලුතින් ඉදි කිරීමට නියමිතව ඇති බැවින්, එම කාර්යාල තාවකාලිකව පවත්වා ගෙන යාම සඳහා කන්ටේනර් පෙට්ටි නිවාස 2 ක් මිලදී ගෙන, ඒවා ස්ථාපිත කිරීම සිදු කරමින් ඇත.
- කටුගස්තොට කාර්යාලීය භූමියේ පැතිබැම්ම සකස්කිරීම නිම කර ඇත.
- මහා ඉලුම්පල්ලම කාර්යාලයේ මල අපවහන පද්ධතිය අලුත්වැඩියා කර එම කටයුතු අවසන් කර ඇත.

v. අලුත්වැඩියා සහ නඩත්තු කටයුතු පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත.

අ/අ	විස්තරය	සිදුකළ කාර්යය ප්‍රමාණය
1	පරිගණක දෘඩාංග අලුත්වැඩියා කිරීම්	121
2	පරිගණක මෘදුකාංග සම්බන්ධ දෝෂ	42
3	විදුලි අලුත්වැඩියාවන්	55
4	ස්වයංක්‍රීය කාලගුණ පද්ධති දත්ත ලොගර් අලුත්වැඩියා කිරීම	3
5	ජාල සම්බන්ධ අලුත්වැඩියාවන්	103
6	ෆැක්ස් ඇතුළු දුරකථන දෝෂ හා අලුත්වැඩියාවන්	26
7	PABX පද්ධති දෝෂ හා අලුත්වැඩියාවන්	45
8	ඉලෙක්ට්‍රොනික් අලුත්වැඩියා	23
9	ගෝලීය විදුලි සංදේශ පද්ධති දෝෂ හා අලුත්වැඩියාවන්	7
10	CMACast පද්ධති දෝෂ හා අලුත්වැඩියාවන්	10
11	Himawaricast පද්ධති දෝෂ හා අලුත්වැඩියාවන්	6
12	අකුණු නිරීක්ෂණ පද්ධති දෝෂ	2
13	මුද්‍රණ යන්ත්‍ර දෝෂ	68
14	Radiosonde දෝෂ හා අලුත්වැඩියාවන්	7
15	වායුසමන යන්ත්‍ර නඩත්තු සහ සේවා අධීක්ෂණය	43
16	හයිඩ්‍රජන් උත්පාදක යන්ත්‍ර අලුත්වැඩියාවන්	8
17	විදුලි උත්පාදක යන්ත්‍ර අලුත්වැඩියාවන්	6
18	වෙනත් වැඩ	16
	මුළු ගණන	**591**

ඈ. පර්යේෂණ කටයුතු

i. IPCC AR 6 දේශගුණ පුරෝකථන වලට අනුව ශ්‍රී ලංකාව සඳහා දේශගුණ ප්‍රක්ෂේපණ පිළියෙල කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

ii. 1950 සිට 2023 දක්වා ශ්‍රී ලංකාවේ දේශගුණ තත්වයේ සිදුවී ඇති වෙනස්කම් පිළිබඳ අධ්‍යයන කටයුතු සිදුකිරීම අවසන් අදියරේ පවතී.

iii. 2024 ජුනි 1 වන දින ඇතිවූ අධික වර්ෂාපතනයට දායක වන කාලගුණ විද්‍යාත්මක සාධක පිළිබඳ සවිස්තරාත්මක අධ්‍යයනයක් සිදු කරන ලදී. එහි වාර්තාව සකස් කරමින් ඇත.

21. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

අ. පුනරාවර්තන වියදම්

මහා භාණ්ඩාගාරය වෙතින් පර්යේෂණ සඳහා වාර්ෂික ප්‍රතිපාදන ලබාදෙන අතර, ක්‍රියාත්මක කරන නායයෑම් අවදානම් කළමනාකරණ ව්‍යාපෘති සඳහාද ප්‍රතිපාදන සපයයි.

ආ. ආයතනයේ ඉපැයීම්

2011 වසරේ සිට ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සෑම වසරකම ප්‍රමාණවත් අතිරික්ත ආදායමක් උපයන අතර මේ වසර තුළ රු. මි. 901ක ඒකාබද්ධ ආදායමක් සහ රු. මි. 115ක ලාභයක් වාර්තා කර ඇත.

ඇ. සංවර්ධන ව්‍යාපෘති (ප්‍රාග්ධන වියදම්) සහ ඒවායේ ප්‍රගතිය පිළිබඳ විස්තර

අ/අ	වැඩසටහන/ව්‍යාපෘතිය	ඇස්තමේන්තුගත මුළු පිරිවැය (රු. මි.)	2024 සඳහා වෙන්වූ ප්‍රතිපාදන (රු. මි.)	2024.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු. මි.)		2024.12.31 දිනට භෞතික ප්‍රගතිය (%)	
				වියදම	සම්බන්ධිත වියදම	භෞතික	සම්බන්ධිත භෞතික ප්‍රගතිය
1	නායයෑම් විමර්ශන, පර්යේෂණ සහ සංවර්ධන කටයුතු	100.0	100.0	100.00	100.00	100%	100%
2	නායයෑම් අවම කිරීමේ වැඩසටහන	100.0	100.0	35.05	35.05	40%	40%
3	නායයෑම් අවදානම් පැතිකඩක් නිර්මාණය කිරීම	246.0	10.0	19.36	245.00	100%	100%
4	ස්වයංක්‍රීය වර්ෂාමාන ජාලය පුළුල් කිරීම තුළින් තථ්‍ය කාලීනව නායයාම් පුරෝකථනය සහ පූර්ව අනතුරු ඇඟවීමේ ශක්‍යතාවය වැඩිදියුණු කිරීම (පද්ධති නඩත්තු කටයුතු)	15.0	15.0	15.00	15.00	100%	100%

අ/අ	වැඩසටහන/ව්‍යාපෘතිය	ඇස්තමේන්තුගත මුළු පිරිවැය (රු. මි.)	2024 සඳහා වෙන්කළ ප්‍රතිපාදන (රු. මි.)	2024.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු. මි.)		2024.12.31 දිනට භෞතික ප්‍රගතිය (%)	
				වියදම්	සමුච්චිත වියදම්	භෞතික	සමුච්චිත භෞතික ප්‍රගතිය
5	ස්ථායිකරණ ක්‍රමවේද මඟින් නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය (AIIB)	USD 92 Mn	10,224	3,081.79	7,585.92	22.4%	59%
6	ගොඩනැගිලි තක්සේරු කිරීම සහ තත්ත්ව වාර්තාකරණය	20.0	20.0	35.70	35.70	100%	100%
7	වර්ෂාපතනය නිසා සිදුවන වේගවත් හා දිගු දුර නායයෑම් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ තාක්ෂණය සංවර්ධනය කිරීම - (තාක්ෂණික සහයෝගීතා වැඩසටහන- SATREPS/JICA-JST)	USD 6.25 Mn	210.00 (JICA) 10.00 (GOSL)	87.40 (JICA) 10.00 (GOSL)	286.01 (JICA) 38.73 (GOSL)	100%	100%
පුනරාවර්තන වියදම්							
8	නයායෑම් අවදානම තක්සේරු වාර්තා නිකුත් කිරීමේ ක්‍රියාවලිය (LRAR)	42.0	42.0	42.0	42.0	100%	100%

22. ඒකාබද්ධ සේවා භාෂා පුහුණු ආයතනය

අ. 2023 වර්ෂයේ ආරම්භ කර 2024 වර්ෂයේ අවසන් කරන ලද පාඨමාලාවන්

අ/අ	පාඨමාලාව	කාලසීමාව	පාඨමාලාව හදාරන ලද සිසුන් සංඛ්‍යාව	
			නිලධාරි	සෙසුනිල
1.	wxi 105 මූලික දමිළ භාෂා පුහුණු පාඨමාලාව	2023.10.04 සිට 2024.04.05	3	100
2.	අංක 16 ඉංග්‍රීසි භාෂා පුහුණු පාඨමාලාව	2023.10.04 සිට 2024.02.22	-	55
3.	අංක 13 ප්‍රංශ භාෂා පුහුණු පාඨමාලාව	2023.10.04 සිට 2024.02.22	4	16
4	අංක 17 ප්‍රංශ භාෂා පුහුණු පාඨමාලාව	2024.03.14 සිට 2024.08.09		50
5	අංක 17 ප්‍රංශ භාෂා පුහුණු පාඨමාලාව	2024.03.14 සිට 2024.08.09	04	09
6	අංක 17 ප්‍රංශ භාෂා පුහුණු පාඨමාලාව	2024.04.24 සිට 2024.11.06	03	83
එකතුව			**14**	**313**

ආ. **2024 වර්ෂය තුළදී ආරම්භකර 2025 වර්ෂයේ අවසන් කිරීමට නියමිත පාඨමාලාවන්**

අ/අ	පාඨමාලාව	කාල සීමාව	පාඨමාලාවන් හදාරනු ලබන සිසුන් සංඛ්‍යාව	
			නිලධාරි	සෙසුනිල
1.	අංක 108 ඉංග්‍රීසි භාෂා පුහුණු පාඨමාලාව	මාස 05	-	46
2.	අංක 15 ප්‍රංශ භාෂා පුහුණු පාඨමාලාව	මාස 05	08	07
3.	අංක 03 උසස් දමිළ භාෂා පුහුණු පාඨමාලාව	මාස 06	02	56
එකතුව			**10**	**109**

23. අපි වෙනුවෙන් අපි අරමුදල

- ‘‘අපි වෙනුවෙන් අපි’’ නිවාස ව්‍යාපෘතියේ සමස්ත ප්‍රගතිය පහතින් දැක්වේ.

අ/අ	ව්‍යාපෘති නාමය		මුළු ඇස්තමේන්තුගත මුදල (රු.)	2023.12.31 දිනට ප්‍රගතිය	මුළු ව්‍යාපෘතියෙන් ප්‍රතිශතයක් ලෙස
1.	‘‘අපි වෙනුවෙන් අපි’’ පූර්ණ නිවාස ව්‍යාපෘතිය (රු.2,000,000.00)	2024 වර්ෂය (ප්‍රතිලාභීන් 20 දෙනෙකු සඳහා)	40,000,000.00	‘‘අපි වෙනුවෙන් අපි’’ පූර්ණ නිවාස ව්‍යාපෘතියෙහි රණවිරුවන් 09 දෙනෙකු වෙත පළමු අදියරට අදාළ මූල්‍ය ප්‍රතිලාභ නිකුත් කර ඇත. ප්‍රතිලාභීන් තිදෙනෙකු ගිවිසුම් අත්සන් කර අමාත්‍යාංශය වෙත ලැබිය යුතු අතර, ප්‍රතිලාභීන් 08 දෙනෙකුගේ රහස්‍ය වාර්තා බුද්ධි අංශය විසින් ඉදිරිපත් කළ යුතුව ඇත.	50%
2.	‘‘අපි වෙනුවෙන් අපි’’ අර්ධ නිවාස ව්‍යාපෘතිය (රු.1,000,000.00 ක උපරිමයට යටත්ව)	2024 වර්ෂය (ප්‍රතිලාභීන් 300 දෙනෙකු සඳහා)	300,000,000.00	2024 වර්ෂයට අදාළව ප්‍රතිලාභීන් 278 දෙනෙකු වෙත පළමු අදියරට අදාළ මූල්‍ය ප්‍රතිලාභ නිකුත් කර ඇත. ප්‍රතිලාභීන් 139 දෙනෙකු වෙත දෙවන අදියරට අදාළ මූල්‍ය ප්‍රතිලාභද නිකුත් කර ඇති අතර, ප්‍රතිලාභීන් 108 දෙනෙකු වෙත තෙවන අදියරට	75%

අ/අ	ව්‍යාපෘති නාමය		මුළු ඇස්තමේන්තුගත මුදල (රු.)	2023.12.31 දිනට ප්‍රගතිය	මුළු ව්‍යාපෘතියෙන් ප්‍රතිශතයක් ලෙස
				අදාළ මූල්‍ය ප්‍රතිලාභද හිමි ගන්වා ඇත. යුද හමුදාවේ ප්‍රතිලාභීන් තිදෙනෙකු විදෙස්ගත වී ඇති බැවින් මෙතෙක් ගිවිසුම් අත්සන් කර මෙම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර නොමැත.	

24. ජාතික ආරක්ෂක අරමුදල

- මෙම අරමුදල මඟින් තම රාජකාරී කටයුතු ඉටුකරන අතරතුර දී තුවාල ලද හෝ මියගිය සන්නද්ධ හමුදාවේ හා පොලීසියේ යම් සාමාජිකයකුට හෝ සාමාජිකයන්ගේ පවුල්වලට සුබසාධන ප්‍රතිලාභ ලබාදීම සිදු කරයි. එහි ප්‍රගතිය පහතින් දැක්වේ.

අනු අංක	ව්‍යාපෘති නාමය		මුළු ඇස්තමේන්තුගත මුදල (රු.)	2024.12.31 දිනට ප්‍රගතිය	මුළු ව්‍යාපෘතියෙන් ප්‍රතිශතයක් වශයෙන් (%)
1.	"මෙත් සෙවණ" අර්ධ නිවාස ව්‍යාපෘතිය (රු.1,000,000.00 ක උපරිමයකට යටත්ව)	2024වර්ෂය (ප්‍රතිලාභීන් 145දෙනෙකු සඳහා)	138,000,000.00	"මෙත් සෙවණ" අර්ධ නිවාස ව්‍යාපෘතියේ 2024 වර්ෂයට අදාළ ප්‍රතිලාභීන් 145 දෙනෙකුගේ අර්ධ නිවාස සම්පූර්ණ කිරීම සඳහා අධියර 03 ක් යටතේ ප්‍රතිලාභ ලබාදෙන අතර, ප්‍රතිලාභීන් 136 දෙනෙකු වෙත පලමු වාරිකය දක්වා මුදල් ලබා දී ඇත. තවද, ප්‍රතිලාභීන් හට දෙවන වාරිකය ලබා දීම සඳහා කටයුතු කරනු ලැබේ.	80%
2.	"විරුසිසු ප්‍රදීප" ශිෂ්‍යාධාර ප්‍රදානය (රු.25,000.00 ක් ඉතිරි කිරීමේ ගිණුමක් මඟින්)	2022 වර්ෂයට අදාළව 5 වසර ශිෂ්‍යත්ව විභාගය සමත්(ප්‍රතිලාභීන් 97 දෙනෙකු වෙත ප්‍රතිලාභ ලබා දී ඇත.	2,425,000.00	සියලුම ප්‍රතිලාභීන් හට ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කර ඇත.	100%

2.2

ඉදිරි දැක්ම

2.2 ඉදිරි දැක්ම

''පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" උදෙසා වූ වත්මන් රජයේ වැඩපිළිවෙළ යථාර්ථයක් බවට පත්කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ වගකීම හා කාර්යභාර්ය සුවිශේෂී වන අතර ඒ සඳහා ජාතික ආරක්ෂාව සුරක්ෂා කර නිදහස්, ස්වෛරී, සුවපහසු, සතුටින් ජීවත් වියහැකි ජීවන පසුබිමක් රට තුළ නිර්මාණය කිරීමට ත්‍රිවිධ හමුදාව ඇතුළු නීතිය හා සාමය ආරක්ෂා කරන ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ඇති සියලු ආයතන සමඟ කටයුතු කරමින් සිටියි. එමෙන්ම ප්‍රාදේශීය මට්ටමට විහිදා ගිය ක්‍රමානුකූල ආපදා කළමනාකරණ ක්‍රියාවලියක් තුළින් ජනජීවිතය සුරක්ෂා කිරීමට ද මෙම අමාත්‍යාංශය බැඳී සිටියි.

ශ්‍රී ලංකාව භූ භෞතික පිහිටීම අනුව කලාපීය වශයෙන් මෙන්ම ජාත්‍යන්තර වශයෙන්ද ඉතා වැදගත් ස්ථානයක් උසුලන අතර වැදගත් ආර්ථික මර්මස්ථානයක් වීම හේතුකොට ගෙන උසස් ජාතික ආරක්ෂාවක් සහිත සුරක්ෂිත රාජ්‍යයක් තහවුරු කිරීම උදෙසා වත්මන් රජයේ ප්‍රතිපත්තිමය මඟ පෙන්වීම මත පුරවැසි ආරක්ෂාව, ස්වෛරීභාවය හා භෞමික අඛණ්ඩතාවය සමුද්‍රීය හා ගුවන් කලාපය ආරක්ෂාව, ජාතික සම්පත්වල ආරක්ෂාව වැනි දස වැදෑරුම් මූලධර්ම මත පදනම්ව ප්‍රධාන ක්‍රියාකාරකම් 33ක් දැනටමත් අමාත්‍යාංශය මඟින් ක්‍රියාවට නැංවීමට සැලසුම් කර ඇත.

ජාතික ආරක්ෂාව සඳහා වගකීම සහ වගවීම සහතික කරමින් ජාතික ආරක්ෂක කවුන්සිලය ශක්තිමත් කිරීම සහ විධිමත් කිරීම, විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන සමඟ ජාතික ආරක්ෂාව පිළිබඳ දැනුම ඒකාබද්ධ කිරීමෙන් ආරක්ෂක අංශයේ විශිෂ්ඨත්වය ඉහළ නැංවීම, ආර්ථික ස්ථාවරත්වය සඳහා උපායමාර්ගික ආරක්ෂක පරිසරයක් සහ ස්ථීර පදනමක් නිර්මාණය කිරීම, ස්වාභාවික ආපදා අවදානම් භූමි හඳුනාගැනීම, කළමනාකරණය හා ආපදා අවම කිරීම, මත්ද්‍රව්‍ය රට තුළට පැමිණීම වැළැක්වීම සඳහා නාවික ගුවන් මාර්ග පරීක්ෂා කිරීම පහසුකම් වර්ධනය කිරීම, නවීන උපකරණ ලබාදීම හා නිලධාරීන් පුහුණු කිරීම, ගංවතුර, ලැව්ගිනි සහ නායයෑම් සඳහා පූර්ව සහ සක්‍රිය අනතුරු ඇඟවීම් සඳහා ක්‍රියාකාරී ආපදා කළමනාකරණ පද්ධති සංවර්ධනය කිරීම, ශ්‍රී ලංකාවේ අනන්‍ය ආර්ථික කලාපයේ ආරක්ෂාව සහ ස්ථාවරත්වය සහතික කිරීමට හැකිවන පරිදි ශ්‍රී ලංකා නාවික හමුදාව හා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව තාක්ෂණිකව යාවත්කාලීන කර අදාළ නීති මඟින් බලගැන්වීම, සමුද්‍ර බල ප්‍රදේශය තුළ ගුවන් කලාපය ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව තුළ පියාසර තොරතුරු කලාපය සහ සෙවීම් සහ මුදා ගැනීමේ කලාපය ඒකාබද්ධ කර විධිමත් කිරීම, ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ගුවන් හමුදාවේ තාක්ෂණික දියුණුව සහ නාවික හා ගුවන් සේවා සමඟ විචක්ෂණශීලිව ඒකාබද්ධ කිරීම සහ කලාපීය ආරක්ෂාව තහවුරු කිරීමට සහාය වීම වැනි ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමට මේ වන විටත් සැලසුම් සකස් කර ඇත.

තිස් වසරක් පැවති සිවිල් යුද්ධය නිමා කිරීම උදෙසා කැපවීමෙන් ක්‍රියාකළ රණවිරුවන්, රණවිරු පවුලන්, විශ්‍රාමික ත්‍රිවිධ හමුදා සාමාජිකයින්, මියගිය, අතුරුදහන්, ආබාධිත සහ සේවයෙහි නිරත රණවිරුවන් හට ගෞරවයෙන් හා අභිමානයෙන් යුතු ජීවිතයක් ගත කිරීම සහතික කිරීම, අපි වෙනුවෙන් අපි අරමුදල හා ජාතික ආරක්ෂක අරමුදල වැනි අරමුදල් මෙහෙයවීමෙන් රණවිරු සුබසාධන ක්‍රියාවලිය අඛණ්ඩව සිදුකිරීම මෙන්ම රණවිරු දුදරු ශිෂ්‍යත්ව, රණවිරු මාපිය රැකවරණ වැඩසටහන්, රණවිරු ගම්මාන වැඩසටහන්, වෛද්‍ය ආධාර වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කිරීම ප්‍රමුඛකොට සැලසුම් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. දැනට සක්‍රීය සේවයේ සිටින ත්‍රිවිධ හමුදා සාමාජිකයින්ට අවශ්‍යය අධ්‍යාපනය, දැනුම සහ කුසලතා වර්ධනයට ඉවහල් වන පරිදි අධ්‍යාපන හා උසස් අධ්‍යාපනය සඳහා ඒකාබද්ධ සේවා භාෂා පුහුණු ආයතනය, ජාතික ආරක්ෂක විද්‍යායතනය, ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය, ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය වැනි ආයතන හරහා අවස්ථාව සලසා දෙමින් විදෙස් රටවල ශිෂ්‍යයින් ආකර්ෂණය කර ගැනීම මඟින් අවස්ථා පුළුල් කිරීමට හා විදේශ විනිමය ඉපයීමටද ඒ තුළින් ඉහළ වෘත්තීමයභාවයක් ළඟාකර ගැනීමට ද අපේක්ෂා කෙරේ. තවද, ජාතික ශිෂ්‍යභට බලකාය මඟින් නිර්මාණශීලී, විනයගරුක අනාගත පරපුරක් බිහිකරමින් සිදුකරනු ලබන ජාතික මෙහෙවර තවදුරටත් පුළුල් කිරීමටද සැලසුම් සකස් කර ඇත.

ඒ අනුව, ලාංකේය ජනතාවට අභිමානවත් ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය වන නොසැලෙන රටක් නිර්මාණය කිරීමේ පුරෝගාමී මෙහෙවරක තවදුරටත් වගකීමෙන් යුතුව කටයුතු කිරීම සඳහා අවශ්‍ය වන ආරක්ෂක ප්‍රතිපත්ති සකස් කිරීම, එම ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම උදෙසා අවශ්‍ය ඉදිරි සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළ ආරක්ෂක අමාත්‍යාංශය විසින් සිදු කරමින් සිටී.

එයාර් වයිස් මාර්ෂල් සම්පත් තුයියකොන්තා (විශ්‍රාමික)
ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී (තෙවරක්), ආර්එස්පී (දෙවරක්), යූඑස්පී,
එම්එම්එස්සී (උපායමාර්ගික අධ්‍යයන-චීනය), එම්එස්සී (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ,
එම්එස්සී (ආරක්ෂක හා උපායමාර්ගික අධ්‍යයන), එෆ්එන්ඩීයූ (චීනය), පීඑස්සී
ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය

පරිච්ඡේදය 3

වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය - ආරක්ෂක අමාත්‍යාංශය

2024.12.31 දිනෙන් අවසන් වූ කාලසීමාව සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය					
සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024		සටහන	තක්ෂ 2,024	2023	
රු.			රු.	රු.	
-	**ආදායම් ලැබීම්**		**3,197,252,819**	**10,188,404,484**	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	80,360,013	64,116,857	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	3,116,892,806	10,124,287,627	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		**3,197,252,819**	**10,188,404,484**	
-	**ආදායම් නොවන ලැබීම්**		**12,523,364,568**	**14,371,113,445**	
-	භාණ්ඩාගාර අග්‍රිම		12,092,022,895	13,706,875,781	ඒසිඒ-3
-	තැන්පතු		329,403,464	563,211,742	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		101,938,210	101,025,922	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**12,523,364,569**	**14,371,113,445**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**15,720,617,388**	**24,559,517,929**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		**78,767,340**	**13,564,303**	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		**15,641,850,048**	**24,545,953,626**	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
3,196,500,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	3,190,172,154	2,937,522,009	
2,126,350,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	1,950,941,525	1,627,952,601	ඒසිඒ-
6,718,150,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	6,819,000,626	8,624,512,271	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	1,235,441	48,924	
12,041,000,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**11,961,349,746**	**13,190,035,805**	
	මූලධන වියදම්				
83,750,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	84,566,749	24,927,683	
212,950,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	244,891,056	341,509,149	
724,200,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	697,988,034	511,863,841	ඒසිඒ-
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
6,600,000	භෑකියා වර්ධනය	14	5,426,391	4,580,102	
20,245,500,000	වෙනත් මූලධන වියදම්	15	9,018,542,892	10,578,215,055	
21,273,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**10,051,415,123**	**11,461,095,830**	
	තැන්පතු ගෙවීම්		284,742,872	610,108,330	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		95,827,861	92,907,579	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**380,570,733**	**703,015,909**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		22,393,335,601	25,354,147,544	
33,314,000,000	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		**(6,751,485,553)**	**(808,193,917)**	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(6,753,062,283)	(808,193,917)	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		1,576,730	-	ඒසිඒ-3
			(6,751,485,553)	**(808,193,917)**	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය - ආරක්ෂක අමාත්‍යාංශය

ඒසිඒ-පී

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	2024 රු.	තක්‍ය 2023 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	56,885,859,064	40,473,738,814
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	214,467,505	220,577,854
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	1,576,730	-
මුළු වත්කම්		**57,101,903,299**	**40,694,316,668**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(725,192,322)	(674,421,355)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		56,885,859,064	40,473,738,814
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(ඕ)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	939,659,827	894,999,209
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	1,576,730	-
මුළු වගකීම්		**57,101,903,299**	**40,694,316,668**

පිටු අංක 07 සිට 72 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 73 සිට 94 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024** විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 2025.02

වයාර් වයිස් මාර්ශල් සම්පත් තුඩියකොන්තා (විශ්‍රාමික)
බඩුසකිව ආරක්ෂක // ආර්ඵස්ට්/ යුවල්ස් ඔෆ් එව්ඩබ්ලු ඔවස්ඩ්
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ

.....
ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 2025.02

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමිසාරිස් (මුදල්)
නම :
දිනය : 2025.02

දීපිකා බුද්ධදාස
ප්‍රධාන මූල්‍ය නිලධාරී - I
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ.

2

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය - ආරක්ෂක අමාත්‍යාංශය

		ඒසිඒ-සී
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා		
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය		
	තත්‍ය	
	2024 රු.	**2023** රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	53,447,880	42,008,684
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	442,439,251	684,477,006
අග්‍රිම ලැබීම්	12,092,022,895	13,706,875,781
අත්තිකාරම් අයකර ගැනීම්	93,190,745	93,047,350
තැන්පතු ලැබීම්	329,403,464	563,211,742
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**13,010,504,235**	**15,089,620,563**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	4,374,987,357	3,817,430,815
සහනාධාර සහ මාරුකිරීම්	372,237,230	428,109,048
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	2,192,885,003	2,068,535,144
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	78,767,340	13,564,303
අත්තිකාරම් ගෙවීම්	94,699,856	92,086,521
තැන්පතු ගෙවීම්	284,742,872	610,108,330
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**7,398,319,657**	**7,029,834,161**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**5,612,184,577**	**8,059,786,402**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	5,610,607,847	8,059,786,402
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**5,610,607,847**	**8,059,786,402**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(5,610,607,847)**	**(8,059,786,402)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**1,576,730**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**1,576,730**	**-**
2024 ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
2024 දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**1,576,730**	**-**

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් - ආරක්ෂක අමාත්‍යාංශය

1. පිළියෙල කිරීමේ අරමුණ

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2. වාර්තාකරණ කාලපරිච්ඡේදය

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3. මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

4. ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5. දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6. දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

7. මුදල් හා මුදල් සමාන දෑ

2024 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

- යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම ‘‘වාර්තාකරණ පදනම’’ යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම් ඇතුළත් කළ හැක.
- තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය - ආරක්ෂක අමාත්‍යාංශය

ආදායම් සංකේතය	විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව (රු.මි.)	අවසන් ඇස්තමේන්තුව (රු.මි.)	ප්‍රමාණය (රු.මි.)	අවසන් ආදායම ඇස්තමේන්තුවේ % ලෙස
1003.07.05	ආරක්ෂක අමාත්‍යාංශයට අදාළ බලපත්‍ර ගාස්තු	59.00	55.44	79.52	143%
2003.06.00	එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් තුළින් ලද ආදායම්	5,300.00	3,050.01	766.27	25%

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය - ආරක්ෂක අමාත්‍යාංශය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම(රු)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය (රු)	අවසාන ප්‍රතිපාදනය (රු)		
පුනරාවර්තන	2,041,000,000	12,864,654,000	11,961,349,746	92.81%
ප්‍රාග්ධන	21,273,000,000	21,929,751,673	10,051,415,123	45.83%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන - ආරක්ෂක අමාත්‍යාංශය

අ/කු	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම (රු.)	ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන (රු.)	අවසාන ප්‍රතිපාදන (රු.)		
1	පොලිස් දෙපාර්තමේන්තුව	රාජ්‍ය බුද්ධි සේවයේ වැටුප්	333,233,640.00	-	313,614,567.52	94%
2	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	සුහුරුපාය ගොඩනැඟිල්ලෙහි ණය වාරික හා පොළි ගෙවීමට	1,039,440,000.00	-	984,898,017.84	93%

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	2024.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය(රු.)	2024.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය (රු.)	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	13,206,694,304.45	13,206,694,304.45	-	100%
9152	යන්ත්‍රෝපකරණ	4,353,749,067.49	4,353,749,067.49	-	100%
9153	ඉඩම්	18,283,900,000.00	18,283,900,000.00	-	100%
9154	අස්පෘශ්‍ය වත්කම්	195,845,923.11	195,845,923.11	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	20,845,669,769.02	20,845,669,769.02	-	100%
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	100%

මගේ අංකය / எனது இல. / My No. } ඩී්ග්/සී/එම්ඕඩී/02/24/එෆ්එස්/18 මබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2025 මැයි 30 දින

ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය

ශීර්ෂය 103 - ආරක්ෂක අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 103 - ආරක්ෂක අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ **1.6** ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආරක්ෂක අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් **1**හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 **තත්ත්වාගණනය මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ආරක්ෂක අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ආරක්ෂක අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියළුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මුල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම්

(අ) ආදායම් සංකේතාංක 20.03.06.00 – එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් රාජකාරි තුලින් ලද තථ්‍ය ආදායම ලෙස මුල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගය රු. මිලියන 3,116.89 ක් වුවත් එම ආදායම රැස්කරනු ලබන ශ්‍රී ලංකා යුද්ධ හමුදාව හා ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් පිළිවෙලින් 2025 ජනවාරි 31 දින හා 2025 පෙබරවාරි 08 දින ඉදිරිපත්කළ තොරතුරු අනුව දැක්වෙන තථ්‍ය ආදායම රු. මිලියන 3,064.33 ක් වූයෙන් රු. මිලියන 52.56 ක වෙනසක් පැවතුණි.

(ආ) 2024 මුල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් රාජකාරි වෙනුවෙන් ලැබුණු රු. මිලියන 3,116.89 ක තථ්‍ය ආදායමට අදාල විස්තරාත්මක උපලේඛණ, එක් එක් සංරචක අනුව ආදායම දැක්වෙන මූලාශ්‍ර ලේඛණ සහ වාර්තා කරනු ලබන වර්ෂයට අදාල හිඟ මුදලවූ රු. මිලියන 1,106.4 ක් සඳහා ශේෂ තහවුරු කිරීම් ආදිය ඉදිරිපත් නොවීම හේතුවෙන් ආදායමේ නිරවද්‍යතාව සනාථකර ගැනීමට ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් නොවුණි.

(ඇ) ACA-1 ආකෘතියෙහි ආදායම් සංකේතාංක 20.03.06.00 - එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් මගින් ලද රු.86,861,057 ක් ආදායමින් ආපසු ගෙවීම් ලෙස අඩුකර දක්වා ඇතත් එම ගිණුම් ගැලපීමට හේතු හෙළිදරව් කර නොතිබුණු අතර එම අගය පිළිබඳ විස්තරාත්මක උප ලේඛණයක්ද ඉදිරිපත් නොවුණි.

1.6.2 මූල්‍ය නොවන වත්කම්

(අ) 2018 දෙසැම්බර් 31 දිනැති වත්කම් කළමණාකරණ චක්‍රලේඛ අංක 04/2018 හි උපදෙස් අනුව රජයට අයත් සියළු ඉඩම් තක්සේරු කර වාර්තා කල යුතු වුවද ජාතික ශිෂ්‍ය භට බලකායට අයත් හෙක්ටයාර් 3.127 ක් වූ ඉඩම් කොටස් **3** ක වටිනාකම තක්සේරු කර ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) ආරක්ෂක මුලස්ථාන ඉදිකිරීම් ව්‍යාපෘතිය යටතේ 2021 වර්ෂය දක්වා සිදුකරන ලද මූලධන වියදම් මගින් ගොඩනැගී ඇති ස්ථාවර වත්කම් සහ කෙරිගෙන යන වැඩ පිරිවැය මුල්‍ය ප්‍රකාශන හා **SA** 82 - මූල්‍ය නොවන වත්කම් වාර්තාව තුලින් නිරූපණය වී ඇතත්, 2022 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලය තුළ ආරක්ෂක මුලස්ථාන ඉදිකිරීම් ව්‍යාපෘතියේ මූලධන වියදම යටතේ දරන ලද ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම් (9152 -61122 - අනෙකුත් යාන්ත්‍රික උපකරණ) රු. 722,300,666 ක් සහ කෙරිගෙන යන වැඩ පිරිවැය (9160 – 61114) රු. 18,282,445,134 ක් **SA** 82 මූල්‍ය නොවන වත්කම් වාර්තාවට ඇතුලත්ව නොතිබුණි. ඒ අනුව රු. 19,034,745,800 ක් මූල්‍ය නොවන වත්කම් ගිණුම් තුලින් නිරූපනය නොවුණි.

(ඇ) ආපදා කළමණාකරණ අංශයට පරිත්‍යාග වශයෙන් ලැබී අභාවිතව පැවති ජල බවුසර් 78 ක් වෙනත් ආයතන වෙත පවරාදී තිබුණු නමුත් එම රථවල ගිණුම්ගත කළ පිරිවැය වූ රු.

40,170,000 ක් ගිණුම්වලින් ඉවත්කර නොතිබීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) පරිත්‍යාග වශයෙන් ලැබී ඇති ජල බවුසර් 191 හි ඒකක පිරිවැය ලෙස ඒ සඳහා ගෙවන ලද රේගු ගාස්තු වූ රු.515,000 පමණක් හඳුනාගෙන තිබුණු බැවින් මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම අඩුවෙන් ගිණුම්ගතවී තිබුණි.

1.6.3 කුලී හා වැඩ අත්තිකාරම් සහ කුලි හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම

2016 අගෝස්තු 03 දිනැති අංක 250/2016(i) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින්, රජයේ කාර්යාල ගොඩනැගිලි කුලී පදනම මත ලබා ගැනීමේ දී හා වැඩ කොන්ත්‍රාත් සඳහා අත්තිකාරම් ගෙවීමේදී ඒ සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ගිණුම් තැබීමේ ක්‍රියා පිළිවෙත හා සිගාස් පද්ධතිය තුළ ගිණුම් පවත්වා ගත යුතු ආකාරය හඳුන්වාදී ඇතත් අමාත්‍යාංශය විසින් එම පිළිවෙත් අනුගමනය කර නොතිබුණි.

(අ) ඒ අනුව ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාර්යයන් 24 කට අදාලව 2024 දෙසැම්බර් 31 දිනෙන් ඉදිරි කාලපරිච්ඡේදයන්ට අදාලව රු. 159,720,255ක වැඩ අත්තිකාරම් ගෙවීම් සිදුකර ඇතත්, චක්‍රලේඛ උපදෙස් පරිදි කුලී හා වැඩ අත්තිකාරම් ගිණුම හා කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම් මගින් අනාවරණය කර නොතිබුණි.

(ආ) මෙම වැඩ කොන්ත්‍රාත් අත්තිකාරම් ගෙවීමේදී, ගෙවීම් සිදු කරන වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත වීම හා වැඩ අත්තිකාරමක් ලෙස සිගාස් පද්ධතිය තුල ගිණුම්ගත නොවීම හේතුවෙන් ජනරජ ගිණුමේ රජයට ඇති හිමිකම නිසිලෙස නිරූපණය නොවන බවද නිරීක්ෂණය විය.

1.6.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

තුවක්කු බලපත්‍ර ආඥාපනතේ 182 අධිකාරයෙහි 27වන ඡේදය ප්‍රකාරව බලපත්‍ර අධිකාරීවරයා විසින් තුවක්කු සම්බන්ධයෙන් "අ" උපලේඛණයෙහි "ග" ආකෘතියට සාරානුකූලව සියලුම තුවක්කු බලපත්‍ර පිළිබඳ ලේඛණයක් පවත්වා ගත යුතු අතර එම ලේඛණ අනුව 1995 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දක්වා කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නොවන (වගා ආරක්ෂක සහ දේපළ ආරක්ෂාව සඳහා) කාර්යන් සඳහා නිකුත්කර තිබුණු බලපත්‍ර සංඛ්‍යාව 25,064 ක් ලෙස වාර්තාගතව ඇතත්, විගණනට ඉදිරිපත් කළ 2024 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාල අනුව ගිණි අවි බලපත් සංඛ්‍යාව දැක්වෙන ලේඛණය අනුව බලපත්‍ර 12,981ක වෙනසක් පැවතුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
2.4.(ඇ)	2015 ජූලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 1/2015 හි (05) ඡේදයේ සහ මුදල් රෙගුලාසි 128 (2)(එ) හි විධිවිධානවලට අනුව, ආර්ථික තත්ත්වයේ වෙනස්කම් සැලකිල්ලට ගනිමින්, අවශ්‍ය විටෙක විවිධ සේවාවන් සඳහා අය කරනු ලබන ගාස්තු කාලෝචිත ලෙස සංශෝධනය කළ යුතු වුවත්, 1996 අංක 22 දරන තුවක්කු (සංශෝධන) පනත යටතේ අයකරනු ලබන ගාස්තු කාලීනව සංශෝධනය කිරීම තවදුරටත් ප්‍රමාද වෙමින් පැවතීම හා දැනට ක්‍රියාත්මක ගාස්තු සලකා බැලීමේදී ඉතාම අවම වාර්ෂික ගාස්තුවක් ක්‍රියාත්මක වන බැවින් වර්ෂ 29 කට ආසන්න කාලයක් තුළ ගාස්තු සංශෝධනය නොකිරීම හේතුවෙන් සැලකිය යුතු රාජ්‍ය ආදායමක් වාර්ෂිකව අහිමිවන බව.	3.4(උ)

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

(අ) 2015 ජූලි 22 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 3 ඡේදයේ සඳහන් කරුණුද සැලකිල්ලට ගනිමින් නිවැරදි ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට හැකිවන පරිද්දෙන් තාත්විකව ආදායම් ඇස්තමේන්තු පිළියෙල කළයුතු වුවද 2024 වර්ෂයේ මූලික ආදායම් ඇස්තමේන්තුව අනුව බලපත්‍ර ගාස්තු ආදායමක් රු.මිලියන 59 ක් වූ අතර සංශෝධිත ඇස්තමේන්තුව මගින් රු.මිලියන 55.44 ක් දක්වා අඩුකර තිබුණි. එහෙත් 2024 වර්ෂයේ තථ්‍ය ආදායම රු.මිලියන 80.40 ක් වූයෙන් තථ්‍ය ආදායම සංශෝධිත ඇස්තමේන්තුව මෙන් සියයට

145 ක වැඩිවීමක් සහිත විය. එබැවින් තාත්වික ලෙස ආදායම් ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි.

(ආ) 2024 වර්ෂයේ රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අංක 20.03.06.00 - එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් තුලින් ලද ආදායම යන ආදායම් ශීර්ෂයේ මූලික ආදායම් ඇස්තමේන්තුව රු. මිලියන 5,300 ක් ද, සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව රු. මිලියන 3,127.74 ක්ද වූයෙන් ඒ අතර වෙනස (අඩුවීම) රු.මිලියන 2,172.26 ක් හෙවත් මූලික ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 41 ක් විය. මෙලෙස ආදායම් ඇස්තමේන්තුවල සිදුවන සැලකියයුතු විචලනයන්ට බලපෑ හේතු අනාවරණය වන පරිදි එක්සත් ජාතීන්ගේ සංවිධානය සමග ඇතිකරගනු ලබන ගිවිසුම්ගත කරුණු අනුව තක්සේරු කළ ආදායම් හා උපකරණ සැපයීමට නොහැකිවීම ආදිය හේතුවෙන් අහිමිවන ආදායම් හා වෙනත් අඩුකිරීම් ආදිය හඳුනාගත හැකිවන පරිදි ලේඛණ පවත්වා ගැනීමක් අමාත්‍යාංශය විසින් සිදුකරනු ලබන බවද තහවුරු නොවුණි.

(ඇ) විගණනයට ඉදිරිපත්කළ තොරතුරු අනුව ජීවිත ආරක්ෂාව සඳහා නිකුත්කර තිබූ ගිනි අවි 22 ක් 2025 වර්ෂය සඳහා බලපත්‍ර අළුත්කර නොතිබුණු අතර 2024 දෙසැම්බර් 31 දිනට රු.1,370,000 ක හිඟහිටි ආදායමක් වාර්තා වී තිබුණි. මෙම හිඟ බලපත්‍ර ආදායම පිළිබඳ කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණු අතර 2023 දෙසැම්බර් 31 දිනට හිඟ බලපත්‍ර ආදායම රු. 236,000 ලෙසද, 2024 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම රු.1,370,000 ක ලෙසද දක්වා ඇතත් වාර්ෂික බලපත්‍ර ගාස්තුව හා සැසඳීමේදී මෙම සංඛ්‍යාවල නිරවද්‍යතාව සම්බන්ධයෙන් සෑහීමකට පත්විය නොහැකි විය.

3.2 වියදම් කළමනාකරණය

3.2.1 මුදල් රෙගුලාසි 03 හා 04 අනුව, රජයේ සියළුම කාර්යයන් කලින් තීරණය කර සැලසුම් සහ වැඩසටහන් වල දැක්විය යුතු අතර වියදම් වැඩසටහන් ගත කිරීමේදී, අනුමත කරනු ලබන අරමුදල්, මුදල් වර්ෂය තුල සාක්ෂාත් කරගත හැකි වැඩසටහන් වලට සීමා කරන බවට සහතික වීම ගණන් දීමේ නිලධාරීන්ගේ වගකීම වේ. වාර්ෂික ඇස්තමේන්තු තුළ පහත දුර්වලතා පැවතුණි.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාංශය වෙනුවෙන් සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 34,794.4 ක් වූ අතර වර්ෂයේ මුළු වියදම රු. මිලියන 22,012.7 ක් වූයෙන් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 37 ක් හෙවත් රු. මිලියන 12,781.6 ක ප්‍රතිපාදන ඉතිරි වීම් පැවතුණි.

(ආ) වාර්ෂික ඇස්තමේන්තු මගින් පුනරාවර්තන හා මූලධන වැය විෂයන් 20 කට අදාලව සලසාගෙන තිබුණු රු. මිලියන 239.61ක ප්‍රතිපාදන වලින් සියයට 99 ක් හෙවත් රු.මිලියන 236.46 ක් උපයෝජනය කර නොතිබුණු අතර ඉතිරි රු. මිලියන රු. 3.15 ක් මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබූ .

(ඇ) මූලධන හා පුනරාවර්තන වැය විෂයයන් 45 කට සලසා තිබුණු රු. මිලියන 10,921 ක ප්‍රතිපාදනයෙන් රු. මිලියන 7,436.17 ක ප්‍රතිපාදන ඉතිරිව පැවති අතර එම ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සැලකිල්ලට ගත්විට සියයට 50 ත් සියයට **98** ක් අතර පරාසයක පැවතුණි.

(ඈ) වැය විෂයයන් 43 කට අදාලව සලසා තිබුණු රු. මිලියන 9,419.58 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 4,446.66 ක් ඉතිරිව පැවති අතර එය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සැලකිල්ලට ගත්විට සියයට 20 ත් සියයට 49 ත් අතර පරාසයක පැවතීම.

3.2.2 මුදල් රෙගුලාසි 50 (ii) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත්, නිවැරදිවත් පිළියෙල කලයුතු බව දක්වා ඇති අතර, එම ඇස්තමේන්තු පදනම් කරගත් වාර්ෂික ක්‍රියාකාරී සැලසුමකට අනුව නිසි වැඩපිළිවෙලක් යටතේ වියදම් කළ යුතු වුවත් වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් සලසාගෙන තිබුණු ප්‍රතිපාදන මෙන් තුන්ගුණයකට අධික අනුපාතයන් ගෙන් අතිරේක ප්‍රතිපාදන ලබාගෙන තිබුණු අවස්ථා මෙන්ම ලබාගත් අතිරේක ප්‍රතිපාදන ඉතිරිවී පැවති අවස්ථාද නිරීක්ෂණය විය.

(අ) රු. මිලියන 96.54 ක ප්‍රතිපාදන සලසා තිබුණු වැය විෂයයන් 11 ක් සඳහා , මුල් ප්‍රතිපාදනය මෙන් සියයට 368 ක් හෙවත් රු. මිලියන 355.38 ක අතිරේක ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් මගින් ලබාගෙන තිබුණි.

(ආ) රු. මිලියන 81.2 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණු වැය විෂයක් සඳහා මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් මගින් රු. මිලියන 320 ක අතිරේක ප්‍රතිපාදන සලසාගෙන තිබුණු නමුත් එම අතිරේක ප්‍රතිපාදනයෙන් සියයට 86 ක් හෙවත් රු.මිලියන 277.05 ක ප්‍රතිපාදන ඉතිරිවී පැවතුණි.

(ඇ) 2024 වර්ෂයේදී ආරක්ෂක අමාත්‍යාවරයාගේ කාර්යාලයේ පුනරාවර්තන හා මූලධන වියදම් වෙනුවෙන් පිලිවෙලින් රු. මිලියන 76.00 හා රු. මිලියන 8.00 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. එහෙත් එම ප්‍රතිපාදනයෙන් පිලිවෙලින් සියයට 61 හා සියයට 90 බැගින් ඉතිරිව පැවතුණි. තවද 2022 වර්ෂයට සාපේක්ෂව 2023 හා 2024 වර්ෂවලදී මුළු ප්‍රතිපාදනය පිළිවෙලින් සියයට 225 සහ සියයට 366 ලෙස වැඩි කර තිබුණු නමුත් 2022 වර්ෂයේ මුළු ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණු අතර 2023 හා 2024 වර්ෂවල මුළු ප්‍රතිපාදනයෙන් පිලිවෙලින් සියයට 43 ක් හා සියයට 64 ක් වූ ප්‍රතිපාදන ඉතිරි වී පැවතීම.

(ඇ) එලෙස අමාත්‍ය කාර්යාලය සඳහා වෙන්කළ ප්‍රතිපාදන වලින් සැලකිය යුතු ප්‍රතිශතයක් මුදල් රෙගුලාසි 66 මගින් සෑම වර්ෂයකදීම වෙනත් වැය විෂයන් සඳහා මාරු කරගෙන ඇති බව නිරීක්ෂණය විම.

3.2.3 රජයේ වියදම් කළමනාකරණය පිළිබඳ 2024 ජනවාරි 10 දිනැති ජාතික අයවැය වක්‍ර ලේඛ අංක 01/2024 හි 2.1 ඡේදය මගින් අතිකාල හා නිවාඩු දින වැටුප්, ගමන් වියදම් සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන සීමාව තුල පමණක් වියදම් දැරීම සඳහා බැඳීම් ඇති කර ගත යුතු බවත්, එම වැය විෂයන් සඳහා මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කිරීම් මගින් ප්‍රතිපාදන සැලසීමක් සිදු කරනු නොලබන බවත් දක්වා තිබුණද අතිකාල හා නිවාඩු දින වැටුප් , දේශීය ගමන් වියදම් සඳහා සලසා තිබුණු රු. මිලියන 541.93 ක ප්‍රතිපාදනයට අතිරේකව රු. මිලියන 48.12 ක ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 මගින් මාරු කර තිබුණි. තවද 2024 වර්ෂයේදී අතිකාල හා නිවාඩු දින වැටුප් හා ගමන් වියදම් වියදම රු. මිලියන 552.16 ක් වූ අතර 2024 වර්ෂයේ බැරකම් ලෙස හඳුනාගෙන නොතිබුණු රු මිලියන. 1.15 ක අතිකාල හා ගමන් වියදම්ද 2025 ජනවාරි මාසයේදී දරා තිබුණි. එසේම 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේදී අතිකාල හා ගමන් වියදම් සියයට 16 ක් වැඩි වී තිබුණි.

3.2.4 ඉහත වක්‍රලේඛයෙහි 3.1 ඡේදය අනුව විදුලිය, ජලය සඳහා වන වියදම් අවම කිරීම පිණිස උචිත වියදම් පාලන ක්‍රමවේද යොදා ගැනීමට කටයුතු කල යුතු වුවද, 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේදී විදුලි ඒකක ගාස්තුව අඩුවී පැවතියදී 1403 වැය විෂය යටතේ වන විදුලිය හා ජලය සඳහා වියදම රු. 136,307,507 සිට රු. 300,234,497 දක්වා සියයට 120 කින් වැඩි වී තිබුණි.

3.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

මුදල් රෙගුලාසි 94 (2) හි විධිවිධාන අනුව පවත්නා මුදල් වර්ෂයේ ප්‍රතිපාදන පවතින විට ඊළඟ වර්ෂයේද එබදු වියදම් අපේක්ෂා කෙරේ නම් ඊළඟ වර්ෂය තුල බෙරුම් කිරීමට සිදු වන බැරකම් වලට එළඹිය හැකිය. 2025 වර්ෂයේ ජනවාරි සහ පෙබරවාරි මාසවල ගෙවීම් වවුවර් පිළිබඳ නියැදි පරීක්ෂාවකදි 2024 වර්ෂයට අදාළ අවස්ථා 50 කදී එකතුව රු. 4,626,545 ක් වූ වියදම් 2025 වර්ෂයේ ප්‍රතිපාදන වලින් වැයකර තිබුණු නමුත් එම වියදම් 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල බැරකම් ලෙස හඳුනාගෙන නොතිබුණි. ඒ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල රු. 4,626,545 ක බැරකම් අඩුවෙන් දක්වා තිබුණි.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති, රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම
(අ)	ජනාධිපති ලේකම්ගේ අංක PS/CSA/00/1/4/1 හා 2022 සැප්තැම්බර් 09 දිනැති රාජ්‍ය වියදම් කළමනාකරණය මැයෙන් වූ ලිපියේ 3.1 ඡේදය.	යොමුගත ලිපිය අනුව අනුව රාජ්‍ය අමාත්‍යවරුන්/නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ පරිහරණය හා ආරක්ෂක කටයුතු වෙනුවෙන් වෙන්කරනු ලබන උපරිම නිල වාහන සංඛ්‍යාව 03 ක් ලෙස දක්වා ඇතත් , 2024 ජනවාරි සිට අගෝස්තු දක්වා කාළය තුළ නියෝජ්‍ය අමාත්‍යවරයා වෙත අමාත්‍යාංශය විසින් වාහන තුනක් ද යුද්ධ හමුදාව විසින් එක් රථයක් ද වශයෙන් රථ 04 ක් සහ ඉන්ධන ලබාදී ඇති බව නිරීක්ෂණය විය.
(ආ)	2016 ඔක්තෝබර් 04 දිනැති අමාත්‍ය මණ්ඩල තිරණය	ආරක්ෂක මූලස්ථාන සංකීර්ණයේ අංක 06, අංක 07 හා අංක 08 දරන ගොඩනැගිලි කඩිනමින් නිමකර, දැනට කුලී පදනම මත පවත්වාගෙන යනු ලබන කාර්යාල පරිශ්‍ර එම ගොඩනැගිලි වල ස්ථානගත කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු බවට අමාත්‍යාංශ ලේකම් වරයාට නියමකර ඇතත් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය 2009 වර්ෂයේ සිට කුලියට ගත් ගොඩනැගිල්ලක පවත්වා ගනිමින් තිබුණු අතර 2024 දෙසැම්බර් 31 දින වන විටත් වාර්ෂිකව රු. මිලියන 60.47 ක කුලියක් ගෙවමින් පවත්වාගෙන තිබුණි . එහෙත් වර්ග මීටර් 19,000 පමණ වූ මහල් 09 කින් සමන්විත අංක 08 දරන ගොඩනැඟිල්ල 2021 වර්ෂයේ ජනවාරි මාසය වනවිට ඉදිකිරීම් අවසන්කර ඇතත් පූර්වොක්ත අමාත්‍ය මණ්ඩල තිරණය පරිදි කටයුතු කර නොතිබීම හේතුවෙන් 2021 මැයි මාසයේ සිට 2024 නොවැම්බර් දක්වා අවුරුදු 03 මාස 06 ක කාලයක් තුළ ආසන්න වශයෙන් රු. මිලියන 211.6 ක් ගොඩනැගිලි කුළි වශයෙන් ගෙවීමට සිදු වී තිබුණි.
(ඇ)	මුදල් රෙගුලාසි 104 (3)	පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින හතකට වැඩි ප්‍රමාදයක් වේ යැයි අපේක්ෂා කරන්නේනම් ප්‍රාරම්භක වාර්තාව වහාම ඉදිරිපත් කල යුතු වුවත්, ජාතික ශිෂ්‍යාබට

		බලකායෙහි සිදුව තිබූ හානි පාඩු සම්බන්දයෙන් එලෙස ප්‍රාරම්භක වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07 කට වැඩි කාලයක් ගත් අවස්ථා 06 ක් පැවති බව නිරීක්ෂණය විය.
(ඇ)	මුදල් රෙගුලාසි 104 (4)	අලාභහානිය සිදුවූ දිනයේ සිට මාස 03 ක් ඇතුලත පූර්ණ වාර්තාව ඉදිරිපත් කල යුතු වුවත් ජාතික ශිෂ්‍යබට බලකායෙහි විගණනයට ඉදිරිපත් කල ලිපිගොනු 17 ක් පරීක්ෂා කිරීමේදී ඉන් අවස්ථා 13 කදීම පූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබූ බව අනාවරණය විය.
(ඉ)	ආයතන සංග්‍රහයේ XIV වැනි පරිච්ඡේදයේ 4.1 වගන්තියට සහ මුදල් රෙගුලාසි 371(2) හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	උක්ත විධිවිධානවලට පටහැනිව ආපදා කළමනාකරණ අංශයෙහි හා ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ නිලධාරීන්ට ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා අත්තිකාරම් ලබා දී තිබුණි.
(ඊ)	භාණ්ඩාගාර ලේකම්ගේ 2022.06.02 දිනැති රාජ්‍ය වියදම් පාලනය කිරීම මැයෙන් ආරක්ෂක ලේකම් අමතනලද ලිපිය	පූර්වෝක්ත ලිපිය මගින් ත්‍රිවිධ හමුදාවේ හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිළධාරීන් සඳහා නිල වාහන අනුයුක්ත කිරීමේදී අනුමත හිමිකමට පමණක් වාහන භාවිතය සීමා කිරීම, නිල හිමිකම සහිත නිළධාරීන් සඳහා එක් වාහනයක් පමණක් වෙන්කිරීම ඇතුළු අධික ඉන්ධන වියදම් සීමා කිරීම සඳහා ක්‍රමවේද භාවිතා කළයුතු බව අවධාරණය කර ඇතත් අමාත්‍යාංශයට අනුයුක්ත හමුදා නිළධාරීන් විසින් නිත්‍ය සේවා ස්ථානයෙන් නිලවාහන සහ ඉන්ධන ලබාගෙන තිබියදී අමාත්‍යාංශයට අයත් වාහන හා ඉන්ධන භාවිතාකර තිබුණු අවස්ථා පැවති බව නියැදි පරීක්ෂාවලදී නිරීක්ෂණය විය.
(උ)	අංක 01/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1 ඡේදය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 113 (6) (ආ)	ලබාගත් ණය මුදල ගෙවා අවසන්වීමට පෙර සේවය අතහැර යාම සහ වැඩ තහනමට ලක්වූ නිලධාරීන්ගෙන් අයවිය යුතු හිඟ ණය ශේෂ පිළිබඳව සංශෝධිත මුදල් රෙගුලාසිවල දැක්වෙන මාර්ගෝපදේශය අනුව මැනිවරණ දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා පදිංචිය සහ ඔවුන්ගේ වත්කම් පිළිබඳ තහවුරුවක්

		ලබාගෙන නීතිපති මගින් ණය මුදල් අයකරගැනීමට කටයුතු කළ යුතු වුවත්, සේවය අතහැරගොස් ඇති නිලධාරීන් 10 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 1,183,441 ක මුදලක් සහ වැඩ තහනමට ලක්ව ඇති නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු රු.238,267ක ශේෂ හිගහිට පැවතුණි. මෙම ණය ශේෂයෙන් රු. 254,773ක මුදලක් වර්ෂ 05 කට වැඩි කාලයක සිට හිඟ හිට පවතින බව නිරීක්ෂණය විය.
(ඌ)	2015 ජූලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 1/2015 හි (05) ඡේදයේ සහ මුදල් රෙගුලාසි 128 (2)(එ)	උක්ත විධිවිධානවලට අනුව, ආර්ථික තත්ත්වයේ වෙනස්කම් සැලකිල්ලට ගනිමින්, අවශ්‍ය විටෙක විවිධ සේවාවන් සඳහා අය කරනු ලබන ගාස්තු කාලෝචිත ලෙස සංශෝධනය කළ යුතු වුවත්, 1996 අංක 22 දරන තුවක්කු (සංශෝධන) පනත යටතේ අයකරනු ලබන ගාස්තු කාලීනව සංශෝධනය කිරීම තවදුරටත් ප්‍රමාද වෙමින් පැවතුණි. ක්‍රියාත්මක බදු ප්‍රමාණයන් සලකා බැලීමේදී ඉතාම අවම වාර්ෂික ගාස්තුවක් මත බලපත්‍ර නිකුත් කිරීම හා බලපත් අළුත් කිරීම ක්‍රියාත්මක වන බැවින් වර්ෂ 29 කට ආසන්න කාලයක් තුළ ගාස්තු සංශෝධනයකට ලක් නොකිරීම හේතුවෙන් සැලකිය යුතු රාජ්‍ය ආදායමක් වාර්ෂිකව අහිමිවන බවත් නිරීක්ෂණය විය.
(එ)	අංක 03/2022 , අංක 2/2023 දරන ජාතික අයවැය චක්‍රලේඛ හා2024 ජනවාරි 10 දිනැති අංක 01/2024 දරන ජාතික අයවැය චක්‍රලේඛය	රාජ්‍ය වියදම් පාලනය සම්බන්ධයෙන් නිකුත්කර ඇති අංක 03/2022 , අංක 2/2023 දරන ජාතික අයවැය චක්‍රලේඛ මගින් රාජ්‍ය වියදම් ඉතාම අත්‍යවශ්‍ය සේවාවන් සඳහා පමණක් යොදාගැනීමට හැකිවන පරිදි දැඩිව පාලනය කළ යුතු බවත් ගොඩනැගිලි ඉදිකිරීම හා කුළියට ගැනීම ආදී වියදම් සිදු නොකළයුතු බවත් අරපිරිමැසුම්දායී ලෙස රජයේ වියදම් දැරීමත්,වියදම් අවම කිරීම සඳහා වන රෙගුලාසි හා චක්‍රලේඛ දැඩිව පිළිපැදීමත් ඒ ඒ ආයතනවල ස්වභාවය අනුව ගැලපෙන පරිදි වියදම් පාලන උපක්‍රම භාවිතා කිරීමත් සිදුකළ යුතු බව අවධාරණය කර ඇතත්, ජාතික ආරක්ෂක විද්‍යාතනය විසින් සතියේ දිනයන්හි සාමාන්‍ය

		කාර්යාල වේලාවන් තුල පවත්වා තිබුණු තෙවන අධ්‍යයන පාඨමාලාව සඳහා රු. 34,518,000 ක වාර්ෂික බදුකුලී ගිවිසුමක් මත ගෘහ ඒකක 37 කින් යුත් (වායු සමනය කළ නිදන කාමර දෙකක්,ආලින්දය, මුළුතැන්ගෙය, නානකාමර දෙකක් හා සියළු ලීබඩු හා විදුලි උපකරණ සහිතව) ලබාගෙන තිබුණි.
(ඒ)	තුවක්කු ආඥා පනතෙහි 182 අධිකාරියෙහි 22 (1) හා 29 (1) වගන්ති	තුවක්කු ආඥා පනතෙහි 182 අධිකාරියෙහි 22 (1) ඡේදය ප්‍රකාරව යම් තැනැත්තෙකු විසින් තුවක්කුවක් තබා ගැනීමට හෝ සන්තකයේ තබා ගැනීමට හෝ පාවිච්චි කිරීමට බලපත්‍රයක් දරනු ලබන්නේනම් මිස, යම් තුවක්කුවක් තම භාරයේ තබා ගැනීම, සන්තකයේ තබා ගැනීම හෝ පාවිච්චි කිරීම කරනු නොලැබිය යුතු බව සඳහන් වුවද, 2024 දෙසැම්බර් 31 දිනට බලපත්‍ර අළුත් නොකල ගිනි අවි සංඛ්‍යාව 7,125 ක් විය. එසේම, තුවක්කු ආඥාපනතේ 182 අධිකාරයෙහි 29 (1) වගන්තිය අනුව බලපත්‍රයේ වලංගුභාවය අවසන්වී දින 10 ක් තුළ ඒ තුවක්කුව හා බලපත්‍රය බලපත්‍ර අධිකාරිවරයාට භාරදීමත් බලපත්‍ර අධිකාරිවරයා විසින් විධාන කරනු ලබන ස්ථානයක ඒ තුවක්කුව තැන්පත් කිරීමත් සිදුකළයුතු වුවත්. බලපත්‍ර අළුත් කරනු නොලැබූ ඉහත සඳහන් බලපත්‍ර 7,125 සම්බන්ධයෙන් ඉහත පරිදි කටයුතු සිදු කළ බව අනාවරණය නොවුණි.
(ඔ)	2017 ජූනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය	මිලදී ගන්නා හා අපහරණය කරනු ලබන වත්කම් සම්බන්ධයෙන් තොරතුරු අදාල කාර්තුව අවසානයේදී කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කල යුතු වුවද 2024 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු. 124,258,905 ක වත්කම් පිළිබඳ තොරතුරු විගණිත දිනය වන විටත් කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කර නොමැති බව නිරීක්ෂණය විය.

3.5 අවධිමත් ගනුදෙනු

(අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අයත්/ කුලී පදනම මත ලබාගත් වාහන 11 ක් හා යතුරු පැදියක් ඉන්ධන සහිතව ආරක්ෂක අමාත්‍යාංශය වෙත පරිහරණය සඳහා මුදාහැර ඇති බව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් විගණනය වෙත දන්වා තිබුණු අතර එම වාහන ආරක්ෂක අමාත්‍යාංශයේ පාලන අංශය විසින් භාරගෙන නොමැති බවත්, එම වාහන ආරක්ෂක අමාත්‍යාංශයේ පාලන අංශයේ ප්‍රවාහන සංචිතය තුළ, ආරක්ෂක අමාත්‍යාංශයේ රාජකාරී සඳහා අනුයුක්ත කරගත් වාහන නොවන බවත් වාර්තා කර තිබීම හේතුවෙන් වාහන භාවිතයේදී රාජ්‍ය වියදම් කළමනාකරණය නිසි අයුරින් සිදුවූ බවට නිරීක්ෂණය නොවීය.

(ආ) 2017 දෙසැම්බර් 21 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 2/2017 අනුව රජයේ මූල්‍ය නොවන වත්කම් හා පිරිවැය කළමනාකරණය සඳහා විධිමත් ක්‍රියාවලියක් අනුගමණය කිරීමේ අවශ්‍යතාව වෙනුවෙන් ලියාපදිංචි අයිතිය නොමැතිව පරිහරණය කරන වාහන ලියාපදිංචි ඇති ආයතනයේ එකඟතාවය මත තම ආයතනය නමින් ලියාපදිංචි කර ගැනීම හෝ පවරාදීම සිදුකළ යුතු වුවත් එවැනි පවරා ගැනීමකින් තොරව යුද්ධ හමුදාවට අයත් අංක KG-0349, CAF-1086 හා CAF-1094 දරන වාහන අමාත්‍යාංශය විසින් භාවිතා කර තිබුණු බව නිරීක්ෂණය වූ අතර ඒ සඳහා යුධ හමුදා වැය විෂයන් යටතේ ඉන්ධන ද ලබාගෙන තිබුණි.

3.6 තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (2) (ආ) හි සඳහන් විධිවිධාන ප්‍රකාරව කිසියම් නිශ්චිත කාර්යයක් සඳහා මාණ්ඩලික නිලධාරියකු වෙත රු 100,000 ක උපරිමයකට යටත්ව තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබා දිය හැකි අතර එම නිලධාරියා විසින් අදාල කාර්ය නිම කල විගසම අග්‍රිමය පියවීමට කටයුතු කල යුතු වුවත් අවස්ථා 106 කදී විවිධ කාර්යයන් සඳහා ලබා දී තිබූ රු 4,951,582 ක් වූ අත්තිකාරම් මුදල් පියවීමේදී දින 12 සිට දින 128 දක්වා කාල පරාසයක ප්‍රමාදයක් පැවති බව නිරීක්ෂණය විය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) ජාතික සහන සේවා මධ්‍යස්ථානය විසින් නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය යටතේ නිවාස 5,025 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. ඉන් නිවාස 4,898 ක වැඩ ආරම්භ කර තිබූ නමුත් නිවාස 1,179 ක ඉදිකිරීම් අතහැර දමා තිබුණු අතර නිවාස 127 ක ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි.

(ආ) නැවත පදිංචි කිරීමේ නිවාස ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂය අවසන් වනවිට රු.මි.583.83 ක් වැය කර තිබූ නමුත්, යටිතල පහසුකම් නොමැතිවීම සහ අවදානම් සහගත ස්ථානවලින් පදිංචිකරුවන් ඉවත්වීම ප්‍රතික්ෂේප කිරීම යනාදී හේතුමත ඉදිකල නිවාසවල පදිංචි නොවීමේ තත්ත්වයක් නිරීක්ෂණය විය.

4.2 ප්‍රසම්පාදනයන්

(අ) කාර්යසාධන ඇපකර ලබා ගැනීම

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 5.4.10 (ඇ) අනුව ඇස්තමේන්තු ගත කොන්ත්‍රාත් මුදලින් සියයට 10 කට නොඅඩු කාර්යසාධන සුරක්ෂණයක් ලබාගත යුතු වුවද ත්‍රිවිධ හමුදාවන් සඳහා ආහාර ද්‍රව්‍ය ප්‍රසම්පාදනයේදී එය කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 05 ක් ලෙස සංශෝධනය කර ගිවිසුම්වලට එළඹ තිබුණු අතර එක් එක් හමුදාවන්ට අදාලව තැබියයුතු කාර්යසාධන සුරක්ෂණ අනුපාත විවිධ ප්‍රතිශත යටතේ දක්වා තිබුණි.

(ආ) ප්‍රතිග්‍රහණ ලිපි නිකුත්කිරීම හා ගිවිසුම් ගත වීම ප්‍රමාද වීම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.9.1 ප්‍රකාරව ලංසුකරු වෙත වහාම විධිමත් ප්‍රතිග්‍රහණ ලිපියක් නිකුත් කර ඒ සමගම විධිමත් කොන්ත්‍රාත් ගිවිසුම් ලියා අත්සන් කළයුතු වුවද, ආහාර ප්‍රසම්පාදනයේදී ලංසු ප්‍රදානය කිරීමෙන් දින 47 සිට 86 දක්වා කාලයක් ප්‍රමාදව ත්‍රිවිධ හමුදා විසින් ගිවිසුම් ගතවීම සිදුකර තිබුණි.

(ඇ) තරගකාරීත්වය සීමාවීම

ත්‍රිවිධ හමුදාවන් සඳහා අමු හා වියළි ආහාර සැපයීම පිළිබඳ ප්‍රසම්පාදනයට අදාලව ඉදිරිපත් කෙරෙන ලංසු කොන්දේසිවල දැක්වෙන, ලංසු කරුවන්ගේ පූර්ව සුදුසුකම් පිළිබඳ නිර්ණායක, නිෂ්පාදකයාගේ අධිකාරීත්ව සහතික ඉදිරිපත් කිරීම, දක්වා ඇති සන්නම් නාම යටතේ මිලගණන් කැඳවීම හා සාම්පල ඉදිරිපත් කිරීම, ඵලවළු පළතුරු ආදිය සඳහා තත්ත්ව සහතික ඉල්ලීම ආදිය ඇතුළු ලංසු කොන්දේසිවල පැවති දුර්වලතා හේතුවෙන් ප්‍රසම්පාදනයේ තරඟකාරීත්වය ප්‍රවර්ධනය අවම වීමටත්, ඉදිරිපත්වන මිල ගණන් ඉහලයාමටත් හේතුවී ඇති බව නිරීක්ෂණය විය.

එබැවින් ත්‍රිවිධ හමුදාවන්ට අයත් කඳවුරු 147 ක් සඳහා, විවිධ ආහාර කාණ්ඩ 217කට අදාල සැපයුම් අවස්ථා 2,088 ක් පමණ පැවතියද, සැපයුම්කරුවන් 24 ක් වැනි සීමිත සැපයුම් කරුවන් සංඛ්‍යාවක් විසින් සියළුම සැපයුම් අවස්ථා හිමිකරගෙන ඇති බව නිරීක්ෂණය විය.

තවද, 2023 වර්ෂයේ මුළු කොන්ත්‍රාත්තු වටිනාකමෙන් සියයට 36 ක් හෙවත් රු.බිලියන 34.9 ක් හා 2024 වර්ෂයේ මුළු කොන්ත්‍රාත්තු වටිනාකමෙන් සියයට 33 ක් හෙවත් රු.බිලියන 28 ක

සැපයුම් එක් සැපයුම්කරුවෙකු හිමිකරගෙන තිබුණු අතර, 2023 හා 2024 වර්ෂවලදී මුළු කොන්ත්‍රාත්තු වටිනාකමෙන් සියයට 90 ක් හෙවත් රු.බිලියන 76 කට අධික සැපයුම් ලංසුකරුවන් 06 දෙනෙකු හිමිකරගෙන තිබූ අතර, ඉතිරි සියයට 10 ලංසුකරුවන් 18 ක් වෙත බෙදීගෙස් තිබුණි.

(ඇ) 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය ප්‍රකාරව 2020 ජනවාරි 01 සිට සියළුම රාජ්‍ය ආයතන විසින් වෙළඳපල මිල සැදහුම් ක්‍රමය (Shopping Method) යටතේ සිදුකරනු ලබන ප්‍රසම්පාදන, රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රමවේදයට අනුගතව (e-GP system) සිදුකළයුතු වුවත්, ජාතික ශිෂ්‍යභට බලකාය විසින් යොමුගත චක්‍රලේඛය අනුකුළව කටයුතු කර නොතිබුණි.

(ඉ) පූර්වෝක්ත රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය පරිදි 2020 ජනවාරි 31 දිනට පෙර සිදුකළ යුතුව පැවති, විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතියේ (www.promise.lk) ලියාපදිංචි වීම, සම්බන්ධීකාරක නිළධරයකු නම්කිරීම, (Liaison Officer) ප්‍රසම්පාදන සැලැස්ම හා ප්‍රසම්පාදන දැන්වීම් ආදිය පද්ධතියට උඩුගත කිරීම හෝ සැපයුම් කරුවන් දැනුවත් කිරීම ආදී කාර්යයන් සිදුකළ බවට නිරීක්ෂණය නොවුණි.

(ඊ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3 ප්‍රකාරව සම්මත ලංසු ලියවිලි වල ආදර්ශයන් දක්වා ඇති අතර, අවශ්‍ය නම් අවම වෙනස්කම් සහිතව එම සම්මත ලංසු ලියවිලි භාවිතා කල යුතු වුවද ජාතික ශිෂ්‍ය බට බලකාය විසින් 2024 වර්ෂයේදී සිදු කල රු. 127,147,840 ප්‍රසම්පාදනයන් සඳහා සම්මත ලංසු ලියවිලි භාවිතා කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(උ) 2020 මාර්තු 25 දිනැති, 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සඳහා වූ අතිරේක (supplementary) අංක 35 අනුව, භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී රු. මිලියන 01දක්වා භාණ්ඩ හා සේවා මිලදී ගැනීම් වෙළෙඳ පොල මිල සැදහුම් ක්‍රමය යටතේද රු. මිලියන 25 දක්වා මිලදී ගැනීම් විවෘත තරගකාරී ක්‍රමය යටතේද සිදුකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 1 සිට මිලියන 8.6 අතර ප්‍රසම්පාදන වටිනාකමක් සහිත අවස්ථා 5 කදී එකතු වටිනාකම රු. 24,254,900 ක් වූ බූට් 2000ක් මිලදී ගෙන තිබුණු නමුත් විවෘත තරගකාරී වෙළෙඳපොල ක්‍රමය වෙනුවට ලියාපදිංචි සැපයුම් කරුවන් මගින් මිලදී ගෙන තිබුණි.

(ඌ)රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 5.4.10 අනුව, කොන්ත්‍රාත්තුවේ කාර්යසාධනය අසාර්ථක වන විට එයින් ප්‍රසම්පාදන අස්ථිත්වය ආරක්ෂා කිරීම සඳහා ඇස්තමේන්තු ගත කොන්ත්‍රාත් මුදලින් සියයට 10 කට අඩු නොවන සුරක්ෂණයක් මගින් වගකීම් පිළිබඳ බැදීම් ආවරණය කර ගනු ලැබිය හැකි වුවද දුඹුරු බූට් යුවල් 300 ක් මිලදී ගැනීම සඳහා වූ පිරිවැය රු. 3,876,300 ක ප්‍රසම්පාදනය සඳහා රු. 328,500 ක කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණි.

(ඒ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.7.1 (b) ප්‍රකාරව ලංසුවේ වලංගු කාලය ඇතුලත ප්‍රතිග්‍රහණ ලිපිය නිකුත් කල යුතු නමුත් ආපදා කළමනාකරණ අංශ ගොඩනැගිල්ලේ ජල කාන්දුව වැලැක්වීමේ ප්‍රසම්පාදනයේ දී ලංසු වලංගු කාලය 2023 අප්‍රේල් 24 දිනෙන් අවසන් වූවද 2023 ජූනි 09 දින ප්‍රතිග්‍රහණ ලිපිය වැට් බදු සහිතව රු. 40,779,830.42ක වටිනාකමකට ප්‍රදානය කර තිබුණි. තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.5.1 (b) අනුව ලංසුවල වලංගු කාලය සහ ලංසු සුරක්ෂණයේ වලංගු කාලය දීර්ඝ කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.3 වත්කම් කළමනාකරණය

(අ) අමාත්‍යාංශයට අයත් තක්සේරු වටිනාකම රු.මිලියන 12 ක්වූ අංක KC-2275 දරන ඩිෆෙන්ඩර් වර්ගයේ රථය 2021 දෙසැම්බර් මාසයේදී අළුත්වැඩියාවට යොමුකර ඇතත්, 2024 දෙසැම්බර් වන විටත් අළුත්වැඩියාව සිදුකිරීම හෝ රථය ආපසු ලබාගැනීමට හෝ නොහැකිව තිබුණු අතර රථයේ පැවැත්ම හා ආරක්ෂාව සම්බන්ධයෙන් ගැටළු සහගත තත්ත්වයක් පවත්නා බව නිරීක්ෂණය විය.

(ආ) ආපදා සහන සේවා මධ්‍යස්ථානය සතුව භාවිතා නොකරන ජල බවුසර් 33 ක්ද වෙනත් ආයතන වෙත ලබා දීමට අනුමැතිය ලැබී තිබුණද විධිමත් පරිදි පවරා දීමට කටයුතු කර නොතිබුණු අතර වසර 3 කට අධික කාලයක් භාවිතා නොකිරීම නිසා බවුසර් 3 ක් අක්‍රියව පැවතුණි.

4.4 පාඩු හා හානි

(අ) ආරක්ෂක මූලස්ථාන ඉදිකිරීම් ව්‍යාපෘතිය වැලි කියුබ් 1530 ක් මිලදීගැනීම සඳහා රු. 1,057,700 ක් ත්‍රිකුණාමලය දිසා වන කාර්යාලය වෙත ගෙවීම් කර තිබියදී එම වැලි තොගයෙන් කියුබ් 1209 ක් නාවික හමුදාව විසින් භාවිතා කර ඇති බව අනාවරණය වී තිබුණි. මෙම මුදල නාවික හමුදාවෙන් ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු සිදුකරනු ලබන බවට, 2022 වර්ෂයේ වාර්තා කර තිබූ නමුත් විගණිත දිනය වන 2024 ජූලි මස වන විටත් නිරාකරණය කළ බවට තහවුරු නොවිය.

(ආ) 2021 වර්ෂයේදී අමාත්‍යාංශයේ පරිභෝජ්‍ය ද්‍රව්‍ය ගබඩාවේ හඳුනාගෙන තිබුණු රු. 16,769,458 ක භාණ්ඩ ඌනතාවක් සම්බන්ධයෙන් කමිටු වාර්තා කැඳවා තිබූ නමුත් ගබඩාභාරකරුගේ මාසික වැටුපෙන් සියයට 25 ක් හෙවත් රු.9,207 ක මුදලක් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගැනීම හැරුණුවිට මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කිරීම වර්ෂ 04 ක සිට ප්‍රමාද වෙමින් පැවතුණි.

(ඇ) 2023 ජනවාරි 27 සිට 2024 ජූලි 29 දින දක්වා කාලපරිච්ඡේදය තුළ ජාතික ශිෂ්‍යභට බලකායට අදාලව වාහන අනතුරු සම්බන්ධ අලාභහානි අවස්ථා 25 ක් පැවති අතර ඉන් අවස්ථා 20 කදී සිදුව තිබූ හානි/පාඩු සම්බන්ධයෙන් ගත් ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු අනාවරණය නොවුණි. හානි/පාඩු 08ක් සම්බන්ධ ලිපිගොනු විගණනයට ඉදිරිපත් නොවීම, 2023 වර්ෂයට පෙර සිදුව තිබූ හානි/පාඩු සම්බන්ධයෙන් ලිපිගොනු හෝ වාර්තා පවත්වා නොතිබීම, පරිපූර්ණ වාර්තා ඉදිරිපත්

කර නොතිබීම හෝ නියමිත දිනට ඉදිරිපත් නොකිරීම, රක්ෂණ හිමිකම් ලැබීම් ආදිය වාර්තා නොවීම ආදිය හේතුවෙන් හානි හා පාඩු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කිරීම දුර්වල මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

4.5 අනාර්ථික ගනුදෙනු

(අ) 76 වන නිදහස් දින පෙළපාලිය සඳහා ජාතික ශිෂ්‍යභට බලකායේ ශිෂ්‍යභටයන් 600 ක් සහභාගි කරවීම වෙනුවෙන් රු. මිලියන 14.61 ක වියදමක් දරා තිබුණි. නිදහස් උත්සවය සඳහා ශිෂ්‍යභටයන් සහභාගි කරවීම හා ඒ සඳහා රු. මිලියන 14.6 ක වියදමක් දැරීම සඳහා නිසි අනුමැතිය දැක්වෙන ලේඛණයක් ඉදිරිපත් නොවුණු අතර පූර්ව වර්ෂයයන් හිදී මෙලෙස සහභාගී වී ඇති බව පමණක් අනාවරණය විය.

(ආ) නිදහස් දින පෙළපාලිය සඳහා සහභාගි වන ශිෂ්‍යභටයන් සඳහා අලුතින් නිර්මාණය කරන ලද නිලඇදුම් කට්ටල 400 ක් සැකසීමට හා දැනට භාවිතා වන කළු පැහැති බූට් වෙනුවට දුඹුරු පැහැති බූට් 400 ක් මිලදී ගැනීමට රු. 5,972,400 ක වියදමක් දරා තිබුණි. එහෙත් මෙම මිලදී ගැනීම සිදු කරන අවස්ථාව වන විට බලකායේ මධ්‍යම ගබඩාව සතුව නිල ඇදුම් කට්ටල 2,222 ක් හා කලිසම් 2,800 ක ප්‍රමාණයක්ද කළු පැහැති බූට් 2,564 ක් පැවති බවට වාර්තාගතව තිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

(අ) ආරක්ෂක අමාත්‍යාංශයේ තනතුරු 123 ක හා ජාතික ශිෂ්‍යබට බලකායේ තනතුරු 106 ක පුරප්පාඩු පැවති අතර ඉන් තනතුරු 33 ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු විය.

(ආ) ඉදිරිපත් කළ තොරතුරු අනුව ආරක්ෂක අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආපදා කළමනාකරණ අංශය හා සෙසු ආයතන 06 ක් වෙත ත්‍රිවිධ හමුදා නිළධාරීන් හා සෙසු නිලයින් 647 ක් අනුයුක්ත කර ඇතත් එම කාර්යමණ්ඩලය යෙදවීම සඳහාවූ අනුමැතිය පිළිබඳ තොරතුරු අනාවරණය නොවුණි.

(ඇ) ජාතික ශිෂ්‍යබට බලකායේ සක්‍රීය සේවය සඳහා බඳවාගෙන තිබුණු කාර්ය මණ්ඩලයෙන් 45 ක් සිවිල් කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සඳහා යොදවාගෙන තිබුණු බැවින් එම කාර්ය මණ්ඩලය බඳවාගනු ලැබූ නිශ්චිත කාර්යය වන, පූර්ව යුද පුහුණුව හා ප්‍රජා පුහුණු ලබාදීම යන අරමුණට අදාළව ප්‍රශස්ත සේවාවක් ලබා ගත නොහැකිව තිබුණි.

එච්.පී.ඩී. ගුණසේකර
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති (වැ.බ.)වෙනුවට

එච්.පී.ඩී. ගුණසේකර
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

පරිච්ඡේදය 4

කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

අ/අ	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	**75%-89%**	**50%-74%**
1	සැලසුම් කළ පරිදි රණවිරුවන් සඳහා ඉඩම් ලබා දීම		75%	
2	ආරක්ෂක අමාත්‍යාංශීය සිවිල් කාර්ය මණ්ඩලයේ පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීනව පවත්වාගෙන යාම	90%		
3	අමාත්‍යාංශයේ මානව සම්පත් සංවර්ධන සැලැස්මට අදාළව පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම, අභ්‍යන්තර පූර්ණ වැඩසටහන් සැකසීම, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම නියමිත කාලරාමුව තුළ සිදු කිරීම		85%	
4	ආරක්ෂක අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය සහ අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල කාර්ය මණ්ඩලය සඳහා වර්ෂය තුළ මානව සම්පත්, සංවර්ධන/ පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.		75%	
5	වර්ෂය තුළ ලැබෙන විදේශ පුහුණු අවස්ථාවන් සඳහා නිලධාරීන් යොමු කිරීම	100%		
6	වර්ෂය තුළ ලැබෙන බාහිර පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම		85%	
7	ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සිවිල් කාර්ය මණ්ඩල කළමනාකරණයට අදාළ ආයතනික කටයුතු පිළිබඳ යොමු වන ඉල්ලීම්, අවශ්‍යතා සහ උපදෙස් ඉල්ලීම් අප්‍රමාදව හා නිවැරදිව ඉටු කිරීම	95%		
8	කොත්මලේ ඒකාබද්ධ සේවා භාෂා පුහුණු ආයතනයේ සිවිල් කාර්ය මණ්ඩලයේ පරිපාලන කටයුතු අධීක්ෂණය සඳහා යොමු වන ඉල්ලීම්, අවශ්‍යතා සහ උපදෙස් ඉල්ලීම් අප්‍රමාදව හා නිවැරදිව ඉටු කිරීම	95%		
9	රාජ්‍ය බුද්ධි සේවයේ (SIS) පරිපාලන කටයුතු අධීක්ෂණය සඳහා යොමු වන ඉල්ලීම්, අවශ්‍යතා සහ උපදෙස් ඉල්ලීම් අප්‍රමාදව හා නිවැරදිව ඉටු කිරීම	100%		
10	ආරක්ෂණ නිෂ්කාශන හා රාජකාරී හැඳුනුම්පත් නිකුත් කිරීමට අදාළ කටයුතු සම්බන්ධයෙන් ලැබෙන අයදුම්පත් අනුව නිකුත් කිරීම	100%		
11	ආරක්ෂක අමාත්‍යාංශයේ සහ අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල දුරකථන බිල්පත්, අන්තර්ජාල බිල්පත්, සංග්‍රහ වියදම්, අතුරු අග්‍රිම, සුළු මුදල් අග්‍රිම යනාදී බිල්පත් කලට වෙලාවට නිරවුල් කිරීම	100%		
12	කාර්යාලීය උපකරණ හා අවශ්‍යතාවයන් වලට අදාළ ඉල්ලීම් අනුව අවශ්‍යතා සැපයීම සඳහා ලද ඉල්ලීම් ප්‍රමුඛතාවය හා වැදගත්කම අනුව අප්‍රමාදව ඉටු කිරීම	90%		
13	කාර්යාල උපකරණ (ඡායාපිටපත් යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර, විදුලි සෝපාන, පරිගණක යන්ත්‍ර) නඩත්තු ගිවිසුම් හා අළුත්වැඩියා කටයුතු නියමිත කාලය තුළ සිදු කිරීම		85%	

අ/අ	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	75%-89%	50%-74%
14	මැතිවරණ රාජකාරී කටයුතු නිසි කාල රාමුව තුළ ඉටු කිරීම	100%		
15	ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය ස්ථාපිත ගොඩනැගිලි බදු කුලී ගිවිසුම් ගතවීමට අදාළ කටයුතු හා ඊට අදාළ බිල්පත් නිරවුල් කිරීම අප්‍රමාදව හා විධිමත්ව ඉටු කිරීම	100%		
16	ජාතික බුද්ධි අංශයේ කුලී නිවාස ගිවිසුම් ගතවීමට අදාළ කටයුතු හා ඊට අදාළ බිල්පත් නිරවුල් කිරීම අප්‍රමාදව හා විධිමත්ව ඉටු කිරීම	100%		
17	දුම්රිය බලපත්‍ර හා වාර ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමට අදාළ කටයුතු සඳහා ලද අයදුම්පත් අනුව නියමිත කාල සීමාව තුළ නිකුත් කිරීම	100%		
18	අමාත්‍යාංශයේ හා ඒ යටතේ වන ආයතන වල සිවිල් කාර්ය මණ්ඩලයට අදාළව මූලික විමර්ශන හා විනයානුකූලව කටයුතු කිරීම් වලට අදාළ ආයතනික කටයුතු වලට අදාළ පරිපාලන ශාඛාවට අදාළ කාර්යන් අප්‍රමාදව හා නිවැරදිව ඉටු කිරීම	100%		
19	සැලසුම් කළ පරිදි ආරක්ෂක අමාත්‍යාංශයේ වාර්ෂිකව ක්‍රියාත්මක කරන ලද සුබ සාධන වැඩසටහන් හා ක්‍රියාකාරකම් සිදු කිරීම	100%		
20	ආරක්ෂක අමාත්‍යාංශයේ පූස්තකාලය සඳහා සිදු කරන ලද අයෝජනය වාර්ෂිකව වැඩිවීම	100%		
21	නිල වාහන අවශ්‍යතාවයන් සඳහා අමාත්‍යාංශයේ නිලධාරීන්ට වාහන සැපයීම සඳහා යොමුවන ඉල්ලීම් අනුව වාහන නිකුත් කිරීම	100%		
22	අමාත්‍යාංශයේ සියලු රාජකාරී අවශ්‍යතාවයන් සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා යොමුවන ඉල්ලීම් අනුව වාහන නිකුත් කිරීම	100%		
23	කාර්මික නිලධාරීන්ගේ පරීක්ෂාව සහ යාන්ත්‍රික ඉංජිනේරුගේ නිර්දේශ මත අලුත්වැඩියා කිරීම	95%		
24	අමාත්‍යාංශය සතු වාහන වල රක්ෂණ කටයුතු, දුම් වාර්තා, ආදායම් බලපත්‍ර නිසි කාලසීමාවට යාවත්කාලීන කිරීම	100%		
25	අමාත්‍යාංශ නිලධාරීන්ගේ හා රියදුරන්ගේ නිවාඩු වාර්තා, අතිකාල ගෙවීම් වලට අදාළ කටයුතු නිසිකලට ලබාදීම	100%		
26	අවශ්‍යතාවය මත ඉන්ධන කූපන්පත් නිකුත් කිරීම	100%		
27	ඉන්ධන බිල්පත් හා වාහන අලුත්වැඩියාවට අදාළ බිල්පත් නිසිකලට ගෙවීම	100%		
28	අවශ්‍යතාවය මත වාහන පවරා ගැනීම් පවරා දීම හා අපහරණය පිළිබඳ කටයුතු ඉටුකිරීම	100%		
29	නිල වාහන අවශ්‍යතාවයන් සඳහා අමාත්‍යාංශයේ නිලධාරීන්ට යොමුවන ඉල්ලීම් අනුව වාහන නිකුත් කිරීම	100%		
30	අමාත්‍යාංශයේ සියලු රාජකාරී අවශ්‍යතාවයන් සඳහා යොමුවන ඉල්ලීම් අනුව වාහන නිකුත් කිරීම	100%		
31	තැපැල් අංශය වෙත ලැබෙන ලිපි බෙදාහැරීම	100%		
32	රාජ්‍ය බුද්ධි සේවයට අනුයුක්ත පොලිස් නිලධාරීන්ගේ සේවයේ වෙනස් වීමට අනුව වැටුප් වෙනස් වීම ලේඛනගත කිරීම	100%		
33	රාජ්‍ය බුද්ධි සේවයට අනුයුක්ත පොලිස් නිලධාරීන්ගේ සේවයේ වෙනස් වීමට අනුව විශ්‍රාම වැටුප් / වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් සැකසීම	100%		

අ/අ	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	75%-89%	50%-74%
34	රජයේ සහ මහවැලි ඉඩම්වල පදිංචි රණවිරුවන් සඳහා දීර්ඝකාලීන බදු බලපත්‍ර / දීමනාපත්‍ර සඳහා නිර්දේශ ලබා දීම	100%		
35	රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ රැකියාවේ නියුතු රණවිරු කලත්‍රයන් සඳහා ස්ථාන මාරුවීම් සඳහා නිර්දේශ ලබා දීම	100%		
36	රණවිරු දරුවන් රජයේ පාසල්වලට ඇතුළත් කර ගැනීමට සහන ලිපි ලබා දීම	100%		
37	ත්‍රිවිධ හමුදාව විසින් ඉදිරිපත් කරනු ලබන බඳවාගැනීමේ ඉල්ලීම් සඳහා අනුමැතිය ලබා දීම	100%		
38	ත්‍රිවිධ හමුදාවේ සුදුසුකම් සපුරාලූ කැඩෙට් නිලධාරීන් බඳවාගැනීමට අදාළ අනුමැතිය ලබා දීම	100%		
39	ත්‍රිවිධ හමුදාවේ නිලධාරින් අධිකාරියට පත් කිරීමට ඉදිරිපත් කරන ලද ඉල්ලීම් සඳහා ජනාධිපතිතුමාගේ අනුමැතියට ඉදිරිපත් කිරීම	100%		
40	ත්‍රිවිධ හමුදාවේ නිලධාරින්ගේ උසස්වීම සඳහා ඉදිරිපත් කරන ඉල්ලීම් ජනාධිපතිතුමාගේ අනුමැතියට ඉදිරිපත් කිරීම	100%		
41	ත්‍රිවිධ හමුදා නිලධාරීන් ස්ථිර කිරීම සඳහා ඉදිරිපත් කරන ඉල්ලීම් ජනාධිපතිතුමාගේ අනුමැතියට ඉදිරිපත් කිරීම	100%		
42	ත්‍රිවිධ හමුදා පුද්ගලයින්ගේ සේවය අත්හිටු වීම සඳහා ඉදිරිපත් කරන ඉල්ලීම් ජනාධිපතිතුමාගේ අනුමැතියට ඉදිරිපත් කිරීම	100%		
43	ත්‍රිවිධ හමුදා පුද්ගලයින් සේවයෙන් ඉවත් කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් අනුමත කිරීම	100%		
44	ත්‍රිවිධ හමුදා නිලධාරීන්ට සේවා දිගු ලබා දීමට ඉදිරිපත් කරන ඉල්ලීම් ජනාධිපතිතුමාගේ අනුමැතියට ඉදිරිපත් කිරීම	100%		
45	ත්‍රිවිධ හමුදා පුද්ගලයින් සේවයේ පහ කිරීමට අදාළව යොමු කරන ඉල්ලීම් ජනාධිපතිතුමාගේ අනුමැතියට ඉදිරිපත් කිරීම	100%		
46	විදේශ රාජ්‍යයන්ගෙන් ඉදිරිපත් කරන ගිවිසුම්/අවබෝධතා ගිවිසුම් සඳහා අදාළ අභ්‍යන්තර හා බාහිර පාර්ශවයන්ගෙන් නිරීක්ෂණ ලබා ගැනීම හා එම නිරීක්ෂණ ආරක්ෂක අමාත්‍යාංශයෙහි නීති උපදේශක වෙත ඉදිරිපත් කර අවශ්‍ය සංශෝධනයක් සිදු කිරීම	100%		
47	සංශෝධිත ගිවිසුම්/අවබෝධතා ගිවිසුම් විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා අදාළ විදේශ රාජ්‍යය වෙත ඉදිරිපත් කර අවශ්‍ය එකඟතාවයන් ලබා ගැනීම	100%		
48	දෙපාර්ශවය විසින් එකඟතාවයට එළඹී ගිවිසුම්/අවබෝධතා ගිවිසුම් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම	100%		
49	අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත් ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම	100%		
50	වෙනත් අමාත්‍යාංශය වලින් ඉදිරිපත් කරන ලද ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම් සඳහා අදාළ අභ්‍යන්තර හා බාහිර පාර්ශවයන්ගෙන් නීරීක්ෂණ කැඳවා අදාළ ආයතන වෙත ඉදිරිපත් කිරීම	100%		
51	විදේශීය රාජ්‍යයන් සමඟ සිදුකරනු ලබන දේශපාලනික උපදේශන සඳහා අවශ්‍ය යෙදවුම් ඉදිරිපත් කිරීම	100%		
52	තානාපති /මහ කොමසාරිස් කාර්යාල හෝ විදේශ අමාත්‍යාංශය වෙතින් ලැබෙන පාඨමාලා, පුහුණු, සම්මන්ත්‍රණ, සංචාර, වැඩසටහන්, සමුළු සඳහා ත්‍රිවිධ හමුදා හා ආරක්ෂක අමාත්‍යාංශයේ සිවිල් කාර්ය මණ්ඩල සහභාගි කර වීම අනුමත කිරීම	100%		

අ/අ	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	75%-89%	50%-74%
53	එම වැඩසටහන් සඳහා සහභාගී වන ත්‍රිවිධ හමුදා හා ආරක්ෂක අමාත්‍යාංශයේ සිවිල් කාර්ය මණ්ඩලයේ නිර්දේශ නාමයන් යොමු කිරීම	100%		
54	මෙරට තුළ පවත්වන පාඨමාලා, පුහුණු, සම්මන්ත්‍රණ, සංචාර, වැඩසටහන්, සමුළු සඳහා විදේශ පුද්ගලයින් සහභාගී වීමට අනුමැතිය ලබා දීම	100%		
55	ශ්‍රී ලංකාවේ ස්ථාපිත විදේශ තානාපති කාර්යාලවල නිලධාරීන් හා විදේශ නිලධාරීන් මෙම අමාත්‍යාංශයේ නිලධාරීන්ව හෝ මෙම අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වල නිලධාරීන්ව හමුවීමට අනුමැතිය ලබා දීම	100%		
56	පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාව වෙත ඉදිරිපත් වන පෙත්සම් සඳහා ඉදිරි කටයුතු කිරීම	100%		
57	අමාත්‍යාංශ උපදේශක කාරක සභාව ඉදිරිපත් වෙන පෙත්සම් සඳහා ඉදිරි කටයුතු කිරීම	100%		
58	ත්‍රිවිධ හමුදා අයවලුන්ගේ විශ්‍රාම වැටුප් ගැටලු සම්බන්ධ කටයුතු කිරීම	100%		
59	ත්‍රිවිධ හමුදා අයවලුන්ගේ මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වෙන පැමිණිලි සඳහා ඉදිරි කටයුතු කිරීම	100%		
60	ආරක්ෂක අංශයට අදාළව ඉදිරිපත් වන තොරතුරු දැනගැනීමේ පනත යටතේ වන ඉල්ලීම් සඳහා කටයුතු කිරීම	100%		
61	ත්‍රිවිධ හමුදා පුද්ගලයින් සඳහා ඉදිරිපත් කරන දුක්ගැනවිලි සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කිරීම	100%		
62	ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් මියගිය යුද්ධ හමුදා සමාජිකයින්ගේ යැපෙන්නන් වෙත ත්‍රිවිධ හමුදා ඉල්ලීම් මත වයස අවුරුදු 55 සම්පූර්ණ වන දින තෙක් වැටුප් හා දීමනා ගෙවීම	100%		
63	රාජකාරියේ යෙදී සිටියදී සිදුවන අනතුරු හේතුවෙන් තුවාල ලබන හා මියයන ත්‍රිවිධ හමුදා සාමාජිකයින් හා යැපෙන්නන් වෙත ත්‍රිවිධ හමුදා ඉල්ලීම් මත රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 22/93 ප්‍රකාරව වන්දි හිමි ගැන්වීම	100%		
64	ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් ආබාධිතව විශ්‍රාම ගන්වන හමුදා සාමාජිකයින් වෙත ත්‍රිවිධ හමුදා ඉල්ලීම් මත හිඟ වැටුප් ගෙවීමේ කටයුතු කිරීම	100%		
65	2009.05.19 දිනට පෙර පැවති යුදමය වාතාවරණයේ දී අබාධිත වූ හමුදා සාමාජිකයින් වෙත සහන හිමිගැන්වීමට අදාළ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම	100%		
66	ත්‍රිවිධ හමුදා සාමාජිකයින්ට පදක්කම් හිමිගැන්වීම	100%		
67	ත්‍රිවිධ හමුදා සාමාජිකයින්ට දීමනා හිමිගැන්වීම	100%		
68	ත්‍රිවිධ හමුදාවේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා ඉදිරිපත් වන ඉල්ලීම් වලට අනුමැතිය ලබා දීම	100%		
69	ත්‍රිවිධ හමුදාවේ ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළව සිදු කරනු ලබන පුහුණුවීම් හා සංචාර සඳහා ත්‍රිවිධ හමුදා සාමාජිකයින්ට විදේශ ගත වීමට අනුමැතිය ලබා දීම	100%		
70	ශ්‍රී ලංකා ජලශාස්ත්‍රීය කාර්යාලයේ ආයතනික කටයුතු වලට අනුමැතිය ලබා දීම	100%		
71	විදේශ ධූත මණ්ඩල රාජකාරී සඳහා ආරක්ෂක පරිවාර නිලධාරීන් පත් කිරීමේ ක්‍රියාවලිය	100%		

අ/අ	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	75%-89%	50%-74%
72	ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ ආයතනික කටයුතු වලට අනුමැතිය ලබා දීම	100%		
73	ජාතික ආරක්ෂක විද්‍යායතනයේ ආයතනික කටයුතු වලට අනුමැතිය ලබා දීම	100%		
74	ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යායතනයේ ආයතනික කටයුතු වලට අනුමැතිය ලබා දීම	100%		
75	ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ නිලධාරීන්ගේ විදේශ නිවාඩු අනුමත කිරීම	100%		
76	ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යායතනයේ අධ්‍යයනය ලබන විදේශ සිසුන්ගේ වීසා ලබා ගැනීමට අනුමැතිය ලබා දීම	100%		
77	ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන නිලධාරීන් සඳහා සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබා ගැනීමේ ක්‍රියාවලියට ගත වන කාලය	100%		
78	ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහලේ ආයතනික කටයුතු වලට අනුමැතිය ලබා දීම	100%		
79	ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහලේ සේවයේ නියුතු නිලධාරීන්ගේ විදේශ නිවාඩු අනුමත කිරීම	100%		
80	එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාම සාධක කටයුතු වලට අදාළව ත්‍රිවිධ හමුදාවන් වෙත අවශ්‍ය අනුමැතීන් ලබා දීම	100%		
81	ත්‍රිවිධ හමුදාවන් විසින් ඉදිරිපත් කරනු ලබන සාම සාධක කටයුතු වලට අදාළ ඉල්ලීම් අවශ්‍ය ආයතන වෙත යොමු කිරීම	100%		
82	මුදල් අවශ්‍යතාවය පුරෝකතනය හා ඉල්ලුම් කිරීම	100%		
83	බැංකු සැසඳුම් වාර්තා සකස් කිරීම	100%		
84	වවුචර් පරීක්ෂා කිරීම හා සහතික කිරීම	100%		
85	වැය ලෙජරය හා මුදල් පොත් නඩත්තු කිරීම	100%		
86	මාසික ගිණුම් සාරාංශ සකස් කිරීම හා භාරදීම	100%		
87	මුදල් පොත සහ වැය ලෙජරය තුළනය කිරීම හා භාණ්ඩාගාර මුද්‍රිත සටහන් සමඟ සැසඳීම	100%		
88	විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම	100%		
89	වවුචර්පත් සඳහා ගෙවීම් සිදු කිරීම	100%		
90	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	100%		
91	ප්‍රගති වාර්තාව සකස් කිරීම හා අයවැය කාරකසභා අවස්ථාවේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම	100%		
92	ආරක්ෂක අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාව සකස් කිරීම හා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම	100%		
93	අමාත්‍යාංශය යටතේ වන වෙනත් ආයතනයන්හි වාර්ෂික වාර්තා හා කාර්යසාධන වාර්තා අනුමත කිරීම සහ පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට සැලැස්වීම	100%		
94	තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම		85%	
95	මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය ඉදිරිපත් කිරීම	100%		

අ/අ	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	75%-89%	50%-74%
96	අයවැය ඇස්තමේන්තු සකස් කිරීම	100%		
97	ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම	100%		
98	ගිනිඅවි බලපත්‍ර නිකුත් කිරීම හා අලුත් කිරීම		85%	
99	පුපුරණ ද්‍රව්‍ය අවසර පත්‍ර / බලපත්‍ර නිකුත් කිරීම හා අනුමැතිය ලබාදීම	100%		
100	අන්තරායකාරී බහාලුම් සහිත නැව් සඳහා අවසරපත්‍ර ලබාදීම	100%		
101	සමුද්‍රාරක්ෂක මෙහෙයුම් කටයුතු සඳහා අවසරපත්‍ර ලබාදීම	100%		
102	ආපදා අවදානම අවබෝධ කර ගැනීම		85%	
103	ආපදා අවදානම් කළමනාකරණය කිරීමේ කටයුතු ශක්තිමත් කිරීම	100%		
104	ආපදා ප්‍රත්‍යාස්ථිතිය (Resilience) සම්බන්ධයෙන් ආයෝජනය කිරීම		84%	
105	වඩා හොඳින් නැවත ගොඩනැඟීම සඳහා පෙර සූදානම ඉහළ නැංවීම.		86%	
106	ත්‍රිවිධ හමුදා මූලස්ථාන ඉදි කිරීම් ව්‍යාපෘතිය		89.7%	
107	උපාය මාර්ගික ආරක්ෂිත සන්නිවේදන ජාල ව්‍යාපෘතිය			71.4%
108	GPS සන්නිවේදන උපකරණ ආනයනය කිරීමේ දී රේගුවෙන් නිදහස් කර ගැනීම සඳහා ආරක්ෂක නිෂ්කාශන ලබා දීම	100%		
109	ධීවර යාත්‍රා හිමිකරුවන්ගේ සන්නිවේදන උපකරණ භාවිතා කිරීම සඳහා ආරක්ෂක නිෂ්කාශන ලබා දීම	100%		
110	දුරස්ථ පාලක සෙල්ලම් බඩු ආනයනය කිරීමේ දී රේගුවෙන් නිදහස් කර ගැනීම සඳහා ආරක්ෂක නිෂ්කාශන ලබා දීම	100%		
111	ක්‍රීඩා කටයුතු සඳහා අධි ධාරිතාවයෙන් යුතු මොටර් සයිකල් ආනයනය කිරීමේ දී රේගුවෙන් නිදහස් කර ගැනීම සහ ක්‍රීඩා කටයුතු සඳහා මෙරට තුළ භාවිතා කිරීමේ දී ආරක්ෂක නිෂ්කාශන ලබා දීම	100%		
112	නව රූපවාහිනී හා ගුවන් විදුලි විකාශන ආයතන ආරම්භ කිරීමේ දී, අධ්‍යක්ෂ මණ්ඩලය වෙනස් කිරීමේ දී, නව මෙහෙයුම් ක්‍රියාකාරකම් ආරම්භ කිරීමේ දී සහ කාලානුරූපීව විකාශන බලපත්‍ර ලබා ගැනීම සඳහා ආරක්ෂක නිෂ්කාශන ලබා දීම	100%		
113	ආයතන හෝ පුද්ගල වශයෙන් වර්ණ ජායා පිටපත්/ මුද්‍රණ යන්ත්‍ර මෙරටට ආනයනය කිරීමට ආරක්ෂක නිෂ්කාශන ලබා දීම	100%		
114	ආයතන හෝ පුද්ගල වශයෙන් සන්නිවේදන උපකරණ (Hand Held, Walkie Talkie, Satellite, Receiver, Antenna) මෙරටට ආනයනය කිරීමට ආරක්ෂක නිෂ්කාශන ලබා දීම	100%		
115	විකුණුම් බලපත්‍ර (Vendor License) සඳහා ආරක්ෂක නිෂ්කාශන ලබා දීම	100%		

අ/අ	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	**75%-89%**	**50%-74%**
116	ගුවන් යානා අමතර කොටස් ආනයනය කිරීමේ දී රේගුවෙන් නිදහස් කර ගැනීම සඳහා ආරක්ෂක නිෂ්කාශන ලබා දීම	100%		
117	අනාවරක යන්ත්‍ර (Detectors) මෙරටට ආනයනය කිරීමට ආරක්ෂක නිෂ්කාශන ලබා දීම	100%		
118	දූරස්ථ පාලක ගුවන් යානා ආනයනය කිරීමේ දී රේගුවෙන් සහ තැපැල් මඟින් නිදහස් කර ගැනීම සඳහා ආරක්ෂක නිෂ්කාශන ලබා දීම හා සංචාරකයින් සඳහා ඡායාරූපකරණය සඳහා යොදා ගන්නා දූරස්ථ පාලක ඩ්‍රෝන යාත්‍රා ගෙන ඒමට ආරක්ෂක නිෂ්කාශන ලබා දීම	100%		
119	දුරස්ථපාලක දිය මතුපිට හා දිය යට විමර්ශනය/ඡායාරූප කරන යාත්‍රා සඳහා ආරක්ෂක නිෂ්කාශන ලබාදීම	100%		
120	අනෙකුත් සන්නිවේදන උපකරණ (Ex:Night Vision, Binoculars, Wireless Scanners,) මෙරටට ආනයනය කිරීමට ආරක්ෂක නිෂ්කාශන ලබා දීම	100%		
121	Amateur Radio සන්නිවේදන උපකරණ මෙරටට ආනයනයට සහ භාවිතා කිරීමට අවශ්‍ය බලපත්‍ර සඳහා ආරක්ෂක නිෂ්කාශන ලබා දීම	100%		
122	නාවික කටයුතු සඳහා අවශ්‍ය සන්නිවේදන උපකරණ (VMS, Marine 1GPS, Antenna, Hand Set, AIS Fishing Net Buoy) මෙරටට ආනයනය කිරීමට ආරක්ෂක නිෂ්කාශන ලබා දීම	100%		
123	යාත්‍රා (Vessel) ලියාපදිංචිය සඳහා ආරක්ෂක නිෂ්කාශන ලබා දීම	100%		
124	ගුවන් යානාවල ගුවන් විදුලි මධ්‍යස්ථාන සඳහා බලපත්‍ර ලබා දීමේදී ආරක්ෂක නිෂ්කාශන ලබා දීම.(AIRCRAFT STATION LICENSE) - (two-way radiotelephones, radar, radionavigation equipment, and emergency locator transmitters (ELTs))	100%		
125	ආරක්ෂක අමාත්‍යාංශයේ සහ අනුබද්ධ ආයතනවල වාහන නඩත්තු සබැඳි කටයුතු සිදු කිරීම.	100%		
126	අමාත්‍යාංශයේ ත්‍රිවිධ හමුදාවෙහි හා පොලිසියේ යාන්ත්‍රික ඉංජිනේරු කටයුතු ආශ්‍රිත විෂයයන්, රිය අනතුරු සිදුවන වාහන සහ බැහැර කළ යුතු වාහන සම්බන්ධව විවිධ තාක්ෂණික ඇගයීම් සහ ප්‍රසම්පාදනයන් වලට අදාළ තාක්ෂණික සහය ලබා දීම.	100%		
127	අධි ආරක්ෂිත කලාපයේ ගොඩනැගිලි ඉදිකිරීම හා සංවර්ධනය කිරීම සඳහා ආරක්ෂක නිෂ්කාශන ලබාදීම.(පාර්ලිමේන්තුව අවට, කොළොන්නාව ඉන්ධන ගබඩා සංකීර්ණය, මුතුරාජවෙල ඉන්ධන ගබඩා සංකීර්ණය, සපුගස්කන්ද ඉන්ධන ගබඩා සංකීර්ණය, ඔරුගොඩවත්ත ඉන්ධන ගබඩා සංකීර්ණය,)	100%		

අ/අ	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	75%-89%	50%-74%
128	අරලියගහ මන්දිරය, ජනාධිපති ලේකම් කාර්යාලය හා අධිආරක්ෂිත කලාපය අවට ගොඩනැගිලි ඉදිකිරීම හා දිවයින පුරා ඉදිකරනු ලබන හෝටල් ව්‍යාපෘති සඳහා ආරක්ෂක නිෂ්කාශන ලබාදීම	100%		
129	ආරක්ෂක අමාත්‍යාංශයේ සියලුම නඩත්තු කටයුතු සිදු කිරීම	100%		
130	සියලුම පරිගණක උපාංග නඩත්තු හා අළුත්වැඩියා කටයුතු සිදු කිරීම ඇතුළු තොරතුරු තාක්ෂණික කටයුතු සිදු කිරීම	95%		
131	ආරක්ෂක අමාත්‍යාංශයේ විෂය පථයට අදාළ කාර්යභාරයන් පිළිබඳ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම	100%		
132	ආරක්ෂක අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ත්‍රිවිධ හමුදාව ඇතුළු ආයතනවලට අවශ්‍ය ඉඩම් අත්කර/ පවරා ගැනීම සම්බන්ධයෙන් කටයුතු කිරීම		85%	
133	අමාත්‍යාංශ විෂය පථයට අදාළව ප්‍රතිපත්ති කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු හා දත්ත සැපයීම හා යාවත්කාලීන කිරීම	92%		
134	ඉඩම් අත්කර ගැනීම්වලට අදාළව ලැබෙන මහජන ඉල්ලීම් හා දූක් ගැනවිලි පිළිබඳ කටයුතු කිරීම	92%		
135	ආරක්ෂක අමාත්‍යාංශයේ පවතින සියලුම අංශවලින් කෙටුම්පත් කරන ලද කැබිනට් පත්‍රිකා නිරවද්‍යතාව පරීක්ෂා කර ආරක්ෂක ලේකම්වරයාගේ අනුමැතියට යොමු කිරීම හා ඉන් අනතුරුව අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම	100%		
136	අංශය යටතේ අධීක්ෂණය වන ආයතන වලට අදාළ පනත් සැකසීම, පනත් සංශෝධනය කිරීම සහ අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම		75%	
137	රණවිරු සේවා අධිකාරියේ කටයුතු අධීක්ෂණය කිරීම, ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ පහසුකම් සැලසීම	100%		
138	රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ කටයුතු, රාජකාරී විදේශ සංචාර සම්බන්ධ කටයුතු සහ බිල්පත් නිරවුල් කිරීම සඳහා අවශ්‍ය අනුමැතීන් ලබාදීම	100%		
139	ආරක්ෂක පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය මඟින් සිදු කරන නවීන තාක්ෂණික උපකරණ නිර්මාණය කිරීමට අදාළ ව්‍යාපෘති සඳහා අවශ්‍ය අනුමැතීන් ලබා දීම සහ ව්‍යාපෘති අධීක්ෂණ කටයුතු සිදු කිරීම	100%		
140	කොළඹ ආරක්ෂක සේවා විද්‍යාලයේ සිව් මහල් ශිෂ්‍ය නේවාසිකාගාර ගොඩනැගිල්ලේ අධීක්ෂණ කටයුතු සහ ප්‍රගති සමාලෝචන කටයුතු සිදු කිරීම		80%	
141	කුරුණෑගල ආරක්ෂක සේවා විදුහලේ ඉදි කරමින් පවතින තෙමහල් පොදු පහසුකම් ගොඩනැගිල්ලේ අධීක්ෂණ කටයුතු සහ ප්‍රගති සමාලෝචන කටයුතු සිදු කිරීම		79%	
142	ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනයේ සියලුම බඳවා ගැනීම් සිදු කිරීම, විවිධ වැඩසටහන් සඳහා සහ බිල්පත් නිරවුල් කිරීම සඳහා අනුමැතිය ලබා දීම	100%		
143	ආරක්ෂක සේවා විද්‍යාලයන්හි 02 ශ්‍රේණියේ සිට අ.පො.ස (උ.පෙළ) ශ්‍රේණි සඳහා අදාළ සුභසාධක අධ්‍යක්ෂවරුන් විසින් නිර්දේශ කර යොමු කරන අයදුම්පත් ආරක්ෂක සේවා විද්‍යාල අධ්‍යක්ෂක වෙත යොමු කිරීම	100%		

අ/අ	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	75%-89%	50%-74%
144	ආරක්ෂක සේවා විද්‍යාලයන්ට අදාළව ලැබෙන පැමිණිලි, අභියාචනා පිළිබඳ රාජකාරී කටයුතු සහ ඒ පිළිබඳව පසු විපරම් කිරීම	100%		
145	ත්‍රිවිධ හමුදාව සම්බන්ධ පරිපාලන ගැටලු නිරාකරණය කිරීම	100%		
146	ආරක්ෂක අමාත්‍යාංශයෙහි ආරක්ෂාව සම්බන්ධ කටයුතු කිරීම	100%		
147	රටෙහි ඇතිවන විවිධ තත්ත්වයන් යටතේ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, ත්‍රිවිධ හමුදාපතිවරුන් සහ පොලිස්පති වෙත ආරක්ෂක ලේකම්තුමා විසින් ලබාදෙන උපදෙස් ලබාදීම	100%		
148	විදේශීය තානාපති කාර්යාලයන්හි සේවයේ නියුතු ආරක්ෂක උපදේශකයින් හට වගකීම් පැවරීම, ශ්‍රී ලංකා හමුදාවන්ගේ දියුණුව සඳහා අවැසි තොරතුරු යාවත්කාලීන කිරීමට විස්තර ලබා ගැනීම හා අවශ්‍ය අනෙකුත් සම්බන්ධීකරණ කටයුතු සඳහා සහය ලබා ගැනීම	100%		
149	ආරක්ෂක අමාත්‍යාංශයේ සේවය කරන ත්‍රිවිධ හමුදා අයවලුන්ගේ ආරක්ෂක නිෂ්කාශන ලබාදීම	100%		
150	ත්‍රිවිධ හමුදා උත්සව/පෙළපාලි සඳහා අමාත්‍යාංශ අනුමැතිය ලබා දීම.	100%		
151	ත්‍රිවිධ හමුදා පෙළපාලි සඳහා අනුමැතිය ලබාදීම	100%		
152	ත්‍රිවිධ හමුදා තූර්යවාදන කණ්ඩායම් ලබාදීම	95%		
153	ත්‍රිවිධ හමුදාවන් විසින් අරමුදල් වලින් කරන ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබාදීම	100%		
154	වැදගත්කමින් යුතු ස්ථාන වල රූගත කිරීම්/ ඡායාරූප ගතකිරීම් සඳහා අවසර ලබා දීම	95%		
155	පිදුරුතලාගල කන්දෙහි සන්නිවේදන කුළුණු වල නඩත්තු කටයුතු සඳහා යාමට අවසර ලබාදීම	100%		
156	ත්‍රිවිධ හමුදා නිලධාරීන් හා සෙසුනිලයින් සඳහා ත්‍රිවිධ හමුදා නිල ඇදුම්න් යුතුව සිවිල් උත්සව සඳහා සහභාගි වීමට අවසර ලබාදීම	100%		
157	රාජ්‍ය අනුග්‍රහයෙන් සිදුකරන ශ්‍රමදාන වැඩසටහන් සඳහා ත්‍රිවිධ හමුදා පුද්ගලයින් සහභාගි කරවීම	100%		
158	විදේශීය දූත පිරිස්/ විදේශීය හමුදා දූත පිරිස් වල සංචාර සම්බන්ධීකරණය කිරීම සහ පිළියෙල කරදීම.	100%		
159	අතිගරු ජනාධිපතිතුමා සහභාගිවන රාජ්‍ය උත්සව සඳහා අධිසභායකයින් ලබාදීම	100%		
160	ආපදා කළමණාකරණ මධ්‍යස්ථාන සහ ත්‍රිවිධ හමුදාව සමඟ සම්බන්ධතාවයෙන් ආපදා කළමණාකරණ සම්බන්ධ ගැටලු නිරාකරණය කිරීම	100%		
161	විදේශීය දූත මෙහෙවරෙහි යෙදෙන විදේශීය නිලධාරීන් සඳහා ආරක්ෂක නිශ්කාශන ලබාදීම	100%		
162	ත්‍රිවිධ හමුදාව වෙතින් ලබාගන්නා සේවාවන් සඳහා විවිධ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වෙතින් කෙරෙන ඉල්ලීම් වලට පිළිතුරු ලබාදීම	100%		
163	ගුවන් තොටුපල/ වරාය/ ත්‍රිවිධ හමුදා සංකීර්ණ/ අධි ආරක්ෂිත කලාපයන්හි සංචාරය කිරීමට අවසර ලබාදීම	100%		
164	ත්‍රිවිධ හමුදා නිලධාරීන්/ රාජ්‍ය නිලධාරීන් සමඟ පවත්වන රාජතාන්ත්‍රික හමුවීම් සම්බන්ධීකරණය කරදීම	100%		

අ/අ	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	75%-89%	50%-74%
165	ආගමික ස්ථාන හා රාජ්‍ය ආයතන සඳහා ත්‍රිවිධ හමුදා භටපිරිස් ලබාදීම සම්බන්ධීකරණය කරදීම	100%		
166	සඳහිරු සෑය ස්තූපය ඉදිකිරීමේ ව්‍යාපෘතිය අධීක්ෂණය කිරීම සහ සම්බන්ධීකරණය කටයුතු සිදුකිරීම	100%		
167	දීඝවාපිය චෛත්‍යයේ ප්‍රතිසංස්කරණ කටයුතු අධීක්ෂණය කිරීම සහ සම්බන්ධීකරණය කටයුතු සිදුකිරීම	100%		
168	විදේශීය නාවික යාත්‍රා සඳහා ආරක්ෂක නිශ්කාශන ලබාදීම	100%		
169	විවිධ භාණ්ඩ, ගුවන්යානා කොටස්, නාවික යාත්‍රා කොටස් සඳහා රේගු නිශ්කාශන ලබාදීම සඳහා ආරක්ෂක නිශ්කාශන ලබාදීම	100%		
170	යාත්‍රා, මෝටර් බෝට්ටු, ජල ස්කූටර්, යාත්‍රා එන්ජින් සහ පැරෂුට් සම්බන්ධ උපකරණ ආනයනය හා අපනයනය කිරීම සඳහා ආරක්ෂක නිශ්කාශන ලබාදීම	100%		
171	යුද්ධ ගුදම් නැවිගත කිරීම සඳහා අනුමැතිය ලබාදීම	100%		
172	ධීවරයන්, නීති විරෝධී සංක්‍රමණිකයන්, මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් නැවත ඔවුන්ගේ රටවල් වලට භාරදීම ආදී කටයුතු සම්බන්ධීකරණය කිරීම	100%		
173	විශේෂිත වූ වෙරළ තීරයන්හි ධීවර කටයුතු, පර්යේෂණ, සමීක්ෂණ, පිහිනුම් සහ නාවික කටයුතු සඳහා අනුමැතිය ලබාදීම	100%		
174	ශ්‍රී ලංකා නාවික හමුදාවට අයත් නෞකා, යාත්‍රා සහ අනෙකුත් උපකරණ අළුත්වැඩියා කටයුතු සඳහා මෙරටින් ගෙනයාමට සහ නැවත ගෙන්වීම සඳහා රේගු නිශ්කාශන ලබාගැනීමට අවැසි ආරක්ෂක නිශ්කාශන ලබාදීම	100%		
175	විදේශීය හමුදාවන්ට අයත් ගුවන් යානා සඳහා ආරක්ෂක නිශ්කාශන ලබාදීම	100%		
176	මෙරටට ආනයනය කරනු ලබන ගුවන් යානා සඳහා ආරක්ෂක නිශ්කාශන ලබාදීම	100%		
177	අධි සංවේදී කලාපයන්හි ඩ්‍රෝන යානා සහ නියමුවන් රහිත ගුවන් යානා ගුවන්ගත කිරීම සඳහා ආරක්ෂක නිශ්කාශන ලබාදීම	100%		
178	ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් ගුවන් යානා මඟින් ගුවන් ගමන් පහසුකම් ලබාගැනීම සඳහා අවැසි අනුමැතිය ලබාදීම	100%		
179	පෞද්ගලික ගුවන් යානා මඟින් ගුවනින් මල් ඉසීම සහ විවිධ ප්‍රචාරණ කටයුතු සඳහා ආරක්ෂක නිශ්කාශන ලබාදීම	100%		
180	ප්‍රභූ ආරක්ෂාව තහවුරු කිරීමේදී ඩ්‍රෝන යානා මඟින් ඇතිවිය හැකි තර්ජන වැළැක්වීමට අවැසි ආරක්ෂක සහාය ශ්‍රී ලංකා පොලීසිය වෙත ලබාදීම	100%		
181	විදේශීය දූත මෙහෙවරෙහි යෙදෙන විදේශීය නිලධාරීන් ත්‍රිවිධ හමුදා මූලස්ථාන වෙත ප්‍රවිශ්ඨ වීම සඳහා ආරක්ෂක නිශ්කාෂණ ලබාදීම	100%		
182	ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් ගුවන් යානා/ අමතර කොටස් අළුත්වැඩියා කටයුතු සඳහා මෙරටින් ගෙනයාමට සහ නැවත ගෙන්වීම සඳහා රේගු නිශ්කාශන ලබාගැනීමට අවැසි ආරක්ෂක නිශ්කාශන ලබාදීම	100%		
183	ආරක්ෂක ලේකම්තුමා විසින් පවරනු ලබන අමතර රාජකාරීන් ඉටුකිරීම	100%		

අ/අ	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	**75%-89%**	**50%-74%**
184	වැටුප් අංශයට අදාළව අභ්‍යන්තර විගණන සිදුකිරීම	95%		
185	ගෙවීම් අංශයට අදාළව අභ්‍යන්තර විගණන සිදුකිරීම	100%		
186	සිවිල් ආරක්ෂක අංශයට අදාළව අභ්‍යන්තර විගණන සිදුකිරීම	90%		
187	ප්‍රවාහන අංශයට අදාළව අභ්‍යන්තර විගණන සිදුකිරීම	95%		
188	පරිපාලන අංශයට අදාළව අභ්‍යන්තර විගණන සිදුකිරීම	100%		
189	ණය හා අත්තිකාරම් අංශයට අදාළව අභ්‍යන්තර විගණන සිදුකිරීම	100%		
190	ගබඩාවට අදාළව අභ්‍යන්තර විගණන සිදුකිරීම	95%		
191	මුදල් අංශයට අදාළව අභ්‍යන්තර විගණන සිදුකිරීම	95%		
192	ආදායම් හා වත්කම් කළමනාකරණ අංශයට අදාළව අභ්‍යන්තර විගණන සිදුකිරීම	100%		
193	සැලසුම් අංශයට අදාළව අභ්‍යන්තර විගණන සිදුකිරීම	95%		
194	ජාතික ආරක්ෂක විද්‍යාතනයට අදාළව අභ්‍යන්තර විගණන සිදුකිරීම	95%		
195	ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයට අදාළව අභ්‍යන්තර විගණන සිදුකිරීම	95%		
196	ජාතික ආරක්ෂක අරමුදලට අදාළව අභ්‍යන්තර විගණන සිදුකිරීම	95%		
197	ජාතික ශිෂ්‍ය භට බලකායට අදාළව අභ්‍යන්තර විගණන සිදුකිරීම	90%		

පරිච්ඡේදය 5

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු - 2024

ඉලක්ක	අරමුණ	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
1. සියලු තන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම	ආපදා අවදානම අවබෝධ කර ගැනීම	• ආපදා අවදානම සම්බන්ධව දැනුවත්වූ හා පුහුණුව ලැබූ පාර්ශවයන්			✓
		• පැවැත් වූ ධාරිතා වර්ධන වැඩසටහන් හා වැඩමුළු සංඛ්‍යාව මහජනතාව ඇතුළු සියලු පාර්ශව දැනුවත් කිරීම, පුහුණු කිරීම හා පෙර සුදානම් සැලසුම් සකස් කිරීම			✓
		• සංවර්ධනය කළ බහු උපද්‍රව අවදානම් පැතිකඩයන් හා නායයෑම් අවදානම් පැතිකඩයන් හා සම්පූර්ණ කරන ලද පෙර සූදානම් සැලසුම්		✓	
11. නගර සහ ජනාවාස සංයුක්ත, සුරක්ෂිත, ස්ථායි සහ තිරසර කරලීම	ආපදා අවදානම් කළමනාකරණය කිරීම සඳහා ආපදා අවදානම් පාලනය ශක්තිමත් කිරීම	• ආපදා අවදානම් අවම කිරීමේ සංකල්පයට අනුගතවූ පාර්ශවයන්		✓	
		• සංශෝධිත හා බලාත්මක ආපදා කළමනාකරණ පනත		✓	
		• සංශෝධිත හා ප්‍රසිද්ධ කරන ලද ආපදා කළමනාකරණ ජාතික ප්‍රතිපත්තිය		✓	
		• නීති ගත කළ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධාන පනත			✓
		• පරීක්ෂණයට භාජනය කරන ලද ගොඩනැගිලි සංඛ්‍යාව		✓	
13.දේශගුණික විපර්යාස සහ එහි බලපෑම්වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම	ඵලදායි ප්‍රතිචාර සහ ප්‍රකෘතියට පත් වීමේදි වඩා හොඳින් ගොඩ නැගීම, පුනරුත්ථාපනය, සහ ප්‍රතිසංස්කරණය වෙනුවෙන් ආපදා සඳහා සූදානම් වීම ප්‍රවර්ධනය	• හඳුනාගත් ආන්තික දේශගුණික තත්ත්ව අවස්ථා විශ්ලේෂණ වාර්තාව			✓
		• සකස් කරන ලද පදනම් දත්ත	✓		
		• කුසලතා වර්ධන වැඩසටහන් වැඩමුළු හා තක්සේරු වාර්තා සංඛ්‍යාව			✓
		• හඳුනාගත්,සැලසුම් කළ හා ක්‍රියාත්මක කල වැඩසටහන්, ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් හා පසු විපරම් කල අවස්ථා ගණන		✓	
		• වැඩිදියුණු කළ පවතින කාලගුණික අනාවැකිකරණ නිරවද්‍යතාවය හා තව දුරටත් ශක්තිමත් කළ පවතින ආපදා පූර්ව දැනුම් දීමේ ක්‍රමවේදය			✓

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න

තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීම සඳහා අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන හා නිලධාරීන් දැනුවත් කිරීම මෙන්ම තිරසර සංවර්ධන උපායමාර්ගික සැලැස්ම සම්පූර්ණ කර තිරසර සංවර්ධන සභාව වෙත භාර දෙන ලදී. වාර්ෂික ප්‍රගතිය අවශ්‍ය අවස්ථාවල දී වාර්තා කරනු ලැබේ.

පරිච්ඡේදය 6

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	91	51	31
තෘතීයික	12	09	3
ද්විතීයික	339	273	66
ප්‍රාථමික	159	136	89

6.2 ආයතනයේ කාර්යසාධන උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම

ආරක්ෂක අමාත්‍යාංශය තුළ මානව සම්පත් හිඟයක් පවතින අතර, එම මානව සම්පත් හිඟය පියවීම සඳහා කටයුතු කිරීම අත්‍යවශ්‍ය වී ඇත. පුළුල් විෂය පථයක් සහිත ආරක්ෂක අමාත්‍යාංශය තුළ මානව සම්පත් හිඟය සැලකිය යුතු මට්ටමක පවතින අතර ආයතනයේ කටයුතු කාර්යක්ෂමව හා නිවැරදිව ඉටුකිරීම සඳහා අදාළ මානව සම්පත් හිඟය පියවීම මඟින් ආයතනයේ කාර්යසාධනය තවදුරටත් ඉහළ නංවා ගත හැකිය.

6.3 මානව සම්පත් සංවර්ධනය

බැඹසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	බැඳ සටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.) දේශීය		බැඳසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම්/ලබා ගත් දැනුම
ආයතනය තුළ සිටින ජ්‍යෙෂ්ඨ/ තෘතීයික මට්ටමේ නිලධාරීන් හට දෙමළ භාෂා පාඨමාලාව ලබා දීම	13	පැය 200	150,000		දේශීය	නිලධාරීන්ගේ දැනුම කුසලතා වර්ධනය තුළින් ආයතනික ඵලදායීතාවය වර්ධනය වීම
ආයතනය තුළ සිටින ද්වීතීක මට්ටමේ නිලධාරීන් හට දෙමළ භාෂා පාඨමාලාව ලබා දීම (දෙවන අදියර)	110	පැය 150	112,500		දේශීය	නිලධාරීන්ගේ දැනුම කුසලතා වර්ධනය තුළින් ආයතනික ඵලදායීතාවය වර්ධනය වීම
වැටුප් කළමනාකරණ පද්ධතිය පිළිබඳ පුහුණු වැඩසටහන	05	දින 03	90,000.00	-	දේශීය	වැටුප් කළමනාකරණ පද්ධතිය භාවිතයෙන් සේවා ස්ථානයේ ඵලදායීතාවය වැඩිදියුණු කිරීම
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක පුහුණු වැඩසටහන	16	දින 01	-	-	දේශීය	නිලධාරීන්ගේ දැනුම කුසලතා වර්ධනය තුළින් ආයතනික ඵලදායීතාවය වර්ධනය වීම

පරිච්ඡේදය 7

අනුකූලතා වාර්තාව

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1. පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ				
1.1.	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2.	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3.	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල වේ		
1.4.	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.5.	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.6.	වෙනත්			
2. පොත්පත් හා ලිපිලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)				
2.1.	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2.	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
2.5.	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙළ කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6.	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7.	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8.	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9.	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10.	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11.	උප පත්‍රිකා පොත් ලේඛනය (GAN 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
3. මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)				
3.1.	ආයතනය තුළ මූල්‍ය බලතල ආයතනය තුළ පවරා දී තිබීම	අනුකූල වේ		
3.2.	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3.	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4.	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4. වාර්ෂික සැලසුම් සකස් කිරීම				
4.1.	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5. විගණන විමසුම්				
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කර ඇති දිනට සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6. අභ්‍යන්තර විගණනය				
6.1	මු.රෙ.134(2)හා ඩීඑම්ඒ/1-2019 අනුව වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කර අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කලමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මු.රෙ.134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7. විගණන හා කළමනාකරණ කමිටු				
7.1	ඩීඑම්ඒ චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වා තිබීම	අනුකූල වේ		
8. වත්කම් කළමනාකරණය				
8.1.	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිළදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.2.	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සූදුසු සම්බන්ධතා නිලධාරියකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3.	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4.	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම.	අනුකූල වේ		
8.5.	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම.	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9.	**වාහන කළමනාකරණය**			
9.1.	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2.	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඛණ්ඩ කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3.	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4.	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5.	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම් නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6.	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10.	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1.	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2.	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3.	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11.	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1.	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2.	මු.රෙ. 94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
12. රජයේ නිලධාරීගේ අත්තිකාරම ගිණුම්				
12.1.	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2.	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3.	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13. පොදු තැන්පත් ගිණුම				
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14. අග්‍රිම ගිණුම				
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15. ආදායම් ගිණුම				
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16. මානව සම්පත් කළමනාකරණය				
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිත ව ලබා දී තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලු ම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17. මහජනයා වෙත තොරතුරු ලබා දීම				
17	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
17.2.	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18. පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම				
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19. මානව සම්පත් සැලැස්ම සම්පාදන කිරීම				
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පූහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ :02/2018(I) මඟින් රාජ්‍ය අංශය තුළ මානව සම්පත් සංවර්ධන කිරීම යන මැයෙන් 2018/01/24 දිනැතිව නිකුත් කරන ලද උක්ත චක්‍රලේඛයට අමතර වශයෙන් රාජ්‍ය පරිපාලන , ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2023/11/30 දිනැති ලිපිය මඟින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ2/2018 හි 1(ඡේදය) සංශෝධනය කරමින් වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම තවදුරටත් අවශ්‍ය නොවන බව දක්වා ඇත.	
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20. විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම				
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		